87	දේශ සීමා අතර විමර්ශන වැඩමුළුව	26.08.2024	30.08.2024	5	අදාළ නොවේ.
88	නැගෙනහිර ඉන්දියානු සාගරයේ මතුද්‍රව්‍ය ජාවාරම් ජාලය සිතියම් ගත කිරීම පිළිබඳ කලාපීය වටමේස සහ පද්ධති විශ්ලේෂණ අභ්‍යාස	27.08.2024	30.08.2024	2	අදාළ නොවේ.
89	ශ්‍රී ලංකාව සඳහා නිදහස් වෙළඳ කලාප ඉදිකිරීම පිළිබඳ සමුළුව, චීනය,	06.09.2024	19.09.2024	1	අදාළ නොවේ.
90	ලෝක රේගු සංවිධානයේ (WCO) දත්ත ආදර්ශ ව්‍යාපෘති කණ්ඩායමේ (DMPT) සහ එහි ඉලක්ක ණකණ්ඩායමේ **70** වන රැස්වීම	23.09.2024	27.09.2024	2	අදාළ නොවේ.
91	IWT පුහුණුව පිළිබඳ INAMA ව්‍යාපෘති මාර්ගගත කලාපීය පසුවිපරම් රැස්වීම	01.10.2024	-	4	අදාළ නොවේ.
92	සංශෝධිත කියෝතෝ ප්‍රඥප්ති කළමනාකරණ කමිටුව (RKC/MC)	02.10.2024	03.10.2024	3	අදාළ නොවේ.
93	ජාත්‍යන්තර රේගු නිලධාරීන් සඳහා රේගු ධාරිතා ප්‍රවර්ධනය පිළිබඳ 29 වන CHRDI සමුළුව	21.10.2024	28.10.2024	2	අදාළ නොවේ.
94	මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිපික් කණ්ඩායමේ වාර්ෂික රැස්වීම	22.09.2024	27.09.2024	1	84500 .00

95	රේගු සහයෝගිතා පිළිබඳ SAARC උප කමිටුවේ දසවන රැස්වීම, SAARC මහලේකම් කාර්යාලය, කත්මණ්ඩු, නේපාලය	01.10.2024	02.10.2024	2	අදාළ නොවේ.
96	HSC **74** වන සැසිය සහ ක්‍රියාකාරී පක්ෂ රැස්වීමේ පූර්ව සැසිය	16.09.2024	27.09.2024	3	1066500 .00
97	JICA දැනුම් සම -නිර්මාණ වැඩසටහන, රේගු පරිපාලනය (A)	07.10.2024	01.11.2024	2	අදාළ නොවේ.
98	ආසියා/ පැසිපික් රේගු නව ප්‍රකාශන අංක **73** "අරමුණක් සහිතව සාම්ප්‍රදායික සහ නව නිර්මාණ කරුවන් යොදාගැනීම"	-	-	1	අදාළ නොවේ.
99	රේගුව පිළිබඳ දකුණු ආසියානු උප කලාපීය ආර්ථික සහයෝගිතා උප කණ්ඩායමේ (SASEC) **12** වන රැස්වීම (SCS-12)	24.09.2024	25.09.2024	3	අදාළ නොවේ.
100	විද්‍යුත් වෙළඳ පැකේජයේ **2**වන සමාලෝචනය	12.09.2024	13.09.2024	5	අදාළ නොවේ.
101	2024 නීර සහ මාර්ග රේගු බලාත්මක කිරීම් සහයෝගිතා වැඩමුළුව	23.09.2024	27.09.2024	1	අදාළ නොවේ.
102	PSI Pacific Protector අභ්‍යාස 24	24.09.2024	27.09.2024	1	අදාළ නොවේ.
103	ශ්‍රී ලංකා රේගුව සඳහා බලයලත්ආර්ථික මෙහෙයුමකරු වැඩමුළුව	07.10.2024	11.10.2024	8	අදාළ නොවේ.
104	ආසියා සහ පැසිපික් කලාපයේ රේගු දත්ත ප්‍රවේණියන් සඳහා සාකච්ඡා සංසදය	17.10.2024	18.10.2024	2	අදාළ නොවේ.
105	ආසියා/පැසිපික් කලාපීය සබඳතා ස්ථාන **34** වන සැසිය	21.10.2024	25.10.2024	2	අදාළ නොවේ.
106	ගෝලීය තොරතුරු හා බුද්ධිමය උපායමාර්ගික ක්‍රියාකාරී කණ්ඩායමේ **21** වන රැස්වීම (GII WG)	21.10.2024	22.10.2024	16	අදාළ නොවේ.
107	දත්ත හා සංඛ්‍යාලේඛන පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ **5** වන රැස්වීම	07.10.2024	09.10.2024	1	අදාළ නොවේ.
108	API සහ BRI/PNR දත්ත සම්බන්ධතා කමිටුවේ **19** වන රැස්වීම	09.10.2024	10.10.2024	9	අදාළ නොවේ.
109	ලෝක රේගු සංවිධානයේ ව්‍යාජකරණ සහ මුහුදු කොල්ලකෑම් පිළිබඳ කමිටුවේ **21** වන රැස්වීම	29.10.2024	30.10.2024	2	අදාළ නොවේ.
110	කාර්යසාධන ක්‍රියාමාර්ග යාන්ත්‍රණ ව්‍යාපෘති කණ්ඩායමේ **2**වන රැස්වීම (PMMPT)	25.11.2025	26.11.2025	4	අදාළ නොවේ.
111	පුහුණු කළමනාකරණය පිළිබඳ WCO කලාපීය වැඩමුළුව	19.11.2024	21.11.2024	1	අදාළ නොවේ.
112	**2025-2028** WCO උපායමාර්ගික සැලසුම පිළිබඳ කලාපීය උපදේශනය	04.10.2024	-	8	අදාළ නොවේ.
113	SAFE ක්‍රියාකාරී කණ්ඩායමේ (SWG) **30** වන රැස්වීම	06.11.2024	08.11.2024	3	අදාළ නොවේ.
114	රේගු රැස්වීම්හි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ විවිධත්වය සඳහා වන ජාලය	01.10.2024	-	4	අදාළ නොවේ.
115	කලාපීය පුහුණු සහ නිෂ්පාදන හඳුනාගැනීමේ වැඩමුළුව	06.11.2024	07.11.2024	2	අදාළ නොවේ.
116	රේගු මිල පිරික්සුම් පිළිබඳ තාක්ෂණික කමිටුවේ **59** වන සැසිවාරය	14.10.2024	18.10.2024	2	724,000.00
117	**2024** වර්ෂය සඳහා දකුණු ආසියා උප කලාපීය ආර්ථික සහයෝගිතා වැඩසටහනේ (SASEC) වෙළඳ පහසුකම් සැලසීමේ ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම	04.11.2024	06.11.2024	2	අදාළ නොවේ.
118	නීති විරෝධී සිගරට් වලට එරෙහි කලාපීය සමුළුව	20.11.2024	21.11.2024	1	අදාළ නොවේ.
119	විකිරණ අනතුරු ඇඟවීම් විකිරණ අනතුරු ඇඟවීම් පිළිබඳ ද්විතීයික, පරීක්ෂණ සහ තක්සේරු කිරීම් සඳහා ක්‍රියාවලි සහ මෙවලම් පිළිබඳ තාක්ෂණික රැස්වීම IAEA,**2024** නොවැම්බර් 17-21ල කයිරෝ, ඊජිප්තුව	17.11.2024	21.11.2024	1	අදාළ නොවේ.
120	ලෝක රේගු සංවිධානයේ **91**වන සහයෝගිතා වැඩසටහන	03.03.2025	18.04.2025	1	අදාළ නොවේ.
121	රුසියා- ශ්‍රී ලංකා රේගු සහයෝගිතාවය සහ අනේ‍යාන්‍ය ආධාර ගිවිසුම	29.10.2024	30.10.2024	2	8,010.24
122	Operation Mekong Dragon (OMD) VI විස්තර කිරීමේ සහ ඇඟයීමේ රැස්වීම	19.11.2024	20.11.2024	2	අදාළ නොවේ.
123	IAEA ප්‍රධාන මහජන උත්සව සඳහා සහාය වීමේ වසර **20**කින් උගත් පාඩම් පිළිබඳ තාක්ෂණික රැස්වීම	04.11.2024	07.11.2024	1	අදාළ නොවේ.
124	WCO INAMA ව්‍යාපෘතිය - IWT අවදානම් කළමනාකරණය ඉදිරිපත් කිරීම සඳහා රැස්වීම	30.10.2024	30.10.2024	4	අදාළ නොවේ.
125	ශ්‍රී ලංකාවේ රේගු කාර්යයන්හි දී සාගරයේ සාක්ෂි රැස්කිරීම සඳහාවන සහයෝගිතා රාමුවක් සංවර්ධනය කිරීම යටතේ ක්‍රියාකාරකම්	ජනවාරි (2025)	-	2	අදාළ නොවේ.
126	රජයේ නිලධාරීන් සඳහා අපනයන පාලන සහ සම්බාධක අවදානම් කළමනාකරණය සඳහාවන ප්‍රශස්ත ක්‍රියාමාර්ග පිළිබඳ වැඩමුළුව	04.11.2024	05.11.2024	5	අදාළ නොවේ.
127	ආසියා සහ පැසිපික් කලාපය සඳහා RILO වෙනුවෙන් වන ජාතික සබඳතා ස්ථාන පිළිබඳ රැස්වීමේ **35** වන පරිපාලන රැස්වීම	18.11.2024	19.11.2024	1	3,823.29
128	WCO/UPU සම්බන්ධතා කමිටුවේ **44** වන රැස්වීම	19.11.2024	20.11.2024	1	අදාළ නොවේ.
129	පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TTT) කලාපීය වැඩමුළුව	25.11.2024	29.11.2024	7	අදාළ නොවේ.

130	ගෝලීය AEO සමුළුව- ඉන්දියාව	28.11.2024	29.11.2024	1	අදාළ නොවේ.
131	'ආක්‍රමණශීලී නොවන විමර්ශනයන් පිළිබඳ තාක්ෂණයන්' පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන	02.12.2024	04.12.2024	3	අදාළ නොවේ.
132	සංස්කෘතිකමය දේපළ නීති විරෝධී ජාවාරමට එරෙහිව සටන් කිරීම පිළිබඳ කලාපීය ධාරිතා සංවර්ධන වැඩමුළුව	11.12.2024	13.12.2024	2	අදාළ නොවේ.
133	UNODC-WCO මගීන් සහ භාණ්ඩ දේශ සීමා කණ්ඩායම (PCBT)	08.12.2024	12.12.2024	6	අදාළ නොවේ.
134	WCO ඒකාබද්ධ විශේෂඥ සංචාරය සහ වැඩමුළුව	25.11.2024	28.11.2024	20	26,000.00
135	**9** වන කලාපීය රේගු බලාත්මක කිරීම් පිළිබඳ රැස්වීම **2024**	04.12.2024	05.12.2024	2	127,800.00
136	ආදායම් අනුකූලතා සහ වංචා පිළිබඳ WCO **11**වන ක්‍රියාකාරී කණ්ඩායම (WGRCF)	27.11.2024	28.11.2024	5	අදාළ නොවේ.
137	දුම්කොළ නැවගතකිරීමේ අවදානම් තක්සේරුව පිළිබඳ UNODC කලාපීය පුහුණුව	18.12.2024	20.12.2024	1	අදාළ නොවේ.
138	තාවකාලික ඇතුළත් කිරීම් පිළිබඳ සම්මුතිය සඳහාවන පරිපාලන කමිටුවේ **23** වන රැස්වීම	09.12.2024	10.12.2024	4	අදාළ නොවේ.
139	දේශසීමා කඩදාසි රහිත වෙළඳ සහ ඩිජිටල් වෙළඳ පහසුකම් සැලසීම සඳහා වන BIMSTEC ධාරිතා වර්ධන වැඩසටහන**2025** ජනවාරි **21-23**	21.01.2025	23.01.2025	1	අදාළ නොවේ.
140	4th WCO RTC ඉන්දුනීසියා ජාත්‍යන්තර සම්මන්ත්‍රණය **2024**: රේගුවේ නවීන තාක්ෂණයන් සහ බහු පාර්ශවකරුවන්ගේ සහයෝගය තුළින් බාධාරහිත අනාගතයක් ගොඩ නැංවීම	08.10.2024	09.10.2024	3	අදාළ නොවේ.
141	ATA Carnet පද්ධතිය ඩිජිටල්කරණය කිරීම	-	-	1	අදාළ නොවේ.
142	ස්ථාන මාරු විෂමතා සහ ඒ ආශ්‍රිත ගැටළු විසඳීමේදී ප්‍රගස්ථ ක්‍රියාමාර්ග හුවමාරු කරගැනීම	29.01.2024	30.01.2024	1	අදාළ නොවේ.
143	ලෝක රේගු සංවිධානයේ (WCO) දත්ත ආදර්ශ ව්‍යාපෘති කණ්ඩායමේ (DMPT) **71** වන රැස්වීම	27.01.2025	31.01.2025	2	අදාළ නොවේ.
144	WCO ඒකාබද්ධ උප කමිටුවේ (ISO)**24** වන සැසිවාරය	03.03.2024	04.03.2024	2	අදාළ නොවේ.
145	මූලික අන්තර් සම්බන්ධතා පිළිබඳ WCO ගෝලීය සම්මුතිය	03.02.2025	04.02.2025	2	අදාළ නොවේ.
148	CBSA සංග්‍රහය 2025: සුරක්ෂිත වෙළඳ සහ සංචාර සඳහා පහසුකම් සැලසීමවෙනුවෙන් වන කැනඩා සහ ඉන්දු- පාකිස්ථාන ශක්තිමත් සබඳතාව	04.02.2025	06.02.2025	1	අදාළ නොවේ.
149	"ඊ- වෙළඳාමෙන් ව්‍යාජ මුදල් ඉවත් කිරීම" පිළිබඳ **2**වන සම්මන්ත්‍රණය	15.01.2025 - 13.00	15.01.2025 - 15.00	2	අදාළ නොවේ.
150	විද්‍යාත්මක උප කමිටුවේ **40** වන සැසිවාරය (SSC)	20.01.2025	24.01.2025	2	730,000.00
151	WCO INAMA අන්තර්- නියෝජිතියතන සහයෝගිතා IWT වැඩමුළුව	24.20.2025	28.02.2025	8	අදාළ නොවේ.

07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

7.1 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනුකූල නොවීම් අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ /ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශයන්	අනුකූල වේ		
1.2	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.6	වෙනත්	-		
2	පොත්පත් සහ ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛ/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	මූල්‍ය පාලන සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක් ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	**2014.05.11** දිනැති **171/2004** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අනුව රජයේ පඩි පත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත් කිරීම	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			

4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනෙක සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ.134 (2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	විගණකාධිපත්වරයා ගේ උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව මු.රෙ.134 (2) සහ DMA/1-2019 ට අනුකූලව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම.	පිළිතුරු සපයා ඇති සංඛ්‍යාව (මාසයක කාලයක් තුළ) 31 / පිළිතුරු සපයා ඇති සංඛ්‍යාව(මාසයකට වැඩි කාලයක් තුළ) 32	සාමාන්‍ය මෙහෙයුම් කටයුතු වල කාර්යබහුලත්වය හේතුවෙනි.	වහාම පිළිතුරු ලබාගැනීම සඳහා සිහිකැඳවීම් බොහෝ ප්‍රමාණයක් නිකුත් කිරීම සහ කළමනාකරණ සහ විගණන කමිටුවේදී සාකච්ඡා කිරීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	විගණන හා කළමනාකරණ කමිටුව			
7.1	DMA චක්‍ර ලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම	අනුකූල වේ		
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් අදාල නිර්දේශ සම්බන්ධයෙන් චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කර තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, කල්බදු වාහන ලොග් පොතේ සම්පූර්ණ අයිතිය පවරා තිබීම	අනුකූල නොවේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා ඇති ප්‍රතිපාදනවල සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	බැරකම් මු.රෙ. **94 (1)** ප්‍රකාරව වසර අවසානයේ ඉතිරිව ඇති ප්‍රතිපාදන නොඉක්මවීම	අනුකූල වේ		
12	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සලසා ඇති ප්‍රතිපාදනවල සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ		
12.3	වසරකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	පොදු තැන්පතු ගිණුම			
13.1	කාලය ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. **571** ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		

13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. **371** ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. **371** ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. **176** අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත සේවක සංඛ්‍යාව තුල කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබාදීම.			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා තිබීම.	(i) අනුකූල වේ (ii) විකල්ප පියවර		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 8 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	සකස්කරමින් පවතී. මෙතෙක් ඉදිරිපත් කර නැත.		
18	පුද්ගල ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ		මහජනතාවට සහ අපනයනකරුවන්ට/ආනයන කරුවන්ට තොරතුරු ලබාගැනීම සඳහා විමසුම් මධ්‍යස්ථානයේ ගාස්තු රහිත දුරකථන අංකය වන **1915** විවෘතව ඇත.මෙය රේගු වෙබ් අඩවියේද දක්වා ඇත.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි	කටයුතු කරමින් පවතී.		

	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කර තිබීම.			
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.			
19.1	**2018.01.24** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **02/2018** ඇමුණුම **02** ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබීම.	සකස් කර නැත.	ඒ වෙනුවට මානව සම්පත් සංවර්ධන අංශය විසින් දේශීය පුහුණු වැඩසටහන සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ඇත. මෙම ක්‍රියාකාරී සැලැස්ම නියමිත පරිදි නිමකර ඇත. තවද, මෙමගින් දෙපාර්තමේන්තුවේ සෑම ස්ථරයකම පුහුණු අවශ්‍යතා ඉටුකර තිබේ.	චක්‍රලේඛය අනුව මානව සම්පත් සැලසුමක් සකස් කිරීමට ඉදිරියේදී ක්‍රියාකරනු ඇත.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය **12** කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ. (ශ්‍රී ලංකා රේගුවට සරිලන පරිදි ඉහත ආකෘතිය සකස් කරන ලදී.)		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කර තිබීම	මානව සම්පත් සංවර්ධන සැලසුමට අනුකූල නොවේ.නමුත්, ධාරිතා වර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ චක්‍රලේඛයට අනුව සියලුම නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සකස්කර සම්පූර්ණ කර ඇත.	ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී ඉහළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ මධ්‍යම කළමනාකරණ මට්ටමේ නිලධාරීන් විසින් සාමූහික වගකීමක් දරයි.	චක්‍රලේඛයේ යෝජනාකර ඇති පරිදි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පත්කිරීම සඳහා ක්‍රියාකරනු ලැබේ.
20	විගණන ඡේද සඳහා ප්‍රතිචාර			
20.1	පෙර වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන ඡේදයේ දක්වා ඇති අඩුපාඩු නිවැරදි කර ඇත.	සුදුසු පියවර ගැනීම සඳහා සියළුම විගණන විමසුම් අදාළ අංශ වෙත යොමු කර ඇත.		

08 වන පරිච්ඡේදය- දෙපාර්තමේන්තුවේ අංශ වල කාර්ය සාධනය

8.1 බලාත්මක කිරීමේ පර්ෂදය

8.1.1 නිවාරණ අංශය

8.1.2 සමාජ ආරක්ෂණ අංශය

8.1.2.1 මත්ද්‍රව්‍ය පාලන ඒකකය

8.1.2.2 ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශය

8.1.2.3 පාරිභෝගික හා පරිසර ආරක්ෂණ ඒකකය

8.1.2.4 වරාය පාලන සහ ගුවන් භාණ්ඩ පාලන ඒකකය

8.1.3 මධ්‍යම විමර්ශන අංශය

8.1.4 මධ්‍යම බුද්ධි අංශය

8.1.5 නීති කටයුතු අංශය

8.1.6 අවදානම් කළමනාකරණ අංශය

8.1.7 මධ්‍යම අපහරණ අංශය

8.1.1 නිවාරණ අංශය

ශ්‍රී ලංකා රේගුවේ සියලුම මෙහෙයුම් ක්ෂේත්‍රයන් එනම් විශේෂයෙන් වරායන්, තොටුපළ, ජලමාර්ග හා දිවයිනට අයත් භෞමික මුහුදු සීමාව, ජාත්‍යන්තර ගුවන් තොටුපළ, නිදහස් වෙළඳ කලාප, අපනයන සැකසුම් කලාප, භාණ්ඩ පරීක්ෂණ අංගන හා අභ්‍යන්තර නිෂ්කාශන ඒකකවල ආවේක්ෂණ කටයුතු කරන නිවාරණ අංශය, ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන නීති බලාත්මක කිරීමේ හස්තයයි.

එය පහත දක්වා ඇති පරිදි දිවයින පුරා වෙරළාසන්න නගරයන්හි උපාය මාර්ගිකව පිහිටා ඇති ශාඛාවන් සහ උප නිවාරණ කාර්යාල කීපයකින් සමන්විත වේ.

1 පරිපාලන
2 විමර්ශන ශාඛාව
3 මෙහෙයුම් ශාඛාව
4 ගෙවීම් ශාඛාව
5 බහාලුම් ගමනාගමන අධීක්ෂණ ශාඛාව
6 සමුද්‍ර ශාඛාව
7 ප්‍රධාන නිවාරණ නිලධාරී කාර්යාලය
8 අලෙවි ශාඛාව
9 ප්‍රධාන වරාය ආවේක්ෂණ ඒකකය
10 නිවාරණ පරීක්ෂණ ඒකකය
11 ගේට්ටු කාර්යාලය
12 උප නිවාරණ කාර්යාලය - නයිකන්ද
13 උප නිවාරණ කාර්යාලය - මීගමුව
14 උප නිවාරණ කාර්යාලය - කොග්ගල
15 උප නිවාරණ කාර්යාලය - කන්කසන්තුරේ
16 උප නිවාරණ කාර්යාලය - ත්‍රිකුණාමලය
17 උප නිවාරණ කාර්යාලය - ඕන්නපාඩු
18 උප නිවාරණ කාර්යාලය - ගාල්ල
19 උප නිවාරණ කාර්යාලය - බේරුවල
20 උප නිවාරණ කාර්යාලය - හම්බන්තොට
21 උප නිවාරණ කාර්යාලය - බියගම

ප්‍රධාන කාර්යයන්

1. නීති විරෝධී ජාවාරම්, වාණිජ වංචා සහ නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් වැලැක්වීම.
2. රේගු වැරදි පිළිබඳ තොරතුරු ලබාගැනීම සහ එකී තොරතුරු පිළිබඳ ක්‍රියාකිරීම.
3. ආරම්භක අවස්ථාවේ දීම රේගු වැරදි හසුකර ගැනීම, සැක කටයුතු භාණ්ඩ හසුකර ගැනීම, පරීක්ෂණ හා විමර්ශන සිදුකිරීම සහ වැරදිකරුවන්ට එරෙහිව නඩු කටයුතු මෙහෙයවීම.
4. රජයට අයවියයුතු ආදායම එකතු කිරීම සහතික කිරීම.
5. රටේ සමාජ ආර්ථික, සංස්කෘතික සහ පාරිසරක වශයෙන් වැදගත් වන දෑ ආරක්ෂා කිරීම සහ අදාළ නීති සහ නියෝග බලාත්මක කිරීම.
6. කොළඹ වරාය සහ අනෙකුත් වරායන්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සහ මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ආවේක්ෂණ කටයුතු.
7. යාත්‍රා ගමනාගමනය සහ දේශසීමා මෙහෙයුම් කටයුතු පාලනය කිරීම.

ආදායම (රු)

තීරුබදු සහ ගාස්තු අයකිරීම	124,998,308.86
A/E	19,303,999.00
දඩ	52,806,507.00
ලිහිල් කරන ලද රාජසන්තක කිරීම්	4,366,779,079.10
වැඩිදුර රාජසන්තක කිරීම්	19,200,000.00
විකිණුම් කටයුතු	25,080,583.00
SR ගාස්තු	270,600.00
එකතුව	**4,608,439,076.96**

හසුකර ගැනීම

වසර තුළ ආරම්භ කරන ලද විමර්ශන සංඛ්‍යාව	494
වසර තුළ නිමකරන ලද විමර්ශන සංඛ්‍යාව	375

බහාලුම්/වාහන

වසර තුළ නිදහස් කරන ලද බහාලුම් සංඛ්‍යාව	344
වසර තුළ නිදහස් කරන ලද වාහන සංඛ්‍යාව	105

8.1.2 සමාජ ආරක්ෂණ අංශය

8.1.2.1 මත්ද්‍රව්‍ය පාලන ඒකකය

1. හැඳින්වීම

රට තුළට නීති විරෝධී මත් ද්‍රව්‍ය ජාවාරම් කිරීම් හසු කර ගනිමින් ශ්‍රී ලංකා රේගුවේ මත්ද්‍රව්‍ය පාලන ඒකකය (NCU) තීරාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මත් ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම්,අනාවරණය කරගත් ස්ථාන සහ වාර්තාගත කාල සීමාව තුළදී අදාළ සැකකරුවන් පැමිණි රටවල් පිළිබඳව ප්‍රධාන සංඛ්‍යාලේඛන මෙම වාර්තාව මගින් ඉදිරිපත් කරනුලැබේ.

<u>දැක්ම</u>

රටතුළ විෂ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ජාවාරම වැලැක්වීම සහ එම ද්‍රව්‍ය වල පූර්වගාමී රසායනික ද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීම හා ඒවායේ නීති විරෝධී භාවිතය අධික්ෂණය කිරීම සඳහා ක්‍රියාශීලීව ක්‍රියාත්මක වන නීති බලාත්මක කිරීමේ ප්‍රමුඛ නියෝජිතායතනය වීම අපගේ දැක්ම වේ.

<u>මෙහෙවර</u>

- මාදක මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය අනිසි භාවිතය සහ නීති විරෝධී ජාවාරම වැලැක්වීම සහ මර්ධනය කිරීම.
- මත්ද්‍රව්‍ය හා අදාළ නීති බලාත්මක කිරීම සඳහා අනෙකුත් ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන ආයතන හා නියෝජිතායතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- විෂ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ජාවාරම් කිරීම සම්බන්ධයෙන් විවිධ ජාත්‍යන්තර සම්මුතීන් යටතේ ජාතික බැඳීම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සහතික වීම.
- අදාළ විදේශීය බලධාරීන් හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- පවත්නා හා මතුවෙමින් පවතින අභියෝග තක්සේරු කිරීමට සහ විශ්ලේෂණය කිරීමට කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- මත්ද්‍රව්‍ය අනිසි භාවිතය පිළිබඳව සමාජය දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

<u>නීති සහ රෙගුලාසි</u>

- **1869** අංක **17** දරන රේගු ආඥා පනත.
- **1984** අංක **13** දරන පනත ලෙස සංශෝධනය කරන ලද **1929** අංක **17** දරන විෂ වර්ග, අබිං හා අන්තරායකර ඖෂධ පිළිබඳ ආඥා පනත
- **2022** අංක **41** දරන විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ (සංශෝධන) පනත.
- **1980** අංක **27** දරන විලවුන්, ආලේපන උපාංග සහ ඖෂධ නියාමන පනත.
- **2008** අංක **1** දරන මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය නීතිනිරෝධී ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත
- පූර්වගාමී පාලන අධිකාරියේ රෙගුලාසි, **2010** මැයි **10** දිනැති අංක **1653/7** දරන අතිවිශේෂ ගැසට් නිවේදනය.
- **1999** අංක **8** දරන දුම්කොළ බදු පනත.
- දුම්කොළ බදු පනතේ රෙගුලාසි, **2009** ජූලි මස **17** දිනැති අංක **1610/28** දරන අතිවිශේෂ ගැසට් නිවේදනය.
- **1995** අංක **22** දරන දණ්ඩනීති සංග්‍රහ පනත.
- **2018** අංක **26** දරන සුරාබදු පනත.

ශ්‍රී ලංකා රේගුවේ මත්ද්‍රව්‍ය පාලන ඒකකයට අනුයුක්ත නිලධාරීන් විසින් ඉටුකරන කාර්යයන්

1. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි පැය **24** පුරා සෝදිසි කිරීම්.
2. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි CCTV ආරක්ෂක කැමරා පද්ධති මාර්ගයෙන් මගීන් නිරීක්ෂණය කිරීම සහ හසුකර ගැනීම.
3. මාර්ග, සම්භවය, ගමන් රටාව සහ චර්යා රටා ආදිය සැළකිල්ලට ගනිමින් අවදානම් පැතිකඩ මත පදනම්ව මගීන් හඳුනාගැනීම සහ මැදිහත් වීම.
4. ගුවන් භාණ්ඩ, මුහුදු භාණ්ඩ, තැපැල් සහ කුරියර් භාණ්ඩ යනාදිය අහඹු ලෙස සෝදිසි කිරීම.

5. මධ්‍යම තැපැල් හුවමාරුවේ සහ කුරියර් සේවාවන්හි එදිනෙදා චාරිකා සහ අධික්ෂණ කටයුතු සිදුකිරීම.
6. මධ්‍යම තැපැල් හුවමාරුවේ අවදානම් පැතිකඩ භාවිතා කරමින් මත්ද්‍රව්‍ය ප්‍රභව රටවලින් පැමිණෙන පාර්සල් අහඹු ලෙස රඳවා තබාගැනීම.
7. ගුවන් හා මුහුදු මාර්ග හරහා ප්‍රවාහනය වන වාණිජ ආනයන හා අපනයන මගින් විෂ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය ජාවාරම හඳුනාගැනීම සහ වැළැක්වීම.
8. විශ්වාසනීය බුද්ධි තොරතුරු මත පරීක්ෂණ සිදුකිරීම.
9. ආයතනය තුළ මෙන්ම සාමාන්‍ය මහජනයා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල රජයේ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.
10. පූර්වගාමී රසායනික ආනයන ප්‍රතිනැවිගත කිරීම හා අපනයනය අධික්ෂණය කිරීම.
11. පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය (PNB) වැනි වෙනත් මෙහෙයුම් ආයතන සමඟ ඒකාබද්ධ මෙහෙයුම් සිදුකිරීම.

2. මත්ද්‍රව්‍ය හසුකර ගැනීම පිළිබඳ සාරාංශය


වාර්තා වූ කාලය තුළ රු. 2,472,813,179.00 ක් වටිනා විවිධ මත්ද්‍රව්‍ය වර්ග ග්‍රෑම් 159,920 ක ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය පාලන ඒකකය මගින් සාර්ථක ලෙස අනාවරණය කර සහ රාජසන්තක කරන ලදි. .


- අනාවරණය කරගැනීමක සාමාන්‍ය ප්‍රමාණය : ග්‍රෑම් 1,881.41
- අනාවරණය කරගැනීමක සාමාන්‍ය වටිනාකම : රු. 29,091,920.00


අත්අඩංගුවට ගැනීම් පිළිබඳ විස්තරයක් පහත වගුව මගින් සපයනු ලැබේ.

*වගුව **1:** මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සාරාංශය*

මත්ද්‍රව්‍ය වර්ගය	අනාවරණය කරගත් සම්පූර්ණ ප්‍රමාණය (ග්‍රෑම්)	සම්පූර්ණ වටිනාකම (රු)
මෙතැම්පෙටමීන්	20,704	449,219,000.00
මෙතැම්පෙටමීන් (ICE)	7,948	286,910,000.00
මෙතැම්පෙටමීන් /MDMA	2	34,179.00
මරිජුවානා/හශීෂ්	120,231	1,051,580,000.00
කොකේන්	8,514	609,600,000.00
LSD	11	490,000.00
හෙරොයින්	2,450	74,300,000.00
ඇම්පෙටමීන්	60	680,000.00







මත්ද්‍රව්‍ය වර්ගය අනුව:

<u>වැඩිම අනාවරණය කරගැනීම් ප්‍රමාණයන්:</u>

- මරිජුවානා/හෂිෂ්: ග්‍රෑම් 80,981 , රු. 768,819,000 (අනාවරණය කරගැනීම්30).
- කොකේන්: ග්‍රෑම් 8,514 , රු. 609,600,000 (අනාවරණය කරගැනීම් 12).

<u>අනාවරණය කරගැනීම් වල ඉහළම වටිනාකම:</u>

- මෙතැම්පෙටමින් (ICE): රු.286,910,000 (අනාවරණය කරගැනීම්_2 ක් මගින් ග්‍රෑම් 7,948).


3. අනාවරණය කර ගත් ස්ථාන

විවිධ ඇතුළුවීමේ ස්ථාන සහ සහ තැපැල්/ භාණ්ඩ පහසුකම් සැපයීමේ ස්ථාන වලදී අත්අඩංගුවට ගැනීම් සිදුකරන ලදී. අනාවරණය තර ගැනීම් සිදු කරන ලද ප්‍රධාන ස්ථාන වූයේ:

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (BIA)
- තැපැල් සේවා (POSTAL, PA, ආදිය.)
- භාණ්ඩ මෙහෙයුම් පහසුකම් (DHL, CCE, MIDCO, Colombo Cargo, TRICO, ආදිය.)

*වගුව **2:** ප්‍රධාන අනාවරණය කරගැනීම් ස්ථාන සහ අත්අඩංගුවට ගත් ප්‍රමාණයන්*

අනාවරණය කරගත් ස්ථානය	මුළු ප්‍රමාණය (ග්‍රෑම්)	මුළු අගය (රු.)
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ **(BIA)**	115,341.164	1,677,754,000.00
තැපැල් සේවා	7,701	232,602,179.00
CCE	8,043	315,180,000.00
Colombo Cargo	567	5,660,000.00
CSL	4,515	45,150,000.00
DHL	1,883	18,830,000.00
MIDCO	17,976	128,832,000.00
TRICO	1,977	19,770,000.00
UPS	1,914	29,035,000.00



අනාවරණය කරගත් ස්ථාන අනුව:

<u>ප්‍රධාන ස්ථාන:</u>

- BIA (බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ): ග්‍රෑම් 115,341, රු. 1,677,754,000 (අනාවරණය කරගැනීම් 14).
- CCE: ග්‍රෑම් 8,043, රු. 315,180,000 (9 detections).
- තැපැල්: ග්‍රෑම් 6,828, රු. 221,636,000 (අනාවරණය කරගැනීම් 31).


4. සම්භවය ලැබූ රටවල්

අනාවරණය කරගත් මත්ද්‍රව්‍ය රටවල් කිහිපයක සම්භවය ලබාඇත. ප්‍රධාන මූලාශ්‍ර රටවල් වූයේ:

- තායිලන්තය (මරිජුවානා/හෂිෂ් විශාලම ප්‍රමාණය)
- මලයාසියාව (මෙතැම්පෙටමීන් විශාල ප්‍රමාණයක්)
- ඇ.එ.ජ. (මත්ද්‍රව්‍ය වර්ග කිහිපයක් අත්අඩංගුවට ගන්නා ලදී)
- කැනඩාව (මරිජුවානා ඉහළ ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීම්)
- පාකිස්ථානය (හෙරොයින් ජාවාරම)
- බ්‍රසීලයල, ගිනියාව, උගන්ඩාව,මැඩගස්කරය (කොකේන් ජාවාරම)

වගුව 3: අනාවරණය කරගත් මත්ද්‍රව්‍ය සම්භවය ලැබූ රටවල්

රට	මුළු ප්‍රමාණය (ග්‍රෑම්)	මුළු වටිනාකම (රු.)
තායිලන්තය	73,170	675,506,000.00
මලයාසියාව	16,175	379,485,000.00
එක්සත් රාජධානිය	1,091	12,516,000.00
අමෙරිකා එක්සත් ජනපදය	9,708	384,935,000.00
කැනඩාව	24,915	199,436,179.00
පාකිස්ථානය	4,353	102,845,000.00
බ්‍රසීලය	132	3,960,000.00
ඩුබායි	19,679	138,023,000.00
ඉතියෝපියාව	2,861	200,270,000.00
ප්‍රංශය	155	3,694,000.00
ජර්මනිය	644	11,425,000.00
ගෝතමාලාව	3,101	93,030,000.00
ගිනියාව	1,802	72,080,000.00
ඉතාලිය	270	2,700,000.00
මැඩගස්කරය	814.164	24,800,000.00
නෙදර්ලන්තය	64	1,850,000.00
සියෙරා ලියොන්	325	130,000,000.00
ස්පාඤ්ඤය	58	788,000.00
උගන්ඩාව	483	33,810,000.00



සම්භවය ලැබූ රට අනුව:

<u>ප්‍රධාන මූලාශ්‍ර:</u>

- තායිලන්තය: ග්‍රෑ. **73,170** , රු. **675,506,000** (අනාවරණය කරගැනීම් **4**).
- අ.එ.ජ.: ග්‍රෑ **9,708**, රු. **384,935,000** (අනාවරණය කරගැනීම් **11**).
- මලයාසියාව: ග්‍රෑ **16,175**, රු. **379,485,000** (අනාවරණය කරගැනීම් **3**).

5. සුවිශේෂී අත්අඩංගුට ගැනීම්

වසර තුළදී ඉහළ වටිනාකමක් සහිත අත්අඩංගුවට ගැනීම් කිහිපයක් සිදු කරන ලදී:

- රු. මිලියන **436.48** ක් වටිනා මරිජුවානා/හෂිෂ් ග්‍රෑම් **43,648**ක් තායිලන්තයෙන් අත්අඩංගුවට ගන්නා ලදී.
- රු. මිලියන **200.27** ක් වටිනා කොකේන් ග්‍රෑම් **2,861** ක් ඉතියෝපියාවෙන් අල්ලාගන්නා ලදී.
- රු. මිලියන **254.92** ක් වටිනා මෙතැම්පෙටමීන් ග්‍රෑම් **10,197**ක් මලයාසියාවෙන් අල්ලාගන්නා ලදී.

6. අනාවරණය කරගැනීමේ ප්‍රවණතා

- <u>බහුලව භාවිතාවන මත්ද්‍රව්‍ය</u>: ප්‍රමාණය සහ වටිනාකම යන දෙකම අනුව මරිජුවානා/හෂිස් යනු බහුලවම අනාවරණය කරගන්නා මත්ද්‍රව්‍ය වේ.
- <u>සුවිශේෂී අනාවරණය කරගැනීම්</u>: කොකේන් සහ මෙතැම්පෙටමීන් විශාල පරිමාණයෙන් හසුකරගැනීම් වසරපුරාම වාර්තා විය.

7. අනාවරණය කරගත් සහ සම්භවය ලැබූ ස්ථාන

- විවිධ ස්ථානවලදී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් සිදුකරන ලද අතර තැපැල් සේවා සහ බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ **(BIA)** ප්‍රධාන හඳුනාගැනීම් ස්ථාන විය.
- ජර්මනිය, එක්සත් රාජධානිය, කැනඩාව සහ තවත් රටවල් ඇතුළු විවිධ රටවල සැකකරුවන් සම්භවය ලබා ඇත.

8. නිගමනය සහ අනාගත උපාය මාර්ග

2024 වර්ෂය පුරා ශ්‍රී ලංකා රේගුව මගින් මත්ද්‍රව්‍ය අනාවරණය කර ගැනීම සඳහා දරණ ලද සුවිශේෂී ප්‍රයත්නයන් වාර්තාව මගින් විදහා දක්වයි. ඇතැම් මත්ද්‍රව්‍ය වල ඉහළ ප්‍රමාණයන් සහ වටිනාකම්, කලාපය තුළ මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව සටන්කිරීමේදී පවතින අනවරත අභියෝග අවධාරණය කරයි.

වැඩිදියුණු කරන ලද ආවේක්ෂණයන්, බුද්ධි අංශ මෙහෙයුම් සහ ජාත්‍යන්තර ආයතන සමග පවතින සහයෝගීතාවය මගින් රටතුළට නිති විරෝධී මත්ද්‍රව්‍ය ගලා ඒම මැඩපැවැත්වීමේ මෙහෙවර ශ්‍රී ලංකා රේගුව නොසැලී ක්‍රියාත්මක කරමින් සිටී. මෙම ක්‍රියාවලිය තවදුරටත් ඉදිරියට ගෙන යමින් මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීමේ හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා අනාවරණය කරගැනීමේ තාක්ෂණයන් වැඩිදියුණු කිරීමට සහ ශ්‍රම බලකායේ පුහුණුව වැඩිකිරීමට ඒකකය ප්‍රමුඛත්වය දෙනු ඇත.

අනාගත උපායමාර්ගික වැඩිදියුණු කිරීම් සඳහා දිගු කාලීන ප්‍රවණතා, ජාවාරම් මාර්ග සහ ක්‍රමයෙන් වෙනස් වන සැඟව සිටීමේ උපක්‍රම වැඩිදුරටත් විශ්ලේෂණය කිරීම අත්‍යවශ්‍ය වනු ඇත. විශේෂිත දත්ත කට්ටල සවිස්තරාත්මකව පරීක්ෂා කිරීම මගින් බලාත්මක කිරීමේ පියවරයන් පැහැදිලි කිරීම සහ දේශසීමාවන්හි ආරක්ෂාව ශක්තිමත් කිරීම පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගත හැක.


8.1.2.2 ජෛව විවිධත්ව, සංස්කෘතික සහ ජාතික උරුම ආරක්ෂණ අංශය.

පසුබිම

පාරිසරික අපරාධ යනු ස්වභාවික ලෝකයට පමණක් නොව ජාතික හා ජාත්‍යන්තර ආරක්ෂාව, සමාජ හා ආර්ථික සංවර්ධනය සහ ගෝලීය සෞඛ්‍ය කෙරෙහි ද දැඩි අහිතකර බලපෑම් ඇති කරන බරපතල ගෝලීය ගැටළුවක් බවට පත්ව ඇත. විද්‍යාඥයින් විශ්වාස කරන අන්දමට පෘථිවිය මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මේවන විට භයවන මහා නෂ්ටප්‍රාප්තියට මුහුණ දෙමින් සිටී. වර්තමානයේ 166,061 කට අධික වූ ජෛව විශේෂයන් සංඛ්‍යාවක් ස්වාභාවික සම්පත් සංරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සංගමයේ (IUCN) රතු දත්ත ලේඛනයෙහි ලැයිස්තු ගතකර ඇති අතර ඉන් 41% ක් උභය ජීවීන් ද, 37% ක් මෝරුන් හා මඩුවන් ද, 26% ක් මිරිදිය මත්ස්‍යයින් ද, 21% ක් උරගයින් ද, 27% ක් ක්ෂීරපායින් ද, 12% ක් කුරුළු විශේෂ වශයෙන් විශේෂ 46,337 කට අධික ප්‍රමාණයක් වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇත
වාර්ෂික ඇස්තමේන්තුගත වටිනාකම ඇ.ඩො. බිලියන 20 ක් පමණ වන නීති විරෝධී වනජීවී වෙළඳාම මෙම ජෛව විවිධත්ව අර්බුදයට විශාල වශයෙන් දායක වන අතර එය මත්ද්‍රව්‍ය, ව්‍යාජානුකරණය සහ මිනිස් ජාවාරමට පසුව ලෝකයේ සිව්වන විශාලතම සංවිධානාත්මක අපරාධය ලෙස හඳුනාගෙන ඇත.
ඍර්ම කලාපයේ පිහිටා තිබීම හේතුවෙන් ශ්‍රී ලංකාව ජෛව විවිධත්වයෙන් අනූන රටකි. කෙසේ වෙතත් මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මෙරට ආවේනික සතුන් හා ශාක විශේෂයන් විශාල වශයෙන් වඳ වී යාමේ තර්ජනයකට ලක්ව ඇත. මීට අමතරව ශ්‍රී ලංකාව විවිධ ඛනිජ සම්පත් රාශියකින් ආඩ්‍යවේ. මෙම ඛනිජ ද්‍රව්‍යයන් අතරින් සමහරක් සුවිශේෂී ගුණාත්මක බවකින් යුතු ඛනිජ ලෙස පිළිගැනේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසර කිහිපය මුළුල්ලේ මෙම සම්පත් ජාවාරම් කිරීමට ගත් නීති විරෝධී ප්‍රයත්න රැසක් වාර්තා වී තිබේ.
තවද, සංස්කෘතික දේපළ මංකොල්ලය දේශසීමා අතර සිදුවන ඉතා පැරණිතම සංවිධානාත්මක අපරාධයක් ලෙස පිළිගැනෙන අතර වර්තමානයේ දී එවැනි අපරාධ ලොව පුරා ව්‍යාප්ත වූ සංසිද්ධියක් බවට පත්ව ඇත. සංස්කෘතික උරුම ජාවාරම මගින් ජාතික උරුමයන් ක්ෂය කරන අතර සමාජයට තම වටිනාම වස්තූන් අහිමිකරන බව හඳුනාගනිමින් ශ්‍රී ලංකා රේගුව මගින් මෙම ගැටළුවට ප්‍රමුඛතාවය ලබා දේ.
සෑම වසරකම කෞතුකාගාර, දේවස්ථාන, පෞද්ගලික කෞතුක භාණ්ඩ එකතූන් හා රජයේ ආයතන වලින් කෞතුක භාණ්ඩ දහස් සංඛ්‍යාවක් අතුරුදන් වේ.
දේශසීමා අතර සිදුවන මෙම නීති විරෝධී ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීමේ අවශ්‍යතාවය අවබෝධ කර ගනිමින් ශ්‍රී ලංකා රේගුව විසින් 1993 වර්ෂයේ දී ජෛව විවිධත්ව, සංස්කාතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය ආරම්භ කරනු ලැබීය. ආරම්භයේ දී ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය ලෙස හඳුන්වනු ලැබූ මෙම අංශය රේගු පරිපාලනයක් තුළ ගෝලීය වශයෙන් ස්ථාපිත කරනු ලැබූ මෙම ආකාරයේ ප්‍රථම විශේෂිත ඒකකය ලෙස සලකනු ලැබේ. එතැන් සිට මෙකී ඒකකය ශ්‍රී ලංකාවේ මිළ කල නොහැකි වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති ශාක හා සත්ව විශේෂ, ස්වාභාවික සම්පත් සහ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා සුවිශේෂි දායකත්වයක් සපයමින් සිය කාර්යයන් ඉටුකිරීමේ නියැලී සිටී. මෙයට අමතරව ජාතියේ මිල කළ නොහැකි ජෛව විවිධත්වය සහ සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම පිණිස වන කැපවීම ශක්තිමත් කරමින් ශ්‍රී ලංකා රේගුවේ සාමාජීය සහ පාරිසරික ආරක්ෂක අරමුණු ශක්තිමත් කිරීම උදෙසා මෙම ඒකකය කැපී පෙනෙන දායකත්වයක් සපයයි.

අපගේ දැක්ම
ජෛව විවිධත්ව සහ සංස්කෘතික උරුමයන් ආරක්ෂණය පිළිබඳව කටයුතු කරන දකුණු ආසියාවේ විශිෂ්ඨතම රේගු අංශය බවට පත්වීම.


අපගේ මෙහෙවර
ජෛව විවිධත්වය, සංස්කෘතික සහ ජාතික උරුමයන් ආරක්ෂා කිරීම උදෙසා නීති බලාත්මක කිරීම සහ වෙළඳාම සඳහා පහසුකම් සපයන අතරම රජයට ලැබිය යුතු ආදායම උත්පාදනය කිරීම පිළිබඳව සහතික වීම.
ශාඛා ව්‍යුහය



ජෛව විවිධත්ව, සංස්කෘතික සහ ජාතික උරුම ආරක්ෂණ අංශය (BCNP) විසින් සිදුකරන ප්‍රධාන කාර්යයන්


- සත්ව හා ශාක විශේෂ සහ ආශ්‍රිත නිෂ්පාදන සංචලනය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර නීති බලාත්මක කිරීම.
- ඛනිජ වැනි අනෙකුත් ස්වාභාවික සම්පත් සංචලනය හා අදාළ ජාතික නීති බලාත්මක කිරීම.
- සංස්කෘතික දේපළ සහ කෞතුක භාණ්ඩ සංචලනය හා අදාළ ජාතික හා ජාත්‍යන්තර නීති බලාත්මක කිරීම.
- බලපත්‍ර සහ අවසර පත්‍රයන් හි සඳහන් තත්වයන් සම්බන්ධයෙන් අනුකූලතාවන් සහතික කිරීම.
- ජෛව විද්‍යාත්මක, ස්වාභාවික සහ සංස්කෘතික වශයෙන් වැදගත් වෙළඳ භාණ්ඩ දේශසීමාවන් හරහා සංචලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා පාලන ක්‍රියාමාර්ග පැනවීමේ දී විවිධ රේඛීය නියෝජිත ආයතන සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ලබාදීම.
- ශ්‍රී ලංකා රේගුවේ කෞතුකාගාරය පවත්වාගෙන යාම සහ නැරඹීමට පැමිණෙන අමුත්තන් සඳහා විස්තරාත්මක පැහැදිළි කිරීම් ලබාදීම.

මෙහෙයුම් ව්‍යුහය



2024 වර්ෂය සඳහා කාර්ය සාධනය

- මෙම වසර තුළ හොර ජාවාරම් සහ අනුකූල නොවන ප්‍රයත්නයන් **50** ක් හසුකර ගැනීමට BCNP ට හැකිවිය.



01 රූපය : **2024** වර්ෂයේ දී BCNP විසින් විවිධ වෙළඳ භාණ්ඩ කාණ්ඩ යටතේ හසුකර ගැනීම් ගණනාවක් සිදුකරනු ලැබීය.

2024 වසරේ මුළු සිද්ධි සංඛ්‍යාලේඛන

විස්තරය	සංඛ්‍යාව
ආරම්භ කරන ලද සිද්ධි සංඛ්‍යාව	සිද්ධි 50
නිම කරන ලද සිද්ධි සංඛ්‍යාව	සිද්ධි 07
දඩ සහ රාජසන්තක කිරීම් මගින් අයකරගත් මුළු ප්‍රමාණය	රු. 23,469,036/-
අතිරේක සටහන්කර A/E මගින් අයකරගත් මුළු ප්‍රමාණය	-
විකිණීමෙන් ලද මුළු මුදල්	-
2024 වසර සඳහා මුළු අයකර ගැනීම්	රු. 23,469,036/-

01 වගුව

2024 වසරේදී BCNP හි ප්‍රධාන හසුකර ගැනීම්

වෙළඳ භාණ්ඩ වර්ගය	අත්අඩංගුවට ගත් මුළු ප්‍රමාණය
වියළි මුහුදු කැකිරි	කි.ග්‍රෑ.1252.5
කුරුළු පිහාටු	කැබලි 01
කුරුළු කූඩු කැබලි	කි.ග්‍රෑ. 2.37
සිලෝන් ඇක්වාමීන්	40
වියළි මත්ස්‍ය පිලට	කි.ග්‍රෑ. 23,000
වියළි මත්ස්‍ය බොකු	කි.ග්‍රෑ. 01
මාළු බොකු	කි.ග්‍රෑ. 18.1
ගනේෂ් ප්‍රතිමාව	ඒකක 01
කොතලහිඹුටු කැබලි	කි.ග්‍රෑ. 22.65
කොතලහිඹුටු කැබලි	පැකේජ 27
කොතලහිඹුටු මග්	13
කොතලහිඹුටු තේ	පැකේජ 132
ජීවී ඇල්බිනෝ රතු කන් කැස්බෑවා	ඒකක 01
ජීවී රැවුල් මකරා	ඒකක 05
ජීවී ක්ලවුන් ක්නයිෆ් මතස්‍යයින්	කැබලි 02
ජීවී කොළ කැස්බෑවා	ඒකක 01
ජීවී ෆ්ලයි රිවර් කැස්බෑවුන්	ඒකක 08
ජීවී කොමන් ස්නැපර් කැස්බෑවුන්	ඒකක 02
ජීවී මත්ස්‍ය විශේෂ	ඒකක 335
ජීවී ගෙම්බන්	ඒකක 31
ආහාරයට ගන්නා ජීවී පණුවන්	ග්‍රෑම් 665
ජීවී ඉත්තෑවන්	ඒකක 10
ජීවී ඉන්දියන් රෑප් කැස්බෑවා	ඒකක 01
ජීවී තලගොයන්	ඒකක 04
ජීවී සුරතල් බළලුන්	01
ජීවී විසිතුරු මත්ස්‍යයින්	කැබලි 4260
ජීවී සලමන්දරාවන්	කැබලි 02
ජීවී රොබොරොවිස්කි වාමන හැම්ස්ටර්	කැබලි 02
ජීවී කහ තිත් සහිත ගංගා කැස්බෑවා	ඒකක 01
ජීවී සුල්කාටා ඉබ්බන්	ඒකක 12
ජීවී ෂුගර් ග්ලිඩර්	ඒකක 04
ජීවී ලේනුන්	ඒකක 05
ජීවී කැස්බෑ ආදර්ශ	ඒකක 30

ශාක ආදර්ශ	කැබලි 28
මොණර පිහාටු	182

02 වගුව

රැස්වීම්, පුහුණු වැඩසටහන්, වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අනෙකුත් සහයෝගිතාවයන්

මාසය	ක්‍රියාකාරකම
ජනවාරි	• වන ජීවී වෙළඳාම පිළිබඳ විවෘත මූලාශ්‍ර විමර්ශනය පිළිබඳ උසස් පුහුණුව
පෙබරවාරි	• බුද්ධිමය දේපළ නීති සහ නිෂ්පාදන හඳුනාගැනීම පිළිබඳ වැඩමුළුව. • ඝනීපාරක්ෂක හා ශාක ඝනීපාරක්ෂක පියවර පිළිබඳ WTO ජාතික වැඩමුළුව (SPS ගිවිසුම).
මාර්තු	• සම්භවය සහ සංයෝජිත වර්ගීකරණ නීති පිළිබඳ වැඩමුළුව • පරීක්ෂණ හැකියාවන් සංවර්ධනය කිරීම සහ රේගු නීති පිළිබඳ පුහුණුව. • NACWC මගින් විනාශකාරී අවි ව්‍යාප්තියට එරෙහිව සටන් කිරීම. • ජාතික රතු දත්ත ලැයිස්තුව **2020** පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව - ශ්‍රී ලංකාවේ ශාක පිළිබඳ සංරක්ෂණ තත්වය .
අප්‍රේල්	• Mekong Dragon – VI මෙහෙයුම • USAID මගින් මෙහෙයවනු ලබන සම්භවය සහ සංයෝජිත වර්ගීකරණ නීති පිළිබඳ වැඩමුළුව
මැයි	• සමුද්‍රීය විශේෂ පිළිබඳ ICCWC IWT පුහුණුව. • **6**වන ගෝලීය බලයලත් ආර්ථික මෙහෙයුම්කරු සමුළුව (AEO) .
ජූනි	• INAMA ඉන්දියානු සහ දකුණු ආසියානු ව්‍යාපෘතිය - CITES බලාත්මක කිරීමේ පුහුණුව. • IWT ක්ෂේත්‍රෙය් TOA සඳහා පූර්ව ප්‍රතීතන වැඩමුළුව . • ATB බුද්ධිමය දේපළ **(**පුද්**)** සමාගම මගින් බුද්ධිමය දේපළ සන්නාම හඳුනාගැනීමේ පුහුණුව.
ජූලි	• වන ජීවී සහ වන අපරාධ මූල්‍ය විමර්ශන පිළිබඳ පුහුණුව. • PRAESIDO III මෙහෙයුම පූර්ව මෙහෙයුම් වැඩමුළුළු. • INTA මගින් සන්නාම හඳුනාගැනීම දැනුවත් කිරීමේ මාර්ගගත වැඩමුළුළු
අගෝස්තු	• අග්නිදිග ආසියා සයිබර් අපරාධ වැඩසටහන (SACP). • පැමිණිල්ල මෙහෙයවීම සහ පරීක්ෂණ සිදුකිරීම පිළිබඳ වැඩමුළුව. • පරීක්ෂණ හැකියාවන් සංවර්ධනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන. ODS සහ Non-ODS පිළිබඳ වැඩමුළුව.
සැප්තැම්බර්	• Pandora IX මෙහෙයුම • THUNDER මෙහෙයුම. • විදේශ නියෝජිතායතන සමග වැඩමුළුව • 2024 තීරු සහ මාර්ග රේගු බලාත්මක කිරීමේ සහයෝගිතා වැඩමුළුව
ඔක්තෝබර්	• INAMA ව්‍යාපෘතිය - IWT පුහුණුව පිළිබඳ මාර්ගගත කලාපීය පසුවිපරම් රැස්වීම • ජාතික ජෛව විවිධත්ව ඉලක්ක පිළිබඳ උපදේශාත්මක වැඩමුළුව. • විදේශ නියෝජිතායතන සමග වැඩමුළුව
නොවැම්බර්	• කලාපීය IWT පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව • ජාතික රේගු බලාත්මක කිරීම් ජාලය (nCEN) පුහුණු වැඩසටහන. • DFAR මගින් මුහුදු කුඩැල්ලන් හඳුනාගැනීමේ වැඩමුළුව. • ලෝක රේගු සංවිධානය (WCO) කලාපීය නීති විරෝධී වනජීවී වෙළඳාම (IWT) වැඩමුළුව- ඉන්දියාව
දෙසැම්බර්	• ශ්‍රී ලංකාවේ තීරණ ගැනීමේදී සුවහාවික ප්‍රාග්ධන තක්සේරුකරණය ප්‍රධාන ප්‍රවාහ ගත කිරීම සහ ඒකාබද්ධ කිරීම පිළිබඳ වැඩමුළුව • ඉස්සන් කර්මාන්තය සඳහා දත්ත කළමනාකරණ සහ දත්ත පද්ධති. • ඉගැන්වීම් ක්‍රමෝපායන් පිළිබඳ පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන. • සහකාර නිවාරණ නිලධාරී **02** කණ්ඩායම සඳහා වන පාඨමාලාව(2024 දෙසැම්බර්). • නව සහකාර රේගු අධිකාරීවරුන් සඳහා සේවාරම්භක පුහුණුව **2024**

8.1.2.3 පාරිභෝගික සහ පාරිසරික ආරක්ෂණ ඒකකය

රට තුළ දැනට පවතින නියෝගයන්ට සහ ප්‍රමිතීන්ට අනුව ආනයන භාණ්ඩයන් හි තත්වය හා ප්‍රමිතිය පාලනය කිරීමේ හා අධීක්ෂණය කිරීමේ අරමුණ ඇතිව **2011** වසරේ දී පාරිභෝගික සහ ආරක්ෂණ ඒකකය (CPU) ස්ථාපිත කරන ලදි. පාරිභෝගික සහ පාරිසරික ආරක්ෂණ ඒකකය, ආනයන හා අපනයන භාණ්ඩ වලට අදාළ බුද්ධිමය දේපළ හිමිකම් (IPR) සඳහා ශ්‍රී ලංකා රේගුවේ නාභිය ලක්ෂ්‍යය වේ. වෙනත් අදාළ ආයතන සමඟ සහයෝගීතාවය ඇතිව ජාත්‍යන්තර සම්මුතීන්ට අදාළ බැඳීම් බලාත්මක කිරීම හරහා පරිසරය සුරැකීමට ද අප දායක වේ.

ප්‍රධාන කාර්යයන්

1. යම් නීති උල්ලංඝනය වීමක් හෝ වංචාවක් මැඩලීම පිණිස රේගුවට අදාළ නීති සම්බන්ධයෙන් බුද්ධිමය දේපළ පනත (IPR), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත(SLSI), ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත, පාරිභෝගික කටයුතු අධිකාරී පනත (CAA), මධ්‍යම පරිසර අධිකාරිය, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ ආරක්ෂක අමාත්‍යාංශය විසින් දක්වා ඇති පාලන අවශ්‍යතාවන් ක්‍රියාත්මක කිරීම. ඉහත ආයතන සහ අණ පනත් වලින් ආවරණය වන සියළු ආනයන රේගුවෙන් නිදහස් කර ගැනීමට පෙර පාරිභෝගික සහ පාරිසරික ආරක්ෂණ ඒකකය (CPU) වෙත යොමුකල යුතුය.
2. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා පාරිභෝගික සහ පාරිසරක ආරක්ෂණ ඒකකය විසින් ඉහත අධිකාරීන් මගින් ලබාදෙන අනුමැතීන් සම්බන්ධයෙන් ලේඛන පවත්වාගෙන යනු ලැබේ.
3. අදාළ ආයතන සම්බන්ධ ඉහත විෂයන් පිළිබඳ රේගු ක්‍රියා පටිපාටීන් යාවත්කාලීන කිරීම.
4. අවශ්‍ය අවස්ථාවල දී පරීක්ෂණ අංගන වෙත CPU කාර්ය මණ්ඩලය යෙදවීම.
5. රේගු ආඥා පනත සහ හඳුනාගනු ලැබ ඇති අනෙකුත් අදාළ නීති යටතේ සාධන ලද නියෝග සමාලෝචනය කිරීම.
6. ඉහත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අනෙකුත් අදාළ පනත් සහ අණ පනත් සමඟ කියවියයුතු රේගු ආඥා පනත ප්‍රකාරව නීතිය බලාත්මක කිරීම.
7. ප්‍රතික්ෂේපිත භාණ්ඩ සහ උපද්‍රව සහිත අනෙකුත් ආනයන, ප්‍රති-අපනයනය අධික්ෂණය කිරීම.
8. ඉහත විෂය පිළිබඳව ජාතික සහ අන්තර් ජාතික සමුළු වලදී ශ්‍රී ලංකා රේගුව නියෝජනය කිරීම.
9. බුද්ධිමය දේපළ හිමිකම සහ පාරිසරික කරුණු සඳහා ජාතික සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කිරීම.
10. ඉහත විෂය කරුණු පිළිබඳව ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
11. ජාතික සහ ජාත්‍යන්තර මෙහෙයුම් වල දී WCO, INTERPOL, EUROPOL, සහ පාරිසරික අධිකාරිය සමඟ සම්බන්ධීකරණය කිරීම.

ප්‍රධාන කාර්යය - **01:** බුද්ධිමය දේපළ හිමිකම් **(IPR)** යටතේ ගැනෙන වෙළඳ භාණ්ඩ වලට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.			
ප්‍රධාන පියවරයන්	ඉලක්කය	තත්‍ය	ලභාකර නොගත්තේ නම්, හේතුව
(1) හිමිකම් දරන්නන්ගේ නිල ලැයිස්තුව ලබාගැනීම- •ලියාපදිංචි වෙළඳ ලකුණු ලබාගැනීම (ශ්‍රී ලංකාවේ තහනම් කරන ලද ද්‍රව්‍ය ආනයනය කිරීම;) සහ බුද්ධිමය දේපළ හිමිකම් (IPR) යටතේ ගැනෙන වෙළඳ භාණ්ඩ වලට අදාළ බලාත්මක කිරීමේ නියෝගයන් හි සඵලතාවය වැඩිකිරීම සඳහා සියළුම රේගු ප්‍රකාශන සකස් කරන නිලධාරීන්ට හා බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදා හැරීම.	100%	100%	
(2) බුද්ධිමය දේපළ හිමිකම් හා අදාළ භාණ්ඩ ආනයනය කිරීමට අදාළ රෙගුලාසි සහ නියමයන් පිළිබඳව රේගු ප්‍රකාශන සකස් කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම.	100%	100%	
(3) වඩාත් හොඳ ස්වේච්ඡා අනුකූල වීමක් සඳහා ඉහත අංක **(2)** හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයින්ගේ පුහුණු විෂය මාලාව වැඩිදියුණු කිරීම.			
(4) රේගු ක්‍රියා පටිපාටීන් පිළිබඳ හිමිකම් දරන්නන්ගේ දැනුම ඉහළ නැංවීම.	100%	100%	
	100%	100%	

ප්‍රධාන කාර්යය - **02:** ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය **(SLSI)** යටතේ ගැනෙන වෙළඳ භාණ්ඩ වලට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.			
ප්‍රධාන පියවරයන්	ඉලක්කය	තත්‍ය	ලඟාකර නොගත්තේ නම්, හේතුව
(1) ආනයනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් සහතිකයක් අවශ්‍ය වන නිල භාණ්ඩ ලැයිස්තුවක් ලබාගැනීම සහ රේගු ප්‍රකාශන ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් සහ බලාත්මක කරන සියළුම නිලධාරීන්ට එම තොරතුරු බෙදා හැරීම.	100%	100%	
(2) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රතික්ෂේපිත ආනයනයට අදාළ රෙගුලාසි සහ අවශ්‍යතා සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිය සිදුකරන නිලධාරීන් සහ බලාත්මක කිරීමේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම.	100%	100%	
(3) වඩාත් හොඳ ස්වේච්ඡා අනුකූල වීමක් සඳහා ඉහත අංක **(2)** හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයින්ගේ පුහුණු විෂය මාලාව වැඩිදියුණු කිරීම.	100%	100%	
(4) පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම හා වෙළඳාම පහසු කිරීම සඳහා නව රෙගුලාසි සැකසීම.	100%	100%	

ප්‍රධාන කාර්යය - **03:** බුද්ධිමය දේපළ නීති **(IP Law)** බලාත්මක කිරීම			
ප්‍රධාන පියවරයන්	ඉලක්කය	තත්‍ය	ලඟාකර නොගත්තේ නම්, හේතුව
(1) බුද්ධිමය දේපළ අයිතියට අදාළ නීති බලාත්මක කිරීම පිළිබඳ රේගු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	100%	100%	
(2) බුද්ධිමය දේපළ හිමිකම් උල්ලංඝනය කරමින් ආනයනය කර ඇති බවට සැක කෙරෙන භාණ්ඩ හසුකර ගැනීම.	100%	100%	
(3) රේගු ආඥා පනතේ **125 (අ)** හා **125 (ආ)** වගන්ති වලට අනුකූලව **"ක්‍රියාකිරීම සඳහා යෙදවීම"** සම්බන්ධයෙන් කටයුතු කිරීම.	100%	100%	
(4) බුද්ධිමය දේපළ හිමිකම් උල්ලංඝනය කිරීම් හසුකර ගැනීම් වාර්තා කිරීම .	100%	100%	
(5) **WCO** හා **RILO** කාර්යාල වෙත කාලීනව ප්‍රතිඵල වාර්තා කිරීම			

ප්‍රධාන කාර්යය - **04:** මොන්ට්‍රියල් සම්මුතිය මගින් ආවරණය කරනු ලබන ඕසෝන් ස්ථරයට හානිකර ද්‍රව්‍ය ආනයනය කිරීමට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේදී ඵලදායී බව ඉහළ නැංවීම.			
ප්‍රධාන පියවරයන්	ඉලක්කය	තත්‍ය	ලඟාකර නොගත්තේ නම්, හේතුව
(1) පරිසර අමාත්‍යාංශයේ ජාතික ඔසෝන් ඒකකයේ පූර්ව ලියාපදිංචිය අවශ්‍යවන සහ ආනයන කිරීමට පෙර ආනයන බලපත්‍රයක් (ICL) අවශ්‍ය වන භාණ්ඩ පිළිබඳ නිල ලැයිස්තුවක් ලබා ගැනීම සහ සියලුම රේගු ප්‍රකාශන සකස් කරන නිලධාරීන්ට සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදා හැරීම.	100%	100%	
(2) වඩා හොඳ අනුකූලතාවක්/ බලාත්මක කිරීමක් සඳහා ඕසෝන් ස්ථරයට හානිකර ද්‍රව්‍ය සහ ඉහත **(2)** හි සඳහන් ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතා පිළිබඳව රේගු සටහන්කර සකස් කරන හා බලාත්මක කරන නිලධාරීන්ට දැනුම ලබාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම.	100%	100%	
(3)) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීමක් සඳහා ඉහත අංක **(2)** හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම.	100%	100%	
(4) ඉල්ලීම් වලට අනුව ඕසෝන් ස්ථරයට හානිවන ද්‍රව්‍ය ආනයන පිළිබඳ දත්ත ජාතික ඕසෝන් ඒකකයට ලබාදීම	100%	100%	

(5) යම් සැක සහිත භාණ්ඩ තොග විස්තර ලබා ගැනීම හා ඉලක්ක කිරීම..	100%	100%	

ප්‍රධාන කාර්යය - **05:** බාසල් ප්‍රඥප්තිය මගින් ආවරණය වන හානිකර අපද්‍රව්‍ය දේශ සීමා හරහා සංක්‍රමණය වීමට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.			
ප්‍රධාන පියවරයන්	ඉලක්කය	තත්‍ය	ලභාකර නොගත්තේ නම්, හේතුව
(1) • බේසල් සම්මුතියෙහි ඇමුණුම් I සහ ඇමුණුම් III යටතට ඇතුලත්; • ශ්‍රී ලංකාව තුළට අපනයන කිරීම තහනම් කරන ලද අනෙකුත් හානිකර භාණ්ඩ; • ආනයනය කිරීමට පෙර ආනයන පාලන බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය වන්නාවූ භාණ්ඩවල නිල ලයිස්තුවක් ලබාගැනීම හා එම දත්ත රේගු ප්‍රකාශන ක්‍රියාවලිය සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන්ට ලබාදීම.	100%	100%	
(2) රජයේ අනෙකුත් නියෝජිතායතනයන්ගේ සහාය ඇතිව වඩාත් උචිත අනුගතවීමේ ක්‍රියාමාර්ග ගැනීම බලාත්මක කිරීම සඳහා, • බාසල් ප්‍රඥප්තිය යටතේ සඳහන් වන හානිකර අපද්‍රව්‍ය; • ශ්‍රී ලංකාව තුළට ආනයන කිරීම තහනම් කරන ලද අනෙකුත් හානිකර භාණ්ඩ; • ආනයනය කිරීමට පෙර ආනයන පාලන බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය වන්නා වූ පරිසරයට සංවේදී අනෙකුත් භාණ්ඩ; • ආනයනය කරන ලද හානිකර භාණ්ඩ තොග හඳුනාගත් අවස්ථාවකදී අනුගමනය කළ යුතු ආරක්ෂිත ක්‍රියාමාර්ග සහ එවැනි අවස්ථාවකදී අනෙකුත් රාජ්‍ය ආයතන වල තාක්ෂණ සහය ඇතිව ගතයුතු ක්‍රියාමාර්ග සහ ආරක්ෂක ක්‍රියාමාර්ග අනුගතකර ගැනීම පිළිබඳව රේගු ප්‍රකාශන සකස් කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම; **(2)** රජයේ අනෙකුත් නියෝජිතායතනයන්ගේ සහාය ඇතිව වඩාත් උචිත අනුගතවීමේ ක්‍රියාමාර්ග ගැනීම බලාත්මක කිරීම සඳහා,	100%	100%	
(3) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීම සඳහා ඉහත අංක **(2)** හි සඳහන් අවශ්‍යතාවන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම..	100%	100%	
(5) යම් සැක සහිත භාණ්ඩ තොග විස්තර ලබාගැනීම හා ඉලක්ක කිරීම.	100%	100%	

ප්‍රධාන කාර්යය - **06:** ස්ටොක්හෝම් සම්මුතිය මගින් ආවරණය වන දිගුකල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය ආනයන කිරීමට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම.			
ප්‍රධාන පියවරයන්	ඉලක්කය	තත්‍ය	ලභාකර නොගත්තේ නම්, හේතුව
(1) • ස්ටොක්හෝම් සම්මුතියේ ඇමුණුම් අ, ආ, සහ ඇ හි ලැයිස්තු ගත කර ඇති; • ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරන ලද; • ආනයනට පෙර ආනයන පාලන බලපත්‍රයක් අවශ්‍ය වන (ඇමුණුම ආ. භාවිතය සීමාකරන ලද) දිගු කල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියලුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් වෙත එම තොරතුරු බෙදා හැරීම. • ස්ටොක්හෝම් සම්මුතියේ ඇමුණුම් අ, ආ, සහ ඇ හි ලැයිස්තු ගත කර ඇති; • ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරන ලද;	100%	100%	

• ආනයනට පෙර ආනයන පාලන බලපත්‍රයක් අවශ්‍ය වන (ඇමුණුම අ. භාවිතය සීමාකරන ලද)			
(2) දිගු කල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය පිළිබඳව සියලුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම.	100%	100%	
(3) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීම සඳහා ඉහත අංක (2) හි සඳහන් අවශ්‍යතාවන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩිදියුණු කිරීම	100%	100%	
(4) යම් සැක සහිත භාණ්ඩ තොග විස්තර ලබාගැනීම හා ඉලක්ක කිරීම..	100%	100%	

ප්‍රධාන කාර්යය - **07:** රොටර්ඩෑම් සම්මුතිය මගින් ආවරණය වන පූර්ව දැනුම්දීමේ අනුමැතිය (PIC) ක්‍රියාවලිය බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.			
ප්‍රධාන පියවරයන්	ඉලක්කය	තත්‍ය	ලභාකර නොගත්තේ නම්, හේතුව
(1) • රොටර්ඩෑම් සම්මුතිය තුළ ආවරණය කරනු ලැබූ; • ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරන ලද; • පළිබෝධනාශක පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා (ROP) යටතේ පූර්ව ලියාපදිංචිය අවශ්‍ය වන්නාවූ • ආනයනය කිරීමට පෙර පළිබෝධනාශක පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ නිර්දේශය මත නිකුත් කරනු ලැබූ ආනයන බලපත්‍රයක් අවශ්‍ය වන්නාවූ; අන්තරාදායක රසායන සහ කෘමිනාශක පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියලුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් වෙත එම තොරතුරු බෙදා හැරීම. • රොටර්ඩෑම් සම්මුතිය තුළ ආවරණය කරනු ලැබූ; • ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරන ලද;	100%	100%	
(2) පළිබෝධනාශක ආනයනය සම්බන්ධ රෙගුලාසි සහ අවශ්‍යතා පිළිබඳව සියලුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදුකරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.			
(3) වඩාත් හොඳ ස්වේච්ඡා අනුකූලවීම් සඳහා ඉහත අංක (2) හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුලත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයින්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම.	100%	0%	
	100%	100%	

ප්‍රධාන කාර්යය - **08:** රසායනික අවි සම්මුතිය (CWC) යටතේ ගැනෙන භාණ්ඩ වලට අදාල නියෝග බලාත්මක කිරීමේ කාර්යක්මතාවය ඉහල නැංවීම (රසායනික අවි වැඩිදියුණු කිරීම, නිෂ්පාදනය, තොග රැස්කිරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතිය)			
ප්‍රධාන පියවරයන්	ඉලක්කය	තත්‍ය	ලභාකර නොගත්තේ නම්, හේතුව
(1) • රසායනික අවි ප්‍රඥප්තිය;	100%	100%	
• ශ්‍රී ලංකාව තුළ ආනයනය තහනම් කරන ලද;			
• ආනයනය කිරීමට පෙර ආනයන බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය කරන;			

රසායනික පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියලුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් වෙත එම තොරතුරු බෙදා හැරීම.			
(2) හානිකර රසායන ද්‍රව්‍ය සම්බන්ධ රෙගුලාසි සහ අවශ්‍යතා පිළිබඳව සියලුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදුකරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම.	100%	100%	
(3) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීම සඳහා ඉහත අංක (2) හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම.	100%	100%	
(4) යම් සැක සහිත භාණ්ඩ තොග විස්තර ලබා ගැනීම හා ඉලක්ක කිරීම.	100%	100%	

ප්‍රධාන කාර්යය – **09** අනෙකුත් පාර්ශවකරුවන් සහ රජය සමඟ සම්බන්ධීකරණය ඉහළ නැංවීම			
ප්‍රධාන පියවරයන්	ඉලක්කය	තත්‍ය	ලඟාකර නොගත්තේ නම්, හේතුව
(1) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO), සෞඛ්‍ය අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය හා කෘෂිකර්ම අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය සමඟ රැස්වීම් සංවිධානය කිරීම.	100%	100%	
(2) පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.	100%	100%	
(3) පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ ක්‍රියාකාරකම්හි නියුතු වෙනත් ආයතන සමඟ ඒකාබද්ධ මෙහෙයුම් සංවිධානය කිරීම.	100%	100%	
(4) ජනමාධ්‍ය හරහා පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳ මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	100%	100%	
(5) WCO, WIPO, INTERPOL, EUROPOL, USPTO,UNODC හා UNEP වැනි අන්තර්ජාතික සංවිධාන සමඟ සහයෝගීතාවය පවත්වා ගැනීම.	100%	100%	

ප්‍රධාන කාර්යය –**10** ධාරිතා සංවර්ධන වැඩසටහන්			
ප්‍රධාන පියවරයන්	ඉලක්කය	තත්‍ය	ලඟාකර නොගත්තේ නම්, හේතුව
(1) වැඩමුළු, පුහුණු සහ සම්මන්ත්‍රණ (දේශීය/ ජාත්‍යන්තර) සඳහා නිලධාරීන් නම් කිරීම.	100%	100%	
(2) රේගු කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පිළියෙල කිරීම.	100%	100%	
(3) පාරිභෝගික ආරක්ෂණ සහ පාරිසරික ආරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා නිලධාරීන් දිරිමත් කිරීම.	100%	100%	
(4) රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ අනෙකුත් අදාල ආයතන වෙත විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් කිරීම.	100%	100%	

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට **(SLSI** අදාළ විමර්ශන


ලියාපදිංචි කරන ලද මුළු **SLSI** විමර්ශන සංඛ්‍යාව	163
SLSI විමර්ශන සඳහා පනවන ලද මුළු දඩ (දඩ + ළිහිල් කරන ලද දඩ) ප්‍රමාණය (රු)	5,707,179.00
SLSI විසින් ප්‍රතික්ෂේප කරන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය	(කරුණාකර වගුව I බලන්න)

බුද්ධිමය දේපළ හිමිකම් **(IPR)** පිළිබඳ විමර්ශන

ලියාපදිංචි කරන ලද මුළු IPR විමර්ශන සංඛ්‍යාව	27
ලියාපදිංචි කරන ලද IPR විමර්ශන මඟින් අයකරගත් මුළු දඩ ප්‍රමාණය(රු.)	17,787,181.00

පාරිසරික ආරක්ෂණය හා අදාල විමර්ශන

ලියාපදිංචි කරන ලද මුළු විමර්ශන සංඛ්‍යාව	4
සිද්ධි සඳහා පනවන ලද මුළු දඩ ප්‍රමාණය (රු.)	-
ප්‍රති අපනයනය කරන ලද මුළු ප්‍රමාණය	-



වගුව I

2024 වසරේදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් ප්‍රතික්ෂේප කරන ලද භාණ්ඩ

අනු අංකය	විස්තරය	ප්‍රමාණය
1	LP වායු හෝස් බටs	සෙ.මී.610
2	ඇම්පියර් 13 Aනැවත සකස්කළ නොහැකි පේනු	කැලි19,400
3	ඇම්පියර් 13 ස්විචය සහිත සොකට්	කැලි 2,764
4	ළදරු කුඩ	දුසිම් 55
5	බැසිල් ඇට පානය	කාටින් 250
6	බැටරි	කැලි 1,734,896
7	Bebo බිලැක් කරන්ට්	පෙට්ටි 256
8	බබ්ල් ගම්	කාටින්150
9	ටින් මාළු	කෑන් 5,550
10	ටින් මාළු	කාටින් 10,734
11	සෙල්ලම් කාර් බිස්කට්	කාටින් 61
12	Catch ලකුණ සහිත මැකරල් ටින් මාළු	කාටින් 1,846
13	සිව්ලිම් විදුලි පංකා	කැලි 3,148
14	සෙරමික් මග්	කාටින් 39
15	සෙරමික් භාණ්ඩ	කැලි 1,327
16	සෙරමික් තේ පෝච්චි කට්ටල	කාටින් 22
17	කොකා කෝලා සැහැල්ලු	කාටින් 100
18	රැලි සහිත නම්‍යශීලී කොන්ඩියුට් බට	මීටර් 8,000
19	ක්‍රැන්බරි රසැති කෝඩියල්	කාටින් 136
20	ශුද්ධ නොකළ පොල් තෙල්	සුනම්‍ය බෑග් 20
21	ශුද්ධ නොකළ පොල් තෙල්	මෙ.ටො. 21.2
22	DC සහ AC කුඩා පරිපථ කඩන	කැලි 4,422
23	එලබෝ	කැලි 1,680
24	විදුලි උඳුන්	කැලි 2,520
25	විදුලි කේතල	කැලි 632
26	එන්ඩ් කැප්	කැලි 2,695
27	විදුලි පංකා	කාටින් 1,176


28	නම්‍යශීලී කේබල්	කැලි 4,620
29	පළතුරු රසැති බබල් ගම්	කාටන් 25
30	Galaxy ලකුණ සහිත සෙලිබ්‍රේෂන් පාන	කාටන් 60
31	රවුම් ගැල්වනයිස් බට	කැලි 259
32	ගැල්වනයිස් වානේ බට	කැලි 793
33	ගැල්වනයිස් වානේ කම්බි	කොයිල් 40
34	ජෙලි	කාටන් 100
35	ජෙලි සූකිරි	කි.ග්‍රෑ.240
36	කේතල්	කැලි 136
37	රෙදි සෝදන ඩිටර්ජන්ට් කුඩු	කි.ග්‍රෑ.60
38	එල්ඊඩී බල්බ	කැලි 11,000
39	ලොලිපොප්	කැලි 220,200
40	LP වායු	මෙ.ටො. 7,320.5
41	LP වායු	කාටන් 30 n
42	LPG සිලින්ඩර්	කැලි 27,000
43	LPG හෝස්	කාටන් 100
44	කුඩා පරිපථ කඩන	කැලි 60
45	මෘදු වානේ ගැල්වනයිස් යකඩ කම්බි	කට්ටල 112
46	කුඩා පරිපථ කඩන	කැලි 60
47	Minso වර්ගයේ බැටරි	කැලි 72
48	මල්ටි සොකට් එක්ස්ටෙන්ෂන්	කැලි 2,120
49	පීඩන නොවන පීවීසී උපාංග	කැලි 1,000
50	නැවත රැහැන්ගත කළ නොහැකි පේනු	කැලි 6,970
51	බිම සිටුවන විදුලි පංකා	කැලි 2,516
52	පොලියෙස්ටර් මහන නූල්	කාටන් 6
53	පෝසිලේන් පීරිසි සහ කෝප්ප	කාටන් 134
54	විදුලි කෝඩ්	කාටන් 150
55	විදුලි කෝඩ්	කැලි 3,880
56	පීඩන පීවීසී උපාංග	කැලි 10,830
57	රේඩියෝ වයර්	කැලි 10,000
58	රතු මයිසූර් පරිප්පු	කි.ග්‍රෑ.25,000
59	රේණුකා කැප්ටන් ලකුණ සහිත ජැක් මැකරල්	කාටන් 3,130සහ කැන් 30
60	රයිසු කුකර් වයර්	කැලි 12,000
61	රවුම් පයිප්ප	කැලි 202
62	skew තේ	කැලි 495
63	සොකට්	1 කැලි 2
64	සෝයා සෝස්	කාටන් 80
65	සෝයා සෝස්	කි.ග්‍රෑ.46
66	සිටුවන විදුලි පංකා	කැලි 15,222
67	ස්විච් සොකට්	කැලි 720
68	ස්විච්	කැලි 60
69	මේස, බිම සිටුවන සහ බිත්ති විදුලි පංකා	කැලි 1,800
70	කොටස් එකක් සහ දෙකක් සහිත මල්ටි සොකට්	කැලි 43
71	කුඩ	කාටන් 36
72	වැකියුම් උණු වතුර බෝතල්	කාටන් 1,057
73	වැකියුම් උණු වතුර බෝතල්	කැලි 3,300
74	වැකියුම් උණු වතුර බෝතල්	කට්ටල 244
75	වතුර හීටර්	කැලි 2,500

8.1.2.4 වරාය පාලන සහ ගුවන් භාණ්ඩ පාලන ඒකකය

හැඳින්වීම

දේශසීමාවන් හරහා සංවිධානාත්මක අපරාධ මැඩලීමේ අභිප්‍රායෙන් මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳව එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ (UNODC) බහාලුම් පාලන වැඩසටහන ලෙස පෙර හැඳින්වූ මගීන් සහ භාණ්ඩ දේශසීමා කණ්ඩායම (PCBT) /ලෝක රේගු සංවිධානය යටතේ එක්සත් ජාතින්ගේ කාර්යාලය සමඟ **2015.01.31** දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම යටතේ **2014** දී ශ්‍රී ලංකා රේගු වරාය පාලන ඒකකය සහ ගුවන් භාණ්ඩ පාලන ඒකකය ස්ථාපනය කරන ලදි. මෙම ඒකක දෙක, බලාත්මක කිරීමේ පර්ෂදයේ සමාජ ආරක්ෂණ අංශය යටතේ පාලනය වේ. මෙම වරාය පාලන ඒකකය සහ ගුවන් භාණ්ඩ පාලන ඒකකය ශ්‍රී ලංකා රේගුවේ සාමාන්‍ය රාජකාරි වලට අතිරේකව අමතර ආරක්ෂක ස්ථරයක් ලෙස ක්‍රියා කරයි.

සංවිධාන ව්‍යුහය



වරාය පාලන ඒකකයෙහි විෂය පථය

1. මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සහ ලෝක රේගු සංවිධානය (WCO) සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම
2. UNODC හි ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.
3. UNODC සහ WCO PCBT වෙතින් ලැබෙන තොරතුරු මගින් ආරම්භ කරන ලද සිද්ධි පිළිබඳ විමර්ශන සිදුකිරීම.
4. දේශසීමාවන් හරහා අධි අවදානම් භාණ්ඩ ගමන් කිරීම ඉලක්ක කිරීම සඳහා WCO භාණ්ඩ ඉලක්ක කිරීමේ පද්ධතිය (CTS) පරිපාලනය කිරීම සහ භාවිතා කිරීම.
5. අනෙකුත් ඒකකය විසින් ඉල්ලා සිටින අවස්ථාවන්හි දී ඒ සඳහා සහය වීමට Hazmat, TruNarc සහ UNODC විසින් සපයන ලද අනෙකුත් උපකරණ මෙහෙයුම් කිරීම.
6. නැව් නියෝජිතයින් විසින් අනිකාල එකතු කිරීම අධීක්ෂණය කිරීම.
7. ආනයන, අපනයන, ප්‍රවාහනය කරන සහ නැවකින් නැවකට මාරු කරන බහාලුම් සංචලනය අධීක්ෂණය කිරීම.
8. ලොව පුරා බහාලුම් තදබදය නියාමනය කිරීම සහ අධික්ෂණය කිරීමේ නියැළි අදාළ ජාතික සහ ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය කිරීම. .
9. රටවල් අතර දේශසීමාවන් හිදී නීති විරෝධී භාණ්ඩ, තහනම් කරන ලද භාණ්ඩ, මත්ද්‍රව්‍ය සහ රටවල් අතර අපරාධ හා සම්බන්ධ අනෙකුත් වංචා හඳුනා ගැනීම, රඳවා ගැනීම හා හසුකර ගැනීම සහ බැක්ට්‍රැකින් (backtracking investigations) පරීක්ෂාවන් සිදුකිරීම.
10. UNODC විසින් පරිත්‍යාග කරන ලද Hazmat සහ TruNarc වැනි තාක්ෂණික උපකරණ භාවිතයෙන් රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ අනෙකුත් අංශ සහ ඒකක සමඟ සම්බන්ධීකරණය සිදුකිරීම.
11. රේගුව යටතේ එන නීති විරෝධී භාණ්ඩ, තහනම් කරන ලද භාණ්ඩ, මත්ද්‍රව්‍ය, දේශසීමාවන් හරහා අපරාධ හඳුනා ගැනීම, රඳවා ගැනීම හා තහමනම් කිරීම සහ මත්ද්‍රව්‍ය පාලන ඒකකය, පාරිභෝගික ආරක්ෂණ ඒකකය, අවදානම් කළමනාකරණ අංශය සහ නිවාරණ අංශය සමඟ සම්බන්ධීකරණයෙන් රේගු ආඥා පනත සහ අනෙකුත් අදාළ නීති වලට අනුකූලව එකී ආනයනය, අපනයන, මගී භාණ්ඩ, පාර්සල් හෝ ප්‍රති-නැවගත කරන භාණ්ඩ නැවැත්වීම, රඳවා ගැනීම, පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම.

ශ්‍රී ලංකා රේගුවේ වරාය පාලන ඒකකය භාවිතා කරන මෙවලම්.

1. WCO රේගු බලාත්මක කිරීමේ ජාලය. (CEN)
    a. බහාලුම් COMM

b. ගුවන් භාණ්ඩ COMM

2. WCO ජාතික රේගු බලාත්මක කිරීමේ ජාලය (nCEN)
3. WCO භාණ්ඩ ඉලක්ක කිරීමේ පද්ධතිය
4. AsyCuDa ගෝලීය පද්ධතිය

වරාය පාලන ඒකකයෙහි ඇති විශේෂ උපකරණ

1. HAZMAT

අ. රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා වන HazMatID 360 පද්ධතිය මගින් ක්ෂේත්‍රයේ දී නොදන්නා සහ ද්‍රව්‍ය, පෙල් සහ ද්‍රාවණ ඉක්මනින් සහ විස්තීර්ණ ලෙස විශ්ලේෂණය කිරීමේ හැකියාව ඇත.



2. TRUNARC

ආ. අතේ රැගෙන යන TruNarc™ මත්ද්‍රව්‍ය විශ්ලේෂකය මගින් එක් නිශ්චිත පරීක්ෂා කිරීමක දී නිලධාරීන්ට සැක සහිත ද්‍රව්‍ය **530** කට වැඩි ප්‍රමාණයක් පරිලෝකනය කිරීමේ හැකියාව ඇත.



වරාය පාලන ඒකකයේ අනෙකුත් කාර්යයන්

1. වරාය පාලන ඒකකය විසින් ලෝක රේගු සංවිධානය මගින් සපයන ලද විශේෂිත මෙවලමක් වන භාණ්ඩ ඉලක්ක කිරීමේ පද්ධතිය භාවිතයේන් පර්යන්ත මෙහෙයුම්කරුවන් විසින් සපයන ලද බහාලුම් ලැයිස්තු භාවිතයෙන් දිර්ඝ කාලසීමාවක් පුරා කොළඹ වරායේ ඇති බහාලුම් අධීක්ෂණය කරනු ලබයි.

2. මුහුදු සහ ගුවන් මාර්ගයෙන් ශ්‍රී ලංකාව තුළට සහ පිටතට ගමන් ගන්නා භාණ්ඩ අධීක්ෂණය කිරීම, විමර්ශණය කිරීම, රඳවා ගැනීම සහ සෝදිසි කිරීම සහ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සහ ලෝක රේගු සංවිධිනය (WCO) විසින් ආරම්භ කරන ලද බහාලුම් පාලන වැඩසටහන (CCP) භාවිතා කරන අතර එමගින් UNODC සහ WCO සමඟ සම්බන්ධීකරණය කරයි.

3. වරාය පාලන ඒකකයේ නිලධාරීන් විසින් UNODC විසින් පරිත්‍යාග කරන ලද HazMat සහ TruNarc වැනි විශේෂ උපකරණ භාවිතා කර රසායන ද්‍රව්‍ය අඩංගු භාණ්ඩ තොග අහඹු ලෙස පරීක්ෂා කරයි.






කාර්ය සාධන සාරාංශය

වාර්ෂික සාරාංශය

අනු අංකය	විස්තරය	අයකරගත් ප්‍රමාණය (රු.)
1	**2004** වසරේ දී මුළු රාජසන්තක කිරීම්/ලිහිල් කරන ලද රාජසන්තක කිරීම්/අලවියෙන් ලද මුදල්	315,830,288.69
2	**2024** වසරේ යාත්‍රා අනිකාල අයකර ගැනීම්	107,549,219.50
එකතුව		

විමර්ශනයන්හි තත්වය හා අයකර ගැනීම්

මාසය	ලියාපදිංචි කරන ලද විමර්ශන සංඛ්‍යාව	අවසන් කරන ලද විමර්ශන සංඛ්‍යාව /NFA	එකතු කරන ලද දඩ එකතුව (රු.)	එකතු කරන ලද ලිහිල් කල රාජසන්තක කිරීම් (රු.)	අලෙවියෙන් ලද මුදල් (රු.)	(දඩ/රාජසන්තක කිරීම්/ලිහිල් කරන ලද රාජසන්තක කිරීම්/අලෙවියෙන් ලද මුදල්) එකතුව (රු.)	අතිරේක සටහන්කර (A/E) මගින් අයකර ගත් ප්‍රමාණය (මිළ සැසඳුම්/දිගු කාමරය) (රු.)
ජනවාරි	0	7			747,000.00	747,000.00	8,060,480.00
පෙබරවාරි	1	0	200,000.00		47,574,000.00	47,774,000.00	
මාර්තු	8	4	150,000.00	2,650,000.00	56,911,143.69	59,711,143.69	1,415,691.00
අප්‍රේල්	5	0	100,000.00	11,259,994.00		11,359,994.00	447,373.00
මැයි	5	2	200,000.00	6,640,000.00		6,840,000.00	1,285,462.00
ජූනි	1	4	410,000.00	17,210,066.00		17,620,071.00	2,766,556.00
ජූලි	6	1	100,000.00	1,340,000.00		1,440,000.00	1,060,393.00
අගොස්තු	7	3		540,000.00		540,000.00	
සැප්තැම්බර්	3	1	110,000.00	28,310,000.00		28,420,000.00	1,689,704.00
ඔක්තෝබර්	7	0	200,000.00	133,862,000.00		134,062,000.00	1,110,673.00
නොවැම්බර්	4	12	200,000.00	3,492,000.00		3,692,000.00	916,423.00
දෙසැම්බර්	2	12		500,000.00	3,124,080.00	3,624,080.00	
එකතුව	**49**	**46**	**1,670,000.00**	**205,804,060.00**	**108,356,223.69**	**315,830,288.69**	**18,752,755.00**




රසායනික පරීක්ෂාව

- HazMat භාවිතා කරමින් සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව
  - වරාය පාලන ඒකකය සඳහා - 03
  - අනෙකුත් අංශ සඳහා - 05
- TruNarc භාවිතයෙන් සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාව
  - වරාය පාලන ඒකකය සඳහා - 03
  - අනෙකුත් අංශ සඳහා - 05

යාත්‍රා අතිකාල අයකර ගැනීම

මාසය	අයකරගත් මුදල (රු.)	යාත්‍රා සංඛ්‍යාව
ජනවාරි	11,931,182.00	456
පෙබරවාරි	7,806,165.00	290
මාර්තු	8,659,859.50	297
අප්‍රේල්	6,173,977.50	215
මැයි	10,984,133.50	393
ජුනි	6,474,687.50	215
ජූලි	9,379,617.50	303
අගොස්තු	9,124,519.00	305
සැප්තැම්බර්	6,962,800.00	208
ඔක්තෝබර්	8,582,052.50	318
නොවැම්බර්	12,902,938.00	432
දෙසැම්බර්	8,567,287.50	287
එකතුව	107,549,219.50	3719



2024 වසරේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ජයග්‍රහණයන්

ආදායම් අරමුණු

රේගු නීතිය බලාත්මක කිරීමේ අරමුණ වන්නේ භාණ්ඩ තොග හඳුනා ගැනීම සහ ඉලක්ක කිරීම, ඒකාබද්ධ පරීක්ෂා කිරීම් සහ විමර්ශන සිදුකිරීම වැනි යෝජිත උපාය මාර්ග හරහා හොර බඩු ජාවාරම් කිරීමේ ප්‍රයත්නයන් වැලැක්වීමයි. එමගින් අයකරගත් මුළු දඩ මුදල් ප්‍රමාණය රු. 1,670,000.00, මුළු ලිහිල් කරන ලද රාජසන්තක කිරීම් රු. 205,804,060.00, අලෙවියෙන් ලද මුදල් රු. 108,356,223.69 සහ මුළු අතිරේක සටහන්කර (A/E) මගින් අයකර ගැනීම් රු. 18,752,755.00 කි.

2024 වසර තුළ වරාය පාලන ඒකකය විසින් මුළු එකතුව රු. 107,549,219.50 ක් වන යාත්‍රා අතිකාල ගාස්තු අධීක්ෂණය කරනු ලැබීය.

වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ අරමුණු

අවදානම් ආකෘති සැකසීම සහ ලෝක රේගු සංවිධානයේ භාණ්ඩ ඉලක්ක කිරීමේ පද්ධතිය (CTS) භාවිතා කර වෙළඳ භාණ්ඩ ඇගයීම හරහා වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ අරමුණ ලභා කරගනු ලැබීය.

පාලන අරමුණු

රටවල් අතර සංවිධානාත්මක අපරාධ (TOC) පාලනය කිරීම සඳහා මගී සහ භාණ්ඩ පාලන වැඩසටහන (PCCP) හරහා පාලන අරමුණු ක්‍රියාත්මක කරනු ලැබීය. ලෝක වෙළඳ සංවිධානය භාණ්ඩ ඉලක්ක කිරීමේ පද්ධතිය භාවිතා කර තහනම් කරන ලද භාණ්ඩ ඉලක්ක කිරීම ක්‍රියාත්මක කරන ලදී. මුහුදින් සහ ගුවනින් එන භාණ්ඩ යන දෙවර්ගයම සඳහා භාණ්ඩ ඉලක්ක කිරීමේ පද්ධතිය හරහා ජනනය වන වාර්තා වලට එරෙහිව පද්ධතිය විශ්ලේෂණය කරනු ලැබේ. තවද, AsyCuDa WCO/ UNODC, CENComm (ContainerComm සහ AirCargoComm) හරහා ලැබෙන දැනුම්දීම් නිරන්තර අධීක්ෂණය කර ඒ අනුව කටයුතු කරනු ලැබීය.

අනෙකුත් අරමුණු

හැකියා ප්‍රවර්ධනය

මගී සහ භාණ්ඩ දේශසීමා කණ්ඩායම (PCBT) ලෙස මීන් පෙර හඳුන්වන ලද මගී සහ භාණ්ඩ පාලන වැඩසටහන (PCCP) සහ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ (UNODC) බහාළුම් පාලන වැඩසටහනෙහි (CCP) සහයෝගීතාවය ඇතිව ධාරිත් සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබීය.

i. කලාපීය PCBT උපායමාර්ගික වෙළඳ සහ අපනයන පාලන දැනුවත් කිරීමේ වැඩමුළුව - **1** වන අදියර
ii. ශ්‍රී ලංකා වරාය පාලන ඒකකයේ සාමාජිකයින් සඳහා ඕමාන රාජකීය පොලිසියේ- රේගුවේ අධ්‍යයන චාරිකාව



ශ්‍රී ලංකා වරාය පාලන ඒකකයේ සාමාජිකයින් සඳහා ඕමාන රාජකීය පොලිසියේ- රේගුවේ අධ්‍යයන චාරිකාව



කටුනායක ගුවන් භාණ්ඩ ගම්මානයේ අභ්‍යන්තර තර්ජන පිළිබඳ පුහුණුව

- අනෙකුත් නියෝජිතායතන

1. INAMA ඉන්දියානු සහ දකුණු ආසියානු ව්‍යාපෘතිය -CITES බලාත්මක කිරීමේ පුහුණුව
2. තොරතුරු රැස්කිරීම සහ බුද්ධිය පිළිබඳ පුහුණුව

රේගු නීති සහ ක්‍රියා පටිපාටි පිළිබඳ උපදේශන

ශ්‍රී ලංකා රේගුවේ වරාය පාලන ඒකකයට අනුයුක්ත නිලධාරීන් ගෝලීය නාවුක අපරාධ වැඩසටහන (GMCP) මගින් සංවිධානය කරන ලද උපදේශාත්මක වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

1. නැගෙනහිර ඉන්දීය සාගරයේ මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ සංවිධානාත්මක අපරාධ ජාලය පිළිබඳ මෙහෙයුම් අධ්‍යයනය හා සබැඳි ජාතික උපදේශනය.
2. නැගෙනහිර ඉන්දීය සාගරයේ මත්ද්‍රව්‍ය ජාවාරම් ජාල සිතියම් ගත කිරීම පිළිබඳ කලාපීය වට මේස සහ පද්ධති විශ්ලේෂණ ක්‍රියාවලිය
3. සමුද්‍රීය කලාප දැනුවත් කිරීම පිළිබඳ වැඩමුළුව

ශ්‍රී ලංකා රේගුවේ වරාය පාලන ඒකකයට අනුයුක්ත නිලධාරීන්, රසායනික අවි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික අධිකාරිය මගින් සංවිධානය කරන ලද මලයාසියාව සහ ශ්‍රී ලංකාව අතර රසායනික අවි තහනම් කිරීම සඳහාවන සංවිධානයේ (OPCW) උපදේශාත්මක වැඩසටහන සඳහා සහභාගී වී ඇත. .

වරාය පාලන ඒකකය **UNODC-WCO** වැඩසටහන් සඳහා සත්කාරකත්වය සැපයීය.
මත්ද්‍රව්‍ය හා අපරාධ සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ (UNODC) බහාළුම් පාලන වැඩසටහනේ (CCP) සාමාජිකයින් අතර දැනුම සහ අත්දැකීම් බෙදාගැනීම සහ හුවමාරු කරගැනීමේ අරමුණින් යුතුව පාකිස්ථාන නිලධාරීන් සඳහා **2024.05.28- 2024.05.30** දක්වා ශ්‍රී ලංකාවේ පවත්වන ලද UNODC-WCO PCBT අධ්‍යයන චාරිකාව සඳහා වරාය පාලන ඒකකය සත්කාරකත්වය සපයන ලදී.





කැපී පෙනෙන ජයග්‍රහණ - 2024

- <u>ජූලි</u>

  ආනයනය කිරීමට පෙර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික ශාක නිරෝධායන සේවාවෙන් ශාක ආනයන අවසරපත්‍රය ලබා නොගත් රු. **6,440,383/-** ක් වටිනා **මී.2.44 x මී.0.15 x මී.0.018** ප්‍රමාණයේ ඝන මීටර් **51.228**ක බ්‍රසීල පයින් දැව කැබලි **7776**ක් හසුකර ගන්නා ලදී.





- <u>සැප්තැම්බර්</u>


  පාකිස්ථානයෙන් ආනයනය කරන ලද රු. **757,363,634/-** ක් වටිනා සිගරට් **4,180,000** ක් හසුකර ගන්නා ලද අතර ඒවා කොළඹ වරායේ අයිතිකරුවකු නොමැතිව තිබූ බැවින් රාජසන්තක කරන ලදී.







සෞඛ්‍ය සහතික පත්‍ර, සම්භවය ලැබූ රටෙහි සහතිකය සහ සත්ව නිශ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව මලයාසියාවෙන් ආනයනය කරන ලද ශීත කළ ඌරු මස් කි.ග්‍රෑ. **51,630** ක් ප්‍රති අපනයනය කරන ලදී.



අයිතිකරුවකු නොමැතිව කොළඹ වරායේ අතහැර තිබූ සුරාබදු දෙපාර්තමේන්තුවේ ආනයන බලපත්‍රය ලබා ගැනීමකින් තොරව නෙදර්ලන්තයෙන් ආනයනය කරන ලද රු. **61,393,125/-** ක් වටිනා ලී. **1** වොඩ්කා බෝතල් **2,838** ක් සහ ලී. **1** විස්කි බෝතල් **747**ක් රාජසන්තක කරන ලදී.







- <u>ඔක්තෝබර්</u>

කුරියර් සමාගමක් හරහා චීනයෙන් ආනයනය කරන ලද රු. **575,335/-**ක් වටිනා උපාංග සහිත ඉ- සිගරට් පොඩ් උපකරණ **630**ක් රාජසන්තක කරන ලදී.





- කුරියර් සමාගමක් හරහා කොරියාවෙන් ආනයනය කරන ලද රු. **1,359,296/-** ක් වටිනා උපාංග සහිත ඉ- සිගරට් පොඩ් උපකරණ **1660**ක් රාජසන්තක කරන ලදී.





- <u>නොවැම්බර්</u>

  - කුරියර් සමාගමක් හරහා එක්සත් අරාබ් එමීර් රාජයයෙන් ආනයනය කරන ලද රු. **742,768/-** ක් වටිනා උපාංග සහිත ඉ- සිගරට් පොඩ් උපකරණ **392**ක් රාජසන්තක කරන ලදී.





8.1.3 මධ්‍යම විමර්ශන අංශය

දැක්ම

“සියලුම රේගු පරීක්ෂණයන්හි මධ්‍යගත ලක්ෂ්‍යය වීම”

මෙහෙවර

“වෙළඳාම සඳහා පහසුකම් සලසන අතර රාජ්‍යය තුළ ආදායම් සහ සමාජ ආරක්ෂණ නීති බලාත්මක කිරීම සඳහා රේගු පරීක්ෂණයන් නියමිත කලට සහ විනිවිදභාවයෙන් යුතුව මෙහෙයවනු ලබන බව සහතික කිරීම”

ප්‍රධාන අරමුණු

නීති විරෝධී වෙළඳාම වැළැක්වීම සඳහා බලාත්මනක කිරීම ශක්තිමත් කිරීම, පැහැරහරින ලද බදු ආපසු අයකර ගැනීම, සහ දඩ හා රාජසන්තක කිරීම් ආදායම් ලෙස එකතු කිරීම මධ්‍යම විමර්ශන අංශයේ මූලික අරමුණු වලට ඇතුළත් වේ. මෙයට අමතරව රඳවාගත් භාණ්ඩ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම, නිලධාරින්ගේ ඵලදායිතාවය වැඩි දියුණු කිරීම, සහ අවි ගබඩාව, සුරක්ෂිතාගාරය, ලේඛනාගාර, සහ CIB කුටිය වැනි අවදානම් සහගත පහසුකම් ඒවායේ අපේක්ෂිත අරමුණු සඳහා පවත්වාගෙන යාම.

ක්‍රියාත්මක කරන ලද උපායමාර්ග

මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නංවාගැනීම සඳහා මධ්‍යම විමර්ශන අංශය මගින් විවිධ උපායමාර්ග අනුගමනය කර ඇත.ඒවා නම්:

- අනාගත බදු පැහැර හැරීම් අවම කිරීම සඳහා බදු ගෙවීම් පැහැර හරින්නන්ත් හඳුනාගැනීම සහ පාලනය කිරීම.
- අවභාවිතයට සහ වංචා සිදුකිරීමට ඉඩ ඇති රේගු කාර්යයන් ශක්තිමත් කිරීම.
- අහිමි වී ඇති ආදායම පරීක්ෂණ සහ දඩුවම් හරහා අයකර ගැනීම.
- භාණ්ඩ නිශ්කාෂනය සහ ආදායම් උත්පාදනය කඩිනම් කිරීම සඳහා අංගන අවකාශය නවීකරණය කිරීම.
- රාජසන්තක කරන ලද භාණ්ඩ සඳහා ආරක්ෂිත ගබඩා කිරීමක් සහතික කිරීම.
- කාර්යක්ෂම අයුරින් ගොනු නැවත ලබා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා ලේඛනාගාර සංවිධානය කිරීම.

ප්‍රධාන කාර්යයන්

පරීක්ෂණ, පරිපාලනය, වාර්තා කිරීම, CCR පද්ධති කළමනාකරණය, බැංකු ඇපකර කළමනාකරණය කිරීම සහ සහායක කාර්යයන් ලෙස වර්ගීකරණය කර ඇති කාර්යයන් පරාසයක් මධ්‍යම විමර්ශන අංශය මගින් ඉටුකරනු ලැබේ.
රේගු නීති බලාත්මක කිරීම, ආදායම එකතු කිරීම උපරිම කිරීම, සහ එහි සියලුම මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවයේ සහ වගවීමේ ඉහළ ප්‍රමිතින් පවත්වා ගැනීම සඳහා මධ්‍යම විමර්ශන අංශය කැපවී සිටී.

අයකරගැනීම්

මධ්‍යම විමර්ශන අංශය හරහා **2024** වර්ෂයේදී රු. 735,669,945.59 ක් දක්වා වූ ආදායමක් අයකර ගන්නා ලදී. අළුතින් ආරම්භ කරන ලද රේගු පරීක්ෂණ **43**ක් මෙසයට හේතු විය.

2024 ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක සාක්ෂාත් කර ගැනීම් පහත දක්වා ඇත.

ඉලක්කය : ආදායම උපරිම කරගැනීම

අරමුණු : අපතේයාම් වැළැක්වීම

උපායමාර්ගය :
•රේගු පාලන යාන්ත්‍රණ ශක්තිමත් කිරීම
•පශ්චාත් නිෂ්කාශන විගණන පාලන ශක්තිමත් කිරීම
•විමර්ශන සහ පරීක්ෂණ ක්‍රියාවලි වැඩි දියුණු කිරීම
•සිදුවිය හැකි දූෂිත ක්‍රියාවන් වැළැක්වීම
•අන්තර්- නියෝජිතායතන සහයෝගීතාවය ශක්තිමත් කිරීම

කාර්යයන්	ප්‍රධාන කාර්යසාධන දර්ශක	අපේක්ෂිත නිමැවුම/ ප්‍රතිඵලය රු. මිලියන	**2024.12.31** දිනට සාක්ෂාත් කර ගැනීම
අ.අවසන් වී නොමැති රේගු සිද්ධි **50**ක් අවසන් කිරීම	අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව සහ එකතුකරන ලද ආදායම		
01. අවසන් කළ හැකි සිද්ධි ගොනු තෝරාගැනීම		• ගොඩගැසි ඇති සිද්ධි සංඛ්‍යාව අඩු කිරීම. • රු. මිලියන **25**	• අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව **65** • පෙර සිද්ධි වලින් **2024** වර්ෂයේදී අයකර ගැනීම් : **2022** සහ පෙර - 89,451,166.00 2023 - 244,707,981.00 එකතුව - **334,159,147.00**
02. විමර්ශන අවසන් කිරීම සහ වාර්තා කිරීම			
03. නඩු පැවරීමට භාණ්ඩ භාරකරුට/භාරකරුවන්ට ඇති වරප්‍රසාදයට යටත්ව හැකි ඉක්මනින් වහාම රේගු විමර්ශන අවසන් කිරීම			
04. රාජසන්තක කරන ලද භාණ්ඩ අපහරණය කිරීම			
04 අ. CIB කාර්යාල පරිශ්‍රෙය් ගබඩා කළ			
04 ආ. අනෙකුත් ස්ථානවල ගබඩා කළ			
05. දඩ, රාජසන්තක කිරීම්, විකිණීමෙන් ලැබෙන ආදායම සහ අතිරේක බදු අයකර ගැනීම			
06. DOPL 118 අනුව ත්‍යාග බෙදාහැරීම			
ආ. රේගු සිද්ධි **75**ක් ආරම්භකර අවසන් කිරීම	අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව සහ එකතුකරන ලද ආදායම		
01. රේගු වංචා පිළිබඳ බුද්ධි තොරතුරු රැස් කිරීම සහ සැකසහිත වැරදි පිළිබඳ රේගු සිද්ධි ආරම්භ කිරීම		• දේශ සීමා අතර වෙළඳාම ආරක්ෂා කරන අතරතුර රටේ සුබ සිද්ධිය ස්ථාපිත කර පවත්වා ගැනීම. • විදේශ රාජ්‍ය ආදායම අයකර ගැනීම. • නීතියේ ඇති අපැහැදිලිතාවයන් සහ ප්‍රමාණවත් නොවන බව අවබෝධ කරගැනීම සහ ඒ අනුව හැඩගැස්වීම. • වැරදිකරුවන් නීතිය හමුවට ගෙන ඒම. •රු. මී. **350**	• ආරම්භ කරන ලද සිද්ධි සංඛ්‍යාව - 43 • අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව - 21 • වසර තුළ ආරම්භ කරන ලද සිද්ධි මගින් කරන ලද මුළු අයකර ගැනීම් - **401,510,797.00**
02. විමර්ශන අවසන් කිරීම සහ වාර්තා කිරීම			
02 අ. පශ්චාත් විගණන			
02 ආ. වර්තමාන භාණ්ඩ බාරගැනීම			
03. නඩු පැවරීමට භාණ්ඩ භාරකරුට/භාරකරුවන්ට ඇති වරප්‍රසාදයට යටත්ව හැකි ඉක්මනින් වහාම රේගු විමර්ශන අවසන් කිරීම			
04. රාජසන්තක කරන ලද භාණ්ඩ අපහරණය කිරීම			
05. දඩ, රාජසන්තක කිරීම්, විකිණීමෙන් ලැබෙන ආදායම සහ අතිරේක බදු අයකර ගැනීම			
06. DOPL 118 අනුව ත්‍යාග බෙදාහැරීම			

01. "යථා තත්වය" පවත්වා ගන්නා ලෙස වූ අභියාචනාධිකරණ අතුරු නියෝගයට යටත්ව රේගු විමර්ශනය ඉදිරියට කරගෙන යාම. **2023.05.03** දිනැති අංක **231/2023** දරන රිට් ආඥාව	CIB/2016/00108 දරණ රේගු සිද්ධිය අවසන් කිරීම	• අත්අඩංගුවට ගත් වාහන නිදහස් කිරීම/ අපහරණය කිරීම • රු. මිලියන **00**	2024.05.21 දින පරීක්ෂණය ආරම්භ විය
ඇ. කහ අඩංගු බහාළුම් **25**ක් ආනයනය කිරීම පිළිබඳ රේගු සිද්ධි			
01. තෙල් නිස්සාරණය සහ අපනයනය හෝ විනාශ කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ විශේෂ ටෙන්ඩර් විකිණීමක් හරහා කහ අඩංගු බහාළුම් **15**ක් අපහරණය කිරීම පිළිබඳව මධ්‍යම අපහරණ අංශය (CDU) සමග පසු විපරම් කිරීම	ප්‍රති අපනයනය කරන ලද කහ අඩංගු බහාළුම් සංඛ්‍යාව සහ නාවුක නියෝජිතයින් වෙත නිදහස් කරන ලද හිස් බහාළුම් සංඛ්‍යාව	• අත්අඩංගුවට ගත් කහ තොග ප්‍රති අපනයනය කිරීම. • රු. මිලියන **50**	බහාළුම් **15**ක් විකුණන ලදී.බහාළුම් **08**ක් ප්‍රති අපකයනය කරන ලදී.
02. කහ අඩංගු බහාළුම් **10**ක් ප්‍රති අපනයනය කිරීම සඳහා ආනයනකරුවන් සමග පසු විපරම් කිරීම.			විකුණුම් ආදායම ලෙස රු. මිලියන **51**ක් අයකර ගන්නා ලදී.
ඈ. බහාළුම් **35**ක් පිළිබඳ රේගු සිද්ධි			
01. මධ්‍යම අපහරණ අංශය විසින් අපහරණය කිරීම සඳහා ලබාගත් කාලයට යටත්ව බහාළුම් **04**ක් අපහරණය කිරීම කඩිනම් කිරීම පිළිබඳව මධ්‍යම අපහරණ අංශය (CDU) සමග පසු විපරම් කිරීම.	මධ්‍යම අපහරණ අංශයට යොමු කරන ලද බහාළුම් සංඛ්‍යාව, අපහරණය/විනාශ කරන ලද බහාළුම් සංඛ්‍යාව සහ නාවුක නියෝජිතයින් වෙත නිදහස් කරන ලද හිස් බහාළුම් සංඛ්‍යාව	• අත්අඩංගුවට ගත් තොග අපහරණය/විනාශ කිරීම. •බහාළුම් නිදහස් කිරීම. • රු. මිලියන **25**	
• පාවිච්චි කරන ලද වාහන කොටස් **1**			CDU තෙ යොමු කරන ලදී.
•රේසින් **1**			CDU තෙ යොමු කරන ලදී.
• රෑහැන් රහිත දුරකථන **1**			CDU තෙ යොමු කරන ලදී.
• හෝස් ග්‍රෑම් **1**			CDU තෙ යොමු කරන ලදී.
02. භාණ්ඩ භාරකරුගේ/කරුවන්ගේ නඩු පැවරීමේ වරප්‍රසාදයට යටත්ව බහාළුම් නිදහස් කිරීම සඳහා විමර්ශන අවසන් කරන ලද බහාළුම් **04**ක් පිළිබඳව පසුවිපරම් කිරීම			
•තිරිඟු පිටි **1**			CDU තෙ යොමු කරන ලදී.
•තේ **1**			CDU තෙ යොමු කරන ලදී.
• වායු නැවුම්කාරක ඩිටර්ජන්ට් **2**			නිදහස් කිරීමට තිබේ.
03. භාණ්ඩ භාරකරුගේ/කරුවන්ගේ නඩු පැවරීමේ වරප්‍රසාදයට යටත්ව බහාළුම් නිදහස් කිරීම සඳහා විමර්ශන/පරීක්ෂණ අවසන් නොකරන ලද බහාළුම් **13**ක් පිළිබඳව පසුවිපරම් කිරීම			
•කළු ගම්මිරිස් **4**			**2024.09.05** ප්‍රති අපනයනය කරන ලදී.
•කැබලි ඇළුමිනියම් **2**			විමර්ශනය අවසන් කරන ලදී.අපහරණය කිරීමට තිබේ.
• අළුත් වාහන කොටස් 1			පරීක්ෂණ සිදුකිරීමට තිබේ.
•රෙපලාවන්‍ය නිෂ්පාදන 1			පරීක්ෂණ සිදුකිරීමට තිබේ.
• ලැමිනේටඩ් වින්ඩස්ක්‍රීන්**1**			පරීක්ෂණ සිදුකිරීමට තිබේ.
•එතනෝල් **1**			භාණ්ඩ අපහරණය කරන ලදී.පරීක්ෂණ සිදු කිරීමට තිබේ.
• කොන්ක්‍රීට් ඇණ **1**			පරීක්ෂණ සිදුකිරීමට තිබේ.
•PE ටාපලින් 1			පරීක්ෂණ සිදුකිරීමට තිබේ.
•පාවිච්චි කළ වාහන කොටස් 1			පරීක්ෂණ සිදුකිරීමට තිබේ.
04. භාණ්ඩ භාරකරුගේ/කරුවන්ගේ නඩු පැවරීමේ වරප්‍රසාදයට යටත්ව "උක්පැණි" අඩංගු විමර්ශන අවසන් නොකරන ලද බහාළුම් **10**ක් පිළිබඳව පසුවිපරම් කිරීම			"උක්පැණි" අඩංගු බහාළුම් **10**ක් නිදහස් කරන ලදී.
05. රේගු පරීක්ෂණ අංක CIB/INV/2019/00230 බලන්න. "පාම්			

ඔයිල්" අඩංගු බහාළුම් **04**ක් නිදහස් කිරීම පිළිබඳ වගකීම නිවාරණ අංශයට මාරු කරන්න.			
ඉ. අත් අඩංගුවට ගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරි පරිශ්‍රයේ ගාල් කර ඇති වාහන **05**ක් පිළිබඳ රේගු සිද්ධි			
01. භාණ්ඩ භාරකරුගේ/කරුවන්ගේ නඩු පැවරීමේ වරප්‍රසාදයට යටත්ව පරීක්ෂණ අවසන් කර ඇති වාහන **05**ක් පිළිබඳ අවසන් නොවූ සිද්ධි පිළිබඳ පසු විපරම් කිරීම	අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව	• අත්අඩංගුවට ගත් වාහන අපහරණය/නිදහස් කිරීම. • රු. මිලියන **10**	• වාහන **05**ක් නිදහස් කරන ලදී. (අයකර ගැනීම් නැත) • සිදු කරමින් පවතින පරීක්ෂණ **01**
ඊ. අත් අඩංගුවට ගෙන **SALT** අංගන පරිශ්‍රයේ ගාල් කර ඇති වාහන **83**ක් පිළිබඳ රේගු සිද්ධි.			
01. වාහන **83**ට අදාළව අවසන් නොවූ සිද්ධි පසු විපරම් කිරීම	අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව	• අත් අඩංගුවට ගත් වාහන අපහරණය/නිදහස් කිරීම. • රු. මිලියන **50**	වාහන **2**ක් නිදහස් කරන ලදී.
01 අ. M/s. වෙහිකල් ලංකා සහM/s.ඩෙල්ටා ට්‍රේඩින් ඇතුළත් අවසන් නොවූ අධිකරණ නඩු **- 44**			
01 ආ. DTIP වෙතින් ලැබුණු උපදෙස් හේතුවෙන් අවසන් වී නැත- 30			
01 ඇ. ගොනුව සොයාගත නොහැක-**01**			
01 ඈ. අවසන් නොවූ පරීක්ෂණ- **03**			
01 ඉ. අවසන් නොවූ විමර්ශන - 02			
01 ඊ. CDU වෙත යොමු කළ- 01			
01 උ. අපහරණය කරන ලදී, නමුත් ආපසු එවන ලදිග- **02**			
උ අත්අඩංගුවට ගෙන **HIPG** හි ගාල් කර ඇති වාහන **03**ක් පිළිබඳ රේගු සිද්ධි			
01. භාණ්ඩ භාරකරුගේ/කරුවන්ගේ නඩු පැවරීමේ වරප්‍රසාදයට යටත්ව පරීක්ෂණ අවසන් නොමැති සහ අවසන් කරන ලද වාහන **01** කට අදාළ අවසන් නොවූ සිද්ධිය පිළිබඳ පසු විපරම් කිරීම	අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව	• අත් අඩංගුවට ගත් වාහන අපහරණය/නිදහස් කිරීම. • රු. මිලියන **05**	• වාහන **03**ක් නිදහස් කරන ලදී. රු. 12,628,260.00 ක් අයකර ගන්නා ලදී.
02. අපහරණය අවසන් නොවූ - 02	අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව		
ඌ. රඳවාගෙන ගෙන රේගු මූලස්ථානයෙහි ගාල් කර ඇති වාහන **01**ක් පිළිබඳ රේගු සිද්ධිය			
01. භාණ්ඩ භාරකරුගේ/කරුවන්ගේ නඩු පැවරීමේ වරප්‍රසාදයට යටත්ව පරීක්ෂණ අවසන් සහ අවසන් කරන ලද වාහන **01** කට අදාළ අවසන් නොවූ සිද්ධිය පිළිබඳ පසු විපරම් කිරීම	අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව	• අත් අඩංගුවට ගත් වාහන අපහරණය/නිදහස් කිරීම. • රු. මිලියන **01**	• තක්සෙටුරු වාර්තාව ලැබුණු පසු විමර්ශන නියෝගය ලබාදෙනු ඇත.
එ.ශ්‍රී ලංකා වරාය අධිකාරි පරිශ්‍රය් ගාල් කර ඇති **LCL18**ක් පිළිබඳ රේගු සිද්ධි			
01. භාණ්ඩ භාරකරුගේ/කරුවන්ගේ නඩු පැවරීමේ වරප්‍රසාදයට යටත්ව පරීක්ෂණ අවසන් සහ අවසන් කරන ලද LCL **01** කට අදාළ අවසන් නොවූ සිද්ධි පිළිබඳ පසු විපරම් කිරීම	අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව	• අත් අඩංගුවට ගත් වාහන අපහරණය/නිදහස් කිරීම. • රු. මිලියන **25**	කිසිදු සිද්ධියක් අවසන් කර නැත.
02. පරීක්ෂණ අවසන් සහ අපහරණය/නිදහස් කිරීම අවසන් LCL **02** කට අදාළ සිද්ධි පිළිබඳ පසු විපරම් කිරීම			
03. භාණ්ඩ භාරකරුගේ/කරුවන්ගේ නඩු පැවරීමේ වරප්‍රසාදයට යටත්ව පරීක්ෂණ අවසන් නොවූ LCL **02** කට අදාළ සිද්ධි පිළිබඳ පසු විපරම් කිරීම			
04. භාණ්ඩ භාරකරුගේ/කරුවන්ගේ නඩු පැවරීමේ වරප්‍රසාදයට යටත්ව,			

භාණ්ඩ සොයාගත නොහැකි සහ පරීක්ෂණ අවසන් නොකරන ලද LCL **05** කට අදාළ සිද්ධි පිළිබඳ පසු විපරම් කිරීම.			
05. භාණ්ඩ භාරකරුගේ/කරුවන්ගේ නඩු පැවරීමේ වරප්‍රසාදයට යටත්ව සිද්ධි ගොනු සොයාගත නොහැකි සහ අවසන් කරන ලද LCL **05** කට අදාළ සිද්ධි පිළිබඳ පසු විපරම් කිරීම.			
06. විමර්ශන අවසන් කරන ලද නමුත් ප්‍රමාද ගාස්තු ඉතා ඉහළ වීම හේතුවෙන් නිදහස් නොකරන ලද LCL **02** කට අදාළ සිද්ධි පිළිබඳ පසු විපරම් කිරීම.			
ඒ. මධ්‍යම සිද්ධි ලියාපදිංචි කිරීමේ පද්ධතිය පවත්වාගෙන යාම සඳහා වෙනත් අංශ වල රේගු පරීක්ෂණ සඳහා පහසුකම් සැලසීම.	සාධාරණ, කාර්යක්ෂම මධ්‍යම සිද්ධි ලියාපදිංචි කිරීමේ පද්ධතිය		
1. මධ්‍යම විමර්ශන අංශයේ සිද්ධි eCCR පද්ධතියේ ලියාපදිංචි කිරීම සහ eCCR අංකය නිකුත් කිරීම.		• අයකරගැනීම් ඇතුළු රේගු විමර්ශන පිළිබඳ දැනුම් මූල පද්ධතියක්.	• ආරම්භ කරන ලද මුළු සිද්ධි සංඛ්‍යාව - 3596 • අවසන් කරන ලද මුළු සිද්ධි සංඛ්‍යාව - 1937
2. අවශ්‍ය අවස්ථාවල eCCR සිද්ධි ලියාපදිංචිය සංශෝධනය කිරීමට සහභාගී වීම.			
3. මධ්‍යම විමර්ශන අංශයේ සිද්ධිවල අවසාන වාර්තාව eCCR පද්ධතියට ඇතුළත් කිරීම.			
4. සියලුම අංශ වල අවසාන වාර්තා සත්‍යාපනය කිරීම.			
5. eCCR පද්ධතියේ සිද්ධිවල තත්වය අවසන් කිරීම			
6. eCCR පද්ධතියට ප්‍රවේශ වීම සඳහා අවසර ලබාදීම සහ අනෙක් අංශවල නිසි අවසර ලත් පුද්ගලයින්ට දත්ත ඇතුළු කිරීම සඳහා බලය ලබාදීම.			
7. eCCR පද්ධතිය සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් හඳුනාගැනීම.			
8. eCCR පද්ධතියට අවශ්‍ය වැඩිදියුණු කිරීම් පිළිබඳව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට දැනුම් දීම.			
9. eCCR පද්ධතිය යාවත්කාලීන කිරීම.			

ඉලක්කය : විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා සංවිධානයේ පරිවර්තනය

අරමුණු : මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම

උපාය මාර්ගය : පුහුණුව සහ අපදේශනය සඳහා සංවිධාන රාමුවක් සකස් කිරීම.

ක්‍රියාමාර්ග	ප්‍රධාන කාර්යසාධන දර්ශක	අපේක්ෂිත නිමැවුම/ප්‍රතිඵලය රු. මිලියන	2024.12.31 දිනට සාක්ෂාත් කරගැනීම්
අ. * අනාවරණය කරගැනීම් * පරීක්ෂණ * නඩු පැවරීම * පශ්චාත් නිෂ්කාශන විගණන පරීක්ෂණ පිළිබඳ පුහුණුව ලබාදීම.	• වැඩිකරන ලද ඵලදායීතාවය,, කාර්යයේ ගුණාත්මකභාවය, සහයෝගීතාවය • ආදායම් ලබාගැනීම (රාජසන්තක කිරීම්/දඩ/විකිණුම් ආදායම්) ඉලක්කය * අවසන් නොකළ නඩු අවසන් කිරීම.	වෙළඳාම සඳහා පහසුකම් සලසන අතර රාජ්‍යයේ ආදායම් සහ සමාජ ආරක්ෂණ නීති බලාත්මක කිරීම සඳහා රේගු පරීක්ෂණ කාලෝචිත හා විනිවිද පෙනෙන ආකාරයෙන් සිදු කරනු ලැබේ.	මධ්‍යම විමර්ශන අංශයට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් පුහුණු මෙහෙයවන ලදී.
ආ. අවශ්‍ය කාර්ය මණ්ඩලය ස්ථාපනය කිරීම.			වර්ෂය අවසානයේ සහකාර රේගු අධිකාරී තත්‍ය කාර්ය මණ්ඩලය **14**කි.

ඉලක්කය : විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා සංවිධානයේ පරිවර්තනය

අරමුණු : ක්‍රියාශීලී ආයතනික සංවර්ධනය සහ සම්පත් ප්‍රශස්ථකරණය සහතික කිරීම
උපායමාර්ගය : විද්‍යාත්මක සම්පත් කළමනාකරණ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම මගින් සම්පත් වෙන් කිරීම ප්‍රශස්තකරණය කිරීම

ක්‍රියාමාර්ග	ප්‍රධාන කාර්යසාධන දර්ශක	අපේක්ෂිත නිමැවුම/ප්‍රතිඵලය රු. මිලියන	2024.12.31 දිනට සාක්ෂාත් කරගැනිම්
අ. මධ්‍යම විමර්ශන අංශයට අනුයුක්ත පැරණි වාහනය (වෑන් රථය) මාරු කිරීම.			සිදු කර නැත.
ආ.අවි ගබඩාව සහ සුරක්ෂිතාගාරය නඩත්තු කිරීම .	අවි, පතරොම් සහ වටිනා ද්‍රව්‍ය ගබඩා කිරීම සහ අවශ්‍ය වන විට නිදහස් කිරීම.	• අවශ්‍ය වනවිට නිදහස් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ අවි, පතරොම් සහ වටිනා ද්‍රව්‍ය ගබඩා කිරීමට ආරක්ෂිත ස්ථානයක්.	
ආ1. අවි, පතරොම් සහ රන්, රිදී සහ මුදල් ඇතුළු වටිනා ද්‍රව්‍ය ආරක්ෂා කිරීම.			අඛණ්ඩව කටයුතු කරන ලදී.
ඇ. ලේඛනාගාරය සහ වාර්තා පවත්වා ගැනීම.	CIB හි පෙර සිද්දී වාර්තා වෙත ප්‍රවේශ වීම.	• අවසන් කරන ලද රේගු පරීක්ෂණයන්හි CIB සිද්ධි ගොනු සංරක්ෂණය කිරීම සහ අවශ්‍ය වනවිට ඒවා ලබාගැනීම.	අඛණ්ඩව කටයුතු කරන ලදී.
ඇ. ICT හරහා eCCR නවීකරණය කිරීම් සඳහා සහභාගී වීම	රේගු සිද්ධි ලියාපදිංචි කිරීම සඳහා ශක්තිමත් පද්ධතියක්.	• අයකරගැනිම් ඇතුළුව රේගු සිද්ධීන්හි දැනුම් ගබඩාවක්.	අඛණ්ඩව කටයුතු කරන ලදී.
ඇ1.ICT සහ CIB නිලධාරීන් ඇතුළත්ව e-CCR යෙදුම් නැවත පරීක්ෂා කිරීම සඳහා කමිටුක් පත්කිරීම.			
ඉ. රාජසන්තක කරන ලද භාණ්ඩ ගබඩා කිරීම සඳහා ආරක්ෂා සහිත කාමරයක් ලබාගැනීම.	අත්අඩංගුවට ගත් සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අපහරණය/නිදහස් කරන තුරු ඒවා ආරක්ෂා කිරීම සඳහා ස්ථානයක්.	• සැකකරුවන් සහ භාණ්ඩ රඳවා තැබීම සඳහා වෙන්වුනු ස්ථාන.	ආරක්ෂිත කාමරය ලබාගෙන නැත.
ඊ. රැඳවුම් කුටිය නැවත සකස් කිරීම.	සැකකරුවන් රඳවා තැබීම සඳහා සුදුසු රැඳවුම් කුටියක්.		රැඳවුම් කුටිය භාවිතා කළ හැකි පරිදි තිබේ.

8.1.4 මධ්‍යම බුද්ධි අංශය

1 : ලැබූ සහ බෙදාහරිනු ලැබූ තොරතුරු

PIRD මගින් ලැබූ තොරතුරු සංඛ්‍යාව	77
අනෙකුත් ප්‍රභව (ෆැක්ස්, ලිපි, පුවත්) - පුද්ගලික	2
එකතුව	79
ක්‍රියා කිරීම සඳහා අනෙකුත් අංශ සඳහා බෙදාහරින ලද බුද්ධි තොරතුරු සංඛ්‍යාව	70

2: RILO/WCO වෙතින් ලැබුණු බුද්ධි අනතුරු ඇඟවීම් සංඛ්‍යාව

RILO/ WCO CEN අනතුරු ඇඟවීම්	88

3: අනෙකුත් අංශ වලට බෙදාහරින ලද පෙර වැරදි විස්තර සංඛ්‍යාව

POD වාර්තා සංඛ්‍යාව	752

4: CHA හා **VAT** ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව

රේගු මූලස්ථාන අනු නියෝජිත බලපත්‍ර නැවත අළුත් කිරීම	5914
SLPA වාප්පු බලපත්‍ර **(A Pass)**	0

5: CSI මෙහෙයුම්**3**

පරිලෝකනය කරනලද බහාළුම් සංඛ්‍යාව	446

6: nCEN දත්ත පද්ධතිය

දත්ත පද්ධතියට වලංගු කරන ලද සිද්ධි සංඛ්‍යාව	2292

7: දේශීය සහ විදේශීය විමර්ශන සහ බුද්ධි නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය කිරීම

නියෝජිතායතනය	යවනු ලැබූ ඉල්ලීම් සංඛ්‍යාව	ලැබූ පිළිතුරු සංඛ්‍යාව
DRI	2	1
RILO	3	3

8: නීතිය බලාත්මක කිරීමේ කාර්යසාධනය

Eccr පද්ධතියේ ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව	19
අයකර ගනු ලැබූ මුළු ප්‍රමාණය රු.	77,782,916

9 : රඳවාගත් බහාළුම්	අ. ප්‍රවර්තන වර්ෂය **(2024)**	ආ. පෙර වර්ෂය **(2023)**	ඇ. පසුගිය වර්ෂ **(2022** සහ පෙර**)**
කාල සීමාව ආරම්භයේ ශේෂය	0	3	23
කාල සීමාව තුළ රඳවාගනු ලැබූ බහාළුම් සංඛ්‍යාව	11	අදාළ නොවේ	අදාළ නොවේ
කාල සීමාව තුළ නිදහස් කරන ලද බහාළුම් සංඛ්‍යාව	3	1	3
කාල සීමාව අවසානයේ ශේෂය	8	2	20

10 : BRAC මෙහෙයුම්

මෙහෙයුම් වල දන්නා ඉලක්ක සංඛ්‍යාව	1061
මෙහෙයුම් වල නොදන්නා ඉලක්ක පැනිකඩ සංඛ්‍යාව	1
කාල සීමාව තුළ අනාවරණය කරගන්නා ලද දන්නා ඉලක්ක සංඛ්‍යාව	1078
කාල සීමාව තුළ අනාවරණය කරගන්නා ලද නොදන්නා ඉලක්ක සංඛ්‍යාව	25
මව් ඒජන්සිය වෙත දැනුම් දෙන ලද ඉලක්ක සංඛ්‍යාව	1102

.1.5 නීති කටයුතු අංශය

නීති කටයුතු අංශය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නීති උපදේශකවරයා ලෙස කටයුතු කරන අතර අධිකරණයේ නඩු පැවරීම පරිපාලනය සහ අධීක්ෂණය කිරීම මෙන්ම නීතිපති දෙපාර්තමේන්තුව සමඟ ලිපි ගනු දෙනු පවත්වා ගැනීම අංශයේ වගකීම වේ. මෙම අංශයේ ප්‍රධාන අරමුණු වන්නේ, රේගු දෙපාර්තමේන්තුව නීතිමය රාමුව තුළ ඵලදායී සහ කාර්යක්ෂමව කටයුතු කරන බව සහතික කරමින් දෙපාර්තමේන්තුවට අදාළ සියළු කරුණු සම්බන්ධයෙන් නීති උපදෙස් ලබාදීම සහ සියළු නඩු කටයුතු වලට සහභාගී වීමයි.
රේගු අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වන මෙම අංශයේ සහාය කාර්ය මණ්ඩලය එක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයෙකු, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු, නියෝජ්‍ය රේගු අධිකාරිවරුන් දෙනෙකු, සහකාර රේගු අධිකාරිවරුන් පස් දෙනෙකු, රේගු පරීක්ෂකවරුන් දෙදෙනෙකු සහ එක් රේගු නියාමකවරයෙකුගෙන් සමන්විතය.

ප්‍රධාන කාර්යයන්

1 වාර්තා පවත්වා ගැනීම.
2 නීති කරුණු සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අනෙකුත් අංශ වෙත උපදෙස් ලබා දීම.
3 නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම.
4 අවශ්‍ය වනවිට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අනෙකුත් ශාඛා නිලධාරීන් සමඟ කටයුතු කිරීම.

ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ අයදුම්පත්

2024 වසරේ ලියාපදිංචි වූ නඩු සංඛ්‍යාව	56
ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත්	09
අභියාචනාධිකරණ අයදුම්පත්	37
දිසා අධිකරණ අයදුම්පත්	01
මහාධිකරණ අයදුම්පත්	01
මහේස්ත්‍රාත් අධිකරණ අයදුම්පත්	09

2024.12.31 දින වන විට නිම වී නොමැති විමර්ශන	260

2024 වසරේදී නිමකරන ලද අයදුම්පත්	08
ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත්	03
අභියාචනාධිකරණ අයදුම්පත්	05

අනෙකුත් නීති කටයුතු

ලබාදුන් අභ්‍යන්තර නීති උපදෙස් සංඛ්‍යාව	39
සහය ලබාදුන් ජාත්‍යන්තර ගිවිසුම් සංඛ්‍යාව	00
සහය ලබාදුන් දේශීය ගිවිසුම් සංඛ්‍යාව	04
නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලා සිටි නීති උපදෙස් සංඛ්‍යාව	09
නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලබාගත් නීති උපදෙස් සංඛ්‍යාව	02
සහය ලබාදුන් මහාධිකරණ/දිසා අධිකරණ/මහේස්ත්‍රාත් අධිකරණ අයදුම්පත් සංඛ්‍යාව	10
නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සහභාගී වූ සාකච්ඡා සංඛ්‍යාව	53

අභියෝග

- නීති සුදුසුකම්ලත් නිලධාරීන් නීති කටයුතු අංශයේ සේවය කිරීමට මැලිවීම.
- අංශය සඳහා අනුයුක්ත විශේෂඥ දැනුම සහිත නිලධාරීන් සීමාසහිත වීම සහ අක්‍රමවත් ස්ථාන මාරු.
- දෙපාර්තමේන්තුව තුළ සංකීරණ නීතිමය ගැටළු සංඛ්‍යාව වැඩිවීම.
- උපදෙස් ලබාගැනීම සඳහා නීති කටයුතු අංශයට නොවැදගත් ගැටළු යොමුකිරීම.
- වෙන්කර ඇති සම්පත් ප්‍රමාණවත් නොවීම. (නීති දත්ත පද්ධතිය වෙත මාර්ගගතව ප්‍රවේශ වීම, ශක්තිමත් යටිතල පහසුකම්)
- අභියාචනාධිකරණ වල විසඳීමට ඇති අයදුම්පත් සංඛ්‍යාව වැඩිවීම.
- නීතිපති දෙපාර්තමේන්තුවෙන් සිදුකරන ඉල්ලීම් සම්බන්ධව කටයුතු කිරීම සඳහා සෑම අංශයකින්ම බලයලත් නිලධාරියකු පත්කිරීම නොසලකා හැරීම.
- නීතිපති දෙපාර්තමේන්තුවෙන් සිදුකරන හදිසි ඉල්ලීම් සහ අනෙකුත් අංශ වලින් ක්ෂණික ප්‍රතිචාර නොමැතිවීම හේතුවෙන් ඒ පිළිබඳ කටයුතු කිරීමේ අපහසුව.

8.1.6 අවදානම් කළමනාකරණ අංශය


ලෝක රේගු සංවිධානයේ SAFE රාමුවේ ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකා රේගුව අවදානම් කළමනාකරණ ඒකකය ආරම්භ කරනු ලැබීය. එමගින් රේගුව තුළ ඵලදායී අවදානම් කළමනාකරණයක් සඳහා දෙපාර්තමේන්තුවේ හැකියාවන් ඉහළ නැංවීම අරමුණු කෙරේ. ඒ අනුව **2021** වසරේ දී මෙම ඒකකය අවදානම් කළමනාකරණ අංශය බවට පත්විය.

බලාත්මක කිරීම සහ පහසුකම් සැලසීම අතර සමතුලිතතාවය ඇති කරමින් ශ්‍රී ලංකා රේගුව තුළ අවදානම් කළමනාකරණ මූලධර්ම සමග එක්වූ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම සඳහා අවදානම් කළමනාකරණ ඒකකය කැපවී සිටී. නවින රේගු මෙවලමක් ලෙස අවදානම් කළමනාකරණයේ විභව්‍ය ප්‍රතිලාභ ලබාගැනීම සඳහා මෙම අංශය අවදානම් කළමනාකරණ මූලධර්ම සහ ලොව පුරා රේගු බලධාරීන් විසින් අනුගත කරගනු ලැබූ ජාත්‍යන්තර ප්‍රශස්ථ ක්‍රියාවලි පිළිබඳ මනා දැනුමක් ඇති පුහුණු නිලධාරීන්ගෙන් සමන්විත වේ.

වර්තමානයේ අවදානම් කළමනාකරණය අංශය පද්ධති, ක්‍රියාවලි සහ ක්‍රමවේද වැඩිදියුණු කිරීම මගින් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීම සහ අවදානය අඩුකිරීම සහ ක්‍රියාකාරිව නියැලී සිටී. ඒ අනුව අංශය විසින් අධික්ෂණය කරනු ලබන මූලික කාර්යයන් පහත පරිදි වේ.

1) අවදානම් පාදක භාණ්ඩ වරණීයතාව සහ අවදානම් කළමනාකරණය.
2) බලයලත් ආර්ථික මෙහෙයුම්කරු වැඩසටහන.
3) ක්‍රියාවලි නැවත සකස් කිරීම සහ පරීක්ෂණ සිදුකිරීම.
4) ජාතික ආනයන මිළ පිරික්සුම් දත්ත ගබඩා ඒකකය.

අවදානම් කළමනාකරණ අංශය විසින් පහත සංවිධාන ව්‍යුහය අනුව මෙහෙයුම් සහ පරිපාලන කටයුතු සිදුකරයි.



1. අවදානම් පාදක භාණ්ඩ වරණීයතාවය

ශ්‍රී ලංකා රේගුවේ භාණ්ඩ වරණීයතා මොඩියුලය, පූර්ව නිගමනය කරන ලද අවදානම් උපමාන සහ පාලනය කරන ලේඛනය ලෙස සැලකෙන පිළිගත් අවදානම් කළමනාකරණ මෙහෙයුම් ක්‍රියාවලිය (SOP) මගින් දක්වා ඇති නියෝගයන්ට අනුකූලව ASYCUDA පද්ධතියේ වරණීයතා මොඩියුලය විසින් ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වේ. වරණීයතා කණ්ඩායම තුළ විශ්ලේෂකයින් කණ්ඩායමක් විසින් අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ අදාළ අවදානම් පැතිකඩ ස්ථාපනය කිරීම සඳහා ආනයන දත්ත අඛණ්ඩව විශ්ලේෂණය කරයි. උපාය මාර්ගික සංවර්ධන සහ යෙදවුම් කමිටුව/උපාය මාර්ගික සංවර්ධන කමිටුවේ දැඩි පරීක්ෂාව යටතේ කලින් කලට සහ තත්‍ය කාලීන විශ්ලේෂණ මගින් අවදානම් කළමනාකරණ අංශයේ වරණීයතා කණ්ඩායම විසින් මෙම ක්‍රියාවලියේ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් අධික්ෂණය කරයි. යම් වැදගත් ප්‍රවණතාවයක් හෝ වෙනසක් සමාලෝචනය සහ අනුමැතිය සඳහා ඉක්මනින්ම අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි. අනුමැතිය ලබා ගැනීමෙන් පසුව අධි අවදානම් භාණ්ඩ තොග ඉලක්ක කිරීමට හැකිවන සේ මෙම අවදානම් පැතිකඩවල් ASYCUDA පද්ධතිය මගින් වරණීයතා ක්‍රමවේදයට එක්කරනු ලබයි.

2024 වසරේ දී භාණ්ඩ වරණීයතාවයන්හි ලභා කරගත් ජයග්‍රහණ

අ. නිර්විනාශක පරීක්ෂා කිරීම සඳහා යොමුකරන ලද බහාලුම් සංඛ්‍යාව අවම කිරීම.

ආ. ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතිය (ARMS) සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අදියර දෙකකට බෙදන ලද අතර ARMS 1 වන අදියර සංවර්ධනය කිරීම සඳහාවන ටෙන්ඩර් ක්‍රියාවලිය සම්පූර්ණ කර ඇති අතර ව්‍යාපෘතිය සාර්ථක ලංසුකරුට පිරිනමන ලදී.

ඇ. අවදානම්පාදක භාණ්ඩ වරණීයතා ක්‍රියාවලියේ අභිවර්ධනය සඳහා දැනට පවතින අවදානම් පාදක භාණ්ඩ වරණීයතා නිර්ණායක සහ අවදානම් පැතිකඩවල් තවදුරටත් වැඩිදියුණු කිරීම් අඛණ්ඩව සිදුකිරීම.

ඈ. ASYCUDA පද්ධතියේ ඇති බහාලුම් වරණීයතාව කළමනාකරණය මගින් බහාලුම් පරීක්ෂා කිරීමේ අංගනයේ ධාරිතාව සහ X කිරණ පරිලෝකනය ඵලදායී ලෙස භාවිතා කිරීම.

ඉ. අවදානම් දර්ශකයක් ලෙස ව්‍යාජ වෙළඳුන් ඉලක්ක කිරීම සඳහා වෙළඳ සම්බන්ධතා සිතියම්ගත කිරීමේ පද්ධතිය ඵලදායී ලෙස විශ්ලේෂණය කිරීම.

ඊ. අනෙකුත් රාජ්‍ය ආයතනයන්ගේ අනුමැතීන් අවශ්‍ය වන බාහිර පැනල පහසුකම් භාණ්ඩ තොග සඳහා හඳුන්වා දෙමින් කාර්යක්ෂම හා ඵලදායී බහාළුම් කළමනාකරණයක් සඳහා වරණීය නිර්ණායක ක්‍රියාත්මක කිරීම.

උ. බන්ධිත නැව් භාණ්ඩ සඳහා මීල පිරික්සුම් යොමු නිර්ණායක ක්‍රියාත්මක කිරීම.

ඌ. ASYCUDA පද්ධතියේ පරීක්ෂණ ක්‍රියා සඳහා පරිශීලක මිත්‍රශීලී සහ සවිස්තරාත්මක ප්‍රතිපෝෂණ පාලන අතුරු මුහුණතක් ක්‍රියාත්මක කිරීම.

එ. අවදානම් කළමනාකරණ අංශයේ නිලධාරීන් සඳහා ධාරිතා ප්‍රවර්ධනය.

2. බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) වැඩසටහන

2017 පෙබරවාරි 22 වන දින ලෝක වෙළඳ සංවිධානයේ (WTO) වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ ගිවිසුම (TFA) බලාත්මක වූ විට, රටවල් අතර වෙළඳාමේ දී විනිවිදභාවය සහ පුරෝකථනය කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා TFA විසින් නියම කරන ලද ප්‍රමිතීන් ළඟාකර ගැනීමට ශ්‍රී ලංකාව විසින් සපුරාලිය යුතු බැඳීම් ගණනාවක් තිබුණි. බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) වැඩසටහන ආරම්භ කිරීම මෙම බැඳීම් සපුරාලීම සඳහා මූලික අවශ්‍යතාවයක් වන අතර මෙම කාර්යය සඳහා AEO ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම ඇති කරනු ලැබීය. උසස් මට්ටමේ සැපයුම් ජාල ආරක්ෂාවක්, මූල්‍ය ස්ථායීතාවක් සහ රේගු නීතියට අඛණ්ඩව අනුකූලතාවන් පෙන්නුම් කර ඇති නීත්‍යානුකූල ආනයනකරුවන් සහ අපනයනකරුවන් සඳහා පහසුකම් සැළසීම, AEO සංකල්පය මගින් අරමුණු කෙරේ. පරීක්ෂා කිරීම්, නිෂ්කාශන ප්‍රමුඛතාවන්, සාමාන්‍ය මීල පිරික්සුම් උපදෙස් සඳහා යොමු කිරීම් ආදිය අඩුකිරීම වැනි පහසුකම් ලැබීම මගින් පාර්ශවයන්ට ප්‍රතිලාභ ලැබිය හැකි වේ.

2024 වසරේදී බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) වැඩසටහනෙහි ජයග්‍රහණයන්

- බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) වැඩසටහනෙහි ව්‍යුහය, ක්‍රියාකාරිත්වය සහ පාලනය දක්වනු ලබන දෙපාර්තුමේනුත නියෝගය DOPL 1530A යටතේ සකස්කර, සමාලෝචනය කර ප්‍රකාශයට පත්කරන ලදී.
- වඩාත් කාර්යක්ෂම හා ඵලදායී මීල පිරික්සුම් ක්‍රියාවලියක් සඳහා බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) අයදුම් කිරීමේ ක්‍රියා පටිපාටිය සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.
- බලයලත් ආර්ථික මෙහෙයුම්කරු Tier 01 තත්වය සමාගම් 31ක් සඳහා ප්‍රදානය කරන ලදී.
- AEO වැඩසටහනෙහි ක්‍රියාකාරිව නියැළි නිලධාරීන් සඳහා AEO වලංගු කිරීම පිළිබඳ අභ්‍යන්තර පුහුණු ඇතුලු දැනුම සහ පළපුරුද්ද ලබාදීම සඳහා රේගු නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ සැසි පවත්වනු ලැබීය.
- අනෙකුත් පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී.

3. ක්‍රියාවලි නැවත සැකසීම සහ විමර්ශනය කිරීම

සිදුකරන ලද අවදානම් තක්සේරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ක්‍රියාවලි නැවත සැකසීමේ කණ්ඩායම විසින් ඒවායේ පවතින යම් දෝෂයක් සහ නීතියෙන් ගැලවීයාමේ මාර්ග හඳුනා ගැනීම සඳහා සම්පූර්ණ විශ්ලේෂණයක් සිදු කරනු ලැබීය. පද්ධතියේ පවතින හඳුනාගත් ගැටලු සහ එකී ගැටලු විසඳීම සඳහා වන නිර්දේශ අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සභාපතිත්වය දරන RMC හරහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අවධානය සඳහා වාර්තා කරන ලදී. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අනුමැතිය සහ නිර්දේශ මත, තවදුරටත් වැඩිදියුණු කිරීම් සිදුකිරීම සඳහා ප්‍රයෝජනවත් විය හැකි, යම් අවභිරතා හා සම්බන්ධ ගැටලු හඳුනා ගැනීම සඳහා RMD විසින් ක්‍රියාත්මක කිරීම් කිරීම් අඛණ්ඩව අධීක්ෂණය කරයි.

ක්‍රියාවලි නැවත සැකසීමේ ක්‍රියාවලියේ 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

- **ආනයනික නැව් භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලිය සඳහා විවිධ රාජ්‍ය ආයතන වල අනුමැතීන් අවශ්‍ය වේ. පවත්නා ක්‍රියා පටිපාටියට අනුව එම සියළුම බහාළුම් පරීක්ෂණ අංගන වෙත යොමු කරන ලදී.මෙම වසරේ අගභාගයේ පැවති බහාළුම් තදබදයට කාර්යක්ෂම විසඳුමක් ලෙස ශ්‍රී ලංකා රේගුව හැර විවිධ රාජ්‍ය ආයතන වල අනුමැතිය අවශ්‍යවන සම්පූර්ණ බහාළුම් තොග (FCL) ආනයනය කිරීම සඳහා බාහිර පැනල පහසුකම හඳුන්වාදෙන ලදී. එයට අදාළ රේගු ක්‍රියාවලිය සාර්තකව සකස් කර ක්‍රියාත්මක කරන ලද අතර බහාළුම් තදබදය කළමනාකරණය කිරීම සඳහා සහ බහාළුම් නිෂ්කාශනය කඩිනම් කිරීම සඳහා එය කාර්යක්ෂම මෙවලමක් බවට පත්විය.**

- **මෙම වසරේ අගභාගයේ පැවති බහාළුම් තදබදයට කාර්යක්ෂම විසඳුමක් ලෙස සහ සීමාසහිත ඉඩකඩ සහ පහසුකම් සමග පරීක්ෂණ අංගනයන්හිදී වීදුරු තහඩු (float glass) පරීක්ෂා කිරීමේ ස්වභාවය සහ අපහසුතාවන් සැළකිල්ලට ගෙන වීදුරු තහඩු ආනයනය කරන අඩු අවදානම් හිත ආනයනකරුවන්ගේ ලැයිස්තුවක් හඳුනාගෙන බාහිර පැනල පහසුකම ප්‍රදානය කරන ලදී.**

විමර්ශන

ඒ සඳහා කැප වූ පළපුරුදු විමර්ශන නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් රේගු ක්‍රියාවලි වල පවතින අවදානම් ක්ෂේත්‍ර සහ දෝෂ හඳුනා ගැනීමේ අභිලාෂය ඇතිව විවිධ වංචා හසුකර ගැනීම සහ විමර්ශනය කිරීම සිදු කරයි. විවිධ අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ අරමුණු ළඟාකර ගැනීමේදී වරණීයතාවය සහ නැවත සැකසීමේ ක්‍රියාවලිය සහයකර ගැනීම එකී විමර්ශන වල මූලික අරමුණ වේ. 2024 වසරේදී සිදුකරන ලද විමර්ශන වල සාරාංශයක් පහත දක්වා ඇත.

වගුව 01. 2024 වර්ෂයේ විමර්ශන සාර්ථක කරගැනීම්

1	**2024** වර්ෂයේ ආරම්භ කරන ලද මුළු සිද්ධි සංඛ්‍යාව	108
2	නඩු පැවරීමට නියෝග කරන ලද මුළු සිද්ධි සංඛ්‍යාව **(**නිමකරන ලද **+** අපහරණය කරන ලද භාණ්ඩ සමග **+** ගෙවීම් සිදුකරන ලද **+** බැංකු ඇපකර නිදහස් කරන ලද**)**	73
3	**2024** වර්ෂයේ ආරම්භ කරන ලද සිද්ධි වලින් අයකරගැනිම් සහිත මුළු සිද්ධි සංඛ්‍යාව	66
4	**2024** වර්ෂයේ ආරම්භ කරන ලද සිද්ධි වලින් මුළු NFA සිද්ධි සංඛ්‍යාව	7
5	**2024** වර්ෂයේ ආරම්භ කරන ලද සිද්ධි වලින් මුළු විමර්ශන සිද්ධි සංඛ්‍යාව	35
6	සාර්ථකත්ව අනුපාතය **(**අයකරගැනිම් සහිත සිද්ධි**/** නඩු පැවරීමට නියෝග කරන ලද මුළු සිද්ධි සංඛ්‍යාව *** 100)**	90.41 %
7	මුළු දඩ **+ AE + 2024** වර්ෂයේ ආරම්භ කරන ලද සිද්ධි වලින් විකුණුම් ආදායම සහ රාජසන්තක කිරීම් **(**රු.**)**	368,945,211
8	සාර්ථකත්ව අනුපාතය සඳහා සාමාන්‍ය අයකර ගැනීම් **(**රු.**)**	5,590,079
9	**2024** වර්ෂයේ ආරම්භ කරන ලද සිද්ධි වලින් මෙතෙක් කල් ගෙවන ලද මුළු අයකර ගැනිම් ප්‍රමාණය **(**රු.**)**	368,945,211
10	**2024** වර්ෂය ආරම්භයේදී අවසන් නොවූ මුළු සිද්ධි සංඛ්‍යාව	154
11	**2024** වර්ෂය ආරම්භයේදී අවසන් නොවූ මුළු සිද්ධි සංඛ්‍යාවෙන් අවසන් කළ මුළු සිද්ධි සංඛ්‍යාව	53
12	**2024** වර්ෂය ආරම්භයේදී අවසන් නොවූ මුළු සිද්ධි සංඛ්‍යාවෙන් පරීක්ෂන සිදුකෙරෙමින් පවතින මුළු සිද්ධි සංඛ්‍යාව	101
13	මුළු දඩ + AE + **2024** වර්ෂය ආරම්භයේදී අවසන් නොවූ මුළු සිද්ධි සංඛ්‍යාවෙන් විකුණුම් ආදායම සහ රාජසන්තක කිරීම් **(**රු.**)**	43,817,113

4. ජාතික ආනයන මිල පරීක්සුම් දත්ත ගබඩා ඒකකය (NIVDU) වෙබ් පෝටලය සහ දත්ත ගබඩාව නඩත්තු කිරීම.

අවදානම් කලමනාකරණ අරමුණු සඳහා දත්ත ගබඩාව වැඩිදියුණු කිරීම් සහ පුළුල් කිරීම් වේගවත් කිරීම සඳහා **2023** වසරේදී ජාතික ආනයන මිල පිරික්සුම් දත්ත ගබඩා ඒකකය **(NIVDU)** අවදානම් කළමනාකරණ අංශය යටතට ගනු ලැබීය. අපනයන භාණ්ඩයන්හි අදාල වටිනාකම පමණක් නොව අදාල නිලධාරීන්ට පහසුකම් සළසන විවිධ මෙහෙයුම් මෙවලම් වැඩිදියුණු කර ඇති අතර මිල පරීක්සුම් ඒකකයේ නිලධාරීන්ට මෙන්ම අනෙකුත් අදාල නිලධාරීන් සඳහා මිල පිරික්සුම් දත්ත පද්ධතියට ප්‍රවේශය ලබා දී ඇත. ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතියක් වැඩිදියුණු කිරීම සඳහා පදනම ලෙස ද දත්ත ගබඩාව භාවිතාවේ.

මිල පිරික්සුම් දත්ත ගබඩාවේ ජයග්‍රහණයන්

- ගනුදෙනු අගයන් **2831**ක් යාවත්කාලින කරන ලදී.
- NIVDU පෝටලය අවදානම් කළමනාකරණ පද්දති වෙබ් පෝටලයට මාරු කිරීම
- NIVDU පරිශීලක ගිණුම් **55**ක් ප්‍රදානය කරන ලදී.

ශ්‍රී ලංකා රේගුව සඳහා ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතියක් වැඩිදියුණු කිරීම.

ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතිය (ARMS) ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකා රේගුවේ අවදානම් කළමනාකරණ රාමුව තුළ ක්‍රියාත්මක කළ යුතු වැදගත් කාර්යයක්වේ. ARMS අත්පත්කර ගැනීමේ අවශ්‍යතාවය මුදල් අමාත්‍යාංශය ඇතුලුව ඉහළ කළමනාකාරිත්වයට ද දන්වනු ලැබීය. කෙසේවුවද, වෙළඳපලෙහි ඇති අවදානම් කළමනාකරණ විසඳුම් මිල අධික බැවින් එකී පද්ධති මිලදී ගැනීම ඇනහිට ඇත. නියමිත පරිදි නිමවූ අවදානම් කළමනාකරණ පද්ධතියක වැදගත්කම හඳුනා ගනිමින්, අවදානම් කළමනාකරණ අංශය විසින් ආයතනිකව අවදානම් කළමනාකරණ පද්ධතියක් වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයක නිරතව සිටී. මෙම කාර්යයයේ මූලික පියවර සනිටුහන් කරමින් පද්ධතියේ මූලාකෘතිය සාර්ථකව නිමකර ඇත. එය උසස් තත්වයේ පූර්ණ ක්‍රියාකාරී පද්ධතියක් බවට පත් කිරීම සඳහා මෘදුකාංග වැඩිදියුණු කිරීමේ නිපුණ කාර්ය මණ්ඩලයක් එම කාර්යයයේ නිරත වනු ඇත. මෙම වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැළසීමට, රජය විසින් 2024 මූල්‍ය වර්ෂය සඳහා මේ සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

2024.08.15 දින සමස්ත ව්‍යාපෘතිය අදියර දෙකකට බෙදන ලදී. ARMS **අදියර 1 ප්‍රසම්පාදනය 2024.09.24-2024.12.30 අතර කාලය තුළ සිදුකරන ලදී. මේ අතර,** ARMS **අදියර 1 ප්‍රසම්පාදනය සඳහාවන ටෙන්ඩර් පටිපාටිය සම්පූර්ණ කර සාර්ථක ලංසුකරුට ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. 2024 වර්ෂය සඳහා වෙන් කරන ලද රු. මිලියන 100 න් මිලියන 58ක් විශේෂ තැන්පතුවක් ලෙස සුරක්ෂිත කරන ලදී.** ARMS **අදියර 1 ප්‍රසම්පාදන පටිපාටිය සම්පූර්ණ කර ඇති අතර වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.**

2024 ක්‍රියාකාරී සැලැසම් අනුව කාර්යසාධනය

මූලික ක්ෂේත්‍රය	කාර්යයන්	ගතයුතු ක්‍රියාමාර්ග	ප්‍රධාන කාර්යසාධන දර්ශක	තත්වය	
				ප්‍රතික්ෂේපිත	සම්පූර්ණ කරන ලද
අවදානම් පාදක භාණ්ඩ වරණීයතාවය සහ අවදානම් කළමනාකරණය					
1. ශ්‍රී ලංකා රේගුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සහ අධීක්ෂණය කිරීම	1. **RMC** සමඟ සම්බන්ධීකරණය	1. **RMC** සඳහා අවදානම් විශ්ලේෂණ වාර්තා පිළියෙල කිරීම	RMC වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සංඛ්‍යාව	අදාළ නොවේ	වාර්තා **50**
		2. වෙළඳුන්ගේ ඉල්ලීම් පදනම් කර ගෙන **RMC** සඳහා වාර්තා පිළියෙල කිරීම	RMC වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සංඛ්‍යාව	අදාළ නොවේ	වාර්තා **21** (DC – RMD වෙත ඉදිරිපත් කරන ලදී.)
		3 RMC රැස්වීම් කැඳවීම	කැඳවන ලද රැස්වීම් සංඛ්‍යාව	වසරකට **12**	රැස්වීම් **12**ක් කැඳවන ලදී.
		4. RMC රැස්වීම් සඳහා සහභාගී වීම	සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව	වසරකට **12**	රැස්වීම් **12**කට සහභාගී විය.
		5. රැස්වීම් වාර්තා සකස් කිරීම සහ බෙදා හැරීම	සකස්කරන ලද රැස්වීම් වාර්තා සංඛ්‍යාව	වසරකට **12**	රැස්වීම් **12**කට සටහන් බෙදාහරින ලදී.
	2.සැම අංශයකම අවදානම් වාර්තා කිරීමේ නිලධාරීන් (RRO) සමඟ සම්බන්ධීකරණය කිරීම (RRO)	1. අවදානම් වාර්තා කිරීමේ නිලධාරීන් සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ සැසි මෙහෙයවීම	පවත්වන ලද පුහුණුවීම් සංඛ්‍යාව	අදාළ නොවේ	නිලධාරීන් හිඟය, කාලය ප්‍රමාණවත් නොවීම සහ ස්ථාන මාරුවීම් වල ප්‍රතිඵලයක් ලෙස අවදානම් වාර්තා කිරීමේ නිලධාරීන් වෙනස්වීම හේතුවෙන් සම්පූර්ණ කිරීමට නොහැකිවිය.
		2. අවදානම් වාර්තා කිරීමේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව	අදාළ නොවේ	
		3. පවත්නා ක්‍රියාවලිය තුළ අවදානම් සහ ගැටළු හඳුනාගැනීම	විසඳන ලද ගැටළු සංඛ්‍යාව	අදාළ නොවේ	
	3. අනෙකුත් නියාමන අධිකාරීන් සහ අනෙකුත් දේශ සීමා නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය කිරීම	1. ORA සහ අනෙකුත් දේශ සීමා නියෝජිතායතන සමඟ සාකච්ඡා කිරීම	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව	අදාළ නොවේ	රැස්වීම් **09**
		3. අදාළ 4. MOU/ ලේඛන/ උපදෙස් සකස් කිරීම	සකස්කරන ලද ලේඛන සංඛ්‍යාව	අදාළ නොවේ	ලිපි හුවමාරු **09**
		3. පවත්නා ක්‍රියාවලිය තුළ අවදානම් සහ ගැටළු හඳුනාගැනීම	හඳුනාගන්නාලද ගැටළු සංඛ්‍යාව	අදාළ නොවේ	අවභිරතාවයන් **06** ක් හඳුනාගෙන නිවැරදිකර ඇත.
	4. කාර්යක්ෂම අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් සඳහා අධීක්ෂණය කිරීම	1.අවදානම් කළමනාකරණ අංශයේ, අවදානම් වාර්තා කිරීමේ සහ RMC නිලධාරීන් සමඟ සාකච්ඡා කරන ලදී.	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව	අදාළ නොවේ	රැස්වීම් **34**
		2.අවදානම් ලැයිස්තුව සමාලෝචනය කිරීම.	සකස්කරන ලද ලේඛන සංඛ්‍යාව	අදාළ නොවේ	ලේඛන **02**

		3. අවදානම් ලැයිස්තුව යාවත්කාලින කිරීම සහ RMC වෙතින් අනුමැතිය ලබාගැනීම.	අවදානම් ලැයිස්තුවේ සිදුකරන ලද යාවත්කාලීන සංඛ්‍යාව	අදාළ නොවේ	නිලධාරීන් හිඟය සහ කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සම්පූර්ණ කිරීමට නොහැකිවිය.
2. කාර්යක්ෂම භාණ්ඩ වරණීය ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම	1. පරීක්ෂා කිරීමකින් තොරව වංචා සහගත භාණ්ඩ තොග නිදහස් කිරීම අවම කිරීම සහ ආක්‍රමණශීලී නොවන පරීක්ෂාකිරීමකට යටත්ව අඩු අවදානම් සහිත භාණ්ඩ තොග නිදහස් කිරීම.	1. වර්තමාන වරණීය රීති/ලැයිස්තු සමාලෝචනය කිරීම	පවත්වන ලද සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව	අදාළ නොවේ	සමාලෝචන රැස්වීම් **221**
		2. වරණීය රීති වෙනස්වීම් පිළිබඳව ශක්‍යතාව තක්සේරු කිරීම	වරණීය රීති පිළිබඳ සමාලෝචන සංඛ්‍යාව	අදාළ නොවේ	සමාලෝචන **64**
		3. වරණීය ලැයිස්තු වෙනස්වීම් පිළිබඳව ශක්‍යතාව තක්සේරු කිරීම	වරණීය ලැයිස්තු පිළිබඳ සමාලෝචන සංඛ්‍යාව	අදාළ නොවේ	සමාලෝචන **267**
		4. වරණීය රීති වෙනස්වීම් පිළිබඳව සමාකරණ ක්‍රියාත්මක කිරීම	රීති වෙනස්වීම් පිළිබඳව ක්‍රියාත්මක වූ සමාකරණ සංඛ්‍යාව	අදාළ නොවේ	සමාකරණ **224**
		5. වරණීය ලැයිස්තු වෙනස්වීම් පිළිබඳව සමාකරණ ක්‍රියාත්මක කිරීම	ලැයිස්තු වෙනස්වීම් පිළිබඳව සමාකරණ සංඛ්‍යාව	අදාළ නොවේ	සමාකරණ **567**
		6. වරණීය රීති සඳහා සංශෝධන සිදුකිරීම	සිදුකරණ ලද රීති සංශෝධන සංඛ්‍යාව	අදාළ නොවේ	සංශෝධන **37 (රීති 30)**
		7. වරණීය ලැයිස්තු සඳහා සංශෝධන සිදුකිරීම	සිදුකරණ ලද ලැයිස්තු සංශෝධන සංඛ්‍යාව	අදාළ නොවේ	සංශෝධන **148 (ලැයිස්තු 126)**
	2.භාණ්ඩ වරණීයතාවය පිළිබඳ පුහුණුව සහ දැනුවත් කිරීම	1. වරණීයතාවය පිළිබඳ අභ්‍යන්තර පුහුණු පැවැත්වීම	පවත්වන ලද පුහුණු සැසි සංඛ්‍යාව	අදාළ නොවේ	පුහුණු **20**
		2. දැනුවත් කිරීමේ සැසි සහ සාකච්ඡා පැවැත්වීම	දැනුවත් කිරීමේ සැසි සහ සාකච්ඡා සංඛ්‍යාව	අදාළ නොවේ	දැනුවත් කිරීමේ සැසි **07**
	3. අවදානම් පාදක භාණ්ඩ වරණීයතාවය අධීක්ෂනය කිරීම	1.අවදානම් වාර්තා කිරීමේ පුවරු සකස් කිරීම	අවදානම් වාර්තා කිරීමේ පුවරු ක්‍රියාත්මක කෙරෙමින් පවතී.	Complete by 30.06.2024	සම්පූර්ණ කරන ලදී
		2. දෛනික/මාසික සාරාංශ වාර්තා සකස් කිරීම	සකස්කරන ලද දෛනික/මාසික සාරාංශ වාර්තා සංඛ්‍යාව	අදාළ නොවේ	වාර්තා **125**
		3. සාරාංශ වාර්තා විශ්ලේෂණය කිරීම	විශ්ලේෂණය කරන ලද සාරාංශ වාර්තා සංඛ්‍යාව	අදාළ නොවේ	විශ්ලේෂණ **80**
		4. සකස්කරන ලද වාර්තා පිළිබඳ සාකච්ඡා	සකස්කරන ලද වාර්තා මත පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව	අදාළ නොවේ	රැස්වීම් **45**
		5.අවශ්‍යතාවන් මත වෙනත් ඕනැම විශ්ලේෂණයක් සහ සාකච්ඡා පැවැත්වීම	විශ්ලේෂණ සහ සාකච්ඡා සංඛ්‍යාව	අදාළ නොවේ	විශ්ලේෂණ **32**
	4.ස්වයංක්‍රිය අවදානම් කළමනාකරණ පද්ධතියක්	1. පද්ධති පිරිවිතර පිළිබඳ සම්පූර්ණ ලේඛන සකස් කිරීම	පද්ධති පිරිවිතර ලේඛන සකස් කෙරෙමින් පවතී.	**2024.03.31** දිනට සම්පූර්ණ කිරීම	සම්පූර්ණ කරන ලදී

	සකස්කර පවත්වා ගැනීම (ARMS)	2. ARMS හි මූලාකෘති සකස් කිරීම සම්පූර්ණ කිරීම	මූලාකෘති සකස් කෙරෙමින් පවතී.	**2024.03.31** දිනවන විට සම්පූර්ණ කිරීම	සම්පූර්ණ කරන ලදී
		3. ARMS වැඩිදුර දියුණු කිරීම සඳහා අතිරේක මූල්‍ය සහාය ඉල්ලා සිටීම	ගන්නා ලද ප්‍රයත්නයන් සංඛ්‍යාව	**2024.03.31**	ප්‍රයත්නයන් **05** **2024** වෙන්කිරීම් ARMS අදියර **1** සඳහාවන විශේෂ තැන්පතුවකට මාරු කරන ලද අතර පළමු ගෙවීම **2025.01.31** දින වන විට කරනු ඇත.
		4. ARMS සකස්කිරීම සඳහා සුදුසු පද්ධති සංවර්ධන/ යාන්ත්‍රණයක් සොයාගැනීම	සංවර්ධකය සකස් කෙරෙමින පවතී.	**2024.03.31** දිනවන විට සම්පූර්ණ කිරීම	**2024.08.05** දින ව්‍යාපෘතිය අදියර දෙකකට බෙදන ලදී. ARMS අදියර **1** සංවර්ධනය සඳහාවන ටෙන්ඩර් පටිපාටිය සම්පූර්ණ කර සාර්ථක ලංසුකරුට ව්‍යාපෘතිය පිරිනමන ලදී. කොන්ත්‍රාත්තු අත්සන් කිරීම සිදු කෙරෙමින් පවතින අතර මූලික කාර්යයන් සිදු කෙරෙමින් පවතී.
		5. ARMS සකස් කිරීම අවසන් කිරීම.	ARMS අවසන් වෙමින් පවතී.		
		6. ARMS පරීක්ෂා කිරීම සහ සමාකරණය	සිදුකරන ලද සමාකරණ/Cusdec පරීක්ෂා කිරීම් සංඛ්‍යාව	අදාළ නොවේ	ARMS ක්‍රියාත්මක කිරීම සමග සිදු කිරීමට නියමිතයි.
		7. ARMS ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම	ARMS ක්‍රියාත්මක වෙමින් පවතී.		
		8. ARMS හි ක්‍රියාකාරිත්වය සමාලෝචනය සහ සංශෝධනය කිරීම	සිදුකරන ලද සමාලෝචන සහ සාකච්ඡා සංඛ්‍යාව		
	5. ASYHUB ව්‍යාපෘතියේ භාණ්ඩ වරණීයතාවය පිළිබඳ UNCTAD සහ ICT අංශය අතර සම්බන්ධීකරණය කිරීම.	1. ICT/UNCTAD සමග සම්බන්ධ වී යෝජිත ASYHUB ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වයේ පිරිවිතර ලබාගැනීම.	පවත්වන ලද රැස්වීම්/සන්නිවේදනයන් සංඛ්‍යාව	අදාළ නොවේ	08
		2. භාණ්ඩ වරණීයතාවයට අදාළ යෝජිත ASYHUB ව්‍යාපෘතිය පිළිබඳව ICT/UNCTAD සමග සාකච්ඡා කිරීම.	පවත්වන ලද රැස්වීම්/සන්නිවේදනයන් සංඛ්‍යාව	අදාළ නොවේ	08
		3. ASYHUB හි නව වරණීය ක්‍රියාපටිපාටිය සැලසුම් කිරීම	පවත්වන ලද රැස්වීම්/සන්නිවේදනයන් සංඛ්‍යාව	අදාළ නොවේ	08
		4.ASYHUB හි වරණීයතාවය ක්‍රියාත්මක කිරීම	ASYHUB වරණීයතාවය ක්‍රියාත්මක වෙමින් පවතී.		ප්‍රගතිය සඳහා ICT මඟින් ASYHUB ක්‍රියාත්මක කිරීමට අපේක්ෂාවෙන් සිටී.

බලයලත් ආර්ථික මෙහෙයුම්කරු **(AEO)** වැඩසටහන					
3. අනුකූල ආර්ථික මෙහෙයුම්කරු **(CEO)** සහ බලයලත් ආර්ථික මෙහෙයුම්කරු වැඩසටහන් **(AEO)** ඉහළ නැංවීම	1.AEO කමිටුව සමග සම්බන්ධීකරණය කිරීම	1. AEO කමිටු රැස්වීම් කැඳවීම	කැඳවන ලද රැස්වීම් සංඛ්‍යාව	අදාළ නොවේ	රැස්වීම් **06**
		2. AEO කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම	සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව	අදාළ නොවේ	රැස්වීම් **06**
		3. AEO කමිටු රැස්වීම් සටහන් සකස් කිරීම	සකස් කරන ලද රැස්වීම් සටහන් සංඛ්‍යාව	අදාළ නොවේ	රැස්වීම් **06**
	2.AEO වැඩසටහන් පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම	1. අයදුම්පත් පරීක්ෂා කිරීම සහ වලංගු කිරීම පිළිබඳව රේගු කාර්ය මණ්ඩලයට දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම	දැනුවත් කිරීමේ සැසි සංඛ්‍යාව	අදාළ නොවේ	සැසි **12**
		2. ආර්ථික මෙහෙයම්කරුවන් සඳහා දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම	දැනුවත් කිරීමේ සැසි සංඛ්‍යාව	අදාළ නොවේ	USAID සහාය වූ සැසි **01**
	3. ඉදිරිපත් කරන ලද අයදුම්පත් අවසන් කිරීම	1. ඉදිරිපත් කරන ලද අයදුම්පත් වලංගු කිරීම	වලංගු කරන ලද අයදුම්පත් සංඛ්‍යාව	20.03.2024	අයදුම්පත් **70**
		2. ස්ථිතීන් සඳහා AEO (Tier 1) තත්වය ප්‍රදානය කිරීම	ප්‍රදානය කරන ලද ස්ථිතීන් සංඛ්‍යාව	31.03.2024	ස්ථිතීන් **31** (**2024.07.30** දින ප්‍රදානය කරන ලදී)
	4. නව අයදුම්පත් ලබාගැනීම සහ සකස් කිරීම	1. නව අයදුම්පත් ලබාගැනීම	ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව	අදාළ නොවේ	අයදුම්පත් **108**
		2. නව අයදුම්පත් සකස් කිරීම	සකස් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව	අදාළ නොවේ	අයදුම්පත් **108**
		3. වෙළඳුන් සඳහා AEO (Tier 1) තත්වය ප්‍රදානය කිරීම	ප්‍රදානය කරන ලද ස්ථිතීන් සංඛ්‍යාව	අදාළ නොවේ	ස්ථිතීන් **31**
	5. AEO වලංගු කිරීමේ සංචිතය ශක්තිමත් කිරීම	1. AEO වලංගුකරුවන් ලෙස නිලධාරීන් හඳුනාගැනීම	හඳුනාගන්නා ලද නිලධාරීන් සංඛ්‍යාව	29.02.2024	නිලධාරීන් **14**
		1. වලංගුකරුවන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද පුහුණු සංඛ්‍යාව		**2024** මාර්තු පුහුණු **02**ක් පවත්වන ලදී.
ජාතික ආනයන මිල පිරික්සුම් දත්ත ගබඩාව					
4. ජාතික ආනයන මිල පිරික්සුම් දත්ත ගබඩාව **(NIVDB)** සංවර්ධනය කර වැඩි දියුණු කිරීම	1. NIVDB වැඩිදියුණු කර RMS වෙත ඒකාබද්ධ කිරීම	1. NIVDB , ARMS මූලාකෘතිය සමග ඒකාබද්ධ කිරීම සම්පූර්ණ කිරීම	NIVDB , ARMS මූලාකෘතිය සමග ඒකාබද්ධ කිරීම් සිදු කෙරෙමින් පවතී.	31.03.2024	සම්පූර්ණ කරන ලදී
	2. NIVD වෙබ් පෝටලය සහ	1. ගනුදෙනු අගයන් මිල පිරික්සුම් දත්ත ගබඩාවට එක් කිරීම	එකතු කරන ලද යොමු අගයන් සංඛ්‍යාව	අදාළ නොවේ	අගයන් 2831

	දත්ත ගබඩාව නඩත්තු කිරීම	2. පිරික්සුම් දත්ත ගබඩාවට අගයන් එකතු කිරීම	එකතු කරන ලද යොමු අගයන් සංඛ්‍යාව	අදාළ නොවේ	00 (කාර්ය මණ්ඩලය නිහවීම)
		3. NIVDB සඳහා HS මාර්ගෝපදේශ වැඩිදුර දියුණු කිරීම	එකතු කරන ලද HS කේත සංඛ්‍යාව	අදාළ නොවේ	00 (කාර්ය මණ්ඩලය නිහවීම)
		4. පරිශීලකයින් සඳහා ඇති උපාග වැඩිදියුණු කිරීම	සිදු කරන ලද වැඩිදියුණු කිරීම් සංඛ්‍යාව	අදාළ නොවේ	වැඩිදියුණු කිරීම් 08
		5. NIVDB භාවිතය පුළුල් කිරීම	ප්‍රදානය කරන ලද පරිශීලක ගිණුම් සංඛ්‍යාව	අදාළ නොවේ	පරිශීලක ගිණුම් 55
			ක්‍රියාවලි නැවත සැකසීම සහ විමර්ශනය කිරීම		
5. ක්‍රියාවලි නැවත සැකසීම සහ විමර්ශනය කිරීම	1. පවත්නා රේගු ක්‍රියාවලියේ දුර්වලතා අවම කිරීම සඳහා අවදානම සහ ගැටළු පවතින පවත්නා ක්‍රියාවලි නැවත සකස් කිරීම	1. මෙහෙයුම් ඒකක සමග සාකච්ඡා පැවැත්වීම	පවත්වන ලද සාකච්ඡා සංඛ්‍යාව	අදාළ නොවේ	සාකච්ඡා 15
		2. පවත්නා ක්‍රියාවලි සිතියම් ගත කිරීම	සිතියම්ගත කරනලද ක්‍රියාවලි සංඛ්‍යාව	අදාළ නොවේ	ක්‍රියාවලි 02 (Out panel සහ OGA Out panel)
		3. දුර්වලතා හඳුනා ගැනීම	නැවත සකස් කිරීම සඳහා හඳුනාගන්නා ලද ක්‍රියාවලි සංඛ්‍යාව	අදාළ නොවේ	ක්‍රියාවලි 07
		4. නැවත සැකසීමේ ක්‍රියාවලිය අවසන් කිරීම	අවසන් කරන ලද ක්‍රියාවලි සංඛ්‍යාව	අදාළ නොවේ	ක්‍රියාවලි 02
		5. නැවත සැකසීමේ ක්‍රියාවලිය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම	සකස් කරන ලද මාර්ගෝපදේශ සංඛ්‍යාව	අදාළ නොවේ	මාර්ගෝපදේශ 02
		6. නැවත සැකසීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම	ක්‍රියාත්මක කරන ලද නැනැවත සක්ස කරන ලද ක්‍රියාවලි සංඛ්‍යාව	අදාළ නොවේ	ක්‍රියාවලි 02
	2. අවදානම් පැහැදිලි සහ ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාව තහවුරු කරගැනීම සඳහා ආනයන සහ අපනයනයන්හි අවදානම පරීක්ෂා කිරීම	1. බහාළුම් රඳවාගැනීම සහ පරීක්ෂණ පැවැත්වීම	ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව	අදාළ නොවේ	සිද්ධි 108
		2.වරණීයතාවය සඳහා රඳවාගත් බහාළුම්වල පරීක්ෂන වල ප්‍රතිඵල වාර්තා කිරීම	රඳවාගත් බහාළුම් සංඛ්‍යාව සහ වාර්තා කරන ලද ප්‍රතිඵල	අදාළ නොවේ	බහාළුම් 133
		3. පරීක්ෂා කිරීම් වලින් අයවිය යුතු ගාස්තු අයකර ගැනීම	පරීක්ෂණ මගින් අයකර ගත් A/E, දඩ සහ රාජසන්තක කිරීම්	අදාළ නොවේ	දඩ – රු. 359,022,346 A/E –රු. 9,922,865
		4.ආරම්භ කරන ලද සිද්ධි අවසන් කිරීම	අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව	අදාළ නොවේ	සිද්ධි 71
	3. අවසන් නොවූ සිද්ධි අවසන් කිරීම	1. අවසන් නොවූ සිද්ධි වල පරීක්ෂණ අවසන් කිරීම	අවසන් කරන ලද අවසන් නොවී තිබූ සිද්ධි සංඛ්‍යාව	අදාළ නොවේ	සිද්ධි 16
	4.රඳවාගත් බහාළුම් නිදහස් කිරීම	1. දිගු කාලයක් රඳවාගෙන තිබූ බහාළුම් නිදහස් කිරීම සහ සිද්ධි අවසන් කිරීම	නිදහස් කරන ලද බහාළුම් සංඛ්‍යාව	31.12.2024	බහාළුම් 04

	5. nCEN සහ eCCR යාවත්කාලීන කිරීම	1. nCEN සහ eCCR යාවත්කාලීන කිරීම අවසන් කරන ලද සිද්ධි වල වංචා කේත	CEN, eCCR හි යාවත්කාලීන කරන ලද සිද්ධි සංඛ්‍යාව සහ වංචා කේත	අදාළ නොවේ	සිද්ධි 71
	6. ත්‍යාග බෙදාහැරීමේ ලැයිස්තු සකස් කිරීමes	1.ත්‍යාග බෙදාහැරීමේ ගොනු සකස් කිරීම	සකස් කරන ලද ත්‍යාග බෙදාහැරීමේ ගොනු සංඛ්‍යාව	අදාළ නොවේ	ත්‍යාග බෙදාහැරීමේ ලැයිස්තු 08
හඳුන්වාදුන් නවෝත්පාදන ක්‍රියාමාර්ග					
	1. Consignment status යෙදුමේ විකාශනය	1. අතුරු මුහුණත සකස් කිරීම	අතුරු මුහුණත සකස් කරමින් පවතී.	අදාළ නොවේ	සම්පූර්ණ කරන ලදී
		2. අරමුදල් සොයාගැනීම	අරමුදල් වෙන් කිරීම	අදාළ නොවේ	සම්පූර්ණ කරන ලදී
		3. ජංගම සේවා සඳහා යෙදුම හඳුන්වා දීම	යෙදුම හඳුන්වා දෙමින් පවතී.	අදාළ නොවේ	2025 මැයි වන විට සම්පූර්ණ කිරීමට නියමිතයි.
		4. යෙදුම ප්‍රවර්ධනය කිරීම 5. යෙදුම අධීක්ෂණය සහ සංශෝධනය කිරීම		අදාළ නොවේ	ප්‍රවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම සහ සංශෝධන ARMS අදියර **1** සමඟ Phase 1
	2. ආදායම් පුවරු හඳුන්වාදීම	1. ආදායම් පුවරු හඳුන්වාදීම	පුවරු ක්‍රියාත්මක වෙමින් පවතී.	අදාළ නොවේ	සම්පූර්ණ කරන ලදී
	3. අවදානම් පුවරු හඳුන්වාදීම	1. අවදානම් පුවරු හඳුන්වාදීම	පුවරු ක්‍රියාත්මක වෙමින් පවතී.	අදාළ නොවේ	සම්පූර්ණ කරන ලදී
	4. ASYCUDA හි පරීක්ෂණ ක්‍රියාව නවීකරණය කිරීම	1. සකස්කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම ICT සමඟ සාකච්ඡා කිරීම	නව වංචා කේත ඇතුළත් කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක වෙමින් පවතී.	අදාළ නොවේ	ICT සහාය ඇතිව නව වංචා කේත පද්ධතියක් සකස් කර ඇති අතර දැනට එය පරීක්ෂණ අදියරේ පවතී.
	5.බලාත්මක කිරීම සඳහා භාණ්ඩ තොග ස්වයංක්‍රීය අවදානම් පාදක වරණීයතාවය	1. ක්‍රියාත්මක කරන ලදී.	ක්‍රියාත්මක කරන ලදී.	අදාළ නොවේ	Completed

8.1.7 මධ්‍යම අපහරණ අංශය

අදාල අභ්‍යන්තර සහ බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් රාජසන්තක කරන ලද/ අත්හැර දමන ලද භාණ්ඩ සම්බන්ධයෙන් සියලු අපහරණයන් මධ්‍යගතව සිදුකිරීම සඳහා නව අංශයක් ලෙස **2019** වසරේදී මධ්‍යම අපහරණ අංශය **(CDD)** ස්ථාපනය කරනු ලැබීය.

දැක්ම

"ශක්තිමත් දේශ සීමාවන් හරහා ආරක්ෂිත හා සමෘද්ධිමත් දේශයක් "

ශ්‍රී ලංකා රේගුවේ ඇති රාජසන්තක කරන ලද/අත්හැර දමන ලද භාණ්ඩ අපහරණය කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සලසන අතර ආදායම එකතු කිරීම සහ සමාජ ආරක්ෂණය බලාත්මක කිරීම මගින් හොඳම, ක්‍රියාශීලී සහ කාර්යක්ෂම සේවා සපයන්නා බවට පත්වීම.

මෙහෙවර

"ආදායම සුරක්ෂිත කිරීමත්, පරිසරය හා සමාජය ආරක්ෂා කිරීමත්, බාධක රහිත වෙළඳ ප්‍රවාහයක් මෙන්ම සංචාර ප්‍රවර්ධනය කිරීමත් සඳහා සුපිළිපන්භාවය සහ වෘත්තීයභාවය සහිත ලොව පළමු පෙළ රේගු සේවාවක් සැපයීම "

මධ්‍යම අපහරණ අංශය පහත සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කැපවීමෙන් ක්‍රියා කරයි.

- ශ්‍රී ලංකා රේගුවෙහි සමස්ත භාණ්ඩ අපහරණ ක්‍රියාවලිය මධ්‍යගත කොට ඒ සඳහා පහසුකම් සැපයීම.
- ටෙන්ඩර් අලෙවිය තුළින් ආදායම් රැස් කිරීම.
- භාණ්ඩ අපහරණ කරන අතරම සමාජයීය ආර්ථික වටිනාකමින් යුත් දෑ සංරක්ෂණය කිරීම.
- පාර්ශවකරුවන්ට විශිෂ්ට සේවාවක් ලබා ගැනීමට හැකි වන පරිදි භාණ්ඩ අපහරණ නීති බලාත්මක කිරීම.

මධ්‍යම අපහරණ අංශයේ ප්‍රධාන කාර්යයන්

- ටෙන්ඩර් අලෙවි පැවැත්වීම.
- අලෙවි කළ නොහැකි භාණ්ඩ විනාශ කිරීම.
- මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ **RMV** හි ලියාපදිංචි කිරීම මෝටර් වාහන සම්බන්ධ කිරීම, ශ්‍රී ලංකා වරාය අධිකාරි පනත යටතේ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් පවත්වනු ලබන ටෙන්ඩර/වෙන්දේසි සඳහා පහසුකම් සැලසීම.

නීති හා රෙගුලාසි

1. රේගු ආඥාපනතේ **16** වන වගන්තිය - ආනයනය සහ අපනයනය සම්බන්ධව නිවැරදි වේලාව අර්ථ දැක්වීම.
2. රේගු ආඥාපනතේ **105 (2)** වගන්තිය - භාණ්ඩ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බලතල
3. රේගු ආඥාපනතේ පනතේ **109** වන වගන්තිය - දින තිහක් තුළ ඉවත් කර නොගත් භාණ්ඩ විකිණීමට ඇති බලය
4. රේගු ආඥාපනතේ පනතේ **154** වන වගන්තිය - තහනමට ගත් භාණ්ඩ පිලිබඳව මාසයක් තුළ දී හිමිකම් පෑමක් නොකළහොත්, නුසුදුසු බවට ප්‍රකාශ කොට ඒවා සම්බන්ධයෙන් අනුව ක්‍රියා කළ යුතු බව
5. රේගු ආඥාපනතේ පනතේ **162** වන වගන්තිය - අල්වා ගැනීමෙන් පසු නීති විරෝධියැයි ප්‍රකාශ කල බඩු හා නැව් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා නියම කරන ආකාරයට සුදුස්සක් කළ හැකිය.
6. අංක **2016/06** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ
7. **2003** අංක **36** දරන බුද්ධිමය දේපළ පනත
8. **1969** අංක **01** දරන ආනයන හා අපනයන පාලන පනත
9. **1979** අංක **51** දරන ශ්‍රී ලංකා වරාය අධිකාරි පනත **(39/39 (2)/84 (3)**වගන්ති **)**
10. **1979** අංක **31** දරන මෝටර් රථ ප්‍රවාහන පනත
11. **1984** අංක **06** දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත
12. **1980** අංක **26** දරන ආහාර පනත
13. **2002** අංක **14** දරන එකතු කළ අගය මත බදු පනත
14. **2011** අංක **18** දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත
15. **1980** අංක **47** දරන ජාතික පාරිසරික පනත
16. **1999** අංක **35** දරන ශාක ආරක්ෂණ පනත
17. **1942** අංක **13** දරන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත
18. **1947** අංක **08** දරන වනාන්තර පනත
19. **1996** අංක **02** දරන ධීවර හා ජලජ සම්පත් පනත
20. **2015** අංක **05** දරන ශ්‍රී ලංකා ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත

2024 වසරේ මධ්‍යම අපහරණ අංශයේ කාර්ය සාධනය


1. ටෙන්ඩර් විකිණුම්

1.1. **2023** වර්ෂයේ සිදුකරන ලද ටෙන්ඩර් අලෙවි සංඛ්‍යාව

වගුව l.l: **2021, 2022** සහ **2023** වසර තුළ සිදුකරන ලද ටෙන්ඩර අලෙවි සංඛ්‍යාව

ටෙන්ඩර කාණ්ඩය	සිදුකරන ලද ටෙන්ඩර අලෙවි සංඛ්‍යාව		
	2022	2023	2024
සාමාන්‍ය	08	11	12
වාහන	08	11	12
විශේෂ	02	06	5
එකතුව	18	28	29


2024 වර්ෂයේදී මධ්‍යම අපහරණ අංශය මගින් සාමාන්‍ය ටෙන්ඩර් **12**ක්, වාහන ටෙන්ඩර් **12**ක්, සහ විශේෂ ටෙන්ඩර් **5**ක් අන්තර්ගතවන පරිදි සමස්ත ටෙන්ඩර් අලෙවි **29**ක් සිදුකර තිබේ. වාර්ෂික ටෙන්ඩර් විකිණුම් සමාලෝචනය කිරීමේදී මධ්‍යම අපහරණ අංශය විසින් **2022** වර්ෂයේදී **18**ක්ද **2023** වර්ෂයේදී **28**ක්ද සිදුකර ඇති අතර තවද **2024** වර්ෂයේදී මධ්‍යම අපහරණ අංශය මගින් ටෙන්ඩර් අලෙවි **29**ක් සිදු කර ඇති අතර එම අගය වාර්ෂික සාමාන්‍ය ටෙන්ඩර් අලෙවි සංඛ්‍යාව වන **24**ට වඩා ඉහළ අගයකි.



20221, 2023 සහ **2024** වසර වල සිදුකරන ලද ටෙන්ඩර් අලෙවි සංඛ්‍යාව අතර සංසන්දනය ඉහත රූපයේ දැක්වේ.

වගුව **1.2: 2024** වසරේ ටෙන්ඩර අලෙවි මගින් අයකර ගැනීම්


කාණ්ඩය	**2024** වසරේ උපයන ලද අයකර ගැනීම් (රු.)	ප්‍රතිශතය (%)
සාමාන්‍ය	2,167,350,986.67	87.30
වාහන	267,948,290.57	10.79
විශේෂ	47,299,555.80	1.9
එකතුව	**2,482,598,833.04**	**100**



2024 වසර තුළ සිදුකරන ලද ටෙන්ඩර අලෙවි මඟින් අයකර ගන්නා ලද මුළු එකතුව රු. මිලියන 2,482,598,833.04 කි. ඒ අතර සාමාන්‍ය ටෙන්ඩර් අලෙවි මඟින් රු. මිලියන 2,167,350,986.67 ක මුළු ප්‍රමාණයක් අයකර ගනු ලැබූ අතර එය **2024** වසරේ සමස්ත අයකර ගැනීම් වලින් 87.03% කි. විශේෂ ටෙන්ඩර සහ වාහන ටෙන්ඩර මඟින් අයකර ගැනීම් පිළිවෙලින් **1.9 %** සහ **10.79 %** කි.


1.2. සාමාන්‍ය භාණ්ඩ වල අයකර ගැනීම් ව්‍යාප්තිය

සාමාන්‍ය භාණ්ඩ විශේෂ සහ සාමාන්‍ය ටෙන්ඩර් අලෙවි යන දෙයාකාරයෙන් අලෙවි කෙරේ. සාමාන්‍ය රේගු ටෙන්ඩර් අලෙවි මඟින් අයකර ගැනීම් වල ප්‍රධාන භාණ්ඩ ව්‍යාප්තිය පහත පරිදි කාණ්ඩ කර දැක්වේ.



සාමාන්‍ය භාණ්ඩ වල ශුද්ධ අයකර ගැනීම් වලින් **73 %** ක් සඳහා දායක වන බැවින් සාමාන්‍ය ටෙන්ඩර් අලෙවි වල වඩාත් සැළකිය යුතු අංගය වන්නේ රත්‍රං සහ ඉහළ වටිනාකමකින් යුත් ද්‍රව්‍ය වේ. අනෙක් සියලු සාමාන්‍ය අයිතම එක්ව ගත්කළ **27 %** ක ප්‍රතිශතයක් පෙන්නුම් කරයි.

1.3 2022, 2023 සහ 2024 වසරවල කාර්ය සාධනය සන්සන්දනය



ඉහත රූපයේ දක්වා ඇති පරිදි පසුගිය වසර දෙක හා සංසන්දනය කළ විට **2024** වසර සඳහා සමස්ත අයකර ගැනීම් වල කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම්කර ඇත.

2. ආපසු නොගෙවන තැන්පතු මගින් අයකර ගැනීම්

ලංසුකරුවන් විසින් ලංසු ඉදිරිපත් කිරීමට අපේක්ෂිත එක් එක් අයිතමය සඳහා ඔවුන්ට නිකුත් කරන ලංසු ලේඛනයක් සඳහාම ආපසු නොගෙවන තැන්පතුවක් ලබා ගනී. මධ්‍යම අපහරණ අංශයේ දෙපාර්තමේන්තු නියෝග **1450** (DOPL 1450) මගින් අංක **06/2026** චක්‍රලේඛයට අනුකූලව මධ්‍යම අපහරණ අංශය විසින් ටෙන්ඩර අලෙවි සඳහා ආපසු නොගෙවන තැන්පතු ප්‍රතිපත්තිය **2020.05.26** දින සිට සංශෝධනය කර ඇත.

වර්ෂය	අයකරගැනීම්	ලංසු ලේඛන සංඛ්‍යාව
2022	1,645,800	1,098
2023	4,720,900	3,012
2024	3,291,700	2,161

3. විනාශ කිරීම්

අලෙවි කළ නොහැකි භාණ්ඩ (කල් ඉකුත් වූ භාණ්ඩ, බලපත්‍ර නිකුත් කිරීමේ බලධාරීන්ගේ ප්‍රමිතීන්ට අනුකූල නොවන භාණ්ඩ) විනාශ කිරීමට ලක්විය හැකිය. අදාල අංශ/ ආයතන වල ඉල්ලීම් මත මධ්‍යම අපහරණ අංශය විසින් විනාශ කිරීම් සඳහා පහසුකම් සලසනු ලැබේ.

විනාශ කිරීම් සඳහා ඉල්ලීම්	ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව	සිදුකරන ලද	සිදුකළ යුතුව ඇති
විවිධ ඉල්ලීම්	99	25	74
ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉල්ලීම්	29	08	21
එකතුව	128	33	95

2023 වර්ෂය සඳහා මධ්‍යම අපහරණ අංශයේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති පරිදි වර්ෂය සඳහා විනාශ කිරීම් **30**ක් සිදු කිරීමට අපේක්ෂා කර ඇති විටෙක **2024** වසරේදී මධ්‍යම අපහරණ අංශය විසින් විනාශ කිරීම් **33**ක් සාර්ථක ලෙස සිදු කරන ලදී. එය මධ්‍යම අපහරණ විසින් අත්කර ගත් විශාල ජයග්‍රහණයකි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉල්ලා සිටින ලද විනාශ කිරීම් වලින් **27.58 %** ක් සිදුකරන ලද අතර විවිධ ඉල්ලීම් වලින් **25.25%** ක් පමණක් නිමකර ඇත. සිදුකළ යුතුව ඇති විනාශ කිරීම් සඳහා ඇති ප්‍රධාන බාධකය වන්නේ විනාශ කිරීම් සඳහා සුදුසු පාර්ශවයන් පත්කිරීමට ප්‍රමාද වීම සහ තෝරාගත් පාර්ශවයන්ට ඒ සඳහා සහයෝගය දැක්වීමට නොහැකි වීමයි.

විනාශ කිරීමේ කටයුතු සඳහා පාර්ශවයන් තෝරාගත් පසුව සාධාරණ කාලසීමාවක් තුළ විනාශ කිරීම සඳහා අදාළ බලධරයින්ගෙන් අවශ්‍ය අනුමැතීන් ලබාදෙමින් මධ්‍යම අපහරණ අංශයේ අවශ්‍යතාවන් සපුරාලීමට ඔවුනට නොහැකි වේ. එවැනි ගැටළු හේතුවෙන් පාර්ශවයන්ට විනාශ කිරීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වේ.

විශේෂිත භාණ්ඩ සඳහා නිශ්චිත කාල සීමාවක් මත පදනම්ව විනාශ කිරීමේ කටයුතු වලට අදාළ පාර්ශවයන් ගිවිසුම්ගතව පත්කිරීමට යම් ක්‍රියාපටිපාටියක් සකස් කළහොත් එවැනි ගැටළු අඩු කළ හැකිවනු ඇත.

8.2 ආදායම් හා සේවා පර්ෂදය

8.2.1 ප්‍රකාශන අංශය

8.2.1.1 දිගු කාමරය

8.2.1.2 මෝටර් රථ ඒකකය

8.2.1.3 "ඩී" ශාඛාව

8.2.2 කර්මාන්ත හා සේවා අංශය

8.2.3 ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශය

8.2.4 මධ්‍යම භාණ්ඩ පරීක්ෂා කිරීමේ අංශය

8.2.5 අපනයන අංශය

8.2.6 මධ්‍යම මිල පිරික්සුම් අංශය

8.2.1 ප්‍රකාශන අංශය

හැඳින්වීම

ප්‍රකාශන අංශය යනු අදාළ අපනයනකරුවන් විසින් මුහුදු මාර්ගයෙන් ප්‍රවාහනය කරන සියලුම භාණ්ඩ සම්බන්ධයෙන් රේගු සටහන්කර (Cusdecs) ඉදිරිපත් කළ විට ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ස්ථානයයි.

මෙම අංශය පහත ඒකකයන්ගෙන් සමන්විත වේ.

- දිගු කාමරය
- මෝටර් රථ අංශය
- "D" ශාඛාව

අංශයේ විෂය පථය

මෙම අංශයේ ප්‍රධාන විෂය පථය වන්නේ ආනයනික භාණ්ඩ සඳහා ප්‍රකාශන පහසුකම් සැපයීමයි. මෙම අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා මෙම අංශය මගින් පහත පරිදි පහසුකම් සපයා ඇත.

- ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් නෞභාර ලේඛණ ලබාගැනීම.
- සෘජු ව්‍යාපාරික ආදාන පහසුකම (DTI) හරහා රේගු සටහන්කර ලබාගැනීම.
- රේගු සටහන්කර වලට අදාල තීරු බදු හා අනෙකුත් ගාස්තු මාර්ගගතව මෙන්ම බැංකු හරහා ගෙවීම.
- තෝරාගත් ආනයනකරුවන් සඳහා කඩිනම් රේගු සටහන්කර සැකසීමේ පහසුකම සපයාදීම.
- මේ සඳහා පත්කරන ලද නිලධාරීන් විසින් රේගු සටහන්කර පිළිබඳව කටයුතු කිරීම.
- SLPA, SAGT සහ CICT අංගන වලින් FCL බහාලුම් ඉවත් කිරීම සඳහා ගේට්ටු අවසරපත් නිකුත් කිරීම.

සම්පූර්ණයෙන් ක්‍රියාත්මක "ASYCUDA World" ස්වයංක්‍රීය පරිගණක පද්ධතිය හරහා ආනයනකරුවන්ට අප්‍රමාදව රේගු සටහන්කර පිළිබඳව කටයුතු කිරීමේ පහසුකම් සළසා ඇත. දිගු කාමරයේ (දෙවන මහලේ) ඇති "ASYCUDA" පද්ධතිය මගින් රේගු සටහන්කරවල සියලු විස්තර ලබා ගැනීමේ කටයුතු ඉටු කරන අතර එමගින් පරිශීලකයින්ට DTI පහසුකම යොදාගෙන සිය කාර්යාලවල සිට රේගු සටහන්කර සෘජුවම ඇතුළත් කිරීමට ඉඩ සැලසේ.

අංශයේ අරමුණු

- ආනයනය භාණ්ඩ නිෂ්කාශනය පහසු කිරීම.
- භාණ්ඩ වර්ගීකරණ කටයුතු හරහා හා වෙනත් ආකාරයෙන් ආදායම් අඩුවීම් /විදේශ විනිමය අහිමි වීම් අවම කිරීම.
- "D" අංශය හරහා රේගු ආඥා පනත හා අදාළ නීති වලට අනුකූලව බලාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම.
- ආනයන භාණ්ඩ මත පනවන බදු මගින් රජයට ලැබිය යුතු ආදායම නියමිත පරිදි ගණනය කිරීම හා එකතු කිරීම.
- මුදල් අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද භාණ්ඩ නිෂ්කාශන ව්‍යාපෘති වලට බදු සහන ලබාදීමෙන් පහසුකම සැළසීම.
- බලපත්‍ර හිමියන්ට තම වාහන/ භාණ්ඩ ඉක්මනින් නිෂ්කාශනය කිරීම සඳහා පහසුකම් සැළසීම.
- විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු/අනෙකුත් සංවිධාන/මහජනයාට තාවකාලික රේගු සටහන්කර හරහා භාණ්ඩ නිදහස් කර ගැනීමට පහසුකම් සැළසීම.
- රජයේ ප්‍රතිපත්ති මත තීරු බදු සහන/ තීරු බදු සහ අනෙකුත් බදු නිදහස් කිරීම් හා තාවකාලිකව නතර කිරීම් ලබාදීම.
- තහනම් කිරීම සහ සීමා කිරීම් පිළිබඳ එලදායි බලාත්මක කිරීමක් පවත්වා ගෙන යාම.

ප්‍රකාශන අංශයේ කාර්ය මණ්ඩලයේ වගකීම.

දිගු කාමරයේ කාර්ය මණ්ඩලය විසින් රේගු සටහන්කර ඉක්මනින් සකස් කිරීම සහ රජයට ලැබිය යුතු ආදායම එකතු කිරීම සිදුකරන අතරම, අනවශ්‍ය ප්‍රමාදයන්ගෙන් තොරව ආනයන භාණ්ඩ නිෂ්කාශනය සහතික කරයි. මෙම නිලධාරීන් ආමුඛ නිෂ්කාශන සඳහා ආනයන අපනයන පාලකවරයා, සෞඛ්‍යය අමාත්‍යාංශයේ ආහාර සහ ඖෂධ පරීක්ෂා කිරීමේ ඒකකය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පරමාණුක බලශක්ති අධිකාරිය, දුරකථන සන්නිවේදන නියාමන කොමිෂන් සභාව වැනි අනෙකුත් නියාමන ආයතන වලින් බලපත්‍ර සහ/හෝ විශේෂ අවසරයක් අවශ්‍ය කරන සහ ශාක නිරෝධායන සහතිකය, ධූමායන සහතිකය, කුළුබඩු මණ්ඩල සහතිකය සහ පටවන රටේ වරාය පරීක්ෂණ වාර්තාව ආදී අපනයනය කරන රට විසින් නිකුත් කරන සහතික අවශ්‍ය කරන භාණ්ඩ පිළිබඳව විමසිලිමත් වේ.

ඉක්මනින් රේගු සටහන්කර සකස් කිරීම සඳහා, ආනයනකරුවන් විසින් පහත කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුය.

- භාණ්ඩ නිෂ්කාශනය සඳහා නිෂ්කාශන හිමිකම් ලබාගැනීම සඳහා භාණ්ඩ ප්‍රවාහන නැව් සමාගමෙන් ලබාගත් අවසරය.
- භාණ්ඩ තොගය පිළිබඳ සම්පූර්ණ විස්තරයක්.
- රේගු ආනයන තීරුබදු පදනම්ව නිවරදිව සංයෝජිත සංකේතාංක පද්ධතිය නාමකරණ අනුව භාණ්ඩ වර්ගීකරණය කිරීම.
- අදාල මුදල් වර්ගය භාවිතා කරමින් අදාල හුවමාරු අනුපාතයට භාණ්ඩ වටිනාකම ප්‍රකාශ කිරීම.

- පිළිගත්/ අවසරලත් බැංකු හරහා භාණ්ඩ සඳහා ගෙවීම් (විනිමය හුවමාරුව) සිදුකිරීම.
- අදාල පරිදි අවශ්‍ය අවසර ලබාදීමේ ලේඛන, බලපත්‍ර, සහතික ආදිය රේගු සටහන්කර වලට ඇමිණීම.
- ඉහත සඳහන් සියලු අවශ්‍යතාවන් පසුරා ඇති නම්, භාණ්ඩ නිෂ්කාශනය සඳහා රේගු සටහන්කර සකස්කළ හැකිවේ.

ඉහත සඳහන් කළ පරිදි මෙම අංශය ප්‍රධාන ශාඛා/ ඒකක 03 කින් සමන්විත වේ.

8.2.1.1 දිගු කාමරය

ඓතිහාසික වශයෙන් ගත් කළ රේගු පරිපාලනයේ දී දිගු කාමරය සැබැවින්ම දිගු කාමරයක් වූ අතර, අදටත් එය දැකිය හැක්කේ දිගු කාමරයක් ලෙසය. මෙය බ්‍රිතාන්‍යයේ යටත් විජිත ලෙස පැවති බොහෝ ආසියාතික රටවල හා යුරෝපයේ ඉතා පැරණි රේගු සංවිධාන පැවති සමහර රටවල (උදා: ඩෙන්මාර්කය හා නෙදර්ලන්තය) දැකිය හැකි පොදු ලක්ෂණයකි. රේගුව ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආදායම එකතු කරන රාජ්‍ය ආයතනයක් බැවින් මෙම දිගු කාමරයේ වැදගත්කම සුළු කොට තැකිය නොහැක. එවකට පැවති විශාල ප්‍රමාණයේ ඉලක්කයන් කාලය ගත වීමත් සමග ක්‍රමයෙන් සමාජ ආරක්ෂණ බැඳීම් බවට පරිණාමය වී ඇති නමුත් ආදායම එකතු කිරීමේ ප්‍රමුඛතාවයේ වෙනසක් සිදුව නොමැත.

රේගු ආඥා පනතේ 10 වන වගන්තිය මගින් රේගු බදු හා වෙනත් ගාස්තු අය කිරීමට රේගුවට බලය පවරන අතර එහි 47 වන වගන්තිය අනුව භාණ්ඩ ආනයනය කරනු ලබන තැනැත්තා විසින් ඒ පිළිබඳව සත්‍ය සහ නිවැරදි ලෙස ප්‍රකාශ කළ යුතු අතර එකී භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලු බදු (තීරු බදු ආදීය) ගෙවිය යුතුය.

රේගුව විසින් රේගු බදු පමණක් නොව පහත දැක්වෙන අනෙකුත් බදු වර්ග කීපයක් ද අයකිරීම සඳහා පහසුකම් සලසනු ලැබේ;

එකතු කළ අගය මත බදු	(VAT)
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු	(PAL)
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද	(SCL)
නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු	(XID)
අනෙකුත් රජයේ ආයතන වෙනුවෙන් සෙස් බදු	(CESS)
සමාජ ආරක්ෂණ දායකත්ව බදු	(SSCL)
සුඛෝපභෝගී බදු	(LXT)
වාහන හිමිකම් බදු	(VEL)

රේගු සටහන්කර සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් අංශ 05 කට බෙදා ඇත. (එක් ඒකකයක් නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරු දෙදෙනෙක් සහ රේගු අධිකාරිවරුන් හතර දෙනෙකුගෙන් (තක්සේරු නිලධාරීන්) සමන්විත වේ. අධීක්ෂණය හා පරිහරණය කිරීමේ පහසුව සඳහා රේගු සටහන්කර පහත පරිදි එක් එක් ඒකකය වෙත වෙන්කර ඇත.

A ඒකකය	-	රේගු සටහන්කරයන්හි අවසන් අංක 0 - 9
B ඒකකය	-	රේගු සටහන්කරයන්හි අවසන් අංක 1 - 8
C ඒකකය	-	රේගු සටහන්කරයන්හි අවසන් අංක 2 - 7
D ඒකකය	-	රේගු සටහන්කරයන්හි අවසන් අංක 3 - 6
E ඒකකය	-	රේගු සටහන්කරයන්හි අවසන් අංක 4 - 5

රේගු සටහන්කර ඉදිරිපත් කිරීම

CusDec යනු රේගු සටහන්කර වල සංක්ෂේත නාමයයි. අපනයනකරු විසින් රේගු සටහන්කර ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. සටහන්කර සමගින්, PDF ආකාරයෙන් හෝ ස්කෑන් කරන ලද අනෙකුත් අදාල ලේඛන උඩුගත කළ යුතුය.

- නෞභාර පත්‍රය
- භාර දීමේ නියෝගය
- ඉන්වොයිස් පත්‍රය (විදේශ විනිමය අදාළ නොවන පදනම්න් (NFE) භාණ්ඩ ආනයනයක දී හැර බැංකුව විසින් අත්සන් කර සහතික කරන ලද)
- ඇසුරුම් ලේඛනය
- සංයෝජිත වර්ගීකරණය (HS) හඳුනා ගැනීමට අදාළ යම් තාක්ෂණික තොරතුරක්
- නිෂ්පාදිත රට තහවුරු කිරීමට අදාළ ලියවිලි
- ආනයනය කරන ලද භාණ්ඩ සීමා කල භාණ්ඩ නම් ඊට අදාළ ආනයන බලපත්‍ර/ ICL, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය , ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) ආදී බලපත්‍ර
- ණයවර ලිපි, ටෙලිග්‍රැපික් මාර්ගයෙන් මාරුකිරීම වැනි ප්‍රේෂණ ක්‍රම සඳහා තහවුරු කිරීම්
- වෙනත් විශේෂ ලේඛන (රාජ්‍ය තාන්ත්‍රික, තීරු බදු සහන, ශාක සනීපාරක්ෂක සහතිකය, ධූමායන සහතිකය, කුළුබඩු මණ්ඩල සහතිකය, නැවේ භාණ්ඩ පැටවීම සඳහා මිණුම් වාර්තාව ආදිය).

රේගු ආඥාපනතේ **12** හා **43** වගන්ති සහ "ආ" උපලේඛනයට අනුව රේගුව වෙත බලය පවරා ඇති පරිදි භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේදී රේගුව විසින් වෙනත් ඕනෑම නීතියකින් පනවා ඇති සීමාවන් හා තහනම් කිරීම් බලාත්මක කිරීම කළ යුතුය. ඉතා පුලුල් පරාසයක විහිදී ඇති මෙම විධිවිධානයන්හි ප්‍රතිඵලයක් ලෙස, රේගුවට දැනට ක්‍රියාත්මකව පවතින පනත්, ආඥා පනත් හා රෙගුලාසි විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීමට සිදු වේ. **1969** අංක **01** දරන ආනයන හා අපනයන පාලන පනත මේ අතරින් ප්‍රධාන වේ.

8.2.1. 2මෝටර් රථ ඒකකය

දැන් **ACCESS** ජාලයේ යොදවා ඇති **"AsyCuda World"** මෘදුකාංගය මගින් ශ්‍රී ලංකා රේගුවට භාණ්ඩ ආනයනයේදී සම්ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය පරීක්ෂා කිරීම සඳහා බැංකු සමඟ සම්බන්ධ වීමට හැකිවේ. ආනයනය කරනු ලබන වාහන ලියාපදිංචිය සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සබැඳිය හරහා වාහන ආනයන තොරතුරු ලබා දෙන අතර, එමගින් තීරු බදු හා රේගුව මගින් අයකරනු ලබන අනෙකුත් ගාස්තු නොගෙවන ලද වාහන ලියාපදිංචි වීම වැළැක්වීම සිදුවේ. රේගු සටහන් හා සම්බන්ධව කටයුතු කිරීමේදී නිලධාරීන් පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.

- ත්‍යාග වාහන හා පැරණි වාහන සඳහා ආනයන පාලන බලපත්‍ර **(ICL)**
- රාජ්‍ය සේවකයන්ට, පාර්ලිමේන්තු නියෝජිතයන්ට හා ආයෝජන මණ්ඩල නිලධාරීන් සඳහා සහනදායී හා තාවකාලික ආනයන බලපත්‍ර
- රාජ්‍ය තාන්ත්‍රිකයන්ට හා රාජ්‍ය නොවන සංවිධානවලට විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද තීරුබදු රහිත බලපත්‍ර
- ව්‍යාපෘති සඳහා ආනයනය කරන ලද වාහන සඳහා තාවකාලික රේගු සටහන්කර

වාහන සඳහා රේගු සටහන්කර පිළියෙල කිරීමේදී ඒකකයේ නිලධාරීන් පහත සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කළ යුතුය. භාණ්ඩ විස්තර පහත ලේඛණ පරිදි නිසියාකාරව දක්වා ඇතිදැයි පරීක්ෂා කර බැලීම.

වාහන සඳහා රේගු සටහන්කර පිළියෙල කිරීමේදී, ඒකකයේ නිලධාරීන් පහත සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කළ යුතුය.

- ලියාපදිංචි කිරීමේ සහතිකය
- පරීක්ෂා කිරීමේ සහතිකය
- ඉන්වොයිසිය
- අංගනයේදී වාහන පරීක්ෂා කරන තක්සේරුකරු විසින් ලබාදුන් වාහනය පරීක්ෂා කිරීමේ වාර්තාව.
- ඉන්වොයිසිය අනුව වාහනයේ වයස නිවැරදිව ගණනය කිරීම.
- නිෂ්පාදිත රට නිවැරදිව ප්‍රකාශ කිරීම.
- නැව් ගාස්තු නිවැරදිව ප්‍රකාශ කර ඇත්ද යන වග
- සඳහන් කරන ලද උපාංග පරීක්ෂා කිරීමේ සහතිකය සමඟ ගැලපීම.
- සහනදායී ආනයන සඳහා අදාල බලපත්‍රය ලබාදේ.
- භාණ්ඩ ආනයන හා අපනයන පාලකවරයා විසින් විවිධ ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත්කරන ලද තාවකාලිකව තහනම් කරන ලද කාණ්ඩ යටතට ගැනේද යන්න

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (රථ වාහන) විසින් වාහන නිෂ්කාශනය සඳහා අවසර ලබාදේ.

8.2.1.3 **"D"** ශාඛාව

"D" ශාඛාව අංශයේ ලේකම් කාර්යාලය ලෙස සැළකිය හැකි අතරකට පමණ පෙර රේගු **200** ඓතිහාසික වශයෙන් වසර , පාලක ජනරාල්වරයා පත්කිරීමේදී**'A'** විෂයය, **'B'** විෂයය, **'C'** විෂයය ,**'D'** විෂයය යනාදී ලෙස විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඔහු යටතේ ලිපිකරුවන් හතර දෙනෙකු සේවයේ නියුතුව **(4)**සිට ඇත .**'A'** විෂයයට අදාළ ලිපිකරු "වරාය ගාස්තු" සම්බන්ධ රාජකාරි ඉටුකළ අතර පසුව එය වරාය අධිකාරිය නමින් විකාශය වී වෙනම ආයතනයක් ලෙස ස්ථාපනය වියනැවි භාණ්ඩ ලේඛණ භාරගැනීම සඳහා ඓතිහාසික වශයෙන් ,තීරුබදු සහන හා බදු නිදහස් කිරීම් ලබාදීම . භාණ්ඩාගාරය හා රේගුව අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකළ පැරණි **'D'** ශාඛාව තවමත් අඩු හෝ වැඩි වශයෙන් එම කාර්යයන් ඉටු කරන අතර දිගටම මුල් නමින්ම හැඳින්වේ.

ආනයනකරුවන්/ මහජනයා සඳහා පහසුකම් සැළසීමට **"D"** ශාඛාව විවිධ ඒකකයන්ගෙන් සමන්විත වේ. ඒවානම්,

- **DRA** අංශය
- බැංකු ඇපකර ඒකකය
- තීරු බදු සහන ඒකකය
- තොග භාණ්ඩ අධීක්ෂණ ඒකකය
- කානේ ඒකකය
- නෞභාර ලේඛණ ඒකකය
- විමර්ශන ඒකකය
- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) යටතේ ඇති මෝටර් රථ බලපත්‍ර පරීක්ෂා කිරීම් ඉවත් කිරීමේ අංශය.

"D" ශාඛාව විසින් සිදු කරනු ලබන වැදගත් මෙන්ම ප්‍රමුඛ කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

- මුදල් අමාත්‍යාංශය මගින් ලබාදෙන තීරු බදු සහන ලියාපදිංචි කිරීම සහ තීරු බදු රහිත පදනම මත එම භාණ්ඩ

නිෂ්කාශනයට පහසුකම් ලබාදීම.

- පාර්ලිමේන්තුවේ අනුමත වූ ආදායම් සංරක්ෂණ ආඥාව අනුව තීරු බදු සහන හා නිදහස් කිරීම් ලබාදීම.
- විදේශ කටයුතු අමාත්‍යාංශය ලබාදුන් නිෂ්කාශන සහතිකය පදනම් කර ගනිමින් රාජ්‍යතාන්ත්‍රික භාණ්ඩ සහ තානාපති කාර්යාල සේවකයන්ගේ පුද්ගලික භාණ්ඩ නිෂ්කාශනයට අවසර දීම.
- විවිධ වෙළඳ ගිවිසුම් යටතේ ආනයනය කරන භාණ්ඩ සඳහා තීරුබදු නිදහස් හෝ වරණීය තීරුබදු අනුපාත ලබාදීම.
- මුදල් අමාත්‍යාංශයේ උපදෙස් වලට අනුකූලව විලම්භනය කරන ලද ගෙවීම් කොන්දේසි යටතේ රාජ්‍ය ආයතන සඳහා එවන ලද භාණ්ඩ නිෂ්කාශනයේ දී පහසුකම් සැලසීම.
- විවිධ හේතු මත භාණ්ඩ නිෂ්කාශනය සඳහා රේගු සටහන්කර ඉක්මණින් ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවල හා තාවකාලික ප්‍රකාශපත්‍ර **(Provisional Basis)** මත භාණ්ඩ ආනයනයට කිරීම හෝ එම ඉසව්ව නිමවීමෙන් පසු භාණ්ඩ ප්‍රතිඅපනයනය කිරීම සඳහා පහසුකම් සැලසීම.
- මුදල් අමාත්‍යාංශයේ තීරණය මත ප්‍රති-අපනයනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘති භාණ්ඩ ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම.
- නාවුක නියෝජිතයන් විසින් ඉදිරිපත් කරනු ලබන පරිදි නෞභාර ලේඛන භාරගැනීම හා ඒවා සංශෝධනය කිරීම.
- රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) ගේ තීරණ පරිදි තාවකාලික රේගු සටහන්කර හා අනෙකුත් කාරණා සම්බන්ධයෙන් බැංකු ඇපකර/ආයතනික ඇපකර ලබාගැනීම.
- තාවකාලිකව **CPD Carnet** හෝ **ATA Carnet** මත ආනයනය කරන ලද වාහන සහ උපකරණ අධීක්ෂණය සඳහා ලියාපදිංචි කිරීම.
- තොග භාණ්ඩ ආනයනය අධීක්ෂණය කිරීම හා අවශ්‍ය විටකදී අමතර අයකිරීම් ලබාගැනීම.
- මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම සඳහා තීරු බදු සහන ලබාදුන් භාණ්ඩ පිළිබඳ වාර්තා සකස් කිරීම.
- එතනෝල් වැටලීම් හා වාහන කැබලි අත්අඩංගුවට ගැනීම වැනි විවිධ ආනයනය පාලන/නියෝග/රේගු නියෝග වලදී සිදුවිය හැකි කඩකිරීම් හසුකර ගැනීම හා ඒ සම්බන්ධයෙන් රේගු ආඥා පනත යටතේ ක්‍රියාකිරීම.
- වෙනත් රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ ලිපි ලේඛන සම්බන්ධයෙන් කටයුතු කිරීම.

ප්‍රකාශන අංශයේ කාර්යසාධනය		
	විස්තරය	
	DRA යටතේ ලියාපදිංචි කර ඇති තාවකාලික රේගු සටහන්කර සංඛ්‍යාව (ටින් මාළු)	88
	DRA යටතේ නිමකරන ලද තාවකාලික රේගු සටහන්කර සංඛ්‍යාව (ටින් මාළු)	44
	DRA (CPC/IOC) යටතේ ලියාපදිංචි කරන ලද තාවකාලික රේගු සටහන්කර සංඛ්‍යාව	191
DRA	**DRA** (අනෙකුත්) යටතේ ලියාපදිංචි කරන ලද තාවකාලික රේගු සටහන්කර සංඛ්‍යාව	70
1	**DRA** (අනෙකුත්) යටතේ නිමකරන ලද තාවකාලික රේගු සටහන්කර සංඛ්‍යාව	596
2	ලියාපදිංචි කරන ලද **DCP** කානේ සංඛ්‍යාව	155
3	ලියාපදිංචි කරන ලද **ATA** කානේ සංඛ්‍යාව	21
4	**AD** ඇතුළත් කිරීම් සංඛ්‍යාව	33
5	ලියාපදිංචි කරන ලද ගබඩා බිල් පත් සංඛ්‍යාව	166
6	ලියාපදිංචි කරන ලද දුටුවන බිල් පත් සංඛ්‍යාව	121
7	ලියාපදිංචි කරන ලද තොග භාණ්ඩ ඇතුළත් කිරීම් සංඛ්‍යාව	-
8	නිමකරන ලද තොග භාණ්ඩ ඇතුළත් කිරීම් සංඛ්‍යාව	518
9	මුළු තොග අධීක්ෂණ ගාස්තු	142
10	ලියාපදිංචි කරන ලද **FRIC** සංඛ්‍යාව	5,180,000.00
11	**DRA** (අනෙකුත්) යටතේ ලියාපදිංචි කරන ලද තාවකාලික රේගු සටහන්කර සංඛ්‍යාව	101
1	**ISFTA** යටතේ ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව	11833
2	**PSFTA** යටතේ ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව	1004
3	**SAFTA** යටතේ ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව	527
4	**APTA** යටතේ ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව	543
5	**SAARC** යටතේ ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව	-
6	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (දුම්රිය දෙපාර්තමේන්තුව)	38
7	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (නාගරික සංවර්ධන අධිකාරිය)	11
8	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (මහාමාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍යාංශය)	83
9	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය)	-

10	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය)	83
11	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් ((ආරක්ෂක අමාත්‍යාංය)	6
12	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (දුම්රිය කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය)	33
13	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (මාර්ග සංවර්ධන අධිකාරිය)	16
14	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ශ්‍රී ලංකා නාවික හමුදාව)	13
15	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (උමා ඔය ව්‍යාපෘතිය)	2
16	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (රාජ්‍යතාන්ත්‍රික DPL)	-
17	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය)	-
18	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ජාතික උරුම අමාත්‍යාංශය)	-
19	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය)	-
20	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ගුවන්තොටුපළ හා ගුවන් සේවා දෙපාර්තමේන්තුව)	2
21	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (තාක්ෂණ අමාත්‍යාංශය)	-
22	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය)	77
23	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (ලංකා විදුලිබල මණ්ඩලය)	55
24	දෙපාර්තමේන්තු/ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් (වෙනත් අමාත්‍යාංශ)	304
25	සෞඛ්‍යය සේවා අධ්‍යක්ෂ ජනරාල්	-
26	විලම්භනය කරන ලද **VAT**	-
27	අනෙකුත් **NBT/XID/CESS/PAL**	
28	බදු සහන ලයිස්තුව යටතේ ලබා දුන් බදු සහන	
19A බදු නිදහස් කිරීම්		
1	කිරි පිටි	1
2	උණ ලී	16
3	තිරිඟු පිටි	205
4	ගෑස් තෙල්	368
5	සාමාන්‍යය	-
වාහන බලපත්‍ර		
1	සාමාන්‍යය	8,482
2	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	
3	පා. ම.	
4	විදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ යටතේ	
5	පළාත් සභා	
බැංකු ඇපකර		
1	වසර තුළ ලබාගත් ඇපකර සංඛ්‍යාව	284
2	වසර තුළ ලබාගත් ඇපකර වල මුළු වටිනාකම	3,827,847,679
3	නිදහස් කරන ලද බැංකු ඇපකර සංඛ්‍යාව	48
4	නිදහස් කරන ලද ඇපකර වල මුළු වටිනාකම	59,919,359
5	ලැබුණු සහ බැංකුවේ තැන්පත් කරන ලද ගෙවීම් වෙක්පත් සංඛ්‍යාව	-
6	තැන්පත් කරන ලද වෙක්පත් වල මුළු වටිනාකම	-
නෞභාර ලේඛණ		
1	සංශෝධනය කරන ලද නෞභාර ලේඛණ සංඛ්‍යාව	2,712
2	අයකර ගනු ලැබූ මුළු දඩ ප්‍රමාණය (රු.)	78,835,541
දිගු කාමර සහ මොටර් රථ අංශයේ දඩ		
1	දඩ සමගින් ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව	1,523
2	අයකර ගනු ලැබූ මුළු දඩ ප්‍රමාණය (රු.)	199,180,552

2024 වසර සඳහා ආදායම එකතු කිරීම

ශාඛාව	ආදායම එකතු කිරීම (රු.)
දිගු කාමරය	
CBHQ1	719,904,090,500
CCCO	3,150
CBPP1	31,991,830
CBPS1	1,721,150
CBCDU	9,242,900
CEMPC	66,183,121
CBLR	-
CBPC1	6,057,481
මෝටර් රථ ඒකකය	
CBMV1	13,118,549,980
HBIM1	1,177,640,586
D ශාඛාව	
DBRA1	472,226,982,797
DBRA2	36,665,122
මුළු ප්‍රමාණය	**1,206,579,128,617**

2024 වසර සඳහා සකස් කරන ලද මුළු ප්‍රකාශන සංඛ්‍යාව

ශාඛාව	රේගු සටහන්කර සංඛ්‍යාව
දිගු කාමරය	
CBHQ1	188,211
CCCO1	59
CBPP1	147
CBPS1	5,070
CBCDU	49
CEMPC	74
CBLR	-
CBPC1	11
මෝටර් රථ ඒකකය	
CBMV1	3,113
HBIM1	238
D ශාඛාව	
DBRA1	1,736.00
DBRA2	71.00
මුළු ප්‍රමාණය	**198,779**

8.2.2 කර්මාන්ත හා සේවා අංශය

හැඳින්වීම

කර්මාන්ත හා සේවා අංශය, විශේෂිත ක්‍රමවේදයන් යටතේ වාණිජ සහ කර්මාන්ත අවශ්‍යතාවන් සඳහා නිෂ්කාශනය සඳහා පහසුකම් සැළසීම පිණිස සුරැකුම්/ බැඳුම්කර මත තාවකාලිකව භාණ්ඩ ගබඩා කිරීම සඳහා භාණ්ඩ ආනයනයට අදාල රේගු කාර්යයන් සිදුකිරීම සහ අදාල රේඛීය ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්, ශ්‍රී ලංකාවේ අපනයනයන්හි සාම්ප්‍රදායික ප්‍රවණතාව විවිධාංගීකරණය කිරීමේ මාවත් සොයා බැලීමේ අරමුණ ඇතිව නිෂ්පාදන/ අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ කාර්යයන් ඉටුකරයි.

ප්‍රධාන ශාඛා සහ ඒවායේ අංශ

1. සාමාන්‍ය පරිපාලනය
2. බැංකු ඇපකර/ ආයතනික ඇපකර/ වැට බඳු වෙනස්වීමේ සහ අන්තරාල පරිපාලන සහ තිනෙත් (Thineth) පද්ධති ඒකකය
3. ආමුඛ බැඳුම්කර විමර්ශන සහ අභ්‍යන්තර සැකසුම් ඒකකය
4. ව්‍යාපෘති සහ ගුදම් පාලන ඒකකය
5. තැපැල් කත්සේරු ඒකකය
6. පෝෂක බැඳුම්කර ඒකකය

ප්‍රධාන කාර්යයන්

රජයේ වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ/ පරිපාලනය කිරීමේ කාර්යය මෙම අංශයට පැවරී ඇත. අංශයේ මූලික කාර්යයන් පහත දක්වා ඇත.

1. සාමාන්‍ය පරිපාලනය
   - ❖ අංශයේ මානව සම්පත් ක්‍රියාවලි කළමනාකරණය කිරීම.

2. බැංකු ඇපකර සහ අන්තරාල අධීක්ෂණ ඒකකය
   - ❖ බැංකු ඇපකර පරිපාලනය.
   - ❖ අන්තරාල භාණ්ඩ සඳහා අනුමැතිය ලබාදීම.
   - ❖ රේගු සටහන්කර (CUSDEC) සැකසීම සඳහා අනුමැතිය ලබාදීම.
   - ❖ තිනෙත් පද්ධති ඒකකයේ (Thineth system Unit) මෙහෙයුම් අධීක්ෂණය කිරීම.

3. බැඳුම්කර විමර්ශන සහ අභ්‍යන්තර සැකසුම් ඒකකය
   - ❖ අපනයන සැකසුම් සඳහා තාවකාලිකව ආනයනය කිරීමේ වැඩපිළිවෙල I සහ IV (TIEP I & TIEP IV) සඳහා නව ලියාපදිංචි කිරීම්.
   - ❖ TIEP I සහ TIEP IV අළුත් කිරීම්.
   - ❖ INFAC මෙහෙයුම්කරුවන් ලියාපදිංචි කිරීම.
   - ❖ නව IBG මෙහෙයුම් ලියාපදිංචි කිරීම.
   - ❖ IBG මෙහෙයුම්කරුවන් අළුත් කිරීම.
   - ❖ දැනට පවතින තොග තහවුරු කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා සමීක්ෂණ චාරිකා සිදුකිරීම/ ඉහත යෝජනා ක්‍රම පාලනය කිරීම.
   - ❖ අපනයන සැකසුම් ක්‍රියාවලිය සත්‍යාක්ෂණය කිරීම.
   - ❖ බැඳුම්කර විමර්ශනය කිරීම.

4. ව්‍යාපෘති සහ ගුදම් පාලන ඒකකය
   - ❖ නව බන්ධිත ගුදම්/ ගුදම් පහසුකම් සඳහා අයදුම්පත් ලබාගැනීම.
   - ❖ අයදුම්පත් වලට අදාල ලේඛණ පරීක්ෂා කිරීම.
   - ❖ ශක්‍යතාව සහ සඳහන්කර ඇති නියෝගයන්ට අනුකූලතාවය තහවුරු කිරීම සඳහා යෝජිත ස්ථානය භෞතිකව පරීක්ෂා කිරීම.
   - ❖ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ/ මුදල් අමාත්‍යාංශයේ පරීක්ෂා කිරීම අනුව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා මගින් යම් යෝජිත (I) බන්ධිත ගුදම් හෝ /(II) බන්ධිත පහසුකමක් නිර්දේශ කිරීම සහ ඒ අනුව, අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම මත (I) බන්ධිත ගුදම් පත්කරන අතරම ප්‍රාදේශීය පදනමින් (II) නව බන්ධිත ගුදම් පහසුකම් පත්කිරීම.
   - ❖ ගබඩා කේත නිකුත් කිරීම.
   - ❖ බැඳුම්කරුවන්/ ගුදම් මෙහෙයුම්කරුවන් සඳහා උපදෙස් සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම.
   - ❖ PPNR අංශයේ සහය ඇතිව බන්ධිත ගුදම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු නියෝග (DOPL) නිකුත් කිරීම.
   - ❖ බන්ධිත ගුදම් කාලීනව අළුත් කිරීම.
   - ❖ ගුදම් සඳහා ශක්‍ය වලංගු කාලසීමාව දීර්ඝ කිරීම් නිර්දේශ කිරීම.

- ❖ භාණ්ඩ ගුදමෙන් පිට කිරීමේ අයදුම්පත් සකස් කිරීම.
- ❖ අනුකූලතාව අධීක්ෂණය කිරීමෙන් අනතුරුව බලපත්‍රලාභී නාවුක ඉන්ධන සැපයුම්කරුවන් සඳහා මාර්ගෝපදේශ සහ රේගු ක්‍රමවේද සකස් කිරීම.
- ❖ ගුදම් පාලන ක්‍රියාකාරකම්.

5. තැපැල් තක්සේරු ඒකකය

- ❖ තැපැල් තක්සේරු ශාඛාව විසින් තැපැල් පාදක මෙහෙයුම් සහ අදාල සියලු පහසුකම් ලබාදේ.

6. පෝෂක බැඳුම්කර ඒකකය

- ❖ තීරුබදු රහිත සාප්පු පිළිබඳ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම.

මෙම අංශයේ කාර්සාධනය

- බැංකු ඇපකර සහ අන්තරාල අධීක්ෂණ ඒකකය

ආයතනික/ පුද්ගල ඇපකර

ඇපකර අළුත් කිරීම්	176
නව ඇපකර	37

බැංකු ඇපකර

පිළිගත් ඇපකර	2271
ඉල්ලා සිටි ඇපකර	890
නිදහස් කරන ලද ඇපකර	1699

- බැඳුම්කර විමර්ශනය සහ අපනයන සැකසුම් සඳහා තාවකාලිකව ආනයනය කිරීමේ **(TIEP)** ඒකකය.

නිමකරන ලද විමර්ශන සංඛ්‍යාව	19
2023 වසරේදී ආරම්භ කරන ලද නඩු	11
සමස්ත රාජසන්තක කිරීම්	195,163,359/-
සිදුකරන ලද සත්‍යාක්ෂණ සංඛ්‍යාව	57

- අපනයන සඳහා පහසුකම් සැපයීමේ ඒකකය **(EFU) (**අපනයන සැකසුම් සඳහා තාවකාලිකව ආනයන ඒකකය **-TIEP Unit)**

නව TIEP-1	54
නව TIEP-1V	27
නව IBG	06
TIEP-1 අළුත් කිරීම්	434

- ව්‍යාපෘති සහ ගුදම් පාලන ඒකකය

බන්ධිත ගුදම් මෙහෙයුම්

බැඳුම්කර අළුත් කිරීම්	43
නිර්දේශිත නව බැඳුම්කර	48
ගුදම් ඉවත් කිරීම	නැත
බන්ධිත ප්‍රවාහකයින් නැවත අළුත් කිරීම	17

එකතු කරන ලද ගාස්තු (රු.):

බාහිර පරීක්ෂා කිරීම් (O/E)	2,868,000/-
ලියාපදිංචි කිරීම	162,000/-

අළුත් කිරීම	702,000/-
ප්‍රලේඛනය	702,000/-

- තැපැල් තක්සේරු ඒකකය

i. නිදහස් කරන ලද භාණ්ඩවල මුළු වටිනාකම (රු.) : 313,442,569.96

ii. අයකර ගත් මුළු බදු ප්‍රමාණය (රු.):

රේගු ආනයන තිරු බදු **(CID)**	12,482,458.00
වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු **(PAL)**	19,308,411.00
රේගු අධිභාර **(SUR)**	144,196.86
සෙස් බදු **(CESS)**	21,743,486.00
නිෂ්පාදන බදු **(EXD)**	19,099.00
සමාජ ආරක්ෂණ දායකත්ව බදු **(SSCL)**	9,611,584.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු **(SCL)**	264,981.00
එකතු කළ අගය මත බදු **(VAT)**	49,825,815.91
SR ගාස්තු	නැත
පරිගණක ගාස්තු **(COM)**	2,000.00
දඩ	4,0000.00
රාජසන්තක කිරීම්	නැත
එකතුව	**113,442,031.77**

8.2.3 ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශය

හැඳින්වීම:

දෙපාර්තමේන්තු නියෝග 1309 (DOPL 1309) යටතේ 2019.01.01 දින ස්ථාපනය කරන ලද ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශය, ආදායම් සහ සේවා පර්ෂදය යටතේ ක්‍රියාත්මක වේ. දිවයින පුරා ආයෝජන මණ්ඩලීය කාර්යයන් අධීක්ෂණය කිරීමේ කාර්යය මෙම අංශයට පැවරී ඇති අතර එමගින් නීත්‍යානුකූල වෙළඳ කාර්යයන් සඳහා පහසුකම් සැලසීම සහ ආදායම් ඉලක්ක ළඟාකර ගැනීම සාක්ෂාත් කරමින් ශ්‍රී ලංකා රේගුව, ආයෝජන මණ්ඩලය, ආයෝජන මණ්ඩලීය ආයෝජකයින් සහ පාර්ශවකරුවන් අතර මෙහෙයුම් සහ පරිපාලන කාර්යයන් සම්බන්ධීකරණය කිරීමේ මූලික කාර්යය ඉටුකරයි.

ප්‍රධාන කාර්යයන්

- **ආයෝජන මණ්ඩලීය ආනයන ක්‍රියාවලිය (FCL) පරීක්ෂා කිරීම.**
- **ආයෝජන මණ්ඩලයේ දේශීය අලෙවි මගින් බදු එකතු කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම.**
- **ආයෝජන මණ්ඩලයේ භාණ්ඩ විනාශ කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සහ පරීක්ෂා කිරීම.**
- **ආයෝජන මණ්ඩලීය ආයතන අවසන් කිරීමෙන් පසුව අධීක්ෂණය කිරීම.**
- **ඉහත සඳහන් කාර්යයන් හා සම්බන්ධව සංඛ්‍යා ලේඛණ පදනම් විගණන සිදුකිරීම.**

කාර්යසාධනය :

මාසය	ආදායම එකතුකිරීම (දේශීය අලෙවි)(රු.)	දේශීය අපහරණ ගාස්තු සත්‍යාක්ෂණය කිරීම/පරීක්ෂා කිරීම (රු.)	අධීක්ෂණ ගාස්තු යටතේ (රු.)	රේගුවේ මුද්‍රා ගාස්තු (රු.)	මුළු බැංකු ඇපකර භිමිකම් (රු.)	විමර්ශන මගින් අයකර ගැනීම් (රු.)	AE මගින් අයකර ගැනීම් (රු.)	පරීක්ෂා කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව
ජනවාරි	541,695,689	1,740,000	38,250	10,200	-	-	874,828	2,951
පෙබරවාරි	623,762,233	1,740,000	45,750	10,600	-	200,000	1,026,657	2,990
මාර්තු	689,037,734	2,032,000	36,750	9,100	-	-	2,707,289	2,684
අප්‍රේල්	594,442,769	1,618,000	42,000	11,400	-	-	279,326	2,915
මැයි	702,983,520	1,716,000	54,000	17,300	-	-	1,091,241	2,993
ජූනි	666,497,184	1,636,000	45,000	14,500	-	500,000	-	3,139
ජූලි	841,067,387	2,056,000	55,500	16,300	-	-	18,003,492	3,632
අගෝස්තු	883,522,456	1,848,000	69,750	20,800	-	23,000,000	-	3,288
සැප්තැම්බර්	460,983,810	1,516,000	45,000	15,450	-	6,750,000	3,238,114	3,044
ඔක්තෝබර්	583,886,547	2,052,000	57,600	19,100	-	6,750,000	2,209,412	3,321
නොවැම්බර්	629,606,875	1,792,000	56,100	18,800	5,500,000	2,009,144	1,229,339	2,800
දෙසැම්බර්	653,309,434	2,096,000	47,400	18,100	784,407	3,800,000	888,675	2,816
එකතුව	**7,870,795,638**	**21,842,000**	**593,100**	**181,650**	**6,284,407**	**43,009,144**	**31,548,373**	**36,573**

8.2.4 මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය

හැඳින්වීම

බලයලත් රේගු නිලධාරීන් විසින් ආනයනික මුහුදු භාණ්ඩ පරීක්ෂා කිරීම, රේගු නිෂ්කාශන ක්‍රියා පටිපාටිය තුළ සිදුකරනු ලබන ප්‍රධාන කාර්යය වේ. මෙම කාර්යය ඉටුකිරීම සඳහා මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය (CCED) 2000.08.23 දින ස්ථාපනය කරන ලද අතර මෙම කාර්යය මූලිකවම අවදානම් කළමනාකරණය මත පදනම්ව ඇත. භාණ්ඩ තොගයක් පරීක්ෂා කිරීම සහ නිදහස් කිරීම සඳහා ගත වන සාමාන්‍ය කාලය, එකතු කරන ලද අමතර ආදායම සහ භාණ්ඩ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස රේගු නීතිය හා අදාල නීති කඩකිරීම් හසුකර ගැනීම් එහි ඵලදායිතාවය දක්වයි. කොළඹ වරායේ, සීඑස්එල් CSL (CVT), ග්‍රේ ලයින් 02 සහ රෑන්ක් බහාලුම් පර්යන්තයේ ඇති ශාඛා සමඟින් මෙම අංශයේ ප්‍රධාන කාර්යාලය රේගු අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් රෑන්ක් බහාලුම් පර්යන්තයේ ස්ථාපනය කර ඇත. භාණ්ඩ පරීක්ෂා ක්‍රමවේදයේ ප්‍රමිතින් වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ලෝක රේගු සංවිධානය (WCO), ලෝක වෙළඳ සංවිධානය (WTO) සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන විසින් නිර්දේශ කර ඇති මෙවලම් සහ තාක්ෂණයන් ගණනාවක් ක්‍රියාත්මක කර තිබේ. මෙම අංශයේ අරමුණ වන්නේ භාණ්ඩ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේ දී අදාල නියාමන පාලන ක්‍රම යොදාගන්නා අතරම ආනයනකරුවන් සඳහා උපරිම මට්ටමින් පහසුම් සැළසීමයි.

පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය

පරීක්ෂා කිරීමට ලක්වන භාණ්ඩ වර්ගය

- දේශීය භාවිතය සඳහා ආනයනයන්
- ආයෝජන මණ්ඩලයේ (BOI) අනුමැතිය ලත් ව්‍යවසායන් විසින් සිදුකරන ආනයනයන්

වරණීයතාව

පරීක්ෂා කිරීමේ ප්‍රමාණය (රතු, ඇම්බර්, පරිලෝකනය කිරීම සහ නිදහස් කිරීම, පරීක්ෂා කිරීම් වලින් නිදහස් කිරීම) සහ තෝරා ගනු ලැබුවේ නම්, පරීක්ෂා කරන ස්ථානය අවදානම් කළමනාකරණ නිර්ණායක පදනම්කර ගනිමින් ***AsyCuda*** පද්ධතිය හරහා ස්වයංක්‍රීයව තෝරාගනු ලැබේ.

අවදානම මත පදනම්ව භාණ්ඩ පරීක්ෂා කිරීම

- සම්පූර්ණ බහාලුම් භාණ්ඩ තොග (FCL)
  රතු වැනල භාණ්ඩ ග්‍රේලයින් 1 සහ ග්‍රේලයින් 11 අංගන ඔස්සේ ද ඇතැම්විට RCT අංගනයේදී පරීක්ෂා කරනු ලැබේ. RCT අංගනයේදි ඇම්බර් වැනල් පරීක්ෂා කිරීම් සිදුකරනු ලැබේ.
  අවශ්‍යතාවය අනුව පරීක්ෂා කිරීමේ අංගනයේ ජේ.නි.රේ.අ. විසින් අනුකූලතා මට්ටම, භාණ්ඩවල ස්වභාවය, පරීක්ෂණ අංගනයන්හි පවතින පහසුකම් ආදිය මත පදනම්ව ඇම්බර් සිට රතු වැනලය දක්වා මාරු කෙරේ. වෙළඳාම සඳහා පහසුකම් සැළසීම වෙනුවෙන්, පත්කරන ලද මණ්ඩලයක් විසින් කරන ලද ඉල්ලීම අනුව භාණ්ඩ හාරකරුවන් විසින් නම්කරන ලද ස්ථානයකදී ඇතැම් අඩු අවදානම් භාණ්ඩ තොග පරීක්ෂා කිරීම සඳහා ඉඩ සැළසිය හැකිය.

- පූර්ණ නොවන බහාලුම් භාණ්ඩ තොග (LCL cargo)
  පූර්ණ නොවන බහාලුම් භාණ්ඩ තොග (LCL cargo) වරාය තුළ හෝ NNR ගුදම්වල පිරවූ පසු JCT, BQ සහ NNR සඳහා අනුයුක්ත කර ඇති මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශයෙහි කාර්ය මණ්ඩලය විසින් පරීක්ෂා කරනු ලැබේ.

ආයෝජන මණ්ඩලීය ව්‍යවසායන් සඳහා වන භාණ්ඩ පරීක්ෂා කිරීම

නිදහස් වෙළඳ කලාප වලින් පිටත පිහිටුවා ඇති ආයෝජන මණ්ඩලීය ව්‍යවසායන් සඳහා ආනයනය කරන භාණ්ඩ CVT (BOI) හිදී පරීක්ෂා කරනු ඇත.

විස්තරය			එකතුව
ලියාපදිංචි කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව	පූර්ණ නොවන බහාලුම් (LCL)		113,884
	සම්පූර්ණ බහාලුම් (FCL)		99,933
ලියාපදිංචි කරන ලද බහාලුම් (FCL) සංඛ්‍යාව	20' සහ 40'		140,657
රේගු සටහන්කර (CusDecs) සංඛ්‍යාව			204,160
පරීක්ෂා කිරීම් ආකාරය	ඇම්බර්		61,579
	විස්තරාත්මක		29,440
	HRC		11,677
	රතුවැනල		35,182
	අනෙකුත් (TIEP ආදී.)		17,832
	ආයෝජන මණ්ඩල (BOI)		53,844
පූර්ණ නොවන බහාලුම් (LCL) සංඛ්‍යාව			108,474
පරීක්ෂා කිරීම් ආකාරය	ඇම්බර්		29,516
	විස්තරාත්මක		11,371
	HRC		-
	රතුවැනල		8,627
	අනෙකුත් (TIEP ආදී.)		11,363
	ආයෝජන මණ්ඩල (BOI)		46,989
සම්පූර්ණ බහාලුම් (FCL) සංඛ්‍යාව			121,208
පරීක්ෂා කිරීම් ආකාරය	ඇම්බර්		49,707
	විස්තරාත්මක		25,509
	HRC		-
	රතුවැනල		32,534
	අනෙකුත් (TIEP ආදී.)		3,963
	ආයෝජන මණ්ඩල (BOI)		9,495
අනාවරණය කරගත් සිද්ධි සංඛ්‍යාව			1,012
			-
අතිරේක සටහන්කර (A/E) අයකරගත් රේගු සටහන්කර සංඛ්‍යාව			3,514
			-
අයකරගැනීම්			913,137,620
අනාවරණයකර ගැනීම් (රු)	දඩ සහ තවදුරටත් රාජසන්තක කිරීම්		705,292,871
	අපහරණය		191,362,534
අතිකාල (රු.)	සාමාන්‍ය		6,885,251
	ආයෝජන මණ්ඩල (BOI)		7,722,369
අනෙකුත් ගාස්තු (රු.)	අයකරගත් අධිභාර ගාස්තු		1,871,245
	මුද්‍රා ගාස්තු		3,350

අතිරේක සටහන්කර (A/E) අයකර ගැනීම් (මිල පිරික්සුම්) (රු.)			-
රේගු ආනයන තීරු බදු (CID)			-
ආනයන සෙස් බදු (EIC)			-
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)			-
එකතු කළ අගය මත බදු (VAT)			-
විශේෂ වෙලඳ භාණ්ඩ බදු (SCL)			-
වෙනත්			-
			-
අතිරේක සටහන්කර (A/E) අයකර ගැනීම් (අනෙකුත්) (රු.)			751,368,331
රේගු ආනයන තීරු බදු (CID)			269,715,245
ආනයන සෙස් බදු (EIC)			225,372,077
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)			75,838,449
එකතු කළ අගය මත බදු (VAT)			135,438,012
විශේෂ වෙලඳ භාණ්ඩ බදු (SCL)			990,258
සමාජ ආරක්ෂණ බදු (SSL)			25,857,094
අධිභාර (SUR)			5,515,926
වෙනත්			12,641,270
එකතුව			1,664,505,951

ඇපකර විස්තර		
ලියාපදිංචි කරන ලද **B/G** සංඛ්‍යාව		320
නිදහස් කරන ලද **B/G** සංඛ්‍යාව		100
ලියාපදිංචි කරන ලද **P/G** සංඛ්‍යාව		3,162
නිදහස් කරන ලද **P/G** සංඛ්‍යාව		902

CVT සහ INFAC

	CVT	
	ආනයන	අපනයන
රේගු සටහන්කර සංඛ්‍යාව	7,332	12,467
බහාලුම් සංඛ්‍යාව	7,816	4,401
නිෂ්කාශනය කරන ලද **LCL** සංඛ්‍යාව	1,397	7,935
අතිරේක සටහන්කර **(A/E)** මඟින් අයකර ගැනීම් **(රු.)**	18,245,033	0
දඩ සහ රාජසන්තක කිරීම් **(රු.)**	27,457,900	0
රාජසන්තක කරන ලද භාණ්ඩ වටිනාකම		0
අනාවරණය කරගත් සිද්ධි සංඛ්‍යාව		14

8.2.5 අපනයන අංශය

හැඳින්වීම

අපනයන අංශය මගින් ක්‍රියාවලීන් සරල කිරීම හා ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් අපනයන රේගු සටහන්කර සම්බන්ධයෙන් කටයුතු කිරීම, ප්‍රතිනැවිගත කිරීම හරහා ජාත්‍යන්තර නීත්‍යානුකූල භාණ්ඩ සංචලනය ප්‍රවර්ධනය කිරීම මගින් අපනයනයන් හා ප්‍රති අපනයනයන් නිෂ්කාශනය සඳහා පහසුකම් සැළසේ. මෙම අංශය රටේ සංස්කෘතික, පාරිසරික හා සමාජීය වටිනාකම් ආරක්ෂා කිරීම සඳහා ද වගකිව යුතුවේ.

ප්‍රධාන කාර්යයන්

- මෙම අංශය, වරාය මගින් හා ගුවන් මගින් කරනු ලබන සියලු අපනයන සම්බන්ධයෙන් කටයුතු කරයි.
- මෙරටින් අපනයනය කරනු ලබන සියලුම භාණ්ඩ සම්බන්ධ සෑම කරුණක් පිළිබඳව කටයුතු කිරීම.
- රේගු අවශ්‍යතා සහ ආරක්ෂක හේතු සඳහා අපනයන භාණ්ඩ පරීක්ෂා කිරීම.
- අපනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් අපනයන බදු, සෙස් බදු, රාජ්‍ය භාග අය කිරීම.
- කොළඹ හා තදාසන්න ප්‍රදේශවල බහාලුම් රඳවා තබන ස්ථාන කළමනාකරණය.
- බහු දේශ ඒකාබද්ධ තොග ගබඩා **(Multi Country Consolidation Warehouses)** පවත්වාගෙන යාම.
- කානේ **(Carnet)** ක්‍රමය යටතේ තාවකාලික ආනයන පහසු කරවීම.
- ආපසු ගෙවීම් ඉල්ලීම් අනුමත කිරීම.
- නැවිගත කිරීමේ සහතික නිකුත් කිරීම.
- තීරුබදු ප්‍රතිදාන ලේඛන සහතික කිරීම.
- නිදහස් ප්‍රතිඅපනයන සහතික ලියාපදිංචිය.
- පූර්ව තීරණයන්ට අදාළව වාණිජ දෙපාර්තමේන්තුව නැවිගත කිරීම සහතික කිරීම.
- නැවකින් නැවකට මාරුකිරීමේ කටයුතු සඳහා පහසුකම් සැළසීම.
- ජාතික වෙළඳ සංඛ්‍යා ලේඛන සැපයීම.
- රටේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අයිතීන් ආරක්ෂා කිරීම
- පුද්ගලික අංශය, රාජ්‍ය ආයතන ඇතුළුව සියලු පාර්ශවකරුවන් සමඟ සහයෝගිතාවය ගොඩනගා ගැනීම.
- සියලු ව්‍යාපාරික ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය නිරන්තරයෙන් වර්ධනය වන ආකාරයට පද්ධති හා ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම.
- අපනයන වෙළඳාම පහසු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපරිම ලෙස භාවිතයට ගැනීම.

කාර්යසාධනය

01. අපනයන ආදායම – 2024

අපනයන තීරුබදු	26,301,102.00
අපනයන සංවර්ධන මණ්ඩල සෙස්	1,403,236,323.00
සෙස් - රබර්	5,294,078.00
සෙස් - තේ	496,817,613.00
තේ - වෛද්‍ය ආධාර සෙස්	434,387.00
සෙස් - පොල්	169,531,857.00
අපනයන පරීක්ෂණ මණ්ඩල ගාස්තු	15,057,409.00
පිටත පරීක්ෂණ ගාස්තු	1,457,350.00
ශ්‍රී ලන්කන් ගුවන් සේවා ගාස්තු	2,010,601.00
සංශෝධන ගාස්තු, සංශෝධන දඩ සහ අවලංගු කිරීමේ ගාස්තු	7,606,375.00
දඩ සහ තවදුරටත් රාජසන්තක කිරීම්	200,000.00
අතිකාල ගාස්තු	57,332,214.00
නැව් භාණ්ඩ සහතික ගාස්තු	178,500.00
පරිගණක ගාස්තු	2,185,457,809.00

02. ඉදිරිපත් කරන ලද සහ අවසන් කරන ලද රේගු සටහන්කර **(CusDecs)** සංඛ්‍යාව

i. අපනයන කාර්යාලය	**-**	**84,169**
ii. ගුවන් භාණ්ඩ	**-**	**51,950**
එකතුව	**-**	**136,119**

03. පරීක්ෂණ මණ්ඩල අයදුම් පත්

පරීක්ෂණ සංඛ්‍යාව **- 12,606**

04. ජංගම ගිණුම්

i.	පූර්ව ගෙවීම් ගිණුම් හිමියන් සංඛ්‍යාව	**- 154**
ii.	ක්‍රියාත්මක ජංගම ගිණුම් සංඛ්‍යාව	**- 131**
iii.	කාලසීමාව තුළ තැන්පතු	**- Rs. 8,813,533,136.00**
iv.	කාලසීමාව තුළ හර කරන ලද මුළු ප්‍රමාණය	**- Rs. 8,762,770,389.00**

05. ඉල්ලීම් මත නිකුත් කරන ලද **FRIC** සංඛ්‍යාව **- 713**

06. ගබඩා බිල් සංඛ්‍යාව **- 113**

07. නිකුත් කරන ලද නැව් භාණ්ඩ සහතික පත් සංඛ්‍යාව **- 714**

08. එකතු කළ නැව් භාණ්ඩ සහතික පත් ගාස්තු **- රු. 178,500.00**

09. රේගු වැරදි සඳහා අයකරගත් දඩ **- රු. 200,000.00**

8.2.6 මධ්‍යම මිල පිරික්සුම් අංශය

හැඳින්වීම

වටිනාකම අනුව රේගු බදු අදාළ වන අවස්ථාවන්හිදී ආනයනික භාණ්ඩවල (මෝටර් රථ හැර) මිල තක්සේරු කිරීම සඳහා මධ්‍යම මිල පිරික්සුම් අංශය වගකියනු ලැබේ. අත්හැර දමන ලද හෝ අත්අඩංගුවට ගනු ලැබූ භාණ්ඩ පිළිබඳව තක්සේරුකර ටෙන්ඩර මගින් විකිණීම ද මෙම අංශය යටතට පැවරේ. රේගු ආඥා පනතේ 51 හා 52 වන වගන්ති හා "ඉ" උපලේඛණය ඇතුලත් කර ඇති ලෝක රේගු සංවිධානයේ මිල පිරික්සුම් ගිවිසුමෙහි ඇතුලත් මිල පිරික්සුම් මූලධර්ම යොදාගනු ලැබේ. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා පහසුකම් සැලසීම හා දිරිමත් කිරීම සිදුකරන අතරම මෙම අංශය මගින් ක්‍රියාකාරී ඒකක අතර බෙදාහැරීම සඳහා දත්ත එකතු කිරීම හා සකස් කිරීම සඳහා නවීන මෙවලම් හා පර්යේෂණ පහසුකම් යොදාගනු ලැබේ.
මිල පිරික්සුම් කාර්යයන් ඉටුකිරීම සඳහා මිල පිරික්සුම් ඒකකය පහත පරිදි කාර්යාල තුනකින් සමන්විත වේ:

i. රැන්ක් බහාලුම් පර්යන්තයේ පිහිටි මධ්‍යම මිල පිරික්සුම් අංශය.
ii. දිගු කාමරයේ ඇති මිල පිරික්සුම් වෙගවත් කිරීමේ කාර්යාලය.
iii. කටුනායක ගුවන් භාණ්ඩ කාර්යාලයේ පිහිටි ප්‍රාදේශීය මිල පිරික්සුම් කාර්යාලය.

මධ්‍යම මිල පිරික්සුම් අංශයේ ප්‍රධාන කාර්යාලය ඔරුගොඩවත්ත රැන්ක් බහාලුම් පර්යන්තයේ පිහිටා ඇත. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ආදායම් හා සේවා

) යටතේ පාලනය වන මෙම අංශයේ සමස්ත අධීක්ෂණය රේගු අධ්‍යක්ෂ (මිල පිරික්සුම්) වෙත පැවරී ඇති අතර නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානීන් ලෙස කටයුතු කරනු ලැබේ.
තක්සේරු නිලධාරීන් 7 දෙනෙකුගේ (නියෝජ්‍ය රේගු අධිකාරීවරුන්), රේගු අධිකාරීවරුන් 8 දෙනෙකුගේ සහ සහකාර රේගු අධිකාරීවරුන් 10 දෙනෙකුගේ සහය ඇතිව විමර්ශන, පර්යේෂණ, ලියාපදිංචි කිරීම්, පශ්චාත් සටහන් සංශෝධන, ගෙවීම් සත්‍යාපන හා ඇප සහතික කළමනාකරණ කාර්යයන් සිදුකරනු ලැබේ.

අංශයේ ප්‍රධාන කාර්යයන්
රේගු මිල පිරික්සුම හා සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණු වලදී මිල පිරික්සුම් කමිටුවට සහයවීම.


- මිල පිරික්සුම් නීතිය ඵලදායි සහ ඒකිය ලෙස යෙදවීම සඳහා මිල පිරික්සුම් මෙවලම් (දත්ත ගබඩා සහ කලින් කලට සිදුකරන දැනුම්දීම් ඇතුලුව) සහ ප්‍රශස්ත ක්‍රියා පිළිවෙත් වැඩිදියුණු කිරීම.
- වෙළඳ භාණ්ඩවල මිල සත්‍යාපනය කිරීම.
- මිල පිරික්සුම් කිරීමේ ගැටලු විසඳීමේදී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් දිරිමත් කිරීම හා මිල තක්සේරු කිරීමේ පර්යේෂණයන්හිදී රාජ්‍ය හවුල්කාරිත්වය දිරිමත් කිරීම.
- සංවේදී භාණ්ඩවල මිල පිරික්සුම් කිරීමේ ප්‍රවණතාවය අධීක්ෂණය කිරීම හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම;
- මිල පිරික්සුම් මාර්ගෝපදේශ සහ ක්‍රමවේද ඵලදායි ලෙස යෙදවීම හා අනුගමනය කිරීම තහවුරු කරගැනීම සඳහා මිල පිරික්සුම් පරීක්ෂාවන්/ විමර්ශනයන් සිදුකිරීම
- රේගු මිල පිරික්සුම් කරුණු වලදී අදාල ජාත්‍යන්තර සංවිධාන හා පිටරටවල වෙනත් මූලාශ්‍ර සමග සම්බන්ධීකරණය කිරීම.
- අධ්‍යයනයන් සිදුකිරීම හා හුවමාරු මිල සම්බන්ධ ගැටලු සඳහා අවශ්‍ය යෙදවුම් ලබාදීම.

කාර්යසාධනය
01. මිල පිරික්සුම් අංශය විසින් සකස් කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව

මාසය	මිල පිරික්සුම සඳහා යොමු කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව	සකස් කරන ලද A/E සංඛ්‍යාව	ඉහළ නැංවීම %
ජනවාරි	**2839**	**1765**	**62%**
පෙබරවාරි	2941	1917	65%
මාර්තු	2565	1670	65%
අප්‍රේල්	2060	1132	55%
මැයි	2319	1327	57%
ජූනි	1711	755	44%
ජූලි	3131	1699	54%
අගෝස්තු	2858	1747	61%
සැප්තැම්බර්	2620	1491	57%
ඔක්තෝබර්	3174	1911	60%
නොවැම්බර්	3054	1803	59%
දෙසැම්බර්	3239	1879	58%
එකතුව	**32511**	**19096**	**59%**

02. පසුගිය වසරවල කාර්ය සාධනය සංසන්දනය (රු.)

මාසය	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
ජනවාරි	84,498,414	96,976,771	162,436,213	137,861,340	144,183,848	122,928,057	161,908,100	236,485,869	1,117,635,145
පෙබරවාරි	103,263,972	92,588,732	197,606,168	199,983,030	105,983,866	164,236,827	140,321,155	362,317,541	1,137,865,495
මාර්තු	90,903,711	124,223,659	139,270,365	120,416,213	24,305,563	186,305,872	109,684,573	445,182,526	853,275,156
අප්‍රේල්	85,868,619	115,021,168	172,654,159	132,439,443	63,162,192	158,725,332	122,498,186	583,851,468	627,449,467
මැයි	99,738,181	133,249,396	145,106,782	193,606,520	39,312,834	156,899,840	85,905,778	449,202,751	735,205,779
ජූනි	132,070,090	137,691,728	174,176,732	139,689,506	55,953,600	177,211,201	93,209,007	371,445,383	392,277,134
ජූලි	84,129,484	124,688,097	118,414,464	169,113,512	98,974,903	84,991,835	68,459,191	685,811,153	892,380,007
අගෝස්තු	123,306,222	156,586,926	156,252,561	180,739,571	120,472,762	119,628,995	126,660,162	707,436,899	897,857,056
සැප්තැම්බර්	82,950,641	144,727,507	138,100,571	152,906,330	136,495,645	116,716,100	178,854,932	724,154,104	835,064,061
ඔක්තෝබර්	127,316,886	156,768,427	176,677,684	149,523,186	144,617,361	98,523,887	251,229,133	765,088,807	926,479,158
නොවැම්බර්	138,543,377	169,522,592	146,612,176	191,526,236	125,879,311	114,112,419	191,754,301	776,136,812	875,150,133
දෙසැම්බර්	166,120,791	181,737,644	155,126,605	145,948,818	124,631,998	190,164,310	177,259,607	784,885,259	943,521,859
	1,318,710,388	**1,633,782,647**	**1,882,434,480**	**1,913,753,705**	**1,183,973,883**	**1,690,444,675**	**1,707,744,125**	**6,891,998,572**	**10,234,160,450**



03. මිල තක්සේරු කිරීම (ගුවන් භාණ්ඩ)

මාසය	A/E එකතුව (රු.)
ජනවාරි -24	14,107,853
පෙබරවාරි-24	4,560,127
මාර්තු-24	11,636,614
අප්‍රේල්-24	6,316,606
මැයි-24	7,254,313
ජූනි-24	8,339,537
ජූලි-24	11,594,887
අගෝස්තු-24	7,716,252
සැප්තැම්බර් -24	5,822,072
ඔක්තෝබර්-24	6,374,018
නොවැම්බර්-24	7,517,849
දෙසැම්බර්-24	8,768,356
එකතුව	**100,008,484**

04. VRIU කාර්යසාධනය

වසර	සිද්ධි සංඛ්‍යාව	පනවන ලද දඩ/ රාජසන්තක කිරීම් (රු.)
2022	49	128,426,044
2023	53	231,196,843
2024	41	192,788,267

05. 2024 වසරේ සිදු කළ වැඩිදියුණු කිරීම්

05.1 ස්වයංක්‍රීය **A/E** අයකර ගැනීමේ පද්ධතිය (යාවත්කාලීන)

රේගු සටහන්කර වල ප්‍රකාශකර ඇති වටිනාකම සංශෝධනය කිරීමෙන් පසුව එය **ASYCUDA** පද්ධතියේ වෙනස් කළ යුතු අතර මෙය බොහෝ වේලාවක් ගතවන සංකීර්ණ ක්‍රියාවලියකි. මධ්‍යම මිල පිරික්සුම් අංශය විසින් ශ්‍රී ලංකා රේගුව තුළ වැඩිදියුණු කරන ලද මෘදුකාංගයක් භාවිතයෙන් මෙම ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කරනු ලැබූ අතර එමගින් පහත සඳහන් ධනාත්මක ප්‍රතිඵල ලැබී ඇත.

:

- නිලධාරීන් දෙදෙනෙකු **(02)** විසින් පමණක් දෛනිකව රේගු සටහන්කර **80** සිට **120**කට වැඩි ප්‍රමාණයකට අදාළ කටයුතු සිදු කරනු ලැබේ.
- මෙය භාවිතයට ගත්පසු පද්ධති අක්‍රිය කාලයක් තිබී නොමැත.

05.2 ස්වයංක්‍රීය යොමුකිරීමේ පද්ධතිය **(Automated Appointing System)**

ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම තීරණය කිරීම සඳහා, සෑම රේගු සටහන්කරයක්ම ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ, රේගු පරීක්ෂක සහ තක්සේරු නිලධාරීන්ට භාරදිය යුතුය. මෙය ප්‍රමාදයන් මෙන්ම අනෙකුත් අපහසුතාවන් ඇතිකරන අතින් සිදුකරන ලද ක්‍රියාවලියක් විය. මීට විසඳුමක් ලෙස, මධ්‍යම මිල පිරික්සුම් අංශය විසින් ශ්‍රී ලංකා රේගු ඉතිහාසයේ ප්‍රථම වතාවට ආයතනය තුළ වැඩිදියුණු කරන ලද ස්වයංක්‍රීයව නිලධාරීන් යොමු කිරීමේ පද්ධතියක් යොදවා ගනු ලැබීය. එමගින් පහත සඳහන් ධනාත්මක ප්‍රතිඵල ලැබී තිබේ.

- **2023/08/08** දින මෙය ක්‍රියාවට යොදවනු ලැබූ දින සිට රේගු සටහන්කර **28,000** කට අධික ප්‍රමාණයක් නියම කරන ලදී.
- එක් එක් නිලධාරීන් වෙත යොමුකරන ලද රේගු සටහන්කර අධීක්ෂණය කිරීම සඳහා ජංගම දුරකථන/ ඩෙස්ක් ටොප් පරිගණක මත පදනම් වූ තත්‍ය කාලීන පුවරු
- පෙර අනාවැකි කිව නොහැකි සහ ඒකාකාරී කාර්ය බෙදාදීම් සඳහා වැඩිදියුණු කරන ලද ඇල්ගොරිතම
- *(එනම්.: සම්මන-අපගමන, රථා විශ්ලේෂණය, අහඹු සංඛ්‍යා උත්පාදන පදනම් වූ)*
- මෙය භාවිතයට ගත්පසු කිසිසේත්ම පද්ධති අක්‍රිය කාලයක් තිබී නොමැත.

8.3 ආයතනික පර්ශදය

8.3.1 ප්‍රතිපත්ති, සැලසුම් සහ පර්යේෂණ අංශය

8.3.2 අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය

8.3.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

8.3.4 විශේෂිත සේවා අංශය

8.3.1 ප්‍රතිපත්ති , සැලසුම් හා පර්යේෂණ අංශය

හැඳින්වීම

ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපත්තිමය ගැටලු, තීරුබදු ගැටලු හා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ වගකීම දරයි. එම අංශයේ පුළුල් අරමුණු පහත දැක්වෙන පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය:

- දෙපාර්තමේන්තුමය ප්‍රතිපත්ති සකස් කිරීමේදී සහ ඒවා අදාල අංශ මගින් ක්‍රියාත්මක කිරීම පිණිස ක්‍රියාවලි වලට පරිවර්තනය කිරීමේදී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහයවීම; දැනගැනීම සහ අනුකූලවීම සඳහා එකී තීරණ නිලධාරීන්ට දැනුම් දීම.
- ඉල්ල සිටින විට ආර්ථික/ වෙළඳ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා ;
- එකී ප්‍රතිපත්ති තීරු බදු ක්‍රියාමාර්ග වලට පරිවර්තනය කිරීම සඳහා ;
- රේඛීය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වලට සහයවීම.
- දැනගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල පරිදි බදු ක්‍රියාමාර්ග පිළිබඳව නිලධාරීන්ට සහ මහජනයාට දැනුම් දීම.
- ජාතික රේගු තීරු බදු මාර්ගෝපදේශ වඩාත් යාවත්කාලීන තත්වයෙන් පවත්වා ගෙන යන බව තහවුරු කරමින්, සියලු තීරු බදු සම්බන්ධ විමසුම් කටයුතු සිදුකිරීම.
- රේගු තොරතුරු මධ්‍යස්ථානය හරහා ස්වයං අනුකූලතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා මහජනයා ඉල්ලා සිටින තොරතුරු තහවුරු කිරීම.
- ලෝක රේගු සංවිධානය, එහි කලාපීය ආයතන සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන (ලෝක වෙළඳ සංවිධානය සහ MEA ලේකම් කාර්යාල) සහ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික වෙළඳ සාකච්ඡා වලදී ශ්‍රී ලංකා රේගුව නියෝජනය කිරීම.
- දෙපාර්මේන්තුවට සිය දැක්ම ලඟාකර ගැනීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි පරිවර්තනය කිරීමේ දී ලෝක රේගු සංවිධානයේ නිර්දේශ සහ ප්‍රශස්ත ක්‍රියාමාර්ග අනුගත කර ගැනීම.

ප්‍රධාන කාර්යයන්

- දෙපාර්තමේන්තු නියෝග (DOPLs) මගින් මහ භාණ්ඩාගාරය විසින් සම්පාදනය කරන ලද බදු ප්‍රතිපත්ති තීරණ ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තු නියෝග (DOPLs) මගින් ශ්‍රී ලංකා රේගුවේ ප්‍රතිපත්ති තීරණ සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ආනයන බදු මාර්ගෝපදේශ සහ අපනයන බදු මාර්ගෝපදේශ යාවත් කාලීන කිරීම සහ නඩත්තු කිරීම.
- ජනතාවගේ සහ කාර්යමණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ජාතික ආනයන බදු මාර්ගෝපදේශ පොතක් ආකාරයෙන් සහ CD ආකාරයෙන් පළ කිරීම.
- බදු ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේදී අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විට සංයෝජිත වර්ගීකරණ පද්ධතියේ ජාතික උප බෙදුම් ඇති කිරීම සඳහා භාණ්ඩාගාරයට සහය වීම.
- අදාල අංශයන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම මගින් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.
- ලෝක රේගු සංවිධානය (WCO), WCO ආසියා ශාන්තිකර කාර්යාලය, ලෝක රේගු සංවිධානය (WTO), අනෙකුත් ජාත්‍යන්තර වෙළඳ සංවිධාන සහ රේගු පරිපාලනයන් හා අදාල කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- අනෙකුත් රේගු පරිපාලනයන් සමඟ රේගු සහයෝගීතාවය සහ අන්‍යෝන්‍ය පරිපාලන සහය ගිවිසුම් හා අදාල කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- වරණීය වෙළඳ ගිවිසුම් (PTAs) සහ නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) හා අදාල කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- නාමකරණ කමිටුව, වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ කමිටුව සහ අවදානම් කළමනාකරණ කමිටුවේ ලේඛන සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ අනෙකුත් තාක්ෂණ කමිටු කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- තීරු බදු, වෙළඳාම සහ නිෂ්කාශන ක්‍රියාවලි ආදිය හා අදාල කටයුතු පිළිබඳව පර්යේෂණ සිදුකිරීම.
- ක්‍රියාවලි අත්පොත සකස් කිරීම සහ යාවත් කාලීන කිරීම.
- විනිමය අනුපාතය පිළිබඳ දැන්වීම් සකස් කිරීම සහ පළකිරීම.
- මහජන සම්බන්ධතා සහ රේගු තොරතුරු මධ්‍යස්ථානය පිළිබඳව කටයුතු කිරීම.
- වාර්ෂිකව පැවැත්වෙන ලෝක රේගු දින සැමරුම් සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

2024 වසරේ පළකරන ලද දෙපාර්තමේන්තු නියෝග **(DOPL)**

දෙපාර්තමේන්තු නියෝග **(DOPL)** අංකය	දිනය	විස්තරය
1316R	01.01.2024	**1989** අංක **13** දරණ නිෂ්පාදන බදු **(**විශේෂ විධිවිධාන**)** පනත යටතේ ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදනය
1637	02.01.2024	**2007** අංක **48** දරණ විශේෂ වෙළඳ භාණ්ඩ පනතේ **5** වන වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගය
1638	02.01.2024	**2023** අංක **33** දරණ මුදල් පනත
562AF	03.01.2024	නාමකරණ සහ වර්ගීකරණ කමිටුව
1636 A	04.01.2024	එකතු කළ අගය මත බදු සඳහා සංශෝධන
1639	03.01.2024	රේගු ආනයන බදු සහන ලබාදීම (පෙට්‍රල්, සංයෝජිත වර්ගීකරණ 2710)
1640	04.01.2024	ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි රසායනික ද්‍රව්‍ය නියාමනය කිරීම
1641	05.01.2024	ආදායම් සංරක්ෂණ ආඥාව
1642	05.01.2024	**1979** අංක **40** දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ **14** වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගය
1636 B	10.01.2024	**2023** අංක **33** දරණ මුදල් පනත
1643	08.01.2024	2007 අංක **48** දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ **5** වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගය
1638A	10.01.2024	**2023** අංක **33** දරණ මුදල් පනත - (මෝටර් වාහන)
1644	11.01.2024	රේගු ආනයන තීරුබදු (CID) - රේගු ආනයන තීරුබදු නිදහස් කිරීම් (බිත්තර, සංයෝජිත වර්ගීකරණ 0407)
1198 AD	11.01.2024	මෙහෙයුම් උපදෙස් අංක 02/2024 – **2024** අංක **01** දරණ ආනයන හා අපනයන **(**පාලන**)** රෙගුලාසි
1198 AE	12.01.2024	මෙහෙයුම් උපදෙස් අංක 02/2024 - **2024** අංක **01** දරණ ආනයන හා අපනයන **(**පාලන**)** රෙගුලාසි
1227 R	14.09.2024	අභියාචනා කමිටුව
1227 S	19.01.2024	අභියාචනා කමිටුව
1645	17.01.2024	යුරෝපා සංගමයෙන් අනවසර පළිබෝධ නාශක ආනයනය කිරීම
1636 C	17.01.2025	එකතු කළ අගය මත බදු සඳහා සංශෝධන
1636 D	19.01.2024	එකතු කළ අගය මත බදු සඳහා සංශෝධන
1646	19.01.2024	සත්ව ආහාර සහ අමුද්‍රව්‍ය සඳහා පිරිවිතර
1636 E	26.01.2024	එකතු කළ අගය මත බදු සඳහා සංශෝධන
1647	02.02.2024	ශ්‍රී ලංකා රේගුවේ අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU) ස්ථාපිත කිරීම
1648	02.02.2024	ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර නිදහස් වෙළඳ ගිවිසුම යටතේ **2024.01.04** දිනැති අංක **2365/50** සහ **51** දරණ අති විශේෂ ගැසට් නිවේදනයන්හි උපලේඛනයන්ට අදාළ සංශෝධන
1453 BD	09.02.2024	**2024** අංක **02** දරණ ආනයන හා අපනයන **(**පාලන**)** රෙගුලාසි
1649	12.02.2024	වරාය පාලන ඒකකය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි
1650	19.01.2024	**2007** අංක **48** දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ **5** වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගය
1651	22.02.2024	ස්වයංක්‍රීය අවදානම්පාදක භාණ්ඩ වරණීයතාවය හරහා බලාත්මකය කිරීමේ සහ/හෝ පරීක්ෂන අංශ/ ඒකක වෙත යොමු කරන ලද අධි අවදානම් සහිත භාණ්ඩවල පරීක්ෂන ප්‍රතිඵල වාර්තා කිරීම
1198AF	28.02.2024	නාමකරණ සහ වර්ගීකරණ කමිටුව
1652	29.03.2024	**01/2024** දරණ භාණ්ඩ වර්ගීකරණ රෙගුලාසි මත ප්‍රගමන රේගු රීති
1653	01.03.2024	**2007** අංක **48** දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ **5** වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගය
1227 T	26.02.2024	අභියාචනා කමිටුව
810 C	28.02.2024	ගුවන්තොටුපළ හරහා අතේ ගෙන යන මැණික් පාර්සල් සඳහා වන නිෂ්කාශන ක්‍රියාපටිපාටිය
1552 N	29.02.2024	මෙහෙයුම් උපදෙස් අංක 05/2024
1654	13.03.2024	රේගු ආනයන තීරුබදු නිදහස් කිරීම්

1453 BE	20.03.2024	**2024** අංක **05** දරණ ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි
572 F	19.03.2024	අවදානම් කළමනාකරණ කමිටුව (RMC)
1655	22.03.2024	පකිස්ථාන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ බාස්මතී සහල් ආනයනය කිරීම
1227 U	24.03.2024	අභියාචනා කමිටුව
1656	26.03.2024	**2007** අංක **48** දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ **2** සහ **5** වගන්ති යටතේ සිදු කරන ලද නියෝග
1657	25.03.2024	දුරස්ථ පාලක ළමයින් පදින වාහන/ මොටර් රථ සහ සමාන සෙල්ලම් භාණ්ඩ සංයෝජිත වර්ගීකරණය සහ නිදහස් කිරීම
1384 Z	08.04.2024	**2011** අංක **18** දරණ ගුවන්තොටුපළ සහ වරාය සංවර්ධන බදු පනතේ **3 (3)** වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගය
562 AG	08.04.2024	නාමකරණ සහ වර්ගීකරණ කමිටුව
1627 A	22.04.2024	බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) කමිටුව
1658	22.04.2024	සී/ස M/s. Boston Devices (පුද්ගලික) සමාගමේ රේගු පහසුකම් අත්හිටුවීම තාවකාලිකව ඉවත් කිරීම
1198 AG	10.04.2024	මෙහෙයුම් උපදෙස් අංක. 06/2024
562 AH	29.04.2024	නාමකරණ සහ වර්ගීකරණ කමිටුව
1227 V	16.05.2024	අභියාචනා කමිටුව
1453 BF	22.05.2024	**2024** අංක **07** දරණ ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි
1453 BG	27.05.2024	මෙහෙයුම් උපදෙස් අංක 07/2024
1658 A	20.06.2024	සී/ස M/s. Boston Devices (පුද්ගලික) සමාගමේ රේගු පහසුකම් අත්හිටුවීම තාවකාලිකව ඉවත් කිරීම
562 AI	01.07.2024	නාමකරණ සහ වර්ගීකරණ කමිටුව
1453 BH	05.07.2024	මෙහෙයුම් උපදෙස් අංක 08/2024
1453 BI	05.07.2024	මෙහෙයුම් උපදෙස් අංක 09/2024
1198 AH	12.07.2024	මෙහෙයුම් උපදෙස් අංක. 10/2024 | තෝරාගත් භාණ්ඩ ආනයනය කිරීම සඳහා පොදු අනුමැතිය ලබාදීම
1658 B	18.07.2024	රේගු පහසුකම් අත්හිටුවීම ඉවත් කිරීම
1453 BJ	26.07. 2024	මෙහෙයුම් උපදෙස් අංක 11/2024
1227 W	23.08.2024	අභියාචනා කමිටුව
1552 O	26.08.2024	ගෙවීම් කොන්දේසි පිළිබඳ ආනයන පාලන අවශ්‍යතා
1453 BK	18.09.2024	මෙහෙයුම් උපදෙස් අංක 14/2024
1552 P	18.09.2024	මෙහෙයුම් උපදෙස් අංක 13/2024
1627 B	13.11.2024	ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ (RM) ගේ **2024.11.12** දිනැති අභ්‍යන්තර මැමෝ පත්‍රය
118Y	18.11.2024	ජ්‍යෙෂ්ඨ කලමනාකරණ කමිටු රැස්වීමේ සටහන්
1530A	25.11.2024	ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ (RM) ගේ **2024.11.18** දිනැති අභ්‍යන්තර මැමෝ පත්‍රය
1198 AI	05.12.2024	**2024** අංක **13** දරණ ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි
1198 AJ	04.12.2024	මෙහෙයුම් උපදෙස් අංක 16/2024
1453 BL	20.12.2024	මෙහෙයුම් උපදෙස් අංක 16/2024
1453 BM	27.12.2024	මෙහෙයුම් උපදෙස් අංක 16/2024
1453 BN	24.12.2024	අංක **01/2025** ආනයන අපනයන (පාලන) රෙගුලාසි
1198 AK	24.12.2024	අංක **15/2024** ආනයන අපනයන (පාලන) රෙගුලාසි
1659	17.05.2024	**2007** අංක **48** දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ **5** වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගය
1660	22.05.2024	**1969** අංක **01** දරණ ආනයන හා අපනයන පාලන පනත යටතේ ප්‍රමිතකරණ සහ තත්ව පාලන රෙගුලාසි
1661	19.06.2024	පාකිස්ථාන තනි කවුළුව (PSW) හරහා Electronic Certificate of Origin (E-CO) නිකුත් කිරීම
1662	02.08.2024	**2007** අංක **48** දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ **5** වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගය
1663	05.09.2024	**1979** අංක **40** දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ **14** වගන්තිය යටතේ සිදුකරන ලද නියෝගය
1664	25.09.2024	රේගු සේවා ගාස්තු අනුපාත
1665	02.10.2024	**2007** අංක **48** දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ **5** වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගය
1666	14.10.2024	**2007** අංක **48** දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ **5** වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගය

1667	01.11.2024	**2007** අංක **48** දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ **5** වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගය
1668	30.11.2024	**2007** අංක **48** දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ **5** වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගය
1669	12.12.2024	මෝටර් වාහන තොරතුරු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට සම්බන්ධ කිරීම

ජාත්‍යන්තර සබඳතා ඒකකය

I. ජාත්‍යන්තර රේගු දිනය සැමරීම- **2024**

ලෝක රේගු සංවිධානයේ අනුග්‍රහය ඇතිව, සෑම වසරකම ජනවාරි **26** වන දින විශේෂ තේමාවක් යටතේ ජාත්‍යන්තර රේගු දිනය සමරනු ලැබේ. සෑම වසරකම වෙනස් වන තේමාව මඟින් වසර පුරාම ලෝක රේගු සංවිධානයේ සාමාජික රටවල ක්‍රියාකාරකම් සහ ප්‍රයත්නයන් සඳහා මග පෙන්වනු ලැබේ.

බෙල්ජියමේ බ්‍රසල්ස්හි මූලස්ථානය පිහිටා ඇති ලෝක රේගු සංවිධානය **1952** වර්ෂයේදී ස්ථාපිත කරන ලද අතර රටවල් **180** කට වැඩි සංඛ්‍යාවක රේගු පරිපාලනයන්ගෙන් එහි සාමාජිකත්වය සමන්විත වේ.ගෝලීය වශයෙන් රේගු බලධරයන් අතර සහයෝගීතාව වර්ධනය කරමින් සහ තම සාමාජික රටවලට තාක්ෂණික සහාය ලබාදෙමින් රේගු ක්‍රියාපටිපාටීන්

සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ ප්‍රශස්ත භාවිතයන් වැඩිදියුණු කිරීම කෙරෙහි සංවිධානය අවධානය යොමු කරනු ලැබ.

2024 වර්ෂයේ ලෝක රේගු දිනයේ තේමාව වූයේ " අභිප්‍රාය සමඟින් සාම්ප්‍රදායික සහ නව හවුල්කරුවන් සමඟ කටයුතු කරන රේගුව" යන්නයි. මෙම තේමාව මඟින් රේගු බලධාරීන් අතර සහයෝගීතාවයේ වැදගත් කාර්යභාරය සහ හවුල්කරුවන්ගේ විවිධත්වය ඉස්මතු කොට දක්වනු ලැබේ.

රජයේ අනෙකුත් නියෝජිතායතන, ජාත්‍යන්තර සංවිධාන සහ කර්මාන්ත පවත්වාගෙන යන්නන් සාම්ප්‍රදායික සහයෝගීතාකරුවන් යන්නට ඇතුළත් විය හැක. ඒ සමඟම නැඟී එන හවුල්කරුවන් යන්නට නවීන තාක්ෂණයන්, පුද්ගලික අංශයේ අස්ථීන්, සහ ප්‍රජා සංවිධාන ඇතුළත් විය හැක. රේගු පරිපාලනය සහ ජාත්‍යන්තර වෙළඳාම යන ක්ෂේත්‍ර තුළ පවතින අභියෝග සහ අවස්ථාවන්ට මුහුණ දීමේදී සහයෝගීතාවයේ පවතින වැදගත්කම පිළිගනිමින් නිශ්චිත අරමුණු ඉටුකරනු ලබන අර්ථවත් හවුල්කාරිත්වයන් ඩෙයීමත් කිරීම අවධාරණය කරනු ලැබේ.

2024 වර්ෂයේ ජාත්‍යන්තර රේගු දින **2024** ජනවාරි මස **26** වන දින සැමරුම මුදල ්රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මහතාගේ ප්‍රධානත්වයෙන් රේගු මූලස්ථානයේදී පවත්වන ලදී.

II. ශ්‍රී ලංකා රේගුවට අදාල ජාත්‍යන්තර ගිවිසුම් පිළිබඳ කාර්ය සාධනය

අත්සන් කරන ලද දැනට ක්‍රියාත්මක ගිවිසුම්			
අනු අංකය	පාර්ශව	ගිවිසුම් වර්ගය	තත්වය
1	ශ්‍රී ලංකාව සහ ඉරානය	රේගු සහයෝගීතාවය	**2007.11.27** දින අත්සන් කරන ලදී.
2	ශ්‍රී ලංකාව සහ පකිස්ථානය	රේගු සහයෝගීතාවය	**2010.11.28** දින අත්සන් කරන ලදී.
3	ශ්‍රී ලංකාව සහ චීනය	අවබෝධතා ගිවිසුම	**2014.09.06** දින අත්සන් කරන ලදී.
4	ශ්‍රී ලංකාව සහ ඉන්දියාව	රේගු සහයෝගීතාවය	**2015.03.13** දින අත්සන් කරන ලදී.
5	ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව	අවබෝධතා ගිවිසුම	**2023.05.21** දින අත්සන් කරන ලදී.
6	ශ්‍රී ලංකාව සහ මාලදිවයින	රේගු සහයෝගීතාවය	**2024.02.21** දින අත්සන් කරන ලදී.
7	ශ්‍රී ලංකාව සහ රුසියාව	රේගු සහයෝගීතාවය	**2024.10.30** දින අත්සන් කරන ලදී.
අත්සන් කරන ලද දැනට ක්‍රියාත්මකව නොවූ ගිවිසුම්			
8	ශ්‍රී ලංකාව සහ තුර්කිය	රේගු සහයෝගීතාවය	**2021.11.26** දින අත්සන් කරන ලදී. ජාතික අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවත් ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කිරීමට සූදානම් බවත් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් තුර්කි පාර්ශවයට **2024/06/13** දින දැනුම්දෙන ලදී.
9	ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය **(UAE)**	රේගු සහයෝගීතාවය	**2017.11.18** දින අත්සන් කරන ලදී. අවසන් නිවේදනය (සටහන් යොමුව - **L/E/GEN/914)** නිකුත් කරන ලද අතර **UAE** පාර්ශවයෙන් ප්‍රතිචාර

			අපේක්ෂාවෙන් පසුවේ.
ඉදිරි කටයුතු සඳහා අදාළ බලදරයින් වෙත යොමු කරන ලද ගිවිසුම්			
10	ශ්‍රී ලංකාව සහ බංග්ලාදේශය අතර	රේගු සහයෝගීතාවය	නීතිපති නිරීක්ෂණ ඇතුළත් ගිවිසුම් කෙටුම්පත බංග්ලාදේශ පාර්ශවය වෙත යොමුකිරීම සඳහා **2023.10.10** දින විදේශ නටයුතු අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. **2024.04.16** සහ **2024.10.01** දින සිහි කැඳවීම් යවන ලදී.
11	ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර	රේගු සහයෝගීතාවය	අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම **2025** දක්වා නැවත සැලසුම් කිරීමට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යෝජනා කර ඇති බව විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් වියට්නාම සහ ශ්‍රී ලංකා පාර්ශවයන් වෙත දන්වා ඇත.
12	ශ්‍රී ලංකාව සහ ජෝර්දානය	රේගු සහයෝගීතාවය	කටයුතු කරමින් පවතී
13	ශ්‍රී ලංකාව සහ මෙක්සිකෝව	රේගු සහයෝගීතාවය	කටයුතු කරමින් පවතී
14	ශ්‍රී ලංකාව සහ කටාර්	රේගු සහයෝගීතාවය	කටයුතු කරමින් පවතී
15	ශ්‍රී ලංකාව සහ යුක්‌රේනය	රේගු සහයෝගීතාවය	කටයුතු කරමින් පවතී
16	ශ්‍රී ලංකාව සහ අමෙරිකා එක්සත් ජනපදය	රේගු සහයෝගීතාවය	කටයුතු කරමින් පවතී
17	ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය	රේගු සහයෝගීතාවය	කටයුතු කරමින් පවතී
18	ශ්‍රී ලංකාව සහ සවුදි අරාබිය	රේගු සහයෝගීතාවය	කටයුතු කරමින් පවතී
බිම්ස්ටෙක් **(BIMSTEC)** ගිවිසුම්			
19	බිම්ස්ටෙක් **(BIMSTEC)**	රේගු සහයෝගීතාවය	කටයුතු කරමින් පවතී
20	බිම්ස්ටෙක් **(BIMSTEC)**	ප්‍රභවස්ථාන රීති	කටයුතු කරමින් පවතී
21	බිම්ස්ටෙක් **(BIMSTEC)**	වෙළඳාම සඳහා පහසුකම් සැළසීම	කටයුතු කරමින් පවතී
ක්‍රියාත්මකව පවතින වරණීය වෙළඳ ගිවිසුම්			
22	ආසියා පැසිපික් නිදහස් වෙළඳ ගිවිසුම (APTA)		
23	ඉන්දියා- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම		
24	පකිස්ථාන- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම		
25	දකුණු ආසියා නිදහස් වෙළඳ ප්‍රෙද්ශ පිළිබඳ ගිවිසුම (SAFTA)		
26	ආසියා නිදහස් වෙළඳ ප්‍රෙද්ශ පිළිබඳ ගිවිසුම (AFTA)		
27	සිංගප්පූරු- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම		
28	ගෝලීය වෙළඳ වරණීයතා පිළිබඳ ගිවිසුම (GSTP)		

8.3.2 අනුකූලතා සහ පහසුකම් සැලසීමේ (C&F) අංශය

හැඳින්වීම

ශ්‍රී ලංකා රේගුවේ අනුකූලතා හා පහසුකම් සැළසීමේ අංශය, මූලික වශයෙන්ම පශ්චාද් නිෂ්කාශන විගණන (PCA) සිදුකිරීම සඳහා වගකිව යුතුවේ. මීල පිරික්සුම් අංශය යටතේ පශ්චාද් නිෂ්කාශන හා විගණන ශාඛාව ලෙස 2000 වර්ෂයේදී පශ්චාද් නිෂ්කාශන විගණන කාර්යයන් ප්‍රථමයෙන් ආරම්භ විය. පශ්චාත් විගණන හා නෞභාර ලේඛන ඒකකය (PAMU) සහ විගණන හා පරීක්ෂණ ශාඛාව (A&ID) ඒකාබද්ධ කිරීමෙන් මෙම ශාඛාව ස්ථාපනය කරන ලදී.

වෙළඳාම ආර්ථික වර්ධනයේ නියමුවා වන අතර නිරතුරුව වර්ධනය වන ජාත්‍යන්තර වෙළඳාම සහ භාණ්ඩ නිෂ්කාශනය වේගවත් කිරීමේ අවශ්‍යතාවය සමගින් දේශසීමාවන්හි දී කෙටි කාලරාමුවක් තුළ රේගුව මගින් සියලු භාණ්ඩ තොග සඳහා බදු අයකිරීම පිළිබඳව නිශ්චිතව තීරණය කිරීම ප්‍රායෝගික නොවේ. එසේම වංචාවක් පිළිබඳව සැකයන් නැති නම් යම් ප්‍රශ්ණයක් විසඳන තෙක් භාණ්ඩ නිෂ්කාශනය ප්‍රමාද කිරීම සුදුසු නොවේ. එබැවින් පරිපාලනයන් බොහොමයක්ම, අවදානම් කළමනාකරණ තාක්ෂණික ක්‍රම භාවිතයෙන් දේශසීමාවේ දී වරණීය සහ ඉලක්කගත පරීක්ෂා කිරීම් සිදුකරන අතරම පශ්චාද් නිෂ්කාශන පරිසරයක දී සිය පාලනය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. සිය සම්පත් වඩාත් කාර්යක්ෂම ලෙස ඉලක්ක කිරීම සඳහා පශ්චාද් නිෂ්කාශන විගණන අංශයට ක්‍රියාශීලී අවදානම් කළමනාකරණ වැඩසටහනක් අත්‍යාවශ්‍ය වේ.

ජාත්‍යන්තර වෙළඳාම වැඩිදියුණුවීමත්, ලෝක රේගු සංවිධානයේ රේගු මීල පිරික්සුම් ගිවිසුම ඍර්ථක ලෙස ක්‍රියාත්මත වීමත් සමඟ 2010 වර්ෂයේදී පශ්චාද් නිෂ්කාශන විගණන අංශය (PCAD) ලෙස ඒ සඳහාම වෙන්වූ අංශයක් ස්ථාපනය කරන ලදී. දෙපාර්තමේන්තු නියෝග 883 (DOPL 883) අනුව, අනුකූලව කටයුතු කරන වෙළඳුන් සඳහා පහසුකම් සැළසීමේ අවශ්‍යතාවය හා රේගු නිෂ්කාශන ක්‍රියාවලියේ ප්‍රමාදයන් හඳුනා ගැනීමට හා වංචාවන් අනාවරණය කර ගැනීම සළකා අවදානම් කළමනාකරණ ඒකකය ස්ථාපනය කරනු ලැබීය. එබැවින් එය 2013 සැප්තැම්බර් 26 වන දින සිට බලපැවැත්වෙන පරිදි ආයතනික පර්ෂදය තුළ එක් අංශයක් යටතට ගෙන "අනුකූලතා හා පහසුකම් සැළසීමේ අංශය" ලෙස නම් කරනු ලැබීය.


කෙසේ වුවද, පසු කාලයේදී එහි කාර්යයන් පුලුල් වීමත් සමඟ අවදානම් කළමනාකරණ ඒකකය, අනුකූලතා හා පහසුකම් සැළසීමේ අංශයෙන් වෙන්කර මධ්‍යම බුද්ධි අංශය යටතේ ක්‍රියාත්මක විය. එකී කාර්යයන් තවදුරටත් පුළුල්වීමත් සමඟ අවදානම් කළමනාකරණ ඒකකය, ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වෙනත් අංශයක තත්වයට උසස් කරනු ලැබීය. වර්තමානයේදී "අනුකූලතා හා පහසුකම් සැළසීමේ අංශය" පශ්චාද් නිෂ්කාශන විගණන අංශය, ජාතික ආනයන මීල පිරික්සුම් දත්ත ගබඩා ඒකකය (NIVDU) සහ මුදල් ආපසු ගෙවීමේ ශාඛාවෙන් සමන්විත වේ.
අනුකූලතා හා පහසුකම් සැළසීමේ අංශයේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ වෙළඳාම සඳහා පහසුකම් සැළසීම සහ රේගු පාලනය අතර සමතුලිතතාවට තහවුරු කිරීමයි. පශ්චාද් නිෂ්කාශන විගණන (PCA) ක්‍රියාවලිය එවන් එක් රේගු පාලන ක්‍රියාවලියකි. පශ්චාද් නිෂ්කාශන විගණන (PCA) ක්‍රියාවලිය ව්‍යුහාත්මක පරීක්ෂා කිරීමක් වන අතර රේගුව මගින් භාණ්ඩ නිදහස් කිරීමෙන් පසුව අදාල වාණිජ දත්ත, වෙළඳ ගිවිසුම්, මූල්‍ය හා මූල්‍ය නොවන වාර්තා, භෞතික භාණ්ඩ තොග හා වෙළඳුන්ගේ වෙනත් වත්කම් පරීක්ෂා කෙරේ. එහි අරමුණ වෙළඳුන්ගේ අනුකූලතාව මැනීම හා වැඩිදියුණු කිරීම වේ. ලෝක වෙළඳ සංවිධානයේ රේගු මීල පිරික්සුම් ගිවිසුමට අනුකූලවීම ඇතුළුව අරමුණු ගණනාවකදී රේගුවේ පාලනය ඵලදායි බව තහවුරු කිරීමේදී පශ්චාද් නිෂ්කාශන විගණනය අත්‍යාවශ්‍ය මෙවලමක් බව ප්‍රත්‍යක්ෂ වී ඇත. එය අනුකූලතාවය මැනීම හා ප්‍රතිඵල මත පදනම්ව අනාගත පාලනයන් සියුම්ව සකස් කිරීම මගින් රේගුවට එක් එක් වෙළඳුන් සඳහා අදාල අවදානම් මට්ටම මැන බැලීම පහසු කරමින් ඵලදායි රේගු අවදානම් කළමනාකරණ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරයක් ද ඉටුකරයි.
පශ්චාද් නිෂ්කාශන විගණනයේ තවත් අරමුණක් වන්නේ රේගු ප්‍රකාශයන්හි නිරවද්‍යතාවය හා සත්‍යතාව තහවුරු කර ගැනීම හා ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම් සළසන අතරම, එම ලේඛන රේගු අවශ්‍යතාවන්ට අනුකූල වන බව තහවුරු කිරීම වේ. පශ්චාද් නිෂ්කාශන විගණනය මගින් ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ හැකියාව ලබාදේ. එසේම රේගු ක්‍රියාවලීන් හා අවශ්‍යතාවන් පිළිබඳව ව්‍යාපාරික ප්‍රජාව සඳහා වඩාත් හොඳ අවබෝධයක් ලබාදීම මෙන්ම රේගුව සඳහා සිය අනුකූලතාවය වැඩිදියුණු කිරීම සඳහා වෙළඳුන් දිරිමත් කිරීම සිදු කෙරේ.

පශ්චාද් නිෂ්කාශන විගණනයන් මූලික කාණ්ඩ දෙකකි. එනම්, ගනුදෙනු පාදක විගණන (TBA) හා පද්ධති පාදක විගණන (SBA) වේ. ආනයන හෝ අපනයන ප්‍රකාශන පිළිබඳ විශේෂ විස්තර පරීක්ෂා කිරීම් ගනු දෙනු පදනම් විගණන (TBA) වේ. සැකයක් ඇත්නම් රේගුවේ විගණක විසින් වැඩිදුර විස්තර ඉල්ලා දුරකථන හෝ විද්‍යුත් තැපෑල ඔස්සේ ආනයනකරු/ප්‍රේෂණලාභියා හෝ ඔවුන්ගේ නියෝජිතයෙකු හා සම්බන්ධ වේ. ඉල්ලා සිටි සාක්ෂි රේගු කාර්යාලයේ සිටින රේගු විගණක වෙත යවනු ලැබේ. පද්ධති පාදක විගණන (SBA) යනු හඳුනාගත් ශක්තීන් හා දුර්වලතා ක්ෂේත්‍රයන්හි ගවේෂණය හා පරීක්ෂා කිරීම සිදු කරමින් ආනයනකරු හෝ අපනයනකරුගේ අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රමාණුකූලව ඇගයීම වේ. ඉදිරිපත් කරන ලද රේගු ප්‍රකාශයන්හි නිරවද්‍යතාව තහවුරු කිරීම සහ ව්‍යාපාරයක අදාල නෛතික අනුකූලතාවයේ මට්ටම පිළිබඳ අදහසක් ඇති කිරීම හා තහවුරු වූ දුර්වලතාවන් නිවැරදි කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම විගණනයේ අරමුණ වේ.

ප්‍රධාන විගණන ක්‍රම දෙකට අමතරව, පශ්චාද් නිෂ්කාශන විගණන තවත් කාණ්ඩ දෙකකින් සමන්විත වේ. ඒවා නම්, තේමා පදනම් විගණන හා විමර්ශනාත්මක ආකාර විගණනයන් වේ. ශ්‍රී ලංකාවේ අනුකූල වෙළඳුන් සහ අනුකූල නොවන වෙළඳුන් යන කාණ්ඩ දෙකටම අයත් වෙළඳුන් හමුවේ. අනුකූල නොවන වෙළඳුන් පිළිබඳ ගැටළුව විසඳීම සඳහා අපට තේමා පදනම් විගණන හා විමර්ශනාත්මක ආකාර විගණනයන් යන දෙකම සිදුකිරීම අවශ්‍යවේ.

ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් විශේෂ තාක්ෂණ සහය ලබාදීම මගින් ශ්‍රී ලංකා රේගුවේ පශ්චාද් නිෂ්කාශන විගණන පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා සම්පූර්ණ සහය ලබාදී ඇත. ADB විසින් පද්ධති පාදක විගණන (SBA) ඇතුළුව විගණනයේ නව ක්ෂේත්‍ර ආවරණය කරමින් රේගු නිලධාරීන්ට පුහුණුව ලබාදී තිබේ. පද්ධති පාදක විගණනයන්හි අරමුණ ආනයනකරුවන්ගේ අවදානම් මට්ටමේ හඳුනා ගැනීමවේ. අනුකූල ආර්ථික මෙහෙයුම්කරු (CEO)/ බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) තත්වය ප්‍රදානය කිරීම ආකාරයෙන් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා යෙදවුමක් ලෙස අනුකූල වෙළඳුන්ට පහසුකම් සැළසීම පුළුල් කිරීමේ නිර්ණායක වශයෙන් පද්ධති පාදක විගණනයන්හි ප්‍රතිඵල භාවිතා කළහැකි වේ.

අනුකූලතා හා පහසුකම් සැළසීමේ අංශයේ සංවිධාන ව්‍යුහය



1.1 රූපසටහන

024. 12.31 දිනට රේගු කාර්යමණ්ඩලය





Diagram 1.2

අනුකූලතා සහ පහසුකම් සැළසීමේ අංශය- ඒකක හා ඒවායේ කාර්යයන්





1.3 රූපසටහන

8.3.2.1 පශ්චාද් නිෂ්කාශන විගණන ශාඛාව **(PCAB)**

සංශෝධිත කියෝතෝ ගිවිසුම මගින් අර්ථ නිරූපනය කරන පරිදි, පශ්චාත් නිෂ්කාශන විගණනය **(PCA)** හෝ විගණන-පාදක කරගත් පාලනයන් යනු අදාල ව්‍යාපාරිකයන් (පුද්ගලයන්) සතුව ඇති පොත්පත්, වාර්තා, ව්‍යාපාර ක්‍රමවේද සහ වාණිජ දත්ත පරීක්ෂා කිරීම මගින් රේගු ප්‍රකාශනවල නිරවද්‍යතාවය සහ නීත්‍යානුකූලභාවය පිළිබඳව රේගුව සෑහීමකට පත්වනු ලබන මීනුම් ක්‍රම/ක්‍රියාමාර්ගවේ. දැඩි ලෙස ගනුදෙනු පදනම් කරගත් පාලන පරිසරයක සිට වඩා ශක්තිමත් විගණනය පදනම් කරගත් පරිපාලනයක් කරා මාරුවීම මගින් බහුවිධ ස්ථරවල අවදානම් පාදක පාලන ප්‍රවේශයක් යොදා ගැනීමට හැකිවන බැවින් පශ්චාද් නිෂ්කාශන විගණනය, රේගුවට මෙන්ම අනෙකුත් දේශසීමා නියාමන අධිකාරින් සඳහා ද ඉතා වැදගත් පාලන ක්‍රමවේදයක් වේ. දේශ සීමාව හරහා ගමන් කරන අවස්ථාවේදී එක් එක් නැවබඩු තොග පාලනය සඳහා භෞතික පරීක්ෂා කිරීම්, භාණ්ඩවල වටිනාකම, සම්භවය සහ වර්ගීකරණය සත්‍යාපනය කිරීම, සාම්පල කිරීම, සහතික, බලපත්‍ර, අවසර පත්‍ර සත්‍යාපනය කිරීම ආදී ගනු දෙනු පදනම් කරගත් පාලන ක්‍රම යොදා ගනු ලැබේ.
මූලාශ්‍රය: ලෝක රේගු සංවිධානය (WCO)

වාර්ෂික විගණන වැඩසටහනෙහි දක්වා ඇති පරිදි වෙළඳ භාණ්ඩය සහ වෙළඳාම අවදානම විශ්ලේෂණය කිරීමේ පදනමින් තෝරා ගනු ලැබූ ඉලක්කගත මෙහෙයුම්කරුවන් කෙරේ යොමුවී හෝ සැලසුම් ගත, නිසි ආකාරයෙන් එක් එක් සිද්ධිය මත පදනම්ව පශ්චාද් නිෂ්කාශන විගණනයන් සිදු කළ හැකිවේ. තවද, යම් ආර්ථික මෙහෙයුම්කරුවන් සඳහා ලබා දෙන පහසුකම් පිරිනැමීම සඳහා නිර්ණායක ලෙසද විගණන යොදා ගත හැකිවේ.

පශ්චාද් නිෂ්කාශන විගණනයේ මූලික අරමුණු

රේගුවේ නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව රේගු ප්‍රකාශන සම්පූර්ණ කර ඇති බව තහවුරුකර ගැනීම පශ්චාද් නිෂ්කාශන විගණනයේ සමස්ත අරමුණ වේ. මෙහි විශේෂ අරමුණු වන්නේ:

- නෛතිකව අය විය යුතු ආදායම හඳුනාගෙන ඇති බව, ගෙවා ඇති බව තහවුරු කර ගැනීම.
- ශ්‍රී ලංකාවට ඇතුළු වන සහ පිටවන ස්ථානයන්හි දී අවම මැදිහත්වීමක් සහිතව ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම් සැළසීම.
- අදාල සියලු නීති සහ නියෝගයන්ට ඇති අනුකූලතාවය වැඩි කිරීම.
- රේගු ප්‍රකාශනයන්හි ඇති නොගැළපීම් නිවැරදි කිරීම.
- පුද්ගලයෙකු විසින් නිසි ආකාරයෙන් පොත් සහ ගිණුම් පවත්වා ගන්නා බව තහවුරු කිරීම සහ සියලු රේගු ප්‍රකාශන සත්‍ය සහ නිවරදි බව ඔවුන්ගේ අභ්‍යන්තර පාලන පද්ධති මගින් තහවුරු කිරීම සහ,
- රේගු පාලනයේ සඵලතාවය තහවුරු කිරීම.

පශ්චාද් නිෂ්කාශන විගණන **(PCA)** ශාඛාවේ කාර්යයන්

- විගණන වැඩසටහන් සකස් කිරීම.
- **ASyCuDa** පද්ධතියේ ඇති වෙළඳුන් පිළිබඳ පසුගිය වාර්තා භාවිතා කරමින් විගණනලාභියෙකු තෝරා ගැනීම.
- පුද්ගල කාර්යය විගණන සහ වෙනත් අත්‍යවශ්‍ය විගණන ක්‍රම මගින් විගණනය සඳහා සූදානම් වීම.
- පුද්ගල කාර්යය විගණනය තුළින් කිසියම් විෂමතාවයක් හෙලිදරව් වුවහොත් ක්ෂේත්‍ර විගණනයක් පැවැත්වීම.
- විගණන මගින් අනාවරණය වූ වංචා විමර්ශනය කිරීම.
- විමර්ශන සහ වාර්තා නිමකිරීම.
- කිසියම් වංචාකාරී ක්‍රියාවක් සිදුව ඇති බව පරීක්ෂා කිරීම සඳහා විමර්ශන සිදුකිරීම.
- වංචාවක් සිදුවී ඇති බව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඇති නම්, රේගු පරීක්ෂණ සිදුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ රේගු නීතියට අනුකූලව දණ්ඩන පැනවීම සහ රාජසන්තක කිරීම් නියම කිරීම.
- විගණනලාභීන් සඳහා ප්‍රතිපෝෂණයන් ලබාදීම.
- අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා මෙහෙයුමක් ලෙස භාවිතා කිරීම සඳහා මධ්‍යම බුද්ධි අංශයේ, විමර්ශන අංශය සහ අවදානම් කළමනාකරණ අංශයේ දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම.

- ❖ අවශ්‍ය වෙනස්කම් සිදුකිරීම සඳහා සමස්ත විගණන ක්‍රියාවලිය ඇගයීම.

පශ්චාද් නිෂ්කාශන විගණනයේ දී තහවුරු කළ යුතු අයිතම

පශ්චාද් නිෂ්කාශන විගණනයන්හි දී වැදගත් රේගු ප්‍රකාශනයක් සඳහා අවශ්‍ය වන සියලු විස්තර කෙරෙහි පහත වගුවේ දක්වා ඇති පරිදි අවධානය යොමු කරනු ඇති අතර ඒ අනුව සමාගම් වල අනුකූලතා මට්ටම මනිනු ඇත. එමගින් අදාල සමාගම් විසින් විෂමතාවන් හෝ වංචනික ක්‍රියා සිදුකර ඇති දැයි තීරණය කරනු ලැබේ. එසේ විෂමතාවන් හෝ වංචනික ක්‍රියා සිදුකර ඇති නම්, අතිරේක සටහන් හරහා ඒවා අයකර ගැනීමට හෝ රේගු ආඥාපනතේ (235 වන අධිකාරිය) අනුව දණ්ඩන පැනවීම මගින් ඒවා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

බදු පදනම සම්බන්ධ අයිතම	බදු අනුපාත සම්බන්ධ අයිතම	බදු ප්‍රමාණ සම්බන්ධ අයිතම	අනෙකුත්
- වටිනාකම - ප්‍රමාණය - මුදල් වර්ගය - විනිමය අනුපාතය	- වර්ගීකරණය - සාමාන්‍ය බදු අනුපාත අදාලකර ගැනීම - වරණීය බදු අනුපාත	- බදු නිදහස් කිරීම් සාධාරණීකරණය කිරීම ප්‍රමාණය - තිරු බදු ගණනය කිරීමේ නිරවද්‍යතාවය	- සීමා කිරීම් - තහනම් කිරීම් - ආනයන බලපත්‍ර - බුද්ධිමය දේපළ හිමිකම් - CITES - රාජ්‍ය භාගය - විනිමය පාලනය

රේගු නිෂ්කාශනයේදී හා/හෝ පශ්චාද් නිෂ්කාශන විගණනයට පෙර පූර්ව-නිෂ්කාශන සත්‍යෝක්ෂණ අවධියේ දී ඉහත අයිතම පරීක්ෂා කර බැලිය හැකි බව සඳහන් කළ යුතුය. ඒ අතර අනවශ්‍ය ද්විකරණය වැළැක්වීම හා PCA සුදුසුකම් උපරිම කිරීම හා නුසුදුසුකම් අවම කිරීම සඳහා පශ්චාත් නිෂ්කාශන විගණනය සඳහා වන ප්‍රවේශය රේගු නිෂ්කාශනයෙන් (පූර්ව නිෂ්කාශන සත්‍යෝක්ෂණය) වෙනස් විය යුතුය. එක් සුදුසුකමක් ලෙස පශ්චාද් නිෂ්කාශන විගණන මගින් පශ්චාද් නිෂ්කාශන විගණන සිදුකරන නිලධාරීන්ට රේගු සටහන්කර වලට අමුණා ඇති ලේඛන පමණක් නොව විගණනලාභීයාගේ අවසරය මත විගණනලාභියා විසින් පසුගිය නිශ්චිත කාලසීමාවක් තුල තබා ගත් ගිණුම් පොත් වැනි අදාල පොත් හා වාර්තා ද පරීක්ෂාකර බැලිය හැකිවේ. එසේම පශ්චාද් නිෂ්කාශන විගණන මගින් භාණ්ඩ නිෂ්කාශනයේ සිට මාස 3 ක් ඇතුළත සාම්පල ඉල්ලා සිටීමට ද කෙටි කාලීන බදු වසර දෙකක් තුළ අයකර ගැනීමට සහ වංචාවක් සිදුව ඇති බව නිරීක්ෂණය වන්නේ නම් සළකා බලන ලද කාලය නොසළකා රාජසන්තක කිරීම, දණ්ඩන පැනවීම සඳහා ද ඉඩ සැළසේ.

සම්මත මෙහෙයුම් ක්‍රියාවලිය (SOP)

ශ්‍රී ලංකාව ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ ගිවිසුම (WTO-TFA) අත්සන් කර ඇත. එකී ගිවිසුමෙහි විධිවිධාන ක්‍රියාත්මක වීමත් සමඟ, පශ්චාද් නිෂ්කාශන විගණනය "C" කාණ්ඩයේ වගකීමක් ලෙස හඳුනාගෙන තිබේ. අධාර දෙන නියෝජිතායතනයක් මගින් තාක්ෂණ සහය ලබාගැනීම "C" කාණ්ඩයේ වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යතාවක් වේ. ඒ අනුව, ලෝක රේගු සංවිධානයේ (WCO) සහ ලෝක වෙළඳ සංවිධානයේ (WTO) ප්‍රමිතීන්ට අනුකූලව නිසි පශ්චාද් නිෂ්කාශන විගණන ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණ සහය ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව (ADB) එකඟ වී ඇත. ආසියානු සංවර්ධන බැංකුව මේ වන විටත් PCA කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා තාක්ෂණ සහය ලබාදීමට සහ PCA අත්පොත ලෙස භාවිතා කිරීම සඳහා වන සම්මත මෙහෙයුම් ක්‍රියාවලිය (SOP) කෙටුම්පත් කිරීම සඳහා තාක්ෂණ සහය ලබාදී ඇත. මේ වන විට SOP සකස් කිරීම නිමකර ඇති අතර 2023 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලදී.

.

පශ්චාද් නිෂ්කාශන විගණන (PCA) පිළිබඳ පුහුණු වැඩසටහන්

ආසියානු සංවර්ධන බැංකුව විසින් තාක්ෂණ සහය ලබාදීමේ වැඩසටහනෙහි කොටසක් ලෙස, ADB විසින් අඛණ්ඩව පශ්චාද් නිෂ්කාශන විගණන නිලධාරීන් පුහුණු කිරීම සිදු කරයි. පළමු පුහුණු වැඩසටහන 2019 වසරේදී පවත්වනු ලැබූ අතර ඉන්පසු 2021 සහ 2022 වසර වල පුහුණු වැඩසටහන් පවත්වනු ලැබීය.

2023 වර්ෂයේ දී ලෝක රේගු සංවිධානයේ සම්පත් දායකත්වයෙන් PCA අනුයුක්ත නිලධාරීන් සඳහා තවත් විශේෂ පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබීය.

අවදානම් කළමනාකරණ අංශය විසින් සිදුකරන ලද **CEO/AEO** වැඩසටහන සඳහා පහසුකම් සැලසීම

දේශ සීමාවන් අතර ගනු දෙනු හා සම්බන්ධයෙන් කාලය සහ පිරිවැය අඩුකිරීම මගින් භාණ්ඩ සංචලනය, නිදහස් කිරීම සහ නිෂ්කාශනය වේගවත් කිරීම මගින් ගෝලීය වෙළඳාම සුරක්ෂිත කිරීම සහ පහසුකම් සැලසීම අරමුණු කර ගනිමින් ලෝක රේගු සංවිධානයේ **(WCO)** පිළිගත් **SAFE** රාමුව සහ ලෝක වෙළඳ සංවිධානයේ **(WTO)** වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ ගිවිසුමට අනුකූලව අවදානම් කළමනාකරණ අංශය මගින් **CEO/AEO** වැඩසටහන දියත් කර ඇත.

AEO වැඩසටහන මගින් ස්ථර දෙකක සහතිකකරණයක් පිරිනමනු ලැබේ. උදා.- ඉහළ මට්ටමේ නෛතික සහ මෙහෙයුම් අනුකූලතාවක් සහිත මෙහෙයුම්කරුවන් සඳහා අනුකූල ආර්ථික මෙහෙයුම්කරු **(CEO)** සහ අනුකූලතා අවශ්‍යතාවන්ට අමතරව ඉහළ මට්ටමේ සැපයුම් ජාල ආරක්ෂක ප්‍රමිතීන් පවත්වා ගනු ලබන වෙළඳුන් සඳහා බලයලත් ආර්ථික මෙහෙයුම්කරු **(AEO)** තත්වය පිරිනමනු ලැබීය.

පශ්චාද් නිෂ්කාශන විගණන අංශයේ කාර්ය සාධනය - **2024**

විස්තරය	**2024**
වසර තුළ ලියාපදංචි වූ පශ්චාද් විගණන විමර්ශන සංඛ්‍යාව.	185
අවසන් කරන ලද පශ්චාද් විගණන විමර්ශන සංඛ්‍යාව (පෙර ලියාපදිංචි වූ විමර්ශන ද ඇතුළත්ව)	154
සිදුකරන ලද පද්ධති පාදක විගණන **(SBA)** සංඛ්‍යාව.	04
වැරදි සිදුකර ඇති බව නිගමනය කර රාජසන්තක කිරීම්/ දණ්ඩන පනවන ලද පශ්චාද් විගණන විමර්ශන සංඛ්‍යාව	152
පනවන ලද රාජසන්තක කිරීම්/ දණ්ඩන වල මුළු එකතුව (රු.)	4,285,393,606
එකතු කරන ලද රාජසන්තක කිරීම්/ දණ්ඩන වල මුළු එකතුව (රු.)	4,518,638,513
අලෙවි මගින් එකතු කරන ලද මුළු මුදල් ප්‍රමාණය (රු.)	47,499,403
A/E ලෙස එකතු කරන ලද මුළු මුදල් ප්‍රමාණය (රු.)	41,979,247
අයකර ගත් මුළු එකතුව (රු.)	**4,608,117,163**


2020 සිට **2024** දක්වා කාර්යසාධනය සංසන්දනය

	2020	**2021**	**2022**	**2023**	**2024**
වසර තුළ ලියාපදංචි වූ පශ්චාද් විගණන විමර්ශන සංඛ්‍යාව	91	119	87	130	185
අවසන් කරන ලද පශ්චාද් විගණන විමර්ශන සංඛ්‍යාව (පෙර ලියාපදිංචි වූ විමර්ශන ද ඇතුළත්ව)	39	35	61	117	154
රාජසන්තක කිරීම්/ දණ්ඩන පනවන ලද විගණන වැරදි සංඛ්‍යාව	8	27	53	80	167
රාජසන්තක කිරීම්/ දණ්ඩන පැනවීම මගින් අයකර ගත් මුළු ප්‍රමාණය (රු)	72,295,530	811,681,719	1 ,146,354,720	2,587,765,702	4,285,393,606
අලෙවි මගින් එකතු කරන ලද මුළු මුදල් ප්‍රමාණය (රු.)	-	-	-	Nil	47,499,403
A/E ලෙස එකතු කරන ලද මුළු මුදල් ප්‍රමාණය (රු.)	නැත	16,304,877	10,107,147	32,632,397	41,979,247
අයකර ගත් මුළු එකතුව (රු.)	**72,295,530**	**853,483,565**	**1 ,156,461,867**	**2,980,308,099**	**4,608,117,163**

2020 සිට **2024** දක්වා කාර්යසාධනය සංසන්දනය


වසර	වසර තුළ ලියාපදංචි වූ පශ්චාද් විගණන විමර්ශන සංඛ්‍යාව	අවසන් කරන ලද පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව (පෙර ලියාපදිංචි වූ විමර්ශන ද ඇතුළත්ව)	රාජසන්තක කිරීම්/ දණ්ඩන පනවන ලද පශ්චාද් විගණන විමර්ශන සංඛ්‍යාව
2020	91	39	8

2021	119	35	27
2022	87	61	53
2023	130	117	80
2024	185	197	167




ආදායම එකතු කිරීම

වසර	එකතු වූ ආදායම (රු.)
2020	72,295,530
2021	853,483,565
2022	1,156,461,867
2023	2,980,308,099
2024	4,608,117,163



2020, 2021,2022, 2023 සහ **2024** වසර වල දී ලියාපදිංචි වූ සහ අවසන් කරන ලද විමර්ශන සංඛ්‍යාව

වසර	ලියාපදිංචි වූ විමර්ශන සංඛ්‍යාව	අවසන් කරන ලද විමර්ශන සංඛ්‍යාව
2020	91	8
2021	119	35



8.3.2.2 ආපසු ගෙවීමේ ශාඛාව

ආපසු ගෙවීමේ ශාඛාව ආයතනික පර්ෂදය යටතේ ඇති අනුකූලතා හා පහසුකම් සැළසීමේ අංශයේ එක් කොටසක් වේ. ආපසු ගෙවීමේ ශාඛාව මගින් මූලිකවම රේගු ආඥා පනතේ (235 වන අධිකාරිය) 18 හා 22 වන වගන්ති යටතේ යම් විදේශීය වරායකට ප්‍රති-අපනයනය කිරීම මත ආනයන හා අපනයන තීරුබදු වැඩිපුර ගෙවීම් ප්‍රතිපූරණය කිරීම හා යම් විදේශීය වරායකින් ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රතිපූරණය කිරීම සිදුකරනු ලැබේ.


ගෙවීම් සිදුකරන ලද දිනයේ සිට මාස 24 ක නියමිත කාලසීමාවක් තුළ හිමිකම් ඉල්ලා සිටින්නේ නම්, රේගු ආඥා පනතේ 18 වන වගන්ති යටතේ අනයනය හෝ අපනයනය කරන ලද භාණ්ඩ සඳහා වැඩිපුර ගෙවන ලද තීරු බදු හා ගාස්තු ආපසු ගෙවීම සඳහා ආනයනකරුවකුට හිමිකම් ඇත. යම් විදේශීය වරායකට ප්‍රතිඅපනයනය කිරීම මත එම තීරු බදු වලින් දහයෙන් පංගු නවයකට වැඩි නොවන මුදලක් ආපසු ලබාගැනීමට රේගු ආඥා පනතේ 18 වන වගන්ති යටතේ අපනයනකරුට හිමිකම් ඇත්තේය.

ආපසු ගෙවූ හිමිකම් වල තත්වය

වසර	2024
ලියාපදිංචි වූ අයදුම්පත්/ හිමිකම් සංඛ්‍යාව	116
සම්පූර්ණ කරන ලද ආපසු ගෙවීම් (පෙර ලියාපදංචි වූ ඒවා ද	37
ප්‍රතික්ෂේප වූ අයදුම්පත්/ හිමිකම් සංඛ්‍යාව	13

ආපසු ගෙවූ හිමිකම් වල තත්වය - පෙර වර්ෂ (2020 සිට 2024 දක්වා)

වසර	2020	2021	2022	2023	2024
ලියාපදිංචි වූ අයදුම්පත්/ හිමිකම් සංඛ්‍යාව	53	75	93	77	116
සම්පූර්ණ කරන ලද ආපසු ගෙවීම් (පෙර ලියාපදංචි වූ ඒවා ද ඇතුලුව)	45	96	79	98	37
ප්‍රතික්ෂේප වූ අයදුම්පත්/ හිමිකම් සංඛ්‍යාව	7	32	15	6	13



නිගමනය

මුදල් අමාත්‍යාංශය මගින් ලබාදුන් ආදායම් ඉලක්ක ළඟාකර ගැනීමේ දී, **2024** වසර රේගුව සඳහා අභියෝගාත්මක වසරක් විය. ශ්‍රී ලංකාවේ ආර්ථිකය සුරක්ෂිත කිරීම සඳහා ගනු ලබන රජයේ ප්‍රතිපත්තිමය තීරණ සඳහා සහාය වීම පිණිස වන ගෙවීම් කොන්දේසි මෙන්ම ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව මගින් භාණ්ඩ අපනයනය මත පනවනු ලබන බොහෝ පාලන ක්‍රියාමාර්ග වසර පුරාම ක්‍රියාත්මක විය.

එකී සංදර්භය තුළ, අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශයට ලබාදී ඇති ඉලක්ක ලඟාකර ගැනීම සඳහා සිය එදිනෙදා මෙහෙයුම් සිදු කිරීම ද අභියෝගාත්මක විය. කෙසේ වුවද, ඉහළ මටටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කරමින් එයට පැවරී ඇති වගකීම් ඉටුකිරීමට සහ ලබාදී ඇති ඉලක්ක ළඟාකර ගැනීමට මෙම අංශයට හැකි විය.

2024 වසරේදී අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශයේ (C&FD) නිලධාරීන් විසින් පශ්චාද් විගණන විමර්ශන **185** ක් ලියාපදිංචි කර ඇති අතර පෙර වර්ෂයේ විමර්ශන ද ඇතුළත්ව විමර්ශන **197** ක් නිම කිරීමට ඔවුන්ට හැකිවිය. රේගු වැරදි සම්බන්ධයෙන් ස්ථාපනය කරන ලද පශ්චාද් නිෂ්කාශන විගණන සංඛ්‍යාව **167** කි. අමතර අයකර ගැනීම් ලෙස එකතු කරන ලද මුළු ප්‍රමාණය රු. 4,608,117,163/-. කි. දණ්ඩන/ රාජසන්තක කිරීම් ලෙස අයකර ගත් මුළු ප්‍රමාණය රු. 4,285,393,606/-. /- කි. භාණ්ඩ අපහරණය කිරීම මගින් අයකර ගත් මුළු ප්‍රමාණය රු. 47,499,403/- ක් වන අතර A/E ලෙස අයකරගත් මුළු ප්‍රමාණය රු. 41,979,247/ ක් විය.

කාර්ය සාධනය පිළිබඳ දත්ත විශ්ලේෂණය කිරීමේදී, පසුගිය වසර **4** හා සංසන්දනය කළවිට **2024** වසරේ දී වැඩිම අයකර ගැනීම් සිදුකර ඇති බව නිරීක්ෂණය කළහැකි වේ. ලියාපදිංචි කරන ලද විමර්ශන සංඛ්‍යාවට සාපේක්ෂව වැඩි විමර්ශන සංඛ්‍යාවක් අවසන් කිරීමට නිලධාරීන් පියවර ගෙන ඇති බව නිරීක්ෂණය කිරීම වැදගත් වේ. එමනිසා, අවසන් නොවූ විමර්ශන අවසන් කිරීමට ද අඛණ්ඩ පියවර ගෙන ඇති බව පැහැදිලි වේ. තවද, වැරදි ස්ථාපනය කිරීම සහ දණ්ඩන හා රාජසන්තක කිරීම් පැනවීම මගින් ආරම්භ කරන ලද විමර්ශනයන්ගෙන් **80%**කට වැඩි ප්‍රමාණයක් අවසන් කිරීමට හැකිවීම මගින් පශ්චාද් විගණන විමර්ශන මෙහෙයවීමේ කාර්යක්ෂමතාවය නිරූපණය වේ. මෙයින් පෙනී යන්නේ වෙළඳුන්ගේ අනුකූලතා මට්ටම තවමත් සතුටුදායක මට්ටමක් කරා පැමිණ නොමැති බවයි.

මෙම අංශයට අයත් ආපසු ගෙවීමේ ශාඛාව වෙත ආපසු ගෙවීම් සඳහා අයදුම් පත් **116** ක් ලැබී ඇති අතර ආපසු ගෙවීම් හිමිකම් **50** ක් අවසන් කිරීමට මෙම අංශයට හැකිවිය.

අවසාන වශයෙන් අවශ්‍ය සම්පත් වෙන්කර දීම සහ කලින් කලට පුහුණුව ලබාදීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නේ නම් අනුකූලතා සහ පහසුකම් සැළසීමේ අංශයේකාර්යසාධනය වඩාත් කාර්යක්ෂම ලෙස වැඩිදියුණු කළ හැකි බව සඳහන් කිරීම වැදගත්ය.

8.3.3 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය

හැඳින්වීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ අරමුණු වන්නේ පැය **24** පුරාම නිරන්තරයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කිරීමේ කටයුතු හා අන්තර්ජාල සේවාවන් ලබාදීමේ දී දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය තාක්ෂණ, සේවා සහ පහසුකම් ලබාදීම වේ. රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කිරීම පූර්ණ වශයෙන් ස්වයංක්‍රීයකරණය කිරීමෙන් ඵලදායි හා ප්‍රතිඵලදායි පරිපාලනයක් උදෙසා වේගවත්, ගුණාත්මක සහ විශ්වාසනීය තොරතුරු පද්ධතියක් සහතික කරයි. මෙම අංශය මේ වනවිට වඩාත් ඵලදායි හා බිඳ වැටීම් වලින් තොර තොරතුරු තාක්ෂණ පදනම් කරගත් පද්ධති ස්ථාපිත කිරීමටත්, රේගු ප්‍රකාශන ඊට අදාළ ලේඛන, ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය නඩත්තු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටී.

ප්‍රධාන කාර්යයන්:

- ස්වයංක්‍රීයකරණය තුලින් ආයතනික අරමුණු ඉටුකර ගැනීමට සහාය වීම.
- පද්ධති ජාලය, පරිගණ උපාංග හා දත්ත සමුදාය සාර්ථක ලෙස නඩත්තු කිරීම.
- රේගු පාලනයට, අනෙකුත් රේගු අංශයන්ට, අනෙකුත් රජයේ ආයතනවලට හා පාර්ශවකරුවන්ට නිසි කලට නිවැරදි තොරතුරු වාර්තා ලබාදීම.
- ගෝලීය වැඩිදියුණු කිරීම් වලට සමගාමීව ඵලදායී අයුරින් පවත්නා පද්ධති :**‘අසිකුඩා (**ASYCUDA)’, ‘ භාණ්ඩ පාලන පද්ධතිය(Cargo Control System)’, ‘මෝටර් වාහන තොරතුරු පාලන පද්ධතිය (Motor Control System)’ හා ‘තිනෙත් (Thineth)’ පද්ධතිය, පිළිබඳ ඇගයීම් කිරීම සහ යාවත්කාලීන කිරීම.**
- අපේක්ෂිත මෙහෙයුම් අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම අංශයේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම සමග වෘත්තීය ගුණාත්මකභාවය වර්ධනය කිරීම
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ පරිගණක සාක්ෂරතාව හා තොරතුරු තාක්ෂණ මොඩියුල ක්‍රියාකාරිත්වය පිළිබඳ පුහුණු වැඩසටහන් පුලුල් කිරීම.

1. පද්ධති වැඩි දියුණු කිරීම	
කාර්යය	තත්වය
ASYCUDA ගෝලීය පද්ධතියේ ඇති ඒකාබද්ධ ආනයන ප්‍රේෂණ ක්‍රියාවලිය	නිමකර ඇත
SMS හරහා වෙළඳුන්ට රේගු සටහන්කර යාවත්කාලීන කිරීම් සහ ඒවායේ තත්වය පිළිබඳව දැනුම්දීම සඳහා දැනුම්දීමේ පද්ධතියක්	නිමකර ඇත
කැටුව නොඑන මගී ගමන් මළු (UPB) ගුදම්වලදී ASYCUDA පද්ධතියට රේගු සටහන්කර හඳුන්වාදීම මගින් බදු එකතු කිරීම ස්වයංක්‍රීයකරණය කිරීම	නිමකර ඇත
රේගු මූලස්ථානයේ ඇති පැරණි/ දැනට බවත්නා ජාල යටිකල පහසුකම් උත්ශ්‍රේණිගත කිරීම	නිමකර ඇත
සිදුවිය හැකි අනතුරු වැළැක්වීම සඳහා අන්ත ලක්ෂීය උපකරණවල ආරක්ෂාව වැඩිදියුණු කිරීම	නිමකර ඇත
ශ්‍රී ලංකා රේගුවේ භාවිතය සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් යෝජනා කරණ ලද අභ්‍යන්තර ලිපි හුවමාරු සහ ලේඛණ කළමනාකරණ පද්ධතිය	නිමකර ඇත
ගුවන් තොටු පලේදී තීරු බදු නිදහස් දීමනා ලබාදීමට පහසුකම් සැළසීම සඳහා **COPA** නියෝග මත පදනම්ව වැඩිදියුණු කරන ලද පරිගණක පද්ධතියක්	නිමකර ඇත
ශ්‍රී ලංකා රේගුවේ ඇති වෙබ් අඩවිය අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	නිමකර ඇත
ශ්‍රී ලංකා රේගුවේ පරිගණක පද්ධතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය විසින් ලබාදුන් අරක්ෂාව පිළිබඳ ප්‍රතිපෝෂණය	සිදු කරමින් පවතී
අනෙකුත් රාජ්‍ය ආයතනවල අනුමත කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා එම ආයතන **ASYCUDA** පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීම	සිදු කරමින් පවතී
ඔවුන්ට අදාල **TIN** අංක සමඟ **CHA** විසින් ඉදිරිපත් කරන ලද රේගු සටහන්කර සඳහා වෙළඳුන්ගෙන් අනුමැතිය ලබා ලැනීම සඳහා පද්ධතියක්	සිදු කරමින් පවතී
කඩදාසි රහිත රේගු සටහන්කර සකස් කිරීමක් සඳහා ඩිජිටල් අත්සන	සිදු කරමින් පවතී
ශ්‍රී ලංකා රේගුවේ **ASYCUDA** ගෝලීය පද්ධතිය සහ ජාත්‍යන්තර ප්‍රමිති අනුකූලතා නාවුක දත්ත සැපයුම්කරුවන්ගේ පද්ධතිය අතර **ASYHUB** ස්ථාපනය කිරීම මගින් ගෝලීය සමුද්‍රීය වෙළඳාම ඩිජිටල්කරණය කිරීම.	සිදු කරමින් පවතී
අපනයන අංශය ස්වයංක්‍රීය කිරීම - අපනයන අංශය තුළ කඩදාසි රහිත රේගු සටහන්කර සැකසීම ස්ථාපනය කළ යුතුය.	සිදු කරමින් පවතී
බැඳුම්කර අංශය ස්වයංක්‍රීය කිරීම - බැඳුම්කර අංශය තුළ කඩදාසි රහිත රේගු සටහන්කර සැකසීම ස්ථාපනය කළ යුතුය.	සිදු කරමින් පවතී
කෘතිම බුද්ධිය භාවිතා කිරීම මගින් ආදායම පුරෝකථනය කිරීම සඳහා රේගු Ai ව්‍යාපෘතිය	සිදු කරමින් පවතී

2. පද්ධති නඩත්තු කිරීම

කාර්යය	යාවත්කාලීන කිරීම් සංඛ්‍යාව
බදුකරණ නීතිය සහ තීරුබදු යාවත්කාලීන කිරීම්	~187
system bugs දෝෂ නිවැරදි කිරීම්	~420
පාලන වගු යාවත්කාලීන කිරීම්	~245
දත්ත පද්ධති ක්‍රියාකාරිත්වය ක්‍රමවත් කිරීම්	~228

3. සංඛ්‍යා ලේඛන සහ වාර්තා කිරීම්

වර්ගය	ඉල්ලා සිටින ලද	නිම කරන ලද	ලැබීමට ඇති	එකතු වූ ගෙවීම් (රු.)
රේගුවට පිටත ආයතන වලින් වාර්තා සංඛ්‍යාව	361	361	0	
රේගුව මගින් වාර්තා සංඛ්‍යාව	1018	1018	0	
				1,624,550

4. විගණනය

අයිතමය	ආරම්භ කරන ලද	නිම කරන ලද	කටයුතු කිරීමට ඇති
විමර්ශන සංඛ්‍යාව	95	55	40
	රඳවාගත්	නිදහස් කරන ලද	
බහාළුම් සංඛ්‍යාව	46	32	14
			මුළු අයකරගැනීම්
අයකරගත් ප්‍රමාණය (රු.)			182,483,000

5. උපකාරක සේවාව **(HELP DESK)**

වාර්තා කරන ලද ගැටලු ආකාරය	ලැබූ සහ නිමකරන ලද	කටයුතු කිරීමට ඇති
WH, CDN, Blend Sheet, ප්‍රේෂණ සහ රේගු සටහන්කර ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම	1729	නැත
ඉලෙක්ට්‍රොනික ගෙවීම් සම්බන්ධ ගැටලු	1021	නැත
THINETH පද්ධති ගැටලු විසඳීම	521	නැත
ජංගම ක්ෂණික ඇමතුම් හරහා සේවාලාභීන්ට සහය ලබාදීම	දෛනිකව ඇමතුම් 200-250	නැත
රේගු අයදුම්පත් නඩත්තු කිරීම	211	නැත
ඉලෙක්ට්‍රොනික නෞභාර ලේඛණ ලියාපදිංචි කිරීම සහ ගැටලු විසඳීම	929	නැත

6. ජාල පරිපාලනය

කාර්යය	ලැබූ සහ නිමකරන ලද		කටයුතු කිරීමට ඇති
WAF, EDR, QMS, NAC, NMS වැනි විවිධ ආරක්ෂක පද්ධති මගින් ලැබෙන ආරක්ෂක අනතුරු ඇඟවීම් සහ ඇතුළත් වීම් අධීක්ෂණය කිරීම	12483	12483	නැත
පද්ධති, ජාල සහ යෙදවුම් පිළිබඳව එදිනෙදා ආරක්ෂාව පරීක්ෂා කිරීම් සහ විගණන සිදුකිරීම.	341	341	නැත
ආරක්ෂක සිද්ධි සමාලෝචනය, විශ්ලේෂණය කිරීම සහ ප්‍රතිචාර දැක්වීම	239	239	නැත
Firewalls, WAF, EDR, QMS, NAC, NMS පරිපාලන කාර්යයන්	592	592	නැත
ජාල සහ ආරක්ෂාවට හා අදාල රැස්වීම්/ සාකච්ඡා/ සමුළු වලට සහභාගි වීම	39	39	නැත

APN/රවුටර් නිකුත් කිරීම් සහ දුරස්ථ පිහිටුම් වල වින්‍යාසය	133	133	නැත
ආයතනයේ ජාල යටිතල පහසුකම් නිර්මාණය සහ සැලසුම් කිරීම	69	69	නැත
ජාල නඩත්තු කාර්යයන්	871	871	නැත
ගැටලු විසඳීම සහ ප්‍රධාන ජාල ගැටලු නිවැරදි කිරීම	699	699	නැත
අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් සම්බන්ධතාව ස්ථාපනය කිරීම/ නඩත්තු කිරීම	71	71	නැත
7. පද්ධති පරිපාලනය			
කාර්යය	ලැබූ සහ නිමකරන ලද		කටයුතු කිරීමට ඇති
Zimbra ඊ මේල් සර්වරය පරිපාලනය සහ අධීක්ෂණය කිරීමේ කාර්යයන්	~520 (දෛනික අධීක්ෂණය ඇතිව)		නැත
Zimbra පරිශීලක ලියාපදිංචි කිරීමේ සහ වින්‍යාසය සැකසීමේ කාර්යයන්	~165 (ඉල්ලිම් මත පදනම්ව)		නැත
IBM AIX සර්වරය පරිපාලනය සහ අධීක්ෂණය කිරීමේ කාර්යයන්	~322 (දෛනික අධීක්ෂණය ඇතිව)		නැත
Oracle Vmware පරිපාලනය කිරීමේ කාර්යයන්	~347(දෛනික අධීක්ෂණය ඇතිව)		නැත
Provisioned සර්වරය අධීකෂණය කිරීම සහ වින්‍යාසය සැකසීම	~635 (දෛනික අධීක්ෂණය ඇතිව)		නැත
අවශ්‍ය මෘදුකාංග ස්ථාපනය කිරීම	~125		නැත
එදිනෙදා සර්වර් පරිපාලන කාර්යයන් **(Cert** අළුත් කිරීම්, ගබඩා කිරීම සහ පුළුල් කිරීම් ආදී)	~175		නැත
			නැත
ක්‍රියාකාරී නාමාවලි පරිශීලක ලියාපදිංචි කිරීම් සහ වින්‍යාසය සැකසීම	~520		නැත
Oracle EXAData පරිපාලන කාර්යය	~230		නැත
EXSI Dell Node VM වින්‍යාසය වෙනස් කිරීම	~85		නැත
VM මතක වින්‍යාසය වෙනස් කිරීම	~50		නැත
New Vm server යාවත්කාලීන කිරීම සහ වින්‍යාසය සැකසීම	~25		නැත
8. වෙබ් අඩවි			
කාර්යය	ලැබූ සහ නිමකරන ලද		කටයුතු කිරීමට ඇති
තීරු බදු වෙනස් වීම් වෙබ් අඩවියෙහි යාවත් කාලීන කිරීම	15		නැත
විනිමය අනුපාතය වෙබ් අඩවියෙහි පළකිරීම	52		නැත
ටෙන්ඩර් අලෙවි වෙබ් අඩවියෙහි පළකිරීම	28		නැත
HRD මුල් පිටුව යාවත්කාලීන කිරීම	0		නැත
BCNP වෙබ් පිටුව යාවත්කාලීන කිරීම	0		නැත
මුල් පිටුව බැනරයේ **RMU** දැන්වීම් පළකිරීම	0		නැත
ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශයේ මුල් පිටුව යාවත්කාලීන කිරීම	0		නැත
තීරු බදු සංශෝධන ගැසට් නිවේදන පළකිරීම	5		නැත
ආනයනකරුවන් සඳහා මාර්ගගතව ලියාපදංචිවීම සම්බන්ධ නිවේදන පළකිරීම	0		නැත
BCNP වෙබ් පිටුවේ ජාත්‍යන්තර සංවිධාන ලයිස්තුව යාවත්කාලීන කිරීම	0		නැත
රේගු වෙබ් අඩවියේ මුල් පිටුවේ අභ්‍යන්තර දෙපාර්තමේන්තු හා සම්බන්ධවීමේ විස්තර යාවත්කාලීන කිරීම	4		නැත
මුල් පිටුවේ බැනර් ලේඛන යාවත්කාලීන කිරීම	0		නැත
වෙබ් අඩවියේ **Asycuda** විකල්ප සබැඳිය යාවත්කාලීන කිරීම	0		නැත

8.3.4 විශේෂිත සේවා අංශය

හැඳින්වීම

රේගු දෙපාර්තමේන්තුවට සහ එහි පාර්ශවකරුවන්ට සේවාව සැපයීම විශේෂිත සේවා අංශයේ අරමුණ වේ. ආනයනය/ අපනයනය කරන ලද භාණ්ඩ වල අදාල සංයෝජිත වර්ගීකරණ ක්තාංක තීරණය කිරීම, ආනයනය/ අපනයනය කරන ලද රසායනික ද්‍රව්‍ය විශ්ලේෂණය කිරීම, ආනයනය හෝ අපනයනය සඳහා මැණික්, වටිනා ලෝහ සහ ස්වර්ණාභරණ මිල කිරීම, රේගු අනුනියෝජිතයින් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ආනයන/ අපනයන රේගු සටහන්කර සකස් කිරීම සඳහා පහසුකම් සැළසීම පිණිස ආනයනකරුවන් සහ අපනයනකරුවන් ASYCUDA පද්ධතියේ ලියාපදිංචි කිරීම මෙම සේවාවන් වේ.

ප්‍රධාන කාර්යයන්

- වෙළඳ භාණ්ඩ/ භාණ්ඩ වර්ගීකරණය කිරීම
- රසායන ද්‍රව්‍ය සහ ඒ හා සමාන නිෂ්පාදන හඳුනා ගැනීම සහ වර්ගීකරණය කිරීම
- මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරණ හඳුනා ගැනීම, වර්ගීකරණය සහ මිල තක්සේරු කිරීම
- රේගු මූලස්ථාන අනුනියෝජිතයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ආනයනකරුවන් සහ අපනයනකරුවන් ලියාපදිංචි කිරීම

8.3.4.1 භාණ්ඩ වර්ගීකරණ ඒකකය

ආනයන/අපනයන භාණ්ඩ සඳහා වඩාත් සුදුසු සංයෝජිත වර්ගීකරණ ක්තාංක (HS Codes) නිර්ණය කිරීම මෙම ඒකකයේ වගකීම වේ. රේගු ප්‍රකාශන සැකසුම් ඒකකය හෝ බඩු පරීක්ෂා කිරීමේ ඒකකය විසින් යම් භාණ්ඩයකට වර්ගීකරණ ක්තාංක (HS Codes) තීරණය කිරීමේදී මත භේදයක් ඇති වුවහොත් එය මෙම ඒකකය වෙත යොමු කරනු ලැබේ. එවැනි අවස්ථාවකදී MSDS හා වෙනත් අදාළ ලේඛන පරීක්ෂාකර බලා මතභේදයට තුඩුදුන් අයිතමය සඳහා වඩාත් යෝග්‍ය සංයෝජිත වර්ගීකරණ ක්තය යෝජනා කරමින් මෙම ඒකකය මගින් අභ්‍යන්තර උපදේශනයක් නිකුත් කරනු ලැබේ.

ඊට අමතරව, වෙළඳාම පහසු කරන ක්‍රියාමාර්ගයක් ලෙස මෙම අංශය ආනයනය හෝ අපනයනය කළ යුතුව ඇති භාණ්ඩ වලට තීරුබදු වර්ගීකරණ පූර්ව තීරණ නිකුත් කරයි. ආනයන/ අපනයනකරුවන් රේගු වෙබ් අඩවියේ ඇති ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමේදී මෙම තීරණය ලබාගත හැකිවේ. මෙම තීරණය ලබාදුන් පසුව, එම නිෂ්පාදකයාගෙන් ආනයනය කරන ලද ඊට අදාළ භාණ්ඩ අයිතමයට පමණක් එය නිකුත් කළ දින සිට වසරක කාල පරිච්ඡේදයක් සඳහා වලංගු වන්නේය.

කෙසේවුවද, සටහන් ඇතුලත් කරන ස්ථානයකින් රේගු ප්‍රකාශන යොමු කරන නිලධාරීන් හෝ නිකුත් කරන ලද තීරණය පිළිබඳ ආනයනකරුවන්/අපනයනකරුවන් සෑහීමකට පත් නොවන්නේ නම්, ඒ පිළිබඳ තවදුරටත් විස්තර ලබාගැනීම සඳහා ඔවුන්ට ස්වකීය අයිතමයන් නාමකරණ කමිටුවට (NC) හෝ රේගු දෙපාර්තමේන්තුව හරහා ලෝක රේගු සංවිධානයේ සංයෝජිත වර්ගීකරණ පද්ධති කමිටුවට වුවද යොමු කළ හැකිය.

විස්තරය	වසර			
	පසුගිය ප්‍රගතිය	**2024/12/31** දිනට ප්‍රගතිය		
අයදුම්කරන වසර	2023	2023*	2024	සමස්ත ප්‍රගතිය
පූර්ව වර්ගීකරණ තීරණ (AR)				
ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව	456	137	465	602
නිකුත් කරන ලද තීරණ සංඛ්‍යාව	319	127	378	505
කටයුතු කළ යුතුව ඇති අයදුම්පත්	137	10	87	97
සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය	69.96%	92.70%	81.08%	83.88%
අභ්‍යන්තර වර්ගීකරණ උපදෙස් (IA)				
ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව	153	48	150	198
නිකුත් කරන ලද තීරණ සංඛ්‍යාව	105	41	113	154

කටයුතු කළ යුතුව ඇති අයදුම්පත්	48	7	37	44
සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය	68.63%	85.42%	75.33%	77.78%
බාහිර වර්ගීකරණ උපදෙස් (EXT)				
ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව	17	1	17	18
නිකුත් කරන ලද තීරණ සංඛ්‍යාව	16	0	17	17
කටයුතු කළ යුතුව ඇති අයදුම්පත්	1	1	0	1
සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය	94.12%	0.00%	100%	94.44%

*** 2023** වසරේ ලැබුණු සහ **2024** වසරේ නිමකරන ලද ගොනු

- **2024/12/31** දිනට පසුව ලැබුණු ගොනු - 89
- **2024/12/31** දිනට පසුව ලැබුණු සහ **2024/12/31** දිනට නිමකරන ලද ගොනු - 17
- **2024/10/31** දිනට පසුව ලැබුණු සහ **2024/12/31** දිනට අවසන් නොවූ ගොනු - 62

8.3.4.2 රේගු රසායනාගාර ඒකකය

ආනයනය හෝ අපනයනය කරන රසායන ද්‍රව්‍ය හා ඊට සමාන ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා රේගුවට හා පාර්ශවකරුවන්ට සහයවීමට රේගු පර්යේෂණාගාර අංශය පිහිටුවන ලදී. ආනයනික හෝ අපනයනික ද්‍රව්‍ය හා ඒ සමාන භාණ්ඩවල හඳුනා ගැනීම් පිළිබඳ සැකයක් මතුවූ අවස්ථාවන්හිදී ඒවා විශ්ලේෂණය කිරීම සඳහා ඒවායේ නියදි රේගු පරීක්ෂාගාරය වෙත යවනු ලැබේ. තවද, එවැනි රසායන ද්‍රව්‍ය සහ ඊට සමාන ද්‍රව්‍ය වර්ගීකරණය පිළිබඳව මතභේද ඇතිවූ අවස්ථාවන්හි දී අදාළ ද්‍රව්‍ය හා ලිපි ලේඛණ මෙම අංශයේ තීරණය සඳහා යොමු කරයි.

කාර්මික උපදේශන ඒකකයක් වශයෙන් මෙම අංශය විවිධ සම්මුතීන් සහ පවත්නා රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී අනෙකුත් අදාල පාර්ශව සමඟ සම්බන්ධීකරණය සිදුකරනු ලබයි.

කාර්ය සාධනය

විශ්ලේෂණ ගාස්තු ලෙස අයකර ගත් ප්‍රමාණය: රු. 8,500/=

		ලැබූ	නිම කරන ලද	නිම කිරීමේ ප්‍රතිශතය
මුළු රේගු සටහන්කර CusDecs සංඛ්‍යාව	විශ්ලේෂණය සඳහා පමණක් වන CusDecs	**14**	**14**	**100%**
	වර්ගීකරණය සඳහා පමණක් වන CusDecs	-	-	-
	විශ්ලේෂණය සහ වර්ගීකරණය සඳහා පමණක් වන CusDecs	**12**	**7**	**58.33%**
මුළු තීරණ සංඛ්‍යාව සහ අනෙකුත් ගොනු	'CC' අංශය මගින් යොමු කළ පූර්ව තීරණ ගොනු	**273**	**266**	**97.43%**
	වෙනත් අංශ මගින් යොමු කළ අනෙකුත් ගොනු	**15**	**15**	**100%**
	වෙනත්	43	43	100%
	එකතුව	**331**	**324**	**97.88%**

8.3.4.3 බදු ගෙවන්නන් හඳුනා ගැනීමේ අංක/ එකතු කළ අගය මත බදු සහ රේගු මූලස්ථාන අනු නියෝජිතයින් ලියාපදිංචි කිරීමේ ඒකකය (TIN/VAT & CHA REGISTRATION UNIT)

මෙම ඒකකය මගින් රේගු මූලස්ථාන අනු නියෝජිතයින් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සිදුකරනු ලබයි. රේගු ආඥා පනතේ **115(1)** වගන්තිය ප්‍රකාරව, අදාල අවශ්‍යතා සම්පූර්ණ කර ඇති පුද්ගලයින් සඳහා රේගු අනු නියෝජිතයින් ලෙස කටයුතු කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරේ. ශ්‍රී ලංකාවේ යම් වරායකට හෝ යම් ස්ථානයකට ඇතුල් වන යම් නෞකාවක්, භාණ්ඩයක් හෝ යම් ගමන් මල්ලක් සම්බන්ධයෙන් ලේඛන හෝ නිෂ්කාශනය හා අදාලව කටයුතු කළ හැක්කේ බලපත්‍රලාභී රේගු අනු නියෝජිතයින්ට පමණි. එක් වසරක කාලයක් සඳහා පමණක් වලංගු වන මෙම බලපත්‍රය කාලසීමාව අවසානයේ නැවත අළුත් කළ යුතුය.

TIN/ VAT	තනි හිමිකාරිත්වය	509
	හවුල්කාරිත්වය	106
	සීමාසහිත පුද්ගලික සමාගම් (PVT)	1634
	සීමාසහිත පොදු සමාගම් (PLC)	1
	එක් වරක් ආනයන සිදුකරන්නන්/ අපනයන සිදු කරන්නන්	310
	කැටුව නොඑන මගී ගමන් මළු නිෂ්කාශන (වාහන)	1424
	වාහන බලපත්‍ර හිමිකරුවන්	884
	වෙනත්	54
CHA ඒකකය	රේගු මූලස්ථාන නියෝජිතායතන නව ලියාපදිංචි කිරීම්	149
	රේගු මූලස්ථාන අනු නියෝජිතයින් නව ලියාපදිංචි කිරීම්	179
	රේගු මූලස්ථාන නියෝජිතායතන නැවත අළුත් කිරීම්	2159
	රේගු මූලස්ථාන අනු නියෝජිතයින් වත අළුත් කිරීම්	5086
	රේගු මූලස්ථාන නියෝජිතායතන අවලංගු කිරීම්	14
	රේගු මූලස්ථාන අනු නියෝජිතයින් අවලංගු කිරීම්	624
	පුහුණුවන්නන්ගේ අවසරපත් අළුත් කිරීම	705
	අයකරගත් මුදල (රු.)	13,554,077

8.3.4.4 මැණික් ඒකකය

මෙම අංශයේ සිටින මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍ර යේ විශේෂඥ දැනුමක් ඇති නිලධාරීන් විසින් මැණික්, වටිනා ලෝහ සහ ස්වර්ණාභරණ ආනයනය හා අපනයනය සඳහා ලේඛන සකස් කිරීම සිදු කරයි. මෙම නිලධාරීහු මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය කරමින් එම භාණ්ඩ තක්සේරු කරති.

අපනයන

	එකතුව (රු.)
මැණික්	46,743,165,635
දියමන්ති ස්වර්ණාභරණ	402,349,609
අනෙකුත් ස්වර්ණාභරණ	3,746,703,904
දියමන්ති	60,268,231,538
ගෙවුඩ/ ඛණිජ වර්ග	0
ප්‍රදර්ශනය/ පරීක්ෂා කිරීම සඳහා වන මැණික්	60,923,283,826
ප්‍රදර්ශන ස්වර්ණාභරණ	101,732,844
එකතුව	172,185,467,356

ආනයන

ඔප නොදැමූ දියමන්ති	24,546,641,273
කපා ඔප දැමූ දියමන්ති	32,318,433,654
මැණික්	35,387,318,203
රිදී	461,861,584
රත්‍රං	1,902,838,228
රත්‍රං ආභරණ	755,252,134
රිදී ආභරණ	49,523,689
සොයා ගැනීම්	259,828,313
අනෙකුත් (පාරිභෝගික භාණ්ඩ)	55,079,041
එකතුව	95,736,776,119
තීරුබදු සහ වෙනත් බදු	
රේගු ආනයන තිරු බදු (CID)	3,335,910

8.4 මානව සම්පත් පර්ෂදය

8.4.1 මානව සම්පත් කළමනාකරණ අංශය

8.4.2 මානව සම්පත් සංවර්ධන අංශය

8.4.3 කාර්ය මණ්ඩල සේවා අංශය

8.4.4 සේවා සැපයුම් අංශය

8.4.1 මානව සම්පත් කළමනාකරණ අංශය

හැඳින්වීම

රේගු දෙපාර්තමේන්තුවේ අරමුණු ළඟාකර ගැනීමෙහිලා අදාල කාර්යයන් ඉටුකිරීම සඳහා ඵලදායි ලෙස මානව සම්පත කළමනාකරණය කිරීම මෙම අංශයේ මූලික වගකීම වේ.

මෙම අංශය, දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටු කිරීම මගින් එහි දැක්ම ලඟාකර ගැනීම සහ එකී කාර්යය සඳහා අවශ්‍ය වන උපායමාර්ගික සැලසුම සකස් කිරීම සඳහා දක්ෂ සහ සුදුසු පුද්ගලයින් බඳවා ගැනීමේ කාර්යයන් ඉටු කරයි. මානව සම්පත් කළමනාකරණ අංශය ශ්‍රම බලකාය අභිප්‍රේරණය කරමින්, ඔවුන්ගේ හැකියාවන් හඳුනා ගනිමින් සහ කාලීනව ඇති වන ගැටළු සඳහා විසඳුම් ලබාදෙමින් ඔවුන්ගේ උපරිම දායකත්වය ලබාගැනීමට ප්‍රයත්න දරයි.

තවද, මානව සම්පත් කළමනාකරණ අංශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ආදී රාජ්‍ය ආයතන විසින් කලින් කළට නිකුත් කරන ලද නියෝග, මාර්ගෝපදේශ සහ නියෝගයන්ට අනුගත වෙමින් විශ්‍රාමයාම, උසස්වීම්, ස්ථානමාරු, විශ්‍රාම ගැන්වීම සහ කාර්ය සාධනය පවත්වා ගැනීම හා අදාල කාර්යයන් ඉටු කරයි.

ප්‍රධාන කාර්යයන්:

- **බඳවා ගැනීම් පරිපාටියට අනුකූලව බඳවා ගැනීම් සිදුකිරීම, පුරප්පාඩු පිරවීම සහ උසස්වීම් ලබාදීම.**
- **සේවකයින් පිළිබඳ වාර්තා තබා ගැනීම සහ රහස්‍යභාවය පවත්වා ගැනීම. .**
- **කාර්යසාධනය කළමනාකරණය කිරීම.**
- **නිලධාරීන් බඳවා ගැනීම හා සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම.**
- **අභ්‍යන්තර ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.**
- **වන්දි ගෙවීම සහ සේවකයින්ගේ දිරි දීමනා කළමනාකරණය.**
- **සංවිධාන සැලසුම් සකස් කිරීම.**

2024 වසරේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධනය

	මූලික කාර්යයන්	ඒ පිළිබඳ අනුගමනය කළ ක්‍රියාමාර්ග
1.	අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්, ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ, රේගු අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරුවලට උසස් කිරීම	**2024 වර්ෂය තුළදී,** • **අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02 ක් සඳහා පත්වීම් ලිපි ලබා දී ඇත..** • **ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ තනතුරු 08ක් සඳහා උසස්වීම් ලබා දී ඇත.** • **රේගු අධ්‍යක්ෂ තනතුරු 14ක් සඳහා වැඩ බැලීමේ පදනම් යටතේ උසස්වීම් ලබා දී ඇත** • **ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරු 30 ක් සඳහා පූර්ණකාලීන රාජකාරී ආවරණ පදනම යටතේ උසස්වීම් ලබා දී ඇත** • **නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරු 38ක් සඳහා පූර්ණකාලීන රාජකාරී ආවරණ පදනම යටත් උසස්වීම් ලබා දී ඇත**
2.	ප්‍රධාන රේගු පරීක්ෂක (CIC) තනතුරට නිලධාරීන් උසස් කිරීම	**ප්‍රධාන රේගු පරීක්ෂක නිලධාරීන් ලෙස රේගු පරීක්ෂක නිලධාරීන් 16 දෙනෙකු 2024 වර්ෂය තුළ උසස් කරනු ලැබීය. (ඉන් නිලධාරීන් 10 දෙනෙකු සීමිත ධාරාව යටතේ සහකාර රේගු අධිකාරී II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පැවති විභාගය සමත්ව නැවත සහකාර රේගු අධිකාරී තනතුර සඳහා පත්වීම් ලැබිය).**
3.	නව බඳවා ගැනීමේ පරිපාටියට **(SOR)** අනුව සහකාර රේගු අධිකාරී **- II** ශ්‍රේණිය තනතුර	**රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් පසුව කරන ලද ඉල්ලීමකට අනුව තනතුරු පුරප්පාඩු 207ක් සඳහා බඳවා ගැනීමට ලැබී තිබූ අනුමැතිය අනුව විවෘත ධාරාව යටතේ**

	සඳහා නිලධාරීන් 137 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම	166ක් සීමිත ධාරාව යටතේ 31ක් හා කුසලතා ධාරාව යටතේ 10ක් වශයෙන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. විවෘත පදනම මත බඳවා ගැනීමට අදාල විභාගය 2024.03.23 වන දින පවත්වන ලදි. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන පරිදි විභාගය සමත් අයදුම්කරුවන් 337ක් සඳහා 2024.09.27,28 හා 29 යන දිනයන්හි පැවති සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත විභාග දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් අවසානාත්මක ප්‍රතිඵල ලේඛනය මත පත්වීම් ලිපි නිකුත් කිරීමෙන් පසුව 158 දෙනෙකු රාජකාරී භාරගෙන ඇත. සීමිත ධාරාව යටතේ පැවැත්වූ විභාග ප්‍රතිඵල මත පත්වීම් ලිපි 22නිකුත් කළ අතර සියළු දෙනාම රාජකාරී භාරගෙන ඇත. කුසලතා ධාරාව යටතේ පතවීම් ලිපි 10ක් නිකුත් කළ අතර සියළු දෙනාම රාජකාරී භාරගෙන ඇත.
4.	රේගු පරීක්ෂක (IC) තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කිරීම	රේගු පරීක්ෂක තනතුරේ පුරප්පාඩු 185ක් සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලැබී තිබූ අතර එයින් 145ක් විවෘත ධාරාව යටතේද 40ක් සීමිත ධාරාව යටතේද සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදි. විවෘත පදනම මත බඳවා ගැනීමට අදාල විභාගය 2024.02.17 වන දින පවත්වන ලදි. ඒ අනුව විභාගය සමත් අයදුම්කරුවන් 301ක් සඳහා 2024.07.27 හා 28 යන දිනයන්හි සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදි. සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත විභාග දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් ප්‍රතිඵල ලේඛනය අනුව පත්වීම් ලිපි නිකුත් කළ අතර 139 දෙනෙකු රාජකාරී භාරගෙන ඇත. සීමිත ධාරාව යටතේ පැවති විභාගයේ ප්‍රතිඵල මත පත්වීම් ලිපි 22 ක් නිකුත් කරන ලද අතර සියළු දෙනාම රාජකාරී භාරගෙන ඇත.
5.	කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම	• රේගු පරීක්ෂක තනතුරේ II ශ්‍රේණියට අදාළ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2024.10.28, හා 29 දිනයන්හි පවත්වා ඇත. • රේගු පරීක්ෂක තනතුරේ I ශ්‍රේණියට අදාළ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය2024 නොවැම්බර් මස පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර එය 2025.01.26 දින පැවැත්වීමට දින නියම කර ඇත • සහකාර රේගු අධිකාරී තනතුරේ II ශ්‍රේණියට අදාළ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2024 නොවැම්බර් මස පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර එය 2025.02.22 සහ 23 දිනයන්හි පැවැත්වීමට දින නියම කර ඇත. • රේගු නියාමක තනතුරේ III ශ්‍රේණියට අදාළ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2024 දෙසැම්බර් මස පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර එය 2025.02.15 දින පැවැත්වීමට දින නියම කර ඇත.
6.	පත්වීම් ස්ථිර කිරීම	නියමිත අවශ්‍යතා සම්පූර්ණ කළ සහකාර රේගු අධිකාරිවරුන් 29 දෙනෙකුගේ, රේගු පරීක්ෂක නිලධාරීන් 16 දෙනෙකුගේ හා රේගු නියාමකවරුන් 07දෙනෙකුගේ පත්වීම් ස්ථිර කිරීම සිදුකර ඇත.
7.	විශ්‍රාම යාමට නියමිත නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රියාවලිය සිදුකිරීම	2024 වසරේ නිලධාරීන් 73 දෙනෙකුගේ විශ්‍රාම වැටුප සකස් කිරීමට අදාල ලිපි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යවා ඇත.
8.	නිලධාරීන්ගේ අභ්‍යන්තර ස්ථානමාරු ක්‍රියාවලිය සිදුකිරීම	2024 වර්ෂය තුලදී දෙවතාවක් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සිදුකර ඇත.

9.	කාර්යසාධනය ඇගයීම මත පදනම්ව වාර්ෂික වැටුප් වර්ධක ලබාදීමේ ක්‍රියාවලිය සිදුකිරීම	**2024** වර්ෂය තුල රේගු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල නිලධාරීන් **1,513** ක් සඳහා වැටුප් වර්ධක ලබා දී ඇත.
10.	නිලධාරීන්ගේ කාර්යසාධනය මත පදනම්ව දිරි දීමනා ලබාදීම	අදාල සුදුසුකම් සපුරන ලද සියළුම නිලධාරීන් සඳහා **2024** වර්ෂය තුල දිරි දීමනා ලබා දීම සිදුකර ඇති අතර **2023** වසරේ ගෙවීමට නියමිතව තිබූ දිරි දීමනා ද මෙම වසරේ ගෙවන ලදි.
11.	මානව සම්පත් කළමනාකරණ අංශයේ සාමාන්‍ය එදිනෙදා කාර්යයන් ඉටුකිරීම	**2024** වර්ෂයේදී, • ලිපි **11,400**ක් දෛනික තැපෑල මඟින් බෙදා හරින ලදි. • වාහන අවසරපත්‍ර **(Vehicle Pass) 125**ක් නිකුත් කර ඇත. • නිලධාරීන් **274**ක ගේ ණය ඉල්ලුම් පත් ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත. • නිලධාරීන් **160**ක් රාජකාරී විදේශ නිවාඩු ද **6**ක් පෞද්ගලික දිගුකාලීන විදේශ නිවාඩු ද **353** ක් පෞද්ගලික කෙටි කාලීන විදේශ නිවාඩු ද ලබාගෙන ඇත. • අනෙකුත් එදිනෙදා සිදුකල යුතු ආයතනික කටයුතු ද මෙම අංශය විසින් සිදුකර ඇත.

8.4.2 මානව සම්පත් සංවර්ධන අංශය

දැක්ම

රේගු දෙපාර්තමේන්තුවේ විශිෂ්ඨතම පුහුණු අංශය බවට පත්වීම.

මෙහෙවර

ජාත්‍යන්තර රේගුව, වෙළඳ සහ ආරක්ෂක සැකසුම් වලට සමගාමීව බාධාවකින් තොරව සේවා ඒකාබද්ධ කිරීම සඳහා ධාරිතා ප්‍රවර්ධනය කිරීම සහ රටේ ජාතික, සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා රේගුවේ චින්තන ගබඩාව ලෙස දායක වීම.

හැඳින්වීම

නවීකරණය, ගෝලීයකරණය, තාක්ෂණික නවෝත්පාදන, ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාදාමයන් සහ සේවක මණ්ඩල ප්‍රශස්තකරණය වැනි නැගී එන ප්‍රවණතාවන් සමඟ ලෝකයේ සෑම රටකම රේගු පරිපාලනයන් විශාල අභියෝග රැසකට මුහුණ දෙමින් සිටී. රේගු පරිපාලනයේදී මානව සම්පත් සංවර්ධනයට ඉහළ ප්‍රමුඛතාවක් ලබාදීමේ වැදගත්කම දක්වන රේගු වෘත්තීය සංවර්ධනය හා මෙකී සියලු සාධක අතර සෘජු සම්බන්ධතාවක් පවතී.

වසර 200කට වැඩි අත්දැකීම් සහිත ශ්‍රී ලංකා රේගුව, ජාතියේ දේශසීමා පාලන ආයතනයක් ලෙස කටයුතු කරන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම දෙපාර්තමේන්තුවකි. ආදායම එකතු කිරීම, රේගු නීතිය බලාත්මක කිරීම, නීත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැළසීම සහ සමාජ ආරක්ෂණය යන මූලික අරමුණු පෙරදැරිව රටේ සමාජ ආර්ථික යහපැවැත්ම සඳහා ශ්‍රී ලංකා රේගුව මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කෙරේ.

ශ්‍රී ලංකා රේගු වගකීම් ඵලදායි ලෙස හා කාර්යක්ෂමව ඉටු කිරීමේ වගකීම ඉටුකිරීම සඳහා උසස්ම ප්‍රමිතියෙන් සේවා ආචාර ධර්ම පිළිපදිමින් ධනාත්මක ආකල්ප ඇතිව සිය වගකීම් ඉටුකළ හැකි දැනුමැති සහ උසස් නිපුණතාවන්ගෙන් යුත් පුද්ගලයින් බිහිකිරීම අත්‍යවශ්‍ය වේ.

මෙකී පෙළඹවීම තුළ, මානව සම්පත් සංවර්ධන අංශය (HRD) සෑම විටම සිය දෙපාර්තමේන්තු නිලධාරීන්ට පමණක් නොව, රේගු සහ දේශසීමා ආරක්ෂණ කාර්යයෙහි නියැලී සිටින බාහිර පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීම කෙරෙහි ද අවධානය යොමු කරයි.

ඒ අනුව, දෙපාර්තමේන්තුවේ අභිමතාර්ථ හා අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සේවකයින්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම පිණිස ශ්‍රී ලංකා රේගුවේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් දේශීය සම්පත් භාවිතයෙන් සහ ජාත්‍යන්තර සහයෝගීතාවය ඇතිව කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සහ වැඩමුළු ක්‍රියාත්මක කරනු ලැබේ.

ප්‍රධාන කාර්යයන්

- මානව සම්පත් සංවර්ධන අංශය විසින් මූලිකව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා දේශීය සහ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම සිදුකරයි.

- ජාත්‍යන්තර නියෝජිතායතන මගින් පිරිනමන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
  WCO,WTO,UNODC ආදී ජාත්‍යන්තර සංවිධාන මගින් ශ්‍රී ලංකා රේගුවට ලැබෙන අවස්ථා/ ඇරයුම් පදනම් කර ගෙන, මානව සම්පත් කමිටුවේ අනුමැතිය ඇතිව එකී වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ සම්පූර්ණ වගකීම මානව සම්පත් සංවර්ධන අංශය වෙත පැවරී ඇත.

  ජාත්‍යන්තර ස්වභාවයේ රේගු කරුණු සමඟ සමගාමී වන සමුළු, වැඩමුළු, පුහුණු පාඨමාලා, රැස්වීම්, පශ්චාත් උපාධි වැඩසටහන්, සම්මන්ත්‍රණ ආදිය එකී විදේශ පුහුණු අවස්ථාවන්ට අයත්වේ.

විවිධ ස්වභාවයෙන් යුත් මෙම විදේශ පුහුණු අවස්ථාවන් සමහරක් තෝරාගත් රේගු නිලධාරීන් සඳහා විදේශ රටවල් වලදී පැවැත්වෙන අතර සමහර වැඩසටහන් විදේශීය සම්පත්දායකයින් මෙරටට පැමිණ මෙහි දී පවත්වයි.

තවද, රැස්වීම්, සම්මන්ත්‍රණ, වෙබිනාර් ආදී සමහර විදේශ පුහුණු වැඩසටහන් මාර්ගගතව පවත්වනු ලැබේ.

- දේශීය වැඩසටහන් පැවැත්වීම
දක්ෂතා සහ නිසඟ හැකියාවන් හඳුනා ගැනීම සමඟින් අදාල ක්ෂේත්‍රයන්හි දැනුම සහ දැනුවත්භාවය වැඩිකිරීම සඳහා සේවකයින්ගේ හැකියාවන් සංවර්ධනය සමඟ දේශීය පුහුණු සමගාමීවේ.

අනුමත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුකූලව දේශීය සම්පත් දායකයින් යොදා ගනිමින් මානව සම්පත් සංවර්ධන අංශය මඟින් රේගුවේ සියලු ස්ථරයන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වයි. දෙපාර්තමේන්තුවේ යාවත්කාලීන කරන ලද පුහුණු අවශ්‍යතා මත එකී ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ඇත. සෑම වසරක අවසානයේදීම, දෙපාර්තමේන්තුවේ සියලු අංශ වලින් යෝජනා කැඳවා, ප්‍රතිපෝෂණයන් පදනම් කරගෙන ඉදිරි වසරේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ධාරිතාවන් ගොඩනැඟීමේ මූලික වගකීමට අමතරව, ධාරිතා සංවර්ධනය පුහුණු හා අදාල පහත සඳහන් ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම ද මෙම අංශයට පැවරී ඇත;

- පුහුණු ප්‍රතිපත්ති සහ ක්‍රමවේද සකස් කිරීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සියලු මට්ටමකම සේවකයින්ගේ ධාරිතාවන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍යතාවන් ගැළපීම.
- නවක බඳවා ගැනීම් සහ රැකියා තනතුරු වෙනස් කිරීමේදී පළපුරුදු නිලධාරීන් සඳහා ප්‍රමිතිගත පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- සේවකයින්ට යාවත් කාලීන පුහුණු අවස්ථාවන් සළසාදීම සඳහා දේශීය සහ ජාත්‍යන්තර සංවිධාන (WCO,WTO, UNODC ආදී) සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- දෙපාර්තමේන්තුවේ අභිලාෂයන් ලඟාකර ගැනීම සඳහා විශේෂ පුහුණු වැඩසටහන් සකස් කිරීම සහ පැවැත්වීම.
- නවෝත්පාදන සහ ඵලදායි ඉගෙනුම් පරිසරයක් සැපයීම.
- රේගු නිලධාරීන් විසින් සේවා අවාර ධර්ම පිළිපැදීමේ මට්ටම ඉහළ නැංවීම.
- මානව සම්පත් කළමනාකරණයේ ජාත්‍යන්තර අවශ්‍යතා සමඟ ධාරිතා ගොඩනැඟීම හා අදාල කරුණු සම්බන්ධ සියලු කරුණු සම්බන්ධීකරණය කිරීම.
- පුහුණු අවශ්‍යතාවයට ප්‍රමුඛතාව ලබාදීම මඟින් දෙපාර්තමේන්තුවේ පුහුණු අවශ්‍යතාවන් තක්සේරු කිරීම.
- වාර්ෂික පුහුණ සැලැස්ම සහ විෂය මාලා සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.
- පුහුණු වැඩසටහන්, සම්මණ්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.
- පුහුණු වැඩසටහන් අධීක්ෂණය කිරීම සහ ඇගයීම.
- යුධ හමුදාව, පොලිසිය, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන, විශ්වවිද්‍යාල වැනි බාහිර ආයතන විසින් ඉල්ලා සිටි විට අවශ්‍ය පුහුණු ලබාදීම.
- රේගු මූලස්ථාන අනු නියෝජිතයින් සඳහා සහතික පත් වැඩසටහනක් පැවැත්වීම.
- රේගු කරුණු පිළිබඳව පාර්ශවකරුවන්ට අවශ්‍යතා අනුව පුහුණු පහසුකම් සැළසීම සඳහා රේගුවෙන් සම්පත්දායකයින් සැපයීම.
- රේගු කාර්ය මණ්ඩපය සඳහා පුස්තකාල පහසුකම් සැළසීම.

HRD කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ පුහුණු ඉලක්ක ළඟාකර ගැනීම සඳහා, කළමනාකරණ බලධාරීන් විසින් පහත සඳහන් **(01** වගුව) කාර්ය මණ්ඩලය අනුමත කර ඇත.

කෙසේවුවද, වර්තමානයේ මෙම අංශය තුළ පහත වගුවේ **(01** වගුව) විස්තර කර ඇති පරිදි කාර්ය මණ්ඩල හිඟයක් පවතින නමුත් දෙපාර්තමේන්තුවේ ධාරිතා සංවර්ධන අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අංශයේ සියලු කාර්යයන් නියමිත වේලාවට ඉටු කිරීම සඳහා ඉමහත් ප්‍රයත්නයක් දරයි.

01 වගුව : අනුමත කාර්ය මණ්ඩලයට එදිරිව පවත්නා කාර්ය මණ්ඩලය

ශ්‍රේණිය	අනුමත කාර්ය මණ්ඩලය	පවත්නා කාර්ය මණ්ඩලය
රේගු අධ්‍යක්ෂ	01	01
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ	02	01
නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ	03	01
රේගු අධිකාරි	අදාල නොවේ.	01
නියෝජ්‍ය රේගු අධිකාරි	08	02

සහකාර රේගු අධිකාරී	08	04
රේගු නියාමක	N/A	02
කළමනාකරණ සේවා නිලධාරීන්	03	03
එකතුව	**25**	**15**

2024 වසරේ අංශයේ ජයග්‍රහණයන් :

දේශීය පුහුණු වැඩසටහන් - දේශීය පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු මෙහි **6.2** යටතේ දක්වා ඇත.

2024 වසරේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රේගු අධ්‍යක්ෂ ජනරාල්/ මානව සම්පත් කමිටුව විසින් යොමුකරන ලද පරිදි, මානව සම්පත් සංවර්ධන අංශය, **2024** වසරේදී රේගු කාර්යමණ්ඩලය සඳහා දේශීය පුහුණු වැඩසටහන් **58** ක් (ආයතනය තුළ සහ ඉන් පිටත) පවත්වනු ලැබූ අතර එකී වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව (ශ්‍රේණි අනුව) පහත වගුවේ දැක්වේ. නව පත්වීම් ලද සහකාර රේගු අධිකාරීන් **(158)** සහ රේගු පරීක්ෂකයින් **(140)** සඳහා පනත්වන ලද සේවාරම්භක පුහුණු වැඩසටහන් ද ඉහත සඳහන් වැඩසටහන් වලට ඇතුළත් වේ.

02 වගුව : දේශීය පුහුණු වැඩසටහන් සඳහා කාර්යමණ්ඩලයේ සහභාගිත්වය
(ආයතනය තුළ සහ බාහිරව පවත්වන ලද)

ශ්‍රේණිය	සහභාගිත්වය (ආයතනය තුළ සහ බාහිරව පවත්වන ලද)
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්	**01**
ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ	**02**
රේගු අධ්‍යක්ෂ	**05**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ	**85**
නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ	**134**
රේගු අධිකාරී	**135**
තක්සේරුකරු	**10**
නියෝජ්‍ය රේගු අධිකාරී	**91**
සහකාර රේගු අධිකාරී	**468**
රේගු පරීක්ෂක	**01**
රේගු නියාමක	**130**
කළමනාකරණ සේවා නිලධාරී	**40**
කාර්යාල කාර්ය සහායක	**19**
අනෙකුත්	**9**

පිටස්තර පාර්ශවකරුවන් විසින් ඉල්ලීම් කරන පරිදි මානව සම්පත් කමිටුවේ අනුමැතිය ඇතිව මානව සංවර්ධන අංශය විසින් **2023** වසර තුළ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, යුධ හමුදාව, පොලීසිය, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන, විශ්වවිද්‍යාල ආදී විවිධ ආයතන සඳහා පුහුණු වැඩසටහන් ගණනාවක් පවත්වනු ලැබීය.
එකී ඉල්ලීම් වල ස්වභාවය අනුව සමහර වැඩසටහන් ආයතනය මගින් පවත්වන ලද අතර අනෙකුත් අවස්ථාවන්හිදී පුහුණු වැඩසටහන් සඳහා සුදුසු සම්පත් දායකයින් බැහැරින් සපයා ගනු ලැබීය.

බාහිර පාර්ශවකරුවන් සඳහා පුහුණු පාඨමාලා

- පුහුණු පාඨමාල - 58

විදේශීය පුහුණු වැඩසටහන්- විදේශීය පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු මෙහි **6.2** යටතේ දක්වා ඇත.
2024 වසරේදී මානව සම්පත් සංවර්ධන අංශය විසින් විදේශයන්හිදී, ශ්‍රී ලංකාවේදී සහ මාර්ගගත ආකාරයෙන් පවත්වනු ලැබූ සමස්ත විදේශ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව **64**කි.


රේගු නිලධාරීන් විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම (ශ්‍රේණි අනුව) **03** වගුව මගින් නිරූපණය වන අතර වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වර්ග **04** වගුව මගින් නිරූපණය වේ.

03 වගුව : විදේශීය සම්මන්ත්‍රණ/ සමුළු/ පුහුණු වැඩසටහන් සඳහා සහභාගිත්වය - **2023** (ශ්‍රේණි අනුව)

ශ්‍රේණිය	සහභාගිත්වය
රේගු අධ්‍යක්ෂ ජනරාල්	02
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්	06
ජ්‍යෙෂ්ට රේගු අධ්‍යක්ෂ	06

රේගු අධ්‍යක්ෂ	05
ජ්‍යෙෂ්ට නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ	23
නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ	29
රේගු අධිකාරී	08
නියෝජ්‍ය රේගු අධිකාරී	20
සහකාර රේගු අධිකාරී	61
අනෙකුත්	03

04 වගුව: **2024** වර්ෂය තුළ පවත්වන ලද විදේශ පුහුණු වැඩසටහන් වර්ග



විදේශ වැඩසටහන්-	එකතුව: 197
වැඩසටහන් – විදේශ	
• සමුළු	08
• වැඩමුළු	31
• කම්ටු	21
• වැඩසටහන්	25
• පුහුණු පාඨමාලා	16
• සැසි	18
• රැස්වීම්	32
• පශ්චාද් උපාධි වැඩසටහන්	02
• සම්මන්ත්‍රණ	07
• අනෙකුත්	37

රේගු මූලස්ථාන අනු නියෝජිත පුහුණුව සහ විභාග

රේගු මූලස්ථාන අනු නියෝජිතයින්/ වාප්පු සහකාරවරුන් සඳහා සහතික පත් පාඨමාලා මානව සම්පත් සංවර්ධන අංශය විසින් බාහිර පාර්ශවකරුවන් විසින් පවත්වන ලද වඩාත්ම ප්‍රකට පුහුණු වැඩසටහනයි. මෙම පුහුණු පාඨමාලා මගින් රේගු නිෂ්කාශන ක්‍රියාවලිය, ආනයන/ අපනයන ක්‍රියාවලිය, රේගු ආඥා පනත හා අදාල නීති, භාණ්ඩ වර්ගීකරණය, මිල පිරික්සුම් ශිල්පීය ක්‍රම, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රියාපරිපාටි, ASYCUDA පද්ධතිය, පාරිසරික සහ සමාජ ආරක්ෂණ ප්‍රඥාප්ති ආදී විෂයන් පිළිබඳ සමස්ත දැනුමක් ලබා දේ. මෙම සියළුම දේශන පළපුරුදු රේගු නිලධාරීන් විසින් පවත්වනු ලබන අතර ඇතැම් පාඨමාලා මොඩියුල සඳහා පිටත ආයතන වලින් ද සම්පත් දායකයින් කැඳවනු ලැබේ.

බලපත්‍රලාභී රේගු මූලස්ථාන අනු නියෝජිතවරයෙකු බවට පත්වීම සඳහා වන පදනම මෙම වැඩසටහන මගින් සකස්කරන බැවින් මෙම පුහුණු වැඩසටහනට ඉහළ ඉල්ලුමක් පවති. CHA බලපත්‍රය ලබාගැනීම සඳහා මෙම වැඩසටන සඳහා සහභාගි වී පාඨමාලාව අවසානයේ පවත්වන ලිඛිත විභාගය සමත්වීම අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයකි. මෙම CHA බලපත්‍රලාභීන් රටෙහි ආවයන/අපනයන වෙළඳාමෙහි වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

බලපත්‍රලාභී CHA/WAකු වීමට අමතරව මෙම විභාගය අවසානයේදි පිරිනමනු ලබන සහතික පත්‍රයට ඇති ඉහළ පිළිගැනීම හේතුවෙන් බොහෝ දෙනෙකු මේ සඳහා අයදුම් කරනු ලැබේ.

මානව සම්පත් සංවර්ධන අංශය මගින් පිරිනමනු ලබන මෙම සහතික පත්‍රය දේශීයව මෙන්ම විදේශීයව ද පිළිගන්නා සහතික පත්‍රයකි.

2024 වසරේ පවත්වන ලද CHA/WA 01 වන කණ්ඩායමේ විස්තර පහත වගුවේ දැක්වේ.

05 වගුව : 01 -2024 කණ්ඩායමේ සහතිකපත් පාඨමාලා විභාගයේ සාරාංශය

විභාගය	සහභාගිවූවන්	සුදුසුකම් ලත් සහභාගිවූවන්	ප්‍රතිශතය
CHA/WA සහතික පත් පාඨමාලා විභාගය	**284**	**252**	**88.73%**

රේගු පුස්තකාලය

මානව සම්පත් සංවර්ධනයේ වැදගත් අංගයක් වන රේගු පුස්තකාලය **2005.01.06** දින ස්ථාපිත කරන ලද අතර එය මානව සම්පත් සංවර්ධන අංශයේ අනුබද්ධ ඒකකයක් ලෙස ස්ථාපිත කරන ලදී.

මෙමගින් දෙපාර්තමේන්තුවේ සියලු කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල පහසුකම් සපයන අතර සාමාජිකයින් නොවන තැනැත්තන්ට ද පුස්තකාලය භාවිතා කිරීමේ හැකියාව පවතී. පොත් වලට අමතරව විවිධ සඟරා, පුවත්පත් සහ වාර සඟරා පුස්තකාලය සතුවන අතර දෙපාර්තමේන්තු නියෝග, දෙපාර්තමේන්තුවේ වාර්තා මෙන්ම අදාල වාර්තා සහ වාරසඟරාද පුස්තකාල එකතුවේ ඇත.

පුස්තකාල සාමාජිකත්වය වැඩි වෙමින් පවතින බව නිරීක්ෂණය වී ඇති අතර,
(අ) හඳුන්වාදීමට නියමිත නව පුස්තකාල මෘදුකාංගය (තීරු ක්ත්ත ක්‍රමයක් සහිත)
(ආ) නවීන පරිගණක වැඩි සංඛ්‍යාවක් සහිතව අන්තර්ජාල පහසුකම් සැලසීම

වැනි පහසුකම් පුස්තකාලයට සැපයීම අවශ්‍ය වේ.

මානව සම්පත් සංවර්ධන අංශය විසින් ලබා දෙන අනෙකුත් සේවාවන්

පශ්චාත් උපාධි වැඩසටහන් සඳහාවන පාඨමාලා ගාස්තු ප්‍රතිපූරණය කිරීම

> පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගැනීම රේගු නිලධාරීන්ට අනාගත උසස්වීම් ලබාගැනීමේදී ඉතා වැදගත් වන බැවින් රේගු නිලධාරීන් විසින් ඒ වෙනුවෙන් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන අංශය සේවය ලබාදේ.
>
> මෙමගින් රේගු නිලධාරීන් පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගැනීම සඳහා උසස් අධ්‍යාපන කටයුතු වල නිරතවීමට දිරිමත් කරනවා පමණක් නොව, දීර්ඝ කාලීනව ශ්‍රී ලංකා රේගුව සමස්ත රාජ්‍ය අංශයේ ඉහළම අධ්‍යාපන සුදුසුකම් සහිත කාර්යමණ්ඩලයක් සහිත ආයතනයක් බවට පත්වනු ඇත.

වර්තමානයේ මානව සම්පත් සංවර්ධන අංශය මුහුණ දෙන අභියෝග සහ ඒ සඳහා යෝජනා
මේ වන විට අනුමත කාර්ය මණ්ඩලට වඩා ඉතා අඩු සංඛ්‍යාවක සේවක හිඟයක් සහිතව (01 වගුව) අංශයේ කාර්යයන් ඉටුකරනු ලබේ. එබැවින් වර්තමාන මානව සම්පත් සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩලයට අති විශාල කාර්යයන් රැසක් සපුරාලිය යුතුව පවතින බැවින් නියමිත කාලයට දෙපාර්තමේන්තුවේ ඉලක්කයක් ලඟාකර ගැනීම අභියෝගයක්ව පවතී.

සමස්ත රේගු දෙපාර්තමේන්තුවේ වර්ධනය වන ධාරිතා සංවර්ධන වගකීම් දරන මානව සම්පත් කළමනාකරණ අංශයට පානීය ජල ඩිස්පෙන්සර, දේශන පැවැත්වීම සඳහා ලැප්ටොප් පරිගණක වැනි සැපයුම් අවශ්‍යතාවන් ද සපුරාලිය යුතුව පවතී.

මානව සම්පත් කළමනාකරණ අංශයේ ග්‍රවණාගාරයට ඉහළ ප්‍රමිතියකින් යුතු උපකරණ ලැබී ඇති නමුත් ඒවා තවමත් නිසි පරිදි සවිකර නොමැත.
එබැවින් දෙපාර්තමේන්තුවේ වැඩිවන පුහුණු අවශ්‍යතාවන් සපුරාලීම සඳහා, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට සුමට සේවාවක් සැපයීම සඳහා ඉහත සඳහන් අවශ්‍යතාවයන් හැකි ඉක්මනින් සපුරාලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

මානව සම්පත් සංවර්ධන අංශයේ සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා අන්තර්ජාල, සූම්, දේශන කාමර පහසුකම් සහ සහතික පත් මුද්‍රණ පහසුකම් වැනි අනෙකුත් පහසුකම්ද වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.

මීළඟ පියවර

- 2024 පුහුණු වැඩසටහනට අනුගතවීම සඳහා අංශයේ පුහුණු අවශ්‍යතාවන් හඳුනා ගැනීමට පුහුණු අවශ්‍යතා සමීක්ෂණයක් පැවැත්වීම.
- සම්පත් සංචිතය හඳුනා ගැනීම සහ සම්පත් සංචිතය සඳහා ඉගැන්වීමේ ක්‍රමවේද වැඩසටහන් පැවැත්වීම.
- දේශීය වැඩසටහන් සඳහා පුහුණු මොඩියුල සකස් කිරීම.

ප්‍රධාන ජයග්‍රහණයන්

- රේගු නිලධාරීන් සඳහා දේශීය පුහුණු වැඩසටහන් 58ක් සංවිධානය කරන ලදී.
- අයදුම්කරුවන් 284දෙනෙකු සඳහා රේගු මූලස්ථාන අනු නියෝජිත (CHA) සහතික පත් පිරිනැමීම නිමකරන ලද අතර මීලඟ වසරේ වැඩසටහන සඳහා තවත් 300 දෙනෙකු ලියාපදිංචි විය.
- වසර පහක කාලසීමාවක් (2019 සිට 2024) සඳහා විස්තීර්ණ පුහුණු දත්ත පද්ධතියක් (දේශීය සහ විදේශීය) සකස් කිරීම.
- සහකාර රේගු අධිකාරී සහ රේගු පරීක්ෂක සේවාරම්භක පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

8.4.3 කාර්ය මණ්ඩල සේවා අංශය

අරමුණු

සියලුම ක්‍රියාමාර්ග නෛතික, නිල හා සංවිධානිත්මක ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කරමින් වගකීම, විනය, වගවීම සහ ඒකාබද්ධතාවය නිරන්තරයෙන්ම ආරක්ෂාවන පරිසරයක් කෙරෙහි අවධානය යොමු කරවනු ලබන ශක්තිමත් රාජකාරිමය ආචාර ධර්ම සංස්කෘතියක් වර්ධනය කිරීම.

ප්‍රධාන කාර්යයන්

I. විනය කටයුතු පාලනය කිරීම:
අදාල නිලධාරීන්ට එරෙහිව චෝදනා පවතින්නේ නම් මූලික විමර්ශන සහ විනය පරීක්ෂණ පැවැත්වීම සහ ආයතන සංග්‍රහයේ II වෙළුමේ දක්වා ඇති පරිදි ක්‍රියාත්මක කිරීම.

II. රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම:
සියලු අංශ සමඟ සම්බන්ධීකරණය වෙමින් විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

III. විගණන හා කළමනාකරණ රැස්වීම් (AMC) සම්බන්ධීකරණය කිරීම:
මුදල් අමාත්‍යාංශය විසින් පවත්වන ලද විගණන හා කළමනාකරණ රැස්වීම් (AMC) සම්බන්ධීකරණය කිරීම

IV. රාජ්‍ය ගිණුම් කාරක සභාවට (COPA) ඉදිරිපත් කළ යුතු වාර්තා සකස් කිරීම.
සියලු අංශ සමඟ සම්බන්ධීකරණය වෙමින් COPA වාර්තා සඳහා පිළිතුරු සකස් කිරීම සහ මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.

V. පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම
පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා සියලු අංශ වලින් නිරීක්ෂණ/පිළිතුරු ලබාගැනීම සහ මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.

VI. නෛතික ආයතන (අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අල්ලස් කොමිසම, පාර්ලිමේන්තු කමිටු) සමඟ සම්බන්ධීකරණය කිරීම.

2024 වර්ෂය සඳහා අංශයේ කාර්යසාධනය

- විනය කළමනාකරණය
  මූලික විමර්ශන

2024 වසරේ සිදුකරන ලද මූලික විමර්ශන සංඛ්‍යාව.	නිමකරන ලද මූලික විමර්ශන සංඛ්‍යාව.	සිදුකළ යුතුව ඇති මූලික විමර්ශන සංඛ්‍යාව.
20	12	08

විධිමත් විනය පරීක්ෂණ

පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණ සංඛ්‍යාව	නිමකරන ලද විධිමත් විනය පරීක්ෂණ සංඛ්‍යාව	සිදුකළ යුතුව ඇති විධිමත් විනය පරීක්ෂණ සංඛ්‍යාව
18	08	10

- විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

ලැබුණු විගණන විමසුම් සංඛ්‍යාව	පිළිතුරු සපයා ඇති විගණන විමසුම් සංඛ්‍යාව	පිළිතුරු සැපයීමට ඇති විගණන විමසුම් සංඛ්‍යාව
19	19	-

- පාර්ලිමේන්තු ප්‍රශ්න සහ ප්‍රශ්නමාලා සඳහා පිළිතුරු සැපයීම

ලැබුණු ප්‍රශ්න සංඛ්‍යාව	පිළිතුරු සපයා ඇති ප්‍රශ්න සංඛ්‍යාව	පිළිතුරු සැපයීමට ඇති ප්‍රශ්න සංඛ්‍යාව
06	06	-

- විනය අනුමත කිරීම
  ආයතනික රාජකාරී සඳහා මානව සහ කළමනාකරණ අංශය වෙත විනය අනුමත කිරීම් **5,745** ක් ලබා දෙනු ලැබීය.
- විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්
  2024 වර්ෂය සඳහා මුදල් අමාත්‍යාංශය මගින් විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී.

- සේවා සැපයුම් අංශය ශක්තිමත් කිරීම

  පුහුණු
  කාර්ය මණ්ඩලය සඳහා වඩාත් හොඳ ඉගෙනුම් අවස්ථා ලබාදීම සඳහා පුහුණු වැඩසටහන් දෙකක් පිරිනමනු ලැබීය.

  මූලික විමර්ශන ක්‍රියාවලිය වේගවත් කිරීම
  අනවශ්‍ය ප්‍රමාදයන් නොමැතිව මූලික විමර්ශන නිමකරන බව තහවුරු කිරීම අවශ්‍ය කෙරේ. එබැවින්, අවශ්‍ය කාලසීමාව තුළ එකී විමර්ශන සිදුකරන ලද බව තහවුරු කිරීම සඳහා පසු විපරම් සිදු කරයි.

8.4.4 සේවා සැපයුම් අංශය

හැඳින්වීම

රජය විසින් පවරනු ලබන අත්‍යවශ්‍ය රාජකාරීන් ඉටුකිරීමේදී සේවා සැපයුම් අංශය දෙපාර්තමේන්තුව තුළ වැදගත් කාර්යයක් ඉටු කරනු ලැබේ. ඵලදායී ලෙස හා විනිවිදභාවයෙන් යුතුව නඩත්තු කිරීම හා සේවා කටයුතු ඇතුලුව රේගුවේ සෑම අංශයක් සඳහාම සියලු අවශ්‍යතා සහ සේවාවන් සැපයීම සේවා සැපයීම් අංශයේ ප්‍රධාන අරමුණ වේ.

ප්‍රධාන කාර්යයන්

- දෙපාර්තමේන්තුවේ කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස ගුණාත්මකභාවය ආරක්ෂා කරමින් නියමිත වේලාවට අදාළ අංශ වෙත සේවා හා සැපයුම් ලබාදීම.
- ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා භාණ්ඩාගාර චක්‍රලේඛ වලට අනුගත වෙමින් විනිවිදභාවයෙන් යුතුව භාණ්ඩ හා සේවා මිලදී ගැනීම.

- විධිමත් තොග පාලනයක් හා කාර්යක්ෂම ගබඩා කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යමින්, මිලදී ගන්නා භාණ්ඩවල ආරක්ෂාව හා ප්‍රශස්ත භාවිතය සහතික කරමින් නිසි ලෙස ගබඩා කිරීම හා ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම.
- රේගු දෙපාර්තමේන්තුවේ සියලු වංචල හා නිශ්චල වත්කම් කළමනාකරණය කිරීම.
- සැලසුම්ගත පරිදි නව රේගු මූලස්ථාන ගොඩනැගිල්ල තුළ ඉදිකිරීම් කටයුතු සතුටුදායක ලෙස නිම කිරීම සහ විධිමත් පරිශ්‍රය කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන බවට සහතික වීම.
- රේගු දෙපාර්තමේන්තුවේ රථවාහන සමූහය උපරිම ධාවන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා සුදුසු පියවර ගැනීම.

2024 වර්ෂය සඳහා කාර්යසාධනය

2024 වර්ෂය තුළ ශ්‍රී ලංකා රේගුවේ භෞතික සම්පත් වැඩි සියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. මෙම වගකීම සම්පූර්ණයෙන්ම සේවා සැපයුම් අංශය වෙත පවරා ඇත. එබැවින්, දෙපාර්තමේන්තුවේ කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා වන සැපයුම් හා සේවාවන් නිසි කලට සැපයීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය විය.කෙසේවුවද, මෙම සැපයුම් හා සේවා අවශ්‍යතාවයන් **2024** වර්ෂය තුළදී අපේක්ෂිත පරිදි සම්පූර්ණ කිරීමට අංශයට හැකිවිය.

සේවා සැපයුම් අංශය මගින් ඉටු කරනු ලබන කාර්යයන් වෙනුවෙන් **2024** වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා වෙන්කරන ලද රු. මී. **1,321.81**ක්වූ සංශෝධිත ඇස්තමේන්තුවෙන් රු. මී. **1,247.21**ක් උපයෝජනය කර ඇත. උපයෝගිකරණ අනුපාතයේ **94%** ක ප්‍රගතියක් පෙන්නුම් කරයි. එසේම, රු. මී. **593.47**ක් වූ ප්‍රාග්ධන වියදම සඳහා වූ සංශෝධිත ඇස්තමේන්තුවෙන් රු. මී. **462.90**ක් උපයෝජනය කර ඇත. උපයෝගීකරණ අනුපාතයේ **78%** ක ප්‍රගතියක් පෙන්නුම් කරයි. ඉහත ප්‍රගතියට අදාළ ප්‍රධාන සැපයුම් හා සේවාවන් කිහිපයක කාර්යසාධනය පහත සවිස්තරාත්මකව දක්වා ඇත.

2024 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද ප්‍රධාන කාර්යයන්

වැය විෂය අංකය	ප්‍රධාන කාර්යය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු. මී.)	මූල්‍ය කාර්යසාධනය		භෞතික ප්‍රගතිය
			(රු. මී.)	%	
	භාණ්ඩ	**698.67**	**575.70**	**82**	
1201	ලිපිද්‍රව්‍ය	70.00	68.62	98	වර්ෂය තුළදී ලිපිද්‍රව්‍ය අයිතම **85**ක් අවස්ථා තුනකදී මිලදී ගන්නා ලදී.
1203-002	නිල ඇඳුම්	44.20	38.25	87	නිල ඇඳුම් රෙදි මීටර් **1300**ක්, සපත්තු **1,994**ක් මෙස් **3,988**ක් සහ වෙනත් නිල ඇඳුම් උපාංග **20**ක් වර්ෂය තුළ මිලදී ගන්නා ලදී.
1205	අනෙකුත් මිලදී ගැනීම්	51.00	40.74	80	ඇඳ ඇතිරිලි **4,495** ක්, කොට්ට උර **4,443**ක්, *TSS* බෑග් **3,217**ක්, පොලිසැක් බෑග් **65,300**ක්, මේස රෙදි **924**ක් සහ අනෙකුත් භාණ්ඩ (ඉවත දැමිය හැකි මුහුණු ආවරණ **5,500** අත් පිරිසිදුකාරක **41**, කෑන් **50**, මිලි **500** බෝතල් **100**, අත් අවෙරණ **2500** ආදිය)
2102	ලි බඩු සහ කාර්යාලයීය උපකරණ	17.97	13.45	75	ඇඳන් **05**, කැම මේස **06**, කෑම මේස පුටු **04**, ප්ලාස්ටික් පුටු **16**, කාර්යාලයීය මේස **07**, පුටු **74**, ලාච්චු **4** වානේ කබඩ් **32**, දොර **2** කබඩ් **19**, ඇඳුම් රාක්ක **19**, සේප්පු කට්ටල **12**.
2103	යන්ත්‍ර යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	364.50	363.73	100	මුද්‍රණ යන්ත්‍ර **32**, වායු සමීකරණ යන්ත්‍ර **25**, *UPS* **85**, ව්‍යවසායක දත්ත මධ්‍යස්ථාන, ව්‍යවසායක ඊ මේල් සහ පිටපත් ගැනීම්, *(EDR* සහ *PAM)*, විද්‍යාගාර උපකරණ *(EDXRE* යන්ත්‍ර*)* සහ වෙනත් විද්‍යුත් භාණ්ඩ. **2024.07.10** දින අ.ඩො. *211,473.80* ක බහාළුම් පරිලෝකන පද්ධතියේ ගෙවීම් අත්හිටුවීම

2106	මෘදුකාංග සංවර්ධනය	51.00	50.91	100	අවසාන ස්ථාන හඳුනාගැනීමේසහ ප්‍රතිචාර දැක්වීමේ බලපත්‍ර සහ සහාය හා රේගු මෘදුකාංග පද්ධතිය සඳහාප්‍රවිශ කළමනාකරණ විසඳුම් බලපත්‍ර මිලදී ගැනීම.
005-2106	ශ්‍රී ලංකා රේගුවේ අවදානම් කළමනාකරණ මෘදුකාංගයක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම	100.00	0.00	50	ප්‍රසම්පාදන කාර්යයයෙන් පසුව **2024** දෙසැම්බර් **30** වන දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත.
	කාර්යයන්	**48.00**	**22.26**	**46**	
1303 2001	ගොඩනැගිලි සහ ව්‍යුහ නඩත්තු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම	48.00	22.26	46	රේගු මූලස්ථාන ගොඩනැගිල්ල නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම **9** වන මහලේ ආපන ශාලාවේ හානිවී තිබූ ටයිල් ඉවත් කර අළුතින් සවි කිරීම, ඩිස්කොතෙක් කොටසේ අළුත්වැඩියා කටයුතු, අභ්‍යන්තර කටයුතු ඒකකය වැඩි දියුණු කිරීම (වෙන් කිරීමේ කටයුතු), *CHA/VAT* ඒකකයේ වෙන් කිරීමේ කටයුතු , *CHA/VAT* ඒකකයේ හානිවූ වීදුරු නැවත සවිකිරීම, ඉහළ වහලේ හානිවූ ටයිල ්ඉවත් කර අළුතින් සවි කිරීම, රේගු කෞතුකාගාරයේ පින්තාරු කටයුතු, රේගු කෞතුකාගාරයේ මානව ආකෘති සංරක්ෂණය කිරීම රේගු ප්‍රාදේශීය ගොඩනැගිලි නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම මෝගන් පාර රේගු නිල නිවාස නවීකරණය කිරීම, නයිකන්ද *SPO* හි ජල ටැංකිය ඉදිකිරීම, කටුනායක ගුවන්තොටුපළ රේගු විවේකාගාරය අළුත්වැඩියා කිරීම, කටුනායක විවේකාගාරයේ විදුලි ජනන යන්ත්‍රය සවිකිරීම , ආරක්ෂක අවශ්‍යතා සඳහා ජපන් ගබඩාවේ තාප්ප ඉදිකිරීම , රේගු නියාමක විවේකාගාරයේ අළුත්වැඩියා කටයුතු, (නාන කාමර, දොර, ජල කාන්දු වීම) , ආරක්ෂක අවශ්‍යතා සඳහා ගමන්මළු සුරක්ෂිතාගාරයේ වානේ රාමු ඉදිකිරීම, ත්‍රිකුණාමලය *SPO* හි ජල ටැංකි ඉදිකිරීම සහ අළුත්වැඩියාව, සින්නපාඩු *SPO* හි නවීකරණ කටයුතු, මත්තල නිලනිවාසවල අළුත්වැඩියා කටයුතු .

වැය විෂය අංකය	ප්‍රධාන කාර්යය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු. මී.)	මූල්‍ය කාර්යසාධනය		භෞතික ප්‍රගතිය
			(රු. මී.)	%	
	සේවාව	**1,168.60**	**1,112.14**	**95**	
1202-009	සංචිත වාහන සඳහා ඉන්ධන	100.00	91.00	91	වාහන **127**ක් සඳහා ඉන්ධන (මූලස්ථානය සහ ප්‍රාදේශීය කාර්යාල)
1203-001	ආහාර	73.10	72.40	99	රේගු නිලධාරීන් සඳහා දිවා ආහාර, රාත්‍රී ආහාර සහ කෙටි ආහාර සැපයීම (කොළ වරාය සහ හම්බන්තොට වරාය)
1302	යන්ත්‍ර යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	42.00	37.89	90	වායු සමීකරණ, පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, අපද්‍රව්‍ය පිරිසිදු කිරීම් ස්ථාන, පරිලෝකන යන්ත්‍ර ආදිය.
1304	මෘදුකාංග නඩත්තුව	2.93	-	0	

1402	තැපැල් සහ විදුලි සංදේශ	110.20	110.05	100	ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල මාසික බිල් ගෙවීම
1403	විදුලිබලය සහ ජලය	245.00	242.96	99	ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල මාසික බිල් ගෙවීම
1404	කුලී සහ දේශීය බදු	97.20	95.64	98	ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල බදු කුලි සහ දේශීය බදු
1405	පිරිසිදු කිරීම් සහ සනීපාරක්ෂක සේවා	89.70	89.45	100	සේවා ගිවිසුම් (ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල)
1407	ආරක්ෂක සේවා	40.00	39.26	98	*2024.04.01* සිට *2025.03.31* දක්වා සේවා ගිවිසුම් අත්සන් කිරීම (ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල)
1408	මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහන සඳහා බදු කුලී	60.00	57.94	97	මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහන **17**ක් සඳහා කල්බදු ගෙවීම
1409-138	යන්ත්‍රෝපකරණ සහ කාර්යාලයීය උපකරණ සේවා ගිවිසුම්	81.20	60.03	74	සේවා ගිවිසුම් **18**ක් සඳහා සහ ගිවිසුම් මගින් ආවරණය නොවූ අතිරේක නඩත්තු කටයුතු සඳහා ගෙවීම් කිරීම.
1409-139	වාහන රක්ෂණ	5.00	2.30	46	වාහන ඇණිය රක්ෂණය කිරී (සියළුම වාහන පූර්ණ රක්ෂණය කර ඇත)
1409-140	විවිධ සේවා වියදම්	21.27	19.43	91	රේගු භූමිවල නාම පුවරු සවිකිරීම ආදී විවිධ සේවා වියදම්, මායිම් රේඛා යෙදීම
001-1304	ASYCUDA තොරතුරු තාක්ෂණ පද්ධතිය	95.00	94.10	99	*ASYCUDA* තොරතුරු තාක්ෂණ පද්ධතිය සඳහා *fort gate Firewall* මිලදී ගැනීම සහ සවිකිරීම
003-1403 003-1409-140	නව බහාළුම් පරිලෝකන ව්‍යාපෘතිය	41.00	35.67	87	**2024** වර්ෂය තුළ විදුලි සහ ජල බිල්පත් ගෙවීම, ගිනි ආරක්ෂාව සහ විදුලි ජනන යන්ත්‍ර සේවා ගිවිසුම්
1301 2003	වාහන ප්‍රතිසංස්කරණය සහ නඩත්තුව	65.00	64.02	98	වර්ෂය තුළ දෙපාර්තමේන්තු වාහන **108**ක් අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම.
	මුළු වියදම	**1,915.27**	**1710.11**	**89**	

8.5 ප්‍රාදේශීය පර්ෂදය

8.5.1 මගී සේවා (කටුනායක) අංශය

8.5.2 මගී සේවා (කොළඹ) අංශය

8.5.3 ආදායම් හා සේවා (කටුනායක) අංශය

8.5.4 ආදායම් හා සේවා (ප්‍රාදේශීය) අංශය

8.5.1 මගී සේවා (කටුනායක) අංශය

හැඳින්වීම

ශ්‍රී ලංකා රේගුවේ පළාත් පර්ෂදය යටතේ ක්‍රියාත්මක මගී සේවා (කටුනායක) අංශය, රාජ්‍ය ආදායම ආරක්ෂා කිරීම සහ රටේ සමාජ-ආර්ථික, සංස්කෘතික සහ පාරිසරික අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා දේශසීමාවන්හි දී රේගු නීතිය සහ අනෙකුත් අදාල නීති ක්‍රියාකාරී ලෙස බලාත්මක කරන අතරම මගින් සහ මගී ගමන්මලු සංචලනය සඳහා පහසුකම් සැළසීම කෙරෙහි අවධානය යොමු කරයි.

මූලික අරමුණු

- නෛතික අරමුණු සඳහා මගීන් සහ ගමන් මලු නිෂ්කාශනය සඳහා පහසුකම් සැළසීම.
- දේශ සීමාවන් හරහා සීමාකරන ලද සහ තහනම් කරන ලද භාණ්ඩ ගමනා ගමනය පාලනය කිරීම.
- රටේ සමාජ ආර්ථික, සංස්කෘතික සහ පාරිසරික අයිතීන් සුරක්ෂිත කිරීම.
- රාජ්‍ය ආදායම ආරක්ෂා කිරීම.

.

මෙම අංශයේ කාර්යයන්

- අව්‍යාජ මගීන් සහ ඔවුන්ගේ ගමන් මලු රට තුළට සහ පිටතට ගමන් කිරීම සඳහා පහසුකම් සැළසීම.
- එක් ගුවන්යානයකින් තවත් ගුවන්යානයකට මාරුවන මගීන් සහ ඔවුන්ගේ ගමන්මලු සංචලනය සඳහා පහසුකම් සැළසීම.
- ප්‍රභූ ගමන් බිමන් (VVIP, VIP), සේද මාවතේ (Silk Route) සහ වාණිජමය වශයෙන් වැදගත් වන මගීන්ගේ (CIP) ප්‍රවේශය සහ පිටවීම සඳහා පහසුකම් සැළසීම.
- ශ්‍රී ලංකාවට පැමිණෙන සහ පිටවන ගුවන් යානා සහ කාර්ය මණ්ඩලය සඳහා නිෂ්කාශන කටයුතු සිදුකිරීම.
- රටින් පිටතට යන ගුවන් යානා සඳහා අනුමැතීන් නිකුත් කිරීම.
- මගී ගුවන් මලු සඳහා බදු නිදහස් ගමන් මලු දීමනාව ලබාදීම.
- වාණිජ ප්‍රමාණයෙන් සහ වාණිජ ස්වභාවයේ භාණ්ඩ අඩංගු වන ගමන් මලු වලින් තීරු බදු සහ අනෙකුත් බදු අයකර ගැනීම.
- ATA කානේ පත්, ඇපකර සහ විශේෂ තැන්පතු ආදිය මත භාණ්ඩ නිදහස් කිරීම සහ පසු විපරම් කාර්යයන් සිදු කිරීම.
- රට තුළට රැගෙන එන සහ ඉන් පිටතට රැගෙන යන මැණික් පාර්සල් සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීම.
- රට තුළට පැමිණෙන සහ රටින් පිටවන මගීන් විසින් සිදුකරන ලද විදේශ මුදල් පිළිබඳ රේගු ප්‍රකාශන මාර්ගගතව ඉදිරිපත් කිරීම සහ නිල ලදුපතක් නිකුත් කිරීම.
- මගියා පිටත් වූ පසුව, ඇටෝනි බලපත්‍රය මත බලය පවරන ලද පුද්ගලයින්ට කැටුව නොයන ගමන් මලු නිෂ්කාශනය කිරීමට හැකිවන පරිදි ඉතිරි ගමන් මලු ලබාදීම අනුමත කිරීම.
- අක්‍රමවත්ව හසුරුවන ලද ගමන් මලු නිෂ්කාශනය කිරීම.
- රාජ්‍ය තන්ත්‍රික ගමන් මලු නිෂ්කාශනය කිරීම.
- අවශ්‍යය වන්නේ නම් මගීන් පරීක්ෂා කිරීම.
- සීමාකරන ලද හෝ තහනම් කරන ලද භාණ්ඩ ආනයනය හා අපනයනය පාලනය කිරීම සහ වැළැක්වීම.
- රේගු වැරදි හඳුනා ගත් අවස්ථාවන්හි දී පරීක්ෂණ සහ විමර්ශන සිදුකිරීම.
- සැකකරුවන් උසාවියට ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය වන්නේ නම් උසාවි ක්‍රියාමාර්ග මගින් දණ්ඩන අයකර ගැනීමට සහ රාජසන්තක කිරීම් සිදුකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.
- රේගුවේ අධික්ෂණය යටතේ හිමිකම් නොකී භාණ්ඩ අපහරණය සඳහා පහසුකම් සැළසීම.
- රේගුවේ අධික්ෂණය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ රඳවා ගනු ලබන භාණ්ඩ විනාශ කිරීම අධීක්ෂණය කිරීම.
- රාජසන්තක කරන ලද හෝ රඳවා ගනු ලැබූ භාණ්ඩ ආරක්ෂා කිරීම සහ අපහරණය කිරීම.
- රේගු ආඥා පනතේ (235 වන අධිකාරිය) විධිවිධානයන්ට අනුකූලව රාජසන්තක කරන ලද අයිතම අපහරණය කිරීම, දණ්ඩන සහ රාජසන්තක කිරීම් පැනවීම.
- ගුවන් තොටුපලේ ක්‍රියාත්මක අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.

ආදායම එකතු කිරීම - **2024**

තීරුබදු සහ අනෙකුත් බදු :

	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තීරු බදු (CID)	141,693,495.00
එකතුකළ අගය මත බදු (VAT)	456,073,887.00
වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු (PAL)	64,337,092.00
ආනයන CESS	210,727,801.00
අධිභාර	406,831.00
නිෂ්පාදන බදු (XID)	38,435.00
සමාජ ආරක්ෂණ බදු (SSL)	66,083,838.00
දඩ	357,769,245.00
නඩු දණ්ඩන	178,005,808.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	714,770.00
අනෙකුත්	102,700.00
එකතුව	**1,475,953,902.00**

අනෙකුත් ගාස්තු:

	ප්‍රමාණය (රු.)
SR ගාස්තු	**1,765,550.00**
OT ගාස්තු	**8,751,900.00**
DFS රේගු ගාස්තු	**409,600.00**
පරිගණක ගාස්තු	**5,706,750.00**
ඡායා පිටපත්	**166,265.00**
එකතුව	**16,800,065.00**

එකතු වූ මුළු ආදායම (රු.) : **1,492,753,967.00**

හසුකර ගැනීම්

අනාවරණය කරගත් සිද්ධි සංඛ්‍යාව	**: 145**
රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකමේ එකතුව (රු.)	**: 1,638,777,256.00**
රාජසන්තක කරන ලද විදේශ මුදල් වල වටිනාකම (රු.)	**: 201,283,564.60**
රාජසන්තක කරන ලද මැණික් ගල් වල වටිනාකම (රු.)	**: 38,526,038.00**
රාජසන්තක කරන ලද රත්‍රං වල වටිනාකම (රු.)	**: 218,527,974.00**
රාජසන්තක කරන ලද අනෙකුත් භාණ්ඩ වල වටිනාකම (රු.)	**: 1,180,439,679.40**
අනාවරණය කරගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය	**: 104.80 kg**

හසුකර ගන්නා ලද අනෙකුත් සීමාකරන ලද/ තහනම් කරන ලද අයිතම ප්‍රමාණයන්

කාණ්ඩය	රත්‍රං (දළ /ආභරණ)	රත්‍රං ජෙල්/තලප	එනසාල්	විලවුන්	කෘමිනාශක/ පලිභෝධනාශක	පොහොර
බර (කි.ග්‍රෑ.)	21.7	21.2	1926.8	1111.1	82.3	1023


කාණ්ඩය	ජංගම දුරකථන	E- සිගරට්	සිගරට්
ඒකක සංඛ්‍යාව	**6884**	**6546**	**7,039,202**


2024 වසරේ දී මගීන් සඳහා සපයන ලද සේවාවන්

ගුවන් තොටුපලට පැමිණි ගුවන්යානා සංඛ්‍යාව	25,932
ගුවන් තොටුපලට පැමිණි මගීන් සංඛ්‍යාව	4,085,127
ගුවන් තොටුපලන් පිටත්වූ ගුවන්යානා සංඛ්‍යාව	26,355
ගුවන් තොටුපලින් පිටත්වූ මගීන් සංඛ්‍යාව	4,244,462
තීරු බදු සහ අනෙකුත් බදු ගෙවීමෙන් අනතුරුව රතු චැනලය ඔස්සේ නිෂ්කාශන කරන ලද මගීන් සංඛ්‍යාව	22,872
තීරු බදු නිදහස් දීමනාව සඳහා හිමිකම් කියන ලද මගීන් සංඛ්‍යාව	48,285
නිෂ්කාශනය කරන ලද අක්‍රමවත්ව හසුරන ලද ගමන් මලු සංඛ්‍යාව	27,148
පැමිණීමේ පර්යන්තය හරහා ගමන් කළ ප්‍රභූ ගමන් මලු සංඛ්‍යාව	1,342
පිටවීමේ පර්යන්තය හරහා ගමන් කළ ප්‍රභූ ගමන් මලු සංඛ්‍යාව	1,275

*මූලාශ්‍රය: **BIA** සිද්ධි ලේඛනය, **BIA** සුරක්ෂිතාගාර ලේඛනය*
*** රත්‍රං ප්‍රතිශතය සංයෝජිත වර්ගීකරණ ක්‍රියාවලියෙන් සුව වටිනාකම නියම කිරීමට ඇති සහ රත්‍රං පෙල්/තලප ඇතුළත් කර නොමැත.*

වර්ෂය	මුළු එකතුව	පෙර වර්ෂය හා සැසඳීමේදී ආදායම වැඩිවීමේ ප්‍රතිශතය
2018	404,875,536.00	
2019	452,738,967.00	12
2020	139,679,711.00	-69
2021	124,119,902.00	-11
2022	637,675,154.00	414
2023	1,313,385,295.00	106
2024	1,492,753,967.00	12





8.5.2 මගී සේවා (කොළඹ) අංශය

ප්‍රධාන කාර්යයන්

- රටින් බැහැරව හා රටට පැමිණෙන මගීන් හා භාණ්ඩ නිෂ්කාශනය පහසු කිරීම.
- ආදායම් සුරක්ෂිත කිරීම හා තහනම් කරන ලද හා සීමා කරන ලද අයිතම ආනයනය හා අපනයනය වැළැක්වීම.
- සමාජ ආර්ථික, සමාජයේ සංස්කෘතික හා පාරිසරික අපේක්ෂාවන් ආරක්ෂා කිරීම.
- කැටුව නොයන මගී ගමන් මලු (UPB) ගුදම් පාලනය හා නියාමනය කිරීම.

කැටුව නොයන මගී ගමන් මලු (UPB) ගුදම් ලයිස්තුව

ගමන් මලු කාර්යාලය - අලෙවි (BO Sales)
ගමන් මලු කාර්යාලය - රෑන්ක් බහාලුම් පර්යන්තය (BO RCT)
ගමන් මලු කාර්යාලය - නව නුගේ පාර (BO NNR)
ලක්සිරි සේවා - කොළඹ
ලක්සිරි සේවා - නින්දවූර්
ට්‍රාන්ස්කෝ - වත්තල
ට්‍රාන්ස්කෝ - දඹුල්ල
මීඩ්කෝ
ට්‍රයිකෝ - කොළඹ
සිලෝන් ෂිපින් ලයින්ස් - කොළඹ/අඩාලවිචේන

සටහන : 2023 වර්ෂයේදී ට්‍රයිකෝ ගාල්ල, ට්‍රයිකෝ කුරුණෑගල, CSL නුවර ගුදම් මගී සේවා අංශය යටතේ ස්ථාපිත කළද 2024 වර්ෂයේදී ඒවා ප්‍රාදේශීය අංශය යටතේ පැවතුණි.

ආදායම එකතු කිරීම (රු.)

ගමන් මලු කාර්යාලය - අලෙවි (BO Sales)

ප්‍රකාශන සංඛ්‍යාව	-
පැකේජ සංඛ්‍යාව	-
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	61,291,907.14
එකතු කළ අගය මත බදු (VAT)	56,975,254.67
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	18,256,108.63
සේස් බදු (CESS)	1,977,230.82
නිෂ්පාදන බදු (Excise Duty)	351713.00
රේගු අධිභාර (SUR)	622,408.00
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	1,656,206.75
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	78,955.00
VAL	-
සමාජ වගකීම් බදු (SRC)	11,995,780.00
මුද්‍රා ගාස්තු (SEAL)	271,100.00
අතිකාල	43,828,780.58
දඩ	2,652,364.00
අනෙකුත් ගාස්තු	66,776,940.96

TW ගාස්තු	20,990,250.00
එකතුව	**284,724,999.55**

ගමන් මලු කාර්යාලය RCT

ප්‍රකාශන සංඛ්‍යාව	6,408
පැකේජ සංඛ්‍යාව	187054
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	19,672,247.00
එකතු කළ අගය මත බදු (VAT)	44,831,289.00
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	19,332,838.00
සේස් බදු (CESS)	43,660,385.00
නිෂ්පාදන බදු (Excise Duty)	2,154,031.00
රේගු අධිභාර (SUR)	9,225.00
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	8,806,873.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	18,300.00
VAL	-
සමාජ වගකීම් බදු (SRC)	10,600.00
මුද්‍රා ගාස්තු (SEAL)	-
අතිකාල	221,650.00
දඩ	23,870,036.00
අනෙකුත් ගාස්තු	430,650.00
TW ගාස්තු	-
එකතුව	**163,018,124.00**

ගමන් මලු කාර්යාලය - NNR

ප්‍රකාශන සංඛ්‍යාව	13,582
පැකේජ සංඛ්‍යාව	70,816
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	16,389,339.00
එකතු කළ අගය මත බදු (VAT)	27,077,135.00
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	10,847,290.00
සේස් බදු (CESS)	22,305,773.00
නිෂ්පාදන බදු (Excise Duty)	2,073,973.00
රේගු අධිභාර (SUR)	484,469.00
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	5,170,218.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	40,083.00
VAL	2,000.00
සමාජ වගකීම් බදු (SRC)	260,108.00
මුද්‍රා ගාස්තු (SEAL)	34,171.00
අතිකාල	-
දඩ	646,051.00
අනෙකුත් ගාස්තු	146,012.00
TW ගාස්තු	1345.00
එකතුව	**85,477,967.00**

9

ලක්සිරි සේවා - කොළඹ

ප්‍රකාශන සංඛ්‍යාව	23,565
පැකේජ සංඛ්‍යාව	60,463
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	17,212,902.00
එකතු කළ අගය මත බදු (VAT)	31,133,903.00
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	14,585,441.00
සේස් බදු (CESS)	30,402,785.00
නිෂ්පාදන බදු (Excise Duty)	2,104,638.00
රේගු අධිභාර (SUR)	299,064.00
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	6,741,240.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	790,755.00
VAL	-
සමාජ වගකීම් බදු (SRC)	132,400.00
මුද්‍රා ගාස්තු (SEAL)	193,750.00
අතිකාල	7,216,860.00
දඩ	3,137,054.00
අනෙකුත් ගාස්තු	-
TW ගාස්තු	-
එකතුව	**113,950,792.00**

ලක්සිරි සේවා - නින්දවූර්

ප්‍රකාශන සංඛ්‍යාව	3,370.00
පැකේජ සංඛ්‍යාව	7,618.00
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	1,025,720.00
එකතු කළ අගය මත බදු (VAT)	1,857,418.00
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	883,608.00
සේස් බදු (CESS)	2,132,610.00
නිෂ්පාදන බදු (Excise Duty)	155,949.00
රේගු අධිභාර (SUR)	36,390.00
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	404,686.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	49,200.00
VAL	-
සමාජ වගකීම් බදු (SRC)	12,650.00
මුද්‍රා ගාස්තු (SEAL)	-
අතිකාල	-
දඩ	317,012.00
අනෙකුත් ගාස්තු	-

TW ගාස්තු	-
එකතුව	**6,875,243.00**

ට්‍රාන්ස්කෝ- වත්තල

ප්‍රකාශන සංඛ්‍යාව	37,361
පැකේජ සංඛ්‍යාව	131,954
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	10,171,347.00
එකතු කළ අගය මත බදු (VAT)	25,917,085.00
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	19,011,565.00
සේස් බදු (CESS)	52,331,250.00
නිෂ්පාදන බදු (Excise Duty)	1,088,756.00
රේගු අධිභාර (SUR)	1,028,566.00
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	8,671,319.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	139,819.00
VAL	-
සමාජ වගකීම් බදු (SRC)	208,000.00
මුද්‍රා ගාස්තු (SEAL)	200,750.00
අතිකාල	5,561,674.00
දඩ	4,167,279.00
අනෙකුත් ගාස්තු	-
TW ගාස්තු	-
එකතුව	**128,497,410.00**

ට්‍රාන්ස්කෝ (දඹුල්ල)

ප්‍රකාශන සංඛ්‍යාව	47
පැකේජ සංඛ්‍යාව	87
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	900.00
එකතු කළ අගය මත බදු (VAT)	1,512.00
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	10,400.00
සේස් බදු (CESS)	30,450.00
නිෂ්පාදන බදු (Excise Duty)	-
රේගු අධිභාර (SUR)	-
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	4,340.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	-
VAL	-
සමාජ වගකීම් බදු (SRC)	-
මුද්‍රා ගාස්තු (SEAL)	-
අතිකාල	-
දඩ	-

අනෙකුත් ගාස්තු	-
TW ගාස්තු	-
එකතුව	**47,602.00**

මීඩ්කෝ

ප්‍රකාශන සංඛ්‍යාව	21,362.00
පැකේජ සංඛ්‍යාව	95,003.00
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	15,845,846.00
එකතු කළ අගය මත බදු (VAT)	38,119,588.00
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	15,633,932.00
සේස් බදු (CESS)	35,428,045.00
නිෂ්පාදන බදු (Excise Duty)	1,630,965.00
රේගු අධිභාර (SUR)	969,275.00
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	7,122,208.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	12,220.00
VAL	-
සමාජ වගකීම් බදු (SRC)	238,950.00
මුද්‍රා ගාස්තු (SEAL)	101,100.00
අතිකාල	5,549,242.00
දඩ	2,179,001.00
අනෙකුත් ගාස්තු	65,633.00
TW ගාස්තු	-
එකතුව	**122,896,005.00**

ට්‍රයිකෝ (කොළඹ)

ප්‍රකාශන සංඛ්‍යාව	29,998.00
පැකේජ සංඛ්‍යාව	79,533.00
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	29,541,057.00
එකතු කළ අගය මත බදු (VAT)	48,138,392.00
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	20,236,906.00
සේස් බදු (CESS)	38,101,737.00
නිෂ්පාදන බදු (Excise Duty)	3,476,383.00
රේගු අධිභාර (SUR)	1,539,092.00
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	9,709,637.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	254,180.00
VAL	-
සමාජ වගකීම් බදු (SRC)	292,658.00
මුද්‍රා ගාස්තු (SEAL)	374,900.00
අතිකාල	4,959,266.00
දඩ	6,319,879.00

අනෙකුත් ගාස්තු	449.00
TW ගාස්තු	-
එකතුව	**162,944,536.00**

සීඑස්එල් - කොළඹ

ප්‍රකාශන සංඛ්‍යාව	38,839.00
පැකේජ සංඛ්‍යාව	130,646.00
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	33,549,923.00
එකතු කළ අගය මත බදු (VAT)	60,120,365.00
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	26,453,407.00
සේස් බදු (CESS)	54,039,213.00
නිෂ්පාදන බදු (Excise Duty)	2,383,191.00
රේගු අධිභාර (SUR)	1,194.265.00
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	12,251,022.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	90,705.00
VAL	-
සමාජ වගකීම් බදු (SRC)	400,250.00
මුද්‍රා ගාස්තු (SEAL)	203,750.00
අතිකාල	5,687,290.00
දඩ	5,677,862.00
අනෙකුත් ගාස්තු	5,895,825.00
TW ගාස්තු	78,000.00
එකතුව	**208,025,068.00**

සෙරන්ඩිබ්

ප්‍රකාශන සංඛ්‍යාව	11,221.00
පැකේජ සංඛ්‍යාව	36,846.00
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	7,855,687.00
එකතු කළ අගය මත බදු (VAT)	19,225,892.00
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	8,933,749.00
සේස් බදු (CESS)	21,071,489.00
නිෂ්පාදන බදු (Excise Duty)	1,210,284.00
රේගු අධිභාර (SUR)	261,409.00
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	4,068,750.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	-
VAL	-
සමාජ වගකීම් බදු (SRC)	163,350.00
මුද්‍රා ගාස්තු (SEAL)	25,000.00
අතිකාල	4,241,813.00
දඩ	2,539,350.00
අනෙකුත් ගාස්තු	-

TW ගාස්තු	-
එකතුව	**69,596,773.00**

සීඑස්එල්(අඩාලවිවේචන)

ප්‍රකාශන සංඛ්‍යාව	655
පැකේජ සංඛ්‍යාව	1882
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	287,925.00
එකතු කළ අගය මත බදු (VAT)	502,354.00
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	255,450.00
සේස් බදු (CESS)	664,205.00
නිෂ්පාදන බදු (Excise Duty)	17,400.00
රේගු අධිභාර (SUR)	
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	118,378.00
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	
VAL	
සමාජ වගකීම් බදු (SRC)	2,450.00
මුද්‍රා ගාස්තු (SEAL)	
අතිකාල	195,000.00
දඩ	5,000.00
අනෙකුත් ගාස්තු	
TW ගාස්තු	
එකතුව	**2,048,162.00**

මගී සේවා (කොළඹ) අංශයේ මුළු අයකරගැනීම්

ප්‍රකාශන සංඛ්‍යාව	186,408
පැකේජ සංඛ්‍යාව	801130
	ප්‍රමාණය (රු.)
රේගු ආනයන තිරුබදු (CID)	212,844,800.14
එකතු කළ අගය මත බදු (VAT)	353,900,187.67
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL)	154,440,694.63
සේස් බදු (CESS)	302,145,172.82
නිෂ්පාදන බදු (Excise Duty)	16,647,283.00
රේගු අධිභාර (SUR)	6,444,163.00
සමාජ ආරක්ෂක දායක බදු (SSL)	64,724,877.75
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL)	1,474,217.00
VAL	2,000.00
සමාජ වගකීම් බදු (SRC)	13,717,196.00
මුද්‍රා ගාස්තු (SEAL)	1,404,521.00
අතිකාල	77,239,925.58
දඩ	51,510,888.00
අනෙකුත් ගාස්තු	70,537,159.96
TW ගාස්තු	21,069,595.00
එකතුව	**1,348,102,681.55**

2023 වර්ෂයේ මගී සේවා (කොළඹ) අංශයේ මුළු අයකරගැනීම් = රු.1,144253491.80
(සීඑස්එල් නුවර, ට්‍රයිකෝ ගාල්ල, ට්‍රයිකෝ කුරුණෑගල හැර)
2024 වර්ෂයේ මගී සේවා (කොළඹ) අංශයේ මුළු අයකරගැනීම් = රු.1,348,102,681.55
ප්‍රතිශත වෙනස = + 17.82%

පාරිසරික සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවේ දේශසීමා ආරක්ෂක ආයතනයක් වන ශ්‍රී ලංකා රේගුව පාරිසරික සමාජ ආරක්ෂණය සහතික කරමින් සීමා කරන ලද සහ තහනම් කරන ලද අයිතම මෙරටට ඇතුළුවීම වළක්වාලීමට කටයුතු කරයි.
රඳවාගන්නා ලද සහ රාජසන්තක කරන ලද භාණ්ඩ පහත දැක්වේ.

අනු අංකය	විස්තරය	ගුදම							
		ලක්සිරිසේවා	සෙරන්ඩිබ්	සීඑස් එල්	මීඩකෝ	ට්‍රයිකෝ	නව නුගේ පාර	ට්‍රාන්ස්කෝ	ආර්සිටී
1.	වසර ආරම්භයේ ඇති රාජසන්තක කරන ලද පැකේජ සංඛ්‍යාව	303	1	194	32	123	75	62	-
2.	වසර අවසානයේ ඇති රාජසන්තක කරන ලද පැකේජ සංඛ්‍යාව	249	148	339	23	225	82	74	48

පුහුණු වැඩසටහන

මගී සේවා අංශය පිහිටුවා ඇත්තේ මගීන්ට (ආනයනකරුවන් හෝ අපනයනකරුවන් නොවන) සුමට සේවාවක් ලබාදීමට වන බැවින් ඒ සඳහා නිපුණ කාර්යමණ්ඩලයක් සිටීම අත්‍යවශ්‍ය වේ. සාමාන්‍ය ජනතාව නිරන්තරවම ශ්‍රී ලංකාවෙන් පිටතට සහ තුළට යාම් රීම් සිදුකරන බැවින් ඔවුන් සෑමවිටම බාධාවන්ගෙන් තොර සේවාවක් රේගුවෙන් අපේක්ෂා කෙරේ. එබැවින් සාමාන්‍ය ජනතාව සමග කටයුතු කිරීම සඳහා පුහුණු වැඩසටහන් හරහා රේගු නිලධාරීන්ගේ ධාරිතාවය ඉහළ නැංවීමට අප අංශය අවධානය යොමු කරනු ලැබේ.

පහත අවස්ථාවලදී නිලධාරීන්ව පුහුණු වැඩසටහන් සඳහා යොමුකර ඇත.

අනු අංකය	වැඩසටහනේ නම	නිලධාරීන් සංඛ්‍යාව
1	ATB intellectual property (පුද්) සමාගම මගින් බුද්ධිමය දේපළ සන්නාම හඳුනාගැනීමේ පුහුණුව	සරේඅ - 05
2	සරේඅ නිලධාරීන් සඳහා ධාරිතා වර්ධනය	සගානි- 02
3	මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම සහ ව්‍යාප්ත කිරීමටමුදල ්සැපයීම පිළිබඳ සැකකටයුතු ගනුදෙනු	නිරේඅ – 01 , සරේඅ - 05
4	කලාපීය දේශසීමා පරීක්ෂන වැඩමුළුව	සරේඅ -01
5	NDDCB මගින් ලබා දෙන පුහුණු වැඩසටහන	ජෙනිරේඅ - 01, සගානි - 02
6	සම්භවය අන්තර් සබඳතාවය පිළිබඳ WCO ගෝලීය සංසදය	නිරේඅ - 01, සරේඅ - 01
7	ජාතික රේගු බලාත්මක කිරීමේ ජාලය (nCEN) පුහුණු වැඩසටහන	ජෙනිරේඅ - 02, නිරේඅ - 07,
8	විනය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩ මුළුවක් පැවැත්වීම	සරේඅ - 01
9	INAMA ඉන්දියා අග්නිදිග ආසියා ව්‍යාපෘතිය	සරේඅ - 01
10	බලයලත් ආර්ථික මෙහෙයුම්කරු(AEO) පුහුණු වැඩසටහන	සරේඅ - 01
11	රාජ්‍ය බුද්ධි සේවය මගින් සංවිධානය කරනු ලබන රේගු නිලධාරීන් සඳහා වූ බුද්ධිමය පුහුණුව	නිරේඅ - 01
12	WCO-ජපන් වෘත්තීය සංවර්ධන වැඩසටහන	සරේඅ - 01
13	පශ්චාද් නිෂ්කාශන විගනණය පිළිබඳව කාර්මික හා මෙහෙයුම් උපදේශකයින් (TAOs) සඳහාවන WCO කලාපීය පූර්ව- ප්‍රතීතන වැඩසටහන (PCA)	ජෙනිරේඅ - 01
14	බුද්ධිමය දේපළ නීති සහ නිෂ්පාදන හඳුනාගැනීම පිළිබඳ වැඩමුළුව	සරේඅ - 03
15	බලයලක් ආර්ථික මෙහෙයුම්කරු පුහුණු වැඩසටහන	සරේඅ - 01
16	ඩිජිටල් වෙළඳාම මිනුම් කිරීම පිළිබඳ Webinar පාඨමාලාව	සරේඅ - 03
17	බුද්ධිමය දේපළ නීති සහ නිෂ්පාදන හඳුනාගැනීම පිළිබඳ වැඩමුළුව	සරේඅ - 04
18	පළමු ප්‍රතිචාර පරිගණක අනාවැකි සහ සයිබර් අපරාධ පරීක්ෂණ පිළිබඳ වැඩමුළුව	සරේඅ - 01
19	USAID මගින් මෙහෙයවනු ලබන සම්භවය පිළිබඳ නීති සහ සංයෝජික වර්ගීකරණ පිළිබඳ වැඩමුළුව	සරේඅ - 03
20	ජෙනිරේඅ සහ නිරේඅ සඳහා රේගු විමර්ශන පිළිබඳ වැඩමුළුව	නිරේඅ - 08 ජෙනිරේඅ - 04

21	USAID මගින් පවත්වන ලද ප්‍රභවස්ථාන නීති සහ TFA පිළිබඳ විස්තීරණ වැඩමුළුව	නිරේඅ - 3, සරේඅ - 11
22	රේගු අවදානම් කළමනාකරණයේ ප්‍රායෝගික භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන	සරේඅ - 04
23	JAICA Knowledge CO-Creation වැඩසටහන	සරේඅ - 12, නිරේඅ - 03
24	තක්සේරුකරුවන් සඳහා කඩිනම් පාඨමාලාව	නිරේඅ - 01
25	ATB intellectual property (පුද්) සමාගම මගින් බුද්ධිමය දේපළ සන්නාම හඳුනාගැනීමේ පුහුණුව	සරේඅ - 07
26	මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම සහ ව්‍යාප්ත කිරීමටමුදල ්සැපයිම පිළිබඳ සැකකටයුතු ගනුදෙනු	සරේඅ - 05 නිරේඅ - 01
27	පරීක්ෂණ හැකියා වැඩිදියුණු කිරීමේ පුහුණු පාඨමාලාව	සරේඅ - 01
28	නඩු විභාග සහ විමර්ශන පිළිබඳ වැඩමුළුව	සරේඅ - 01
29	ඉගැන්වීම් ක්‍රමෝපායන් පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම	නිරේඅ - 01 සරේඅ - 05
30	පූර්ව පාලන වර්ගීකරණය පිළිබඳ පුහුණු සැසිය	ජෙනිරේඅ - 01, නිරේඅ - 01

වෙළඳාම (සේවා) සඳහා පහසුකම් සැළසීමේ අරමුණු යටතේ සැලසුම් කරන ලද මූලික ක්‍රියාකාරකම්

මගී සේවා අංශයේ ප්‍රධාන අරමුණ වනුයේ මගින්ගේ කැටුව නොඑන පුද්ගලික මගී ගමන්මළු නිෂ්කාශනය කිරීමයි. මෙම බොහෝ මගීන් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකික සේවකයින් වන අතර ඔවුහු ශ්‍රී ලංකාවට විදේශ මුදල් එවීමෙහි නිරත වෙති. පුළුල්වන වෙළඳ හිඟයට එරෙහිව සැළකිය යුතු සහනයක් ලබා දෙමින් ශ්‍රී ලංකාවේ විදේශ මුදල් ඉපැයීම් වල ප්‍රධාන අංගයක් ලෙස විදේශ ප්‍රේශණ පවතී. UPB දිමනා ක්‍රමය යටතේ ශ්‍රී ලාංකික සේවකයින්ගේ කැටුව නොඑන මගී ගමන්මළු නිදහස් කරමින් මගී සේවා අංශය ඔවුන්ගේ සුබසාධනය ඉහළ නැංවීමේ ප්‍රධාන කාර්යයක් ඉටුකරයි. මෙම ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා බොහෝ පියවර ගෙන ඇත. එයට අමතරව ඔවුන් විසින් ත්‍යාග ලෙස එවනු ලබන භාණ්ඩ අදාළ බදු සහ තීරුබදු අයකරගෙන ලබන්නන් වෙත නිදහස් කරනු ලැබේ.එම නිෂ්කාශනයන්හි තොරතුරු පහත පරිදි වේ:

පියවර	ප්‍රධාන කාර්යය	ප්‍රධාන කාර්යසාධන දර්ශක **(KPI)**								
ගුදම් මෙහෙයුම් විධිමත් කිරීම	2024			TRICO	LAKSIRI	CSL	MIDCO	SERANDIB	TRANSCO	NNR	RCT
	මගීන්ට පහසුකම් සැලසීම සඳහා බාධාරහිත නිෂ්කාශන ක්‍රියාවලියක් සහතික කිරීම.	නිෂ්කාශනය කරන ලද pax සංඛ්‍යාව	යූපීබී	14,524	12905	18,968	9,236	4844	13248	7804	953
			ත්‍යාග	15,474	14030	20,526	12,126	6377	24,160	5778	5455
		නිෂ්කාශනය කරන ලද පැකේජ සංඛ්‍යාව	යූපීබී	36,982	37,657	60,973	28,481	10,594	38,852	42,461	93673
			ත්‍යාග	42,551	30,424	71,555	66,522	26,252	93,189	28,355	93381
		නිෂ්කාශනය කරන ලද බහාළුම් සංඛ්‍යාව		1322	463	1247	384	240	566	360	895

භාණ්ඩ අපහරණය කිරීම

කැටුව නොඑන මගී ගමන් මළු ගුදම්වල අත්හැර දමන ලද සහ රාජසන්තක කරන ලද භාණ්ඩ ක්‍රමයෙන් එකතු වීම නිසා එහි ගබඩා ඉඩකඩ අඩු වෙමින් පවතී. එබැවින් අපහරණ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුය.
එක් එක් ගුදම්වල අතහැර දමා ඇති පැකේජ සංඛ්‍යාව පහත දැක්වේ.

		ලක්සිරි සේවා	සෙරන්ඩිබ්	සීඑස්එල්	මීඩකෝ	ට්‍රයිකෝ	එන්එන්ආර්	ට්‍රාන්ස්කෝ	ආර්සීටී
1.	වසර ආරම්භයේ ඇති අත්හැර දමන ලද පැකේජ සංඛ්‍යාව	152	34	427	15	2388	21	179	නැත

2.	වසර අවසානයේ ඇති අත්හැර දමන ලද පැකේජ සංඛ්‍යාව	127	34	2053	54	5440	123	226	නැත

8.5.3 ආදායම් හා සේවා (කටුනායක) අංශය

හැඳින්වීම

ආදායම් හා සේවා කටුනායක අංශය, කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගුවන් භාණ්ඩ පර්යන්තයේ පිහිටා ඇත. රේගු ආඥා පනතේ විධිවිධාන සහ වෙනත් අදාළ නීති සහ රෙගුලාසි යටතේ දේශ සීමා පාලන රෙගුලාසි බලාත්මක වන බව සාක්ෂාත් කරමින් අයවිය යුතු ආදායම එකතු කිරීම සහ ආනයන ගුවන් භාණ්ඩ නිෂ්කාශන සඳහා පහසුකම් සැලසීම මෙම අංශයේ වගකීම වේ.

ශ්‍රී ලන්කන් ගුවන් සමාගම ගුවන් භාණ්ඩ පර්යන්තයේ ප්‍රධානතම භාණ්ඩ හැසිරවීමේ නියෝජිතායතනය ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකා රේගුවේ පාලනය යටතේ සේවාවන් ලබාදීම සඳහා **SLFFA** කාගෝ සර්විසස් සමාගම සහ සී/ස එක්ස්පෝ ඒවියේෂන්ස් සමාගම **II** වන භාණ්ඩ පර්යන්තයේ අනෙකුත් භාණ්ඩ මෙහෙයුම් නියෝජිතායතන සහ ස්වයං මෙහෙයුම් සේවා සැපයුම්කරු ලෙස කටයුතු කරනු ලැබේ. සී/ස **M/S DHL** පුද්ගලික සමාගම සහ සී/ස **M/S Colombo Cargo Express** පුද්ගලික සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන බන්ධිත ගුදම්වලදී ප්‍රමුඛතා පදනම මත කුරියර් භාණ්ඩ ඉතා ඉක්මනින් නිෂ්කාශනය කරනු ලැබේ.

ප්‍රධාන කාර්යයන්

- **ගුවන් මගින් ආනයනය කරනු ලබන භාණ්ඩ මත අයවිය යුතු රේගු බදු, සෙස් සහ අනෙකුත් ගාස්තු තක්සේරු කිරීම සහ එකතු කිරීම.**
- **භාණ්ඩ ප්‍රකාශන සහ අවසර පත්‍ර අනුමත කිරීම.**
- **කර්මාන්ත හා සේවා අංශය යටතේ ක්‍රියාත්මක වන විවිධ අපනයන අරමුණු කරගත් පහසුකම් සැලසීමේ යෝජනා ක්‍රම යටතේ ආනයනය කරනු ලබන භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබාදීම.**
- **ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති ව්‍යවසායන් වෙත එවන ආනයන භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබා දීම.**
- **නරක්වන භාණ්ඩ, කුරියර් භාණ්ඩ, රාජ්‍ය තාන්ත්‍රික භාණ්ඩ සහ තැපැල් භාණ්ඩ ඇතුලු ගුවන් මගින් ආනයනය කරන ලද හදිසි ගුවන් භාණ්ඩ දිනය පුරා ඉක්මනින්ම නිෂ්කාශනය කිරීම.**
- **මෙරටට පැමිණෙන මගින්ගේ කැටුව නොඑන මගී ගමන් මලු විවිධ කැටුව නොඑන මගී ගමන් මලු ගබඩා වෙත මාරු කිරීමට පහසුකම් සැළසීම.**
- **ආනයන රේගු සටහන්කර පිළියෙල කිරීම සහ ආයෝජන මණ්ඩල, ආයෝජන මණ්ඩල නොවන, කුරියර් සහ නරක්වන භාණ්ඩ වලට අදාළ ආනයන නැව් බඩු තොග සඳහා නිෂ්කාශන ලබා දීම.**

2024 වසරේ කාර්ය සාධනය (රු.)

අනු අංකය	විස්තරය	කේතය	ගුවන් භාණ්ඩ	ඩීඑච්එල් (DHL)	කළමිබු කාගෝ	යූපීඑස් (KTF T2)	එකතුව
1	රේගු ආනයන බදු	**CID**	4,011,393,047.00	496,128,304.00	286,032,966.00	177,367,732.00	**4,970,922,049.00**
2	එකතු කළ අගය මත බදු	**VAT**	31,101,197,139.00	2,285,089,209.00	1,345,701,338.00	769,658,177.00	**35,501,645,863.00**
3	වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු	**PAL**	8,830,734,308.00	666,847,897.00	402,410,939.00	236,016,229.00	**10,136,009,373.00**
4	සමාජ වගකීම් බදු	**SRL**	0	0	0	850.00	**850.00**
5	විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද	**SCL**	341,958,575.00	318,549.00	123,514.00	1,310,708.00	**343,711,346.00**
6	සමාජ ආරක්ෂණ දායක බද්ද	**SSL**	4,711,915,824.00	0	193,899,582.00	114,551,508.00	**5,020,366,914.00**
7	ඒකාබද්ධ බදු	**CON**	16,283,926.00	0	0	0	**16,283,926.00**
8	රේගු ආනයන අධිභාර	**SUR**	15,968,855.00	0	6.00	1,668,627.00	**17,637,488.00**
9	නිෂ්පාදන බදු	**XID**	3,952,595.00	29,267.00	38,114.00	945,422.00	**4,965,398.00**
10	SR ගාස්තු	**SR**	0	0	0	16,000.00	**16,000.00**
11	ජාතිය ගොඩනැගීමේ බද්ද	**NBT**	0	0	0	0	**0**
12	ආනයන සෙස් (EDB)	**EIC**	1,820,927,592.00	202,324,539.00	93,653,130.00	64,925,195.00	**2,181,830,456.00**
13	පරිගණක ගාස්තු	**COM**	15,285,208.00	8,227,750.00	4,186,004.00	1,970,200.00	**29,669,162.00**
14	පරීක්ෂා කිරීමේ ගාස්තු	**EXM**	16,191,600.00	9,394,400.00	4,276,700.00	2,362,800.00	**32,225,500.00**
15	වැඩිපුර ගෙවීම්	**OVP**	784.00		0.00	1,270.00	**2,054.00**
16	අතිකාල ගාස්තු	**OTC**	55,465,408.00	10,176,600.00	715,801.00	0	**66,357,809.00**
17	මුද්‍රා ගාස්තු	**SEL**	219,850.00	0	0	0	**219,850.00**
18	දණ්ඩන	**PTY**	77,087,295.00	12,235,583.00	2,037,071.40	3,651,928.00	**95,011,877.40**
19	සත්‍යාක්ෂණ ගාස්තු	**VCS**	0.00	9,229,800.00	1,210,733.24	0	**10,440,533.24**
20	විවිධ	**MISC**	18,346.00	0	0	100.00	**18,446.00**
21	විශේෂ තැන්පතු	**SPD**	0.00	0	0		**0**
22	වාහන හිමිකම් බදු	**VEL**	185,065.00	0	0		**185,065.00**
23	අනෙකුත් (e-අතිරේක ගෙවීම්)	**EOP**	0.00	0	0		**0**
24	පූර්ව ගෙවීම්	**PP**	55,600.00	0	0		**55,600.00**
25	අනෙකුත් (සංශෝධන ගාස්තු)	**AMD**	0.00	237,002.00	0		**237,002.00**
එකතුව (රු.)			**51,018,841,017.00**	**3,700,238,900.00**	**2,334,285,898.64**	**1,374,446,746.00**	**58,427,812,561.64**

අනු අංකය	විස්තරය	ගුවන් භාණ්ඩ (KTIM 2/3/4)	ඩීඑච්එල් (KTDH 2/3)	කළමිබු කාගෝ	යූපීඑස් (KTFT2)	එකතුව
26	ලැබුණු රේගු සටහන්කර (Cusdecs) සංඛ්‍යාව	55,397	5,393	14,256	7,881	**82,927**
27	බැදුම්කර, INFAC සහ TIEP හිදී අනුමත වූ රේගු සටහන්කර සංඛ්‍යාව	3,764	2,481	438	0	**6,683**
28	BOI හිදී අනුමත වූ රේගු සටහන්කර සංඛ්‍යාව	36,827	25,718	10,862	0	**73,407**
29	අන්තරාලt හිදී අනුමත වූ රේගු සටහන්කර සංඛ්‍යාව	69	0	0	0	**69**
30	SR අයදුම්පත් සංඛ්‍යාව (DRA)	20	0	0	0	**20**
31	අතිරේක සටහන්කර යටතේ අනුමත වූ සටහන්කර සංඛ්‍යාව	0	0	0	0	**0**
32	නිදහස් කිරීම් යටතේ අනුමත වූ සටහන්කර සංඛ්‍යාව/ 19 A	1,408	0	0	0	**1,408**
33	නැවකින් නැවකට මාරුකිරීම යටතේ අනුමත වූ අයදුම්පත් සංඛ්‍යාව	7,948	0	624	0	**8,572**
34	Dip/DPL නැව් බඩු සංඛ්‍යාව	254	0	0	0	**254**
35	ආයතනික ඇපකර යටතේ අනුමත වූ රේගු සටහන්කර සංඛ්‍යාව	17	0	0	0	**17**
36	කානේපත් යටතේ අනුමත වූ රේගු සටහන්කර සංඛ්‍යාව	59	0	0	0	**59**
37	B.G (ACT/DHL/CC) යටතේ අනුමත වූ රේගු සටහන්කර සංඛ්‍යාව	97	0	0	0	**97**
38	ISAFTA/SAFTA යටතේ අනුමත වූ රේගු සටහන්කර සංඛ්‍යාව	129	0	0	0	**129**
39	P.G (ACT/DHL/CC) යටතේ අනුමත වූ රේගු සටහන්කර සංඛ්‍යාව	2	0	0	0	**2**
40	Fric ලේඛණය	53	0	0	0	**53**
41	SR අයදුම්පත් සංඛ්‍යාව (DRA)	396	0	0	0	**396**
	එකතුව	**106,440**	**33,592**	**26,180**	**7,881**	**174,093**
42	භාරදුන් පැකේජ සංඛ්‍යාව	-	-	-	-	**0**
43	අනෙකුත්	-	-	-	-	**0**

8.5.4 ආදායම් හා සේවා (ප්‍රාදේශීය) අංශය


හැඳින්වීම

ආදායම් හා සේවා (ප්‍රාදේශීය) අංශය රේගු ප්‍රතිසංස්කරණ හා නවීකරණ වැඩසටහන හරහා ප්‍රාදේශීය පර්ශදය යටතේ 2010 අගෝස්තු මාසයේදී ස්ථාපිත කරන ලදී. වර්තමානයේදී එය රේගු මන්දිරයේ C කොටසේ 7වන මහලේ පිහිටා ඇත.

ප්‍රාදේශීය අංශයේ ව්‍යුහය

- ප්‍රාදේශීය අංශය රේගු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශීය) මගින් පාලනය වේ.
- රේගු අධ්‍යක්ෂ (ප්‍රාදේශීය) සියළුම ප්‍රාදේශීය කාර්යාලයන්හි ප්‍රධානියා වේ.

සංවිධාන ව්‍යුහය



ආදායම් හා සේවා (ප්‍රාදේශීය) අංශය මගින් ඉටුකරනු ලබන කාර්යයන්

- රේගු තීරුබදු සහ අනෙකුත් බදු එකතු කිරීම පාලනය කිරීම
- ප්‍රාදේශීය පර්ෂදය තුළ සිදුකරනු ලබන වෙළඳාම සහ කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම
- කඩිනමින් නිෂ්කාශනය කිරීම මගින් මගීන්ට පහසුකම් සැලසීම
- රේගු ආඥාපනත සහ කලාපයේ ආදායම් හා සමාජ ආරක්ෂණ නීතීන්ට අදාළ අනෙකුත් නීති යටතේ සිදු කරනු ලබන වැරදි විමර්ශනය කිරීම හා නඩු පැවරීම මගින් නීති බලාත්මක කිරීම.
- රේගු කාර්යයන්හි නිරත වන අතර ශ්‍රී ලංකා රේගුවේ අනෙකුත් අංශ සමග සම්බන්ධීකරණය කිරීම.

කාර්යසාධන සාරාංශය (ආදායම්)

ගුවන්තොටුපළ

ප්‍රධාන කාර්යසාධන දර්ශක	MRIA	පලාලි	එකතුව
එකතු කරන ලද රේගු තීරු බදු සහ අනෙකුත් බදු	22,801.00	839,015.00	861,816.00
දණ්ඩන	103,038.00	103,400.00	206,438.00
රඳවාගත්/රාජසන්තක කරන ලද භාණ්ඩ සඳහා වන විමර්ශන සංඛ්‍යාව	-	-	-
අතිකාල සහ එකතු කරන ලද අනෙකුත් ගාස්තු	1,287,100.00	862,200.00	2,149,300.00
එකතුව (රු.)	1,412,939.00	1,804,615.00	3,217,554.00

උප නිවාරණ කාර්යාල

ප්‍රධාන කාර්යසාධන දර්ශක	හම්බන්තොට	ගාල්ල	කොග්ගල	ත්‍රිකුණාමලය	කන්කසන්තුරය	එකතුව
එකතු කරන ලද රේගු තීරු බදු සහ අනෙකුත් බදු	**19,561,583.53**	**1,242,934.64**	**-**	**2,836,429.00**	**11,323,051.00**	**34,963,998.17**
දණ්ඩන	**75,00.00**	**375,000.00**	**-**	**195,956.00**	**4,222,073.00**	**4,868,029.00**
රඳවාගත්/රාජසන්තක කරන ලද භාණ්ඩ සඳහා වන විමර්ශන සංඛ්‍යාව	-	-	-	-	-	-
අතිකාල සහ එකතු කරන ලද අනෙකුත් ගාස්තු	**21,877,029.43**	**9,167,772.00**	**-**	**21,266,605.00**	**525,950.00**	**52,837,356.43**
එකතුව (රු.)	**41,513,612.96**	**10,785,706.64**	**-**	**24,298,990.00**	**16,071,074.00**	**92,669,383.60**

කැටුව නොඑන මගී ගමන්මළු ගුදම්

ප්‍රධාන කාර්යසාධන දර්ශක	ට්‍රයිකෝ- ගාල්ල	ට්‍රයිකෝ-කුරුණෑගල	සීඑස්එල්-නුවර	එකතුව
එකතු කරන ලද රේගු තීරු බදු සහ අනෙකුත් බදු	16,031,362.00	27,936,722.00	25,383,673.00	69,351,757.00
දණ්ඩන	371,494.00	995,000.00	352,440.00	1,718,934.00
රඳවාගත්/රාජසන්තක කරන ලද භාණ්ඩ සඳහා වන විමර්ශන සංඛ්‍යාව	-	-	1	1
අතිකාල සහ එකතු කරන ලද අනෙකුත් ගාස්තු	7,064,958.00	6,645,555.00	7,766,506.00	21,477,019.00
එකතුව (රු.)	**23,467,814.00**	**35,577,277.00**	**33,502,620.00**	**92,547,711.00**

තැපැල් තක්සේරු ශාඛා

ප්‍රධාන කාර්යසාධන දර්ශක	ගාල්ල තැපැල් තක්සේරු	නුවර තැපැල් තක්සේරු	ත්‍රිකුණාමලය තැපැල් තක්සේරු	යාපනය තැපැල් තක්සේරු	එකතුව
එකතු කරන ලද රේගු තීරු බදු සහ අනෙකුත් බදු	8,918,812.00	15,815,403.00	12,493,754.00	30,428,081.00	67,656,050.00
දණ්ඩන	30,400.00	75,926.00	-	2,506,934.00	2,613,260.00
රඳවාගත්/රාජසන්තක කරන ලද භාණ්ඩ සඳහා වන විමර්ශන සංඛ්‍යාව	2	-	-	-	2
අතිකාල සහ එකතු කරන ලද අනෙකුත් ගාස්තු	13,150	2,950	1,900.00	10,350.00	28,350.00
එකතුව (රු.)	**8,962,364.00**	**15,894,279.00**	**12,495,654.00**	**32,945,365.00**	**70,297,662.00**

මගී පහසුකම්

කැටුව නොඑන මගී ගමන්මළු (UPB) ගුදම්

ප්‍රධාන කාර්යසාධන දර්ශක		ට්‍රයිකෝ- ගාල්ල	සීඑස්එල්-නුවර	ට්‍රයිකෝ-කුරුණෑගල	එකතුව
නිෂ්කාශනය කරන ලද පැකේජ සංඛ්‍යාව	UPB	12,056	14,256	23,062	49,374
	ක්‍යාඟ	5,757	8,140	9,650	23,547
පාර්සල් නිෂ්කාශනය සඳහා ගතවන කාලය (මිනිත්තු) *භාණ්ඩ තොගය මත රඳා පවතී		40	60	30	-

ගුවන්තොටුපළ

ප්‍රධාන කාර්යසාධන දර්ශක	**MRIA**	පලාලි	එකතුව
ප්‍රදානය කරන ලද ගුවන් යානා නිෂ්කාශන සංඛ්‍යාව	648	774	1,422
නිෂ්කාශනය කරන ලද මගීන් සංඛ්‍යාව	100,708	38,901	139,609

නිෂ්කාශනය කරන ලද කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව	4,672	-	4,672
ගමන්මළු නිෂ්කාශනය සඳහා ගතවන කාලය (මිනිත්තු)	ගමන්මළු නිෂ්කාශන කාලය මගීන් සංඛ්‍යාව අනුව ගුවන් යානයෙන් ගුවන් යානයට වෙනස් වේ.	ගමන්මළු නිෂ්කාශන කාලය මගීන් සංඛ්‍යාව අනුව ගුවන් යානයෙන් ගුවන් යානයට වෙනස් වේ.	-
තීරුබදු රහිත සාප්පුවලින් සිදුවූ නීති විරෝධී පිටමං වීම් සංඛ්‍යාව	-	-	-

උප නිවාරණ කාර්යාල

ප්‍රධාන කාර්යසාධන දර්ශක	හම්බන්තොට	ගාල්ල	කොග්ගල	ත්‍රිකුණාමලය	කන්කසන්තුරය	එකතුව
ප්‍රදානය කරන ලද යාත්‍රා නිෂ්කාශන සංඛ්‍යාව	579	164	-	188	44	975
නිෂ්කාශනය කරන ලද මගීන් සංඛ්‍යාව	-	-	-	-	5508	5508
නිෂ්කාශනය කරන ලද කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව	-	නැත	-	1663	-	1663
ගමන්මළු නිෂ්කාශනය සඳහා ගතවන කාලය	-	-	-	-	මගීන් සංඛ්‍යාව අනුව යාත්‍රාවෙන් යාත්‍රාවට වෙනස් වේ.	-
තීරුබදු රහිත සාප්පුවලින් සිදුවූ නීති විරෝධී පිටමං වීම් සංඛ්‍යාව	-	-	-	-	-	-

තැපැල් තක්සේරු ශාඛා

ප්‍රධාන කාර්යසාධන දර්ශක	ගාල්ල තැපැල් තක්සේරු	නුවර තැපැල් තක්සේරු	ත්‍රිකුණාමලය තැපැල් තක්සේරු	යාපනය තැපැල් තක්සේරු	එකතුව
නිෂ්කාශනය කරන ලද පාර්සල් සංඛ්‍යාව	6,351	7,851	2,690	8,380	25,272
පාර්සල් නිෂ්කාශනය සඳහා ගතවන කාලය (මිනිත්තු)	10	12	15	15	අදාළ නොවේ.

පාරිසරික සමාජ ආරක්ෂාව

ගුවන්තොටුපළ

ප්‍රධාන කාර්යසාධන දර්ශක	MRIA	පලාලි	එකතුව
හඳුනාගත් අවදානම් සහගත මගීන් සංඛ්‍යාව	-	-	-
පරීක්ෂා කරන ලද මගීන් සංඛ්‍යාව	-	-	-
දණ්ඩන	නැත	නැත	නැත
රාජසන්තක කිරීම් සංඛ්‍යාව	-	-	-
රඳවාගත් භාණ්ඩ සංඛ්‍යාව	24	81	105

උප නිවාරණ කාර්යාල

ප්‍රධාන කාර්යසාධන දර්ශක	ගාල්ල	කොග්ගල	ත්‍රිකුණාමලය	හම්බන්තොට	කන්කසන්තුරය	එකතුව
හඳුනාගත් අවදානම් සහගත මගීන් සංඛ්‍යාව	-	-	113*	-	-	-
පරීක්ෂා කරන ලද මගීන් සංඛ්‍යාව	-	-	-	-	-	-
දණ්ඩන	නැත	නැත	නැත	නැත	නැත	නැත
රාජසන්තක කිරීම් සංඛ්‍යාව	-	-	-	-	-	-
රඳවාගත් භාණ්ඩ සංඛ්‍යාව	-	-	-	-	-	-

*මියන්මාර් සරණාගතයින්

කැටුව නොඑන මගී ගමන්මළු (UPB) ගුදම්


ප්‍රධාන කාර්යසාධන දර්ශක	ට්‍රයිකෝ-ගාල්ල	ට්‍රයිකෝ-කුරුණෑගල	සීඑස්එල්-නුවරඑ	එකතුව
ප්‍රධාන කාර්යසාධන දර්ශක	-	-	1	1
හඳුනාගත් අවදානම් සහගත මගීන් සංඛ්‍යාව	-	-	1	1
පරීක්ෂා කරන ලද මගීන් සංඛ්‍යාව	නැත	නැත	නැත	නැත
දණ්ඩන	-	-	-	-
රාජසන්තක කිරීම් සංඛ්‍යාව	-	-	1	1

තැපැල් තක්සේරු ශාඛා

ප්‍රධාන කාර්යසාධන දර්ශක	ගාල්ල තැපැල් තක්සේරු	නුවර තැපැල් තක්සේරු	ත්‍රිකුණාමලය තැපැල් තක්සේරු	යාපනය තැපැල් තක්සේරු	එකතුව
හඳුනාගත් අවදානම් සහගත මගීන් සංඛ්‍යාව	1	-	1	-	1
පරීක්ෂා කරන ලද මගීන් සංඛ්‍යාව	6,3510	7,851	2,690	8,380	25,272
දණ්ඩන	30,400.00	75,926.00	නැත	2,506,934.00	2,613,260.00
රාජසන්තක කිරීම් සංඛ්‍යාව	1	1	2	19	23
රඳවාගත් භාණ්ඩ සංඛ්‍යාව	2	-	47	59	108

2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ජයග්‍රහණ

ආදායම් අරමුණ



- **2023** වසර හා සැසඳීමේදී ගුවන්තොටුපළවල **33%**ක ආදායම් වැඩිවීමක් ළඟාකර ගන්නා ලදී.
- **2023** වසර හා සැසඳීමේදී උප නිවාරණ කාර්යාලවල **41%**ක ආදායම් වැඩිවීමක් ළඟාකර ගන්නා ලදී.
- **2023** වසර හා සැසඳීමේදී කැටුව නොඑන මගී ගමන්මළු ගුදම්වල **34%**ක ආදායම් වැඩිවීමක් ළඟාකර ගන්නා ලදී.
- **2023** වසර හා සැසඳීමේදී තැපැල් තක්සේරු ශාඛාවල **79%**ක ආදායම් වැඩිවීමක් ළඟාකර ගන්නා ලදී.
- **2023** වසර හා සැසඳීමේදී **47%**ක සමස්ත ආදායම් වැඩිවීමක් ළඟාකර ගන්නා ලදී.

01. ආදායම් අරමුණ යටතේ ප්‍රධාන කාර්යයන්	
ප්‍රධාන කාර්යය	වර්තමාන ප්‍රගතිය
1.1 ආවේක්ෂණය කිරීම සහ මගීන් කැටුව එන ගමන්මළු පරීක්ෂා කිරීම. 1.1.1 ලැබිය යුතු ආදායම අයකර ගැනීම තැපැල් තක්සේරු කාර්යාල	ක්‍රියාත්මක කරන ලදී. මධ්‍යම තැපැල් හුවමාරුවෙන් රඳවාගන්නා ලද සියළුම පාර්සල් පරීක්ෂා කරමින් පවත්න අතර අයවිය යුතු ආදායම එකතු කර ගනිමින් පවතී.වෙළඳ ප්‍රමාණයන් සොයාගතහොත් දණ්ඩන පනවනු ලැබේ.

භාණ්ඩ පරීක්ෂා කිරීම සහ නියමිත වර්ගීකරණය හා මිල තක්සේරු කිරීම තීරණය කිරීම. අදාළ වන්නේ නම් පරීක්ෂා කරන ලද අයිතමයන්ගෙන් අයවිය යුතු ආදායම එකතු කිරීම.	
1.1.2. යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ කන්කසන්තුරය වරායන්වල මගීන්ගෙන් අයවිය යුතු ආදායම එකතු කිරීම (ගුවන් සහ තොටුපළ). භාණ්ඩ පරීක්ෂා කිරීම සහ නියමිත වර්ගීකරණය හා මිල තක්සේරු කිරීම තීරණය කිරීම. අදාළ වන්නේ නම් පරීක්ෂාකරන ලද අයිතමයන්ගෙන් අයවිය යුතු ආදායම එකතු කිරීම. අවශ්‍යවිට රේගු ආඥාපනත අදාළ කිරීම.	ක්‍රියාත්මක කරන ලදී. **2024** වර්ෂයේදී යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ කන්කසන්තුරය වරායන්වල කාර්යයන් සිදු කරන ලදී.
1.1.3. උප නිවාරණ කාර්යාලවලින් අයවිය යුතු ආදායම එකතු කිරීම.	ක්‍රියාත්මක කරන ලදී.
1.2 අතිකාල ගාස්තු එකතු කිරීම. 1.2.1අතිකාල වාර්තා පවත්වා ගැනීම සහ අදාළ ගාස්තු එකතු කිරීම.	ක්‍රියාත්මක කරන ලදී.

2. වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ අරමුණ යටතේ ප්‍රධාන කාර්යයන්	
ප්‍රධාන කාර්යය	වර්තමාන ප්‍රගතිය
2.1.මගීන්ට පහසුකම් සැලසීම සඳහා බාධාවකින් තොර නිෂ්කාශන ක්‍රියාවලියක් සහතික කිරීම.	ක්‍රියාත්මක කරන ලදී.
2.2. මගීන්ට පහසුකම් සැලසීම සඳහා බාධාවකින් තොර නිෂ්කාශන ක්‍රියාවලියක් සහතික කිරීම.	ක්‍රියාත්මක කරන ලදී.
2.3. සුමට කැටුව එන ගමන්මළු නිෂ්කාශන ක්‍රියාවලියක් සහතික කිරීම.	ක්‍රියාත්මක කරන ලදී.
2.4. තීරු බදු රහිත පහසුකම යටතේ මගීන්ට මිලදී ගැනීම් සිදු කිරීමට ඉඩසලසා දීම.	ක්‍රියාත්මක කරන ලදී.
2.7. කන්කසන්තුරය වරායේ භාණ්ඩ මෙහෙයුම්/මගී නිෂ්කාශන සඳහා පහසුකම් සැලසීම. 1. මානව සම්පත් කළමනාකරණ අංශය සමග සම්බන්ධීකරණයෙන් යුතුව භාණ්ඩ මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් වෙන් කිරීම. 2. සේවා සැපයුම් අංශය සමග සම්බන්ධීකරණයෙන් යුතුව භෞතික සම්පත් සැපයීම. 3.කන්කසන්තුරයේ භාණ්ඩ මෙහෙයුම් සඳහා සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි සකස් කිරීම.	තොටුපළ සේවාවන්හි මෙහෙයුම් සුමටව ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තුවේ අඩු කාර්ය මණ්ඩල තත්වය හේතුවෙන් අවම කාර්ය මණ්ඩලයක් සහිතව කටයුතු කරන ලදී. පහත් මට්ටමේ පරිලෝකන යන්ත්‍රයක් සවි කිරීමට නියමිතය. ක්‍රියාත්මක කරන ලදී.

03. පාරිසරික සමාජ ආරක්ෂාව	
ප්‍රධාන කාර්යය	වර්තමාන ප්‍රගතිය
3.1. 3.1.1. සීමා කරන ලද සහ තහනම් කරන ලද භාණ්ඩ රඳවා ගැනීම සඳහා නෛතික අවශ්‍යතාවන් වලට අනුකූල වීම (යාපනය - තැපැල් තක්සේරු ශාඛාව)	ක්‍රියාත්මක කරන ලදී. බලපත්‍ර අවශ්‍යතා සපුරා නොතිබීම හේතුවෙන් පාර්සල් **29**ක් රඳවාගැනීම සහ/හෝ රාජසන්තක කිරීම සිදුකරන ලදී.
3.1.2. සීමා කරන ලද සහ තහනම් කරන ලද භාණ්ඩ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ කන්කසන්තුරය වරායන්වලින් රටතුළට පැමිණීම පාලනය කිරීම (ගුවන් සහ තොටුපළ)	ක්‍රියාත්මක කරන ලදී. පැකේජ **66**ක් රඳවාගෙන යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ශාක හා සත්ව නිරෝධායනඒකක වලට භාර දෙන ලදී. . බලපත්‍ර අවශ්‍යතා සපුරා නොතිබීම හේතුවෙන් පැකේජ **06**ක් රඳවා ගැනීම සහ/හෝ රාජසන්තක කිරීම සිදුකරන ලදී.
04. සංවිධානාත්මක සංවර්ධනය යටතේ සැලසුම් කරන ලද ප්‍රධාන කාර්යයන්	
ප්‍රධාන කාර්යය	වර්තමාන ප්‍රගතිය
4.1. ප්‍රාදේශීය කාර්යාල සමග සම්බන්ධීකරණය සහ සන්නිවේදනය කිරීම. 4.1.1. අනෙකුත් අංශ සහ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවය	ක්ෂණික පණිවුඩ යැවීම, කඩිනම් යාවත්කාලීන කිරීම්, සහ තත්‍ය කාලීන සහයෝගීතාව සඳහා වට්ඇප් යෙදුම සන්නිවේදන මෙවලමක් ලෙස භාවිත් කිරීම.

මත ප්‍රාදේශීය කාර්යාල සමග නිසි කලට සන්නිවේදනය කිරීම 4.2.2. අවශ්‍ය පරිදි ප්‍රාදේශීය කාර්යාලයන්හි සුමට මෙහෙයුම් සහතික කිරීම සඳහා අනෙකුත් අංශ සහ පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කිරීම.	කාලෝචිත සහ කාර්යක්ෂම සන්නිවේදනයක් ලබාදීම සඳහා **100%** සාර්ථකත්ව අනුපාතයක් සාක්ෂාත් කරගන්නා ලදී.
4.2. ප්‍රාදේශීය කාර්යාලයන්හි කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම 4.2.1. යාපනය කලාපයේ නිසි රේගු මෙහෙයුම් සහතික කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ඉල්ලා සිටීම.	දෙපාර්තමේන්තුවේ අඩු කාර්ය මණ්ඩල තත්වය හේතුවෙන් සියලුම ප්‍රාදේශීය කාර්යාල අවම කාර්ය මණ්ඩලයක් සහිතව කටයුතු කරන ලදී.
4.3. කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් සහ නිසි නවාතැන් පහසුකම් ඉදිකිරීම. 4.3.1. යාපනය කලාපය සඳහා ප්‍රමාණවත් සහ නිසි නවාතැන් පහසුකම් සැපයීම සඳහා රේගු පරිපාලනයේ අවධානය යොමු කරවීම. 4.3.2. ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා සේවා සැපයුම් අංශය සමග සම්බන්ධීකරණය කිරීම.	උතුරේ ප්‍රාදේශීය කාර්යාලයන්හි සේවය කරන රේගු කාර්ය මණ්ඩලය සඳහා නිසි නවාතැන් පහසුකම් ඉදිකිරීමට රේඅ(ප්‍රාදේශීය) ගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් පත්කරන ලදී.
4.5. යාපනයේ ඉඩම් සඳහා “ රජයේ සංවිධාන සඳහා ඉඩම් නිදහස් කිරීමේ සහතිකය” ලබාගැනීම. 4.5.1ඉඩම් හඳුනාගැනීම සහ හිමිකම තහවුරු කිරීම සඳහා අදාළ ලේඛන ලබාගැනීම. 4.5.2. ආරවුල් සහිත ඉඩම් සහ ආරවුල් වර්ගය හඳුනාගැනීම. 4.5.3. ආරවුල් සහිත ඉඩම් පිළිබඳව අදාළ පාර්ශව සමග සාකච්ඡා පැවැත්වීම සහ එකඟතාවකට එළඹීම. 4.5.4. සේවා සැපයුම් අංශය හරහා මිනින්දෝරු සැලසුම ලබා ගැනීම. 4.5.5. සේවා සැපයුම් අංශය හරහා ඉඩමට වැට බැඳීම සහ ආරක්ෂා කිරී. 4.5.6. “ඉඩම් නිදහස් කිරීම පිළිබඳ සහතිකය” ලබාගැනීමට කටයුතු කිරීම.	ඉඩම් දහතුනක් ප්‍රදේශයේ රේගු ඉඩම් ලෙස හඳුනාගෙන ඇත. මෙම ඉඩම් දෙකකට ආරවුල් පවතී.එක් ඉඩමක කොටසක් යුධ හමුදාව විසින් අල්ලාගෙන ඇති අතර අනෙක් කොටස වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව විසින් රථ ගාලක් සඳහා ඉල්ලා ඇත. මුලතිවු ඉඩම ධීවර කටයුතු දෙපාර්තමේන්තුව විසින් අල්ලාගෙන ඇති අතර ඉඩම රේගු දෙපාර්තමේන්තුවට පැවරීමේ කටයුතු සිදු කරමින් පවතී. අවශ්‍ය අවසර ලබාගැනීමකින් තොරව ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් ධීවර විවේකාගාරයක් ඉදිකිරීම ආරම්භ කරන ලදී. අදාළ පාර්ශවයන් සමග ඒ පිළිබඳ රැස්වීමක් ජුලි **17** දින මරිතිමේපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රේගුව, ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, මුලතිවු හා මනල්කුඩිරිප්පු ග්‍රාම ධීවර සමිතිවල සහභාගිත්වයෙන් පවත්වනු ඇත.
4.6. මත්ද්‍රව්‍ය, සංයෝජිත වර්ගීකරණ කේත, සහ අනෙකුත් රේගු කාර්යයන් පිළිබඳව ප්‍රාදේශීය කාර්ය මණ්ඩලයේ දැනුම ඉහළ නැංවීම . 4.6.1. අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂිත දැනුමක් සහිත මානව සම්පත් සංවර්ධන අංශය සහ අනෙකුත් අංශ සමග සාකච්ඡා කිරීම. 4.6.2. වැඩමුළු සංවිධානය කිරීම.	රේගු කාර්ය පටිපාටි සහ නීති විරෝධී ආගමනය සම්බන්ධව ඕස්ට්‍රේලියානු දේශසීමා බලකායේ සහාය ඇතිව වැඩමුළු දෙකක් පවත්වන ලදී.

8.6 සෘජුවම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ පවතින අංශ

8.6.1 ආදායම් අධීක්ෂණ අංශය (RTF)

8.6.2 අභියාචනා අංශය

8.6.3 පද්ධති සහ ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය

8.6.4 මූල්‍ය කළමනාකරණ අංශය

8.6.5 නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය

8.6.1 ආදායම් අධීක්ෂණ අංශය

හැඳින්වීම

රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක ආදායම් අධීක්ෂණ අංශය (RTF), ක්ෂණිකව ක්‍රියාත්මක වන හදිසි වැටලීම් බලකායක් ලෙස ක්‍රියා කරන අතර සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීම සහ අවිධිමත් පරිවයන් මෙන්ම රේගු මෙහෙයුම්වල සුමට ක්‍රියාකාරිත්වයට බලපාන අක්‍රමිකතා තුරන් කිරීම සඳහා රේගු දෙපාර්තමේන්තුවේ සියලුම ක්‍රියාකාරකම් පිළිබඳව සුපරීක්ෂාකාරීව සිටියි.

රේගු අධ්‍යක්ෂකවරයකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන මෙම අංශය නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ, රේගු අධිකාරී, නියෝජ්‍ය රේගු අධිකාරී, සහකාර රේගු අධිකාරී, රේගු පරීක්ෂක තනතුරු දරන නිලධාරීන්ගෙන් මෙන්ම ලිපිකරු කාර්ය මණ්ඩලයකින් ද සමන්විත වේ.

ගෙවිය යුතු සියලුම බදු ගෙවීමෙන් පසු හා අනෙකුත් සියලුම නීති රීතිවලට අනුකූලව සියලුම භාණ්ඩ නිෂ්කාශනය කර ඇති බව සහතික කිරීම සඳහා සියලු ආනයන හා අපනයන ආදායම් අධීක්ෂණ අංශය විසින් අධීක්ෂණය කරනු ලබන අතර පුද්ගලික ගමන් මලු, තැපැල් සහ කුරියර් පාර්සල් ඇතුලුව ආනයනය කරන ලද හෝ අපනයනය කරන ඕනෑම භාණ්ඩයක් පරීක්ෂා කිරීම සඳහා නතර කිරීමට හා නැවත පරීක්ෂා කිරීමට හෝ අත්පත් කරගැනීමට බලය ඇත. තවද ආදායම් අධීක්ෂණ අංශය විසින් ගුවන් තොටුපලවල් හිදී, ගුවන් භාණ්ඩ, කුරියර් පාර්සල් ගබඩා, කැටුව නොයන මගී ගමන් මලු ගබඩා, පාර්සල් තැපැල්, සාමාන්‍ය නැව් භාණ්ඩ, BOI භාණ්ඩ, ගුදම්ගත භාණ්ඩ සහ අපනයන භාණ්ඩ ගුදම් ආදියෙහි අනපේක්ෂිත අයුරින් හදිසි පරීක්ෂා මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබේ.

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පාලන හස්තයක් ලබාදීම සහ දෙපාර්තමේන්තුවේ සියලු කටයුතු පිළිබඳව සුපරීක්ෂාකාරීව සිටීමයි. කාර්ය මණ්ඩලය විසින් රැස් කරන ලද බුද්ධි තොරතුරු සහ මහජනතාවගෙන් ලැබෙන තොරතුරු මත ආදායම් අධීක්ෂණ අංශය විසින් විවිධ බලාත්මක කිරීමේ කටයුතු සිදු කරයි.

දිගු කාමරයේ, ගුදම්වල, ගුවන් භාණ්ඩ, තැපැල් පාර්සල්, කුරියර් සේවාවන්හි භාණ්ඩ නිෂ්කාශනය කිරීම මෙන්ම භාණ්ඩ නිෂ්කාශනය කිරීම සඳහා වන විශේෂ ක්‍රියා පටිපාටි පිළිබඳව ද මෙම අංශය සුපරීක්ෂාකාරීව සිටී.

ප්‍රධාන කාර්යයන්

- දෙපාර්තමේන්තුව තුළ සුපිළිපන්බව ප්‍රවර්ධනය කිරීම සහ අවිධිමත් ක්‍රියාමාර්ග තුරන් කිරීම.
- පැමිණිලි හා චෝදනා සම්බන්ධයෙන් කඩිනමින් ප්‍රතිචාර දැක්වීම.
- සම්පත් යෙදවීම මගින් අර්බුදකාරී තත්වයන් කළමනාකරණය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහය වීම.
- ආනයනය හෝ අපනයනය කරන යම් භාණ්ඩ අතරමග නවතාලීම හා නැවත පරීක්ෂා කිරීම සහ අනුගමනය කරන ලද ක්‍රියාවලියේ නිරවද්‍යභාවය සත්‍යෝක්ෂණය කිරීම.
- ගුවන් තොටුපලේදී හෝ කැටුව නොයන ගමන්මලු ගුදම් වලදී මගීන් හා මගී ගමන් මලු අතරමග නවතාලීම හෝ පරීක්ෂා කිරීම.
- පාර්සල් තැපැල්, කුරියර් සේවාවන්හිදී භාණ්ඩ නිෂ්කාශනයේදී සහ භාණ්ඩ නිෂ්කාශනය සඳහා වන වෙනත් විශේෂ ක්‍රමවේදයන් පිළිබඳ සුපරීක්ෂාකාරී බව පවත්වා ගැනීම.

2024 වසරේ මෙම අංශයේ කාර්ය සාධනය (රු.)

ඉලක්කය 1 – ආදායම උපරිම කිරීම							
අරමුණ	උපායමාර්ගය	ක්‍රියාකාරකම්	ප්‍රධාන කාර්යසාධන දර්ශක	ජයග්‍රහණ			
				Q1	Q2	Q3	Q4
1.1 ආදායම අහිමිවීම් අඩුකිරීම/ ආදායම ආරක්ෂා කිරීම	1.1.1 වාණිජ ආනයන/අපනයන සම්බන්ධව සුපරීක්ෂාකාරීව සිටීම (මුහුදු සහ ගුවන්)	සැකකටයුතු භාණ්ඩ තොග විමර්ශන කටයුතු සඳහා තෝරා ගැනීම සහ රඳවා ගැනීම. (පූර්ණ බහාළුම්, සම්පූර්ණ නොවන බහාළුම්, ගුවන් භාණ්ඩ)	රඳවාගන්නා ලද/ අවහිර කරන ලද භාණ්ඩ තොග සංඛ්‍යාව	235	149	144	241
		සංයෝජිත වර්ගීකරණ ක්ෂේත්‍ර සංශෝධන සහ මීල සැකසීම් මත අතිරේක බදු අයකර ගැනීම.	අයකරගන්නා ලද අතිරේක බදු ප්‍රමාණය	59,838,838	55,644,227	59,058,412	68,059,804
		ව්‍යාජ කටයුතු පිළිබඳව රාජසන්තක කිරීම් සහ දණ්ඩන පැනවීම.	රාජසන්තක කිරීම් සහ දණ්ඩන ලෙස අයකරගත් ප්‍රමාණය	469,174,887	477,475,689	304,347,261	594,528,004
	1.1.2 කැටුව නොඑන, කැටුව එන මගී ගමන් මළු පාලනය, අධීක්ෂණය සහ මැදිහත්වීම	සැකකටයුතු කැටුව නොඑන මගී ගමන්මළු බහාළුම් සහ ගමන්මළු තෝරාගැනීම සහ රඳවා ගැනීම.	රඳවාගන්නා ලද/ අවහිර කරන ලද භාණ්ඩ තොග සංඛ්‍යාව	15,053	7,749	10,454	14,002
		බදු අයකළ හැකි අයිතම මත බදු අයකිරීම.	එකතු කරගන්නා ලද බදු ප්‍රමාණය	4,512,921	11,429,018	11,749,971	20,103,706
		ව්‍යාජ කටයුතු පිළිබඳව රාජසන්තක කිරීම් සහ දණ්ඩන පැනවීම.	රාජසන්තක කිරීම් සහ දණ්ඩන ලෙස අයකරගත් ප්‍රමාණය	109,757,973	117,513,289	93,339,334	140,846,702
		බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ වැටලීම් පැවැත්වීම.	බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පවත්වන ලද වැටලීම් සංඛ්‍යාව	5	14	18	13
			බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ වැටලීම් වලින් අයකර ගැනීම්	166,549	22,036,820	11,660,592	61,271,368
	1.1.3 ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා නිර්දේශ සැදීම	අවදානම්, හිඩැස් පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය දැනුවත් කිරීම සහ නිවැරදි කිරීමේ පියවර සඳහා නිර්දේශ සැකසීම.	හඳුනාගත් සහ වාර්තා කරන ලද අවදානම්/හිඩැස් සංඛ්‍යාව	-	-	-	2
1.2 පොදු අතිරේක ආදායම	1.2.1 ආදායම් අධීක්ෂණ අංශ සුරක්ෂිතාගාරයන්හි රාජසන්තක කරනලද භාණ්ඩ අපහරණය කිරීම	විකිණිය හැකි භාණ්ඩ අපහරණය කිරීම	එකතු කරගන්නා ලද ආදායම් ප්‍රමාණය	-	-	1,689,180 *	20,426,467
		විකිණිය නොහැකි භාණ්ඩ විනාශ කිරීම	විනාශ කරන ලද භාණ්ඩ ප්‍රමාණය	-	-	-	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, ආහාර ද්‍රව්‍ය

* පාවිච්චි කරන ලද වාහන ආඥ

8.6.2 අභියාචනා අංශය

හැඳින්වීම

ශ්‍රී ලංකා රේගුවේ අභියාචනා අංශය, ලෝක රේගු සංවිධානයේ (WCO) සංශෝධිත කියෝතෝ ප්‍රඥාප්තිය (RKC) හා ලෝක වෙළඳ සංගමයේ (WTO) වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුමේ (TFA) විධිවිධාන යටතේ දක්වා ඇති ජාත්‍යන්තරව පිළිගත් වෙළඳ ක්‍රියාමාර්ගයන්ට අනුකූලව පිහිටුවා ඇත. මෙම අංශය ඍජුවම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මක වේ.
එහි අරමුණ වනුයේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරන අභියාචනා සළකා බලා කරුණු තහවුරු කරගැනීමෙන් අනතුරුව සුදුසු නිර්දේශ ලබාදීම සහ පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීමයි.

සමාලෝචනය සඳහා සුදුසු කාර්යක්ෂම අභියාචනා යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින්, පරිපාලන කාර්යයන් හා මෙහෙවර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අභියාචනා කමිටුව ස්ථාපනය කර ඇත. රේගු අධ්‍යක්ෂ (අභියාචනා) නිල බලයෙන් මෙම කමිටුවේ සාමාජිකයෙකු වන අතර අනෙකුත් සාමාජිකයින් නිරන්තරයෙන් රැස්වීම් සඳහා සහභාගි වෙමින් අඛණ්ඩව සහය ලබාදේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රේගු අධ්‍යක්ෂ (අභියාචනා) වෙත යොමු කරන අභියාචනා වල වලංගුභාවය සහ අභියාචනා විෂය පථය පිළිබඳව රේගු අධ්‍යක්ෂ (අභියාචනා) විසින් සියුම් ලෙස පරීක්ෂා කරනු ලැබේ. ඉදිරි කටයුතු සඳහා වැඩිදුර තොරතුරු සහ කරුණු අවශ්‍යවන අභියාචනා අදාළ කරුණු පිළිබඳව විස්තරාත්මක වාර්තා ලබාගැනීම සඳහා අදාල අංශ වෙත යොමු කරනු ලැබේ.

මෙම තොරතුරු ලබා ගැනීමෙන් පසුව පමණක් යම් සහනයක් සැළසීම සඳහා අභියාචනා කමිටුවට මෙම අභියාචනා ඉදිරිපත් කිරීමට රේගු අධ්‍යක්ෂවරයාට (අභියාචනා) හැකිවේ.

එබැවින්, සෑම වර්ෂයකම අභියාචනා කමිටුව වෙත යොමු කරන අභියාචනා සංඛ්‍යාව, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම අංශයට යොමුකරන අභියාචනා සංඛ්‍යාව මත රඳාපවතින බව සඳහන් කල යුතුය.

2024 වර්ෂය සඳහා අභියාචනා අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පහත පරිදි වේ.

	කාර්යසාධනය	ප්‍රතිශතය
2024 වර්ෂයේ ලියාපදිංචි කරන ලද අභියාචනා සංඛ්‍යාව	101	-
2023 දෙසැම්බර් අවසානය වන විට අවසාන නොවූ අභියාචනා සංඛ්‍යාව	32	-
2024 වර්ෂයේ සළකා බැලීමට ඇති මුළු අභියාචනා සංඛ්‍යාව	133	-
2024 වර්ෂයේ සළකා බලන ලද අභියාචනා සංඛ්‍යාව	76	57.142
2024 වර්ෂයේ අවසන් කරන ලද අභියාචනා සංඛ්‍යාව	70	52.631
පසු විපරම් කිරීමේ පියවර ගෙන තිබූ අභියාචනා සංඛ්‍යාව	70	52.631

8.6.3 පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය

හැඳින්වීම

පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය සෘජුවම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මක වේ. එහි ප්‍රධානියා වන්නේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 වන පන්තියේ නිලධාරියෙකි. අක්‍රමිකතා නැවත සිදුවීම සහ සුපිළිපන්භාවයේ අඩුපාඩු වළක්වා ගැනීම සඳහා ක්‍රමවත් වැඩිදියුණු කිරීමක් සිදුකිරීමේ දී මෙහෙයුම් කළමනාකරණයට සහය වීම සහ ඒ හා සම්බන්ධ අවදානම් වලට අනුකූලව අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම මෙම නව අංශය වැඩිදියුණු කිරීමේ අපේක්ෂාව විය.

දෙපාර්තමේන්තුවේ සියලු අංශයන්හි සෑම මූලික ක්‍රියාවලි සහ සහාය ක්‍රියාවලින්හි දී සම්පත් භාවිතයේ ඵලදායිතාවය සහ අරපිරිමැසුම් බව ඇගයීම සඳහා විගණනයන් සිදු කිරීම මෙම අංශයේ විෂය පථයට අයත්වේ.

ප්‍රධාන කාර්යයන්

- හැකි සෑම අවස්ථාවකදීම විගණනයෙන් සිදු වන සේවය ප්‍රවර්ධනය කරමින්, එමගින් ආයතනයට වටිනාකමක් එකතුවන බව සනාථ කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.
    - මූල්‍ය හා මෙහෙයුම් තොරතුරුවල විශ්වාසනීයත්වය හා අවංක බව ඇගයීමට ලක් කිරීම
    - මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය හා සඵලත්වය ඇගයීමට ලක් කිරීම
    - වත්කම් ආරක්ෂා කිරී
    - නීති, රෙගුලාසි හා ගිවිසුම්වලට අනුකූලව කටයුතු කිරීම
- ඇතුලුව ආයතනයේ පාලන මෙහෙයුම් හා තොරතුරු පද්ධතියට අදාළව ඒවායේ ප්‍රමාණාත්මක බව හා සඵලතාවය ඇගයීම.
- අවදානම් කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා වන අවදානම් තක්සේරුව මත පදනම්ව විගණන සැලසුම් සකස් කිරීම හා ආයතනයේ මෙහෙයුම් වැඩි දියුණු කිරීම.
- හෙළිවන්නා වූ වැදගත් අවදානම් අවස්ථා සහ පාලන ගැටළු හා අනෙකුත් අවශ්‍ය කරුණු පිළිබඳව වාර්තා කිරීම හෝ ඉහළ කළමනාකරණය විසින් ඉල්ලා සිටි විට එම තොරතුරු ලබා දීම.
- දැනට ක්‍රියාත්මක මෙහෙයුම් හා වැඩසටහන් හෝ ඒවායින් ලද ප්‍රතිඵල අපේක්ෂිත පරිදි කෙතරම් දුරට තීරණය කරන ලද ඉලක්ක හා අරමුණු සමඟ අනුකූලදැයි නිශ්චය කර ගැනීම සඳහා මෙහෙයුම් හා වැඩසටහන් සමාලෝචනය කිරීම.
    - ආයතනය තුළ සුදුසු ආචාර ධර්ම හා වටිනාකම් ප්‍රවර්ධනය කිරීම
    - ඵලදායී අයුරින් ආයතනික කාර්ය සාධනය කළමනාකරණය හා වගවීම සහතික කිරීම
- යන අරමුණු ඉටුකර ගැනීම උදෙසා පාලන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය තක්සේරු සිදුකිරීම සහ ඒ අනුව සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම.

මෙම අංශයේ අනුකූලතා වාර්තාව

අංකය	අදාල අවශ්‍යතාවය	අනුකූලතා තත්වය අනුකූල /අනුකූලවේ) (නොවේ		අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදි අනුකූල නොවීම වැළැක්වීම සඳහා යෝජිත නිවරදි කිරීමේ ක්‍රියාමාර්ග
6	අභ්‍යන්තර විගණන				
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුකූලව විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව වසර ආරම්භයේදීම අභ්‍යන්තර විගණන සැලසුම සකස් කර ඇත.	මු.රෙ. 134(2) DMA/1-2019 අනුකූලව සකස් කර ඇති අතර අභ්‍යන්තර විගණන සැලසුම විගණකාධිපතිවරයාගේ උපදෙස් ලබාගැනීමෙන් පසුව සකස් කර ඇත.			
6.2	සියලු අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මාසයක් තුළ පිළිතුරු සපයා ඇත.	මාසයක් අතුළත පිළිතුරු ලැබී ඇත.	මාසයක කාලයක් ඉක්මවා	කාර්යයන්හි කාර්යබහුලත්වය හේතුවෙන්	ඉක්මනින් පිලිතුරු ලබාගැනීම සඳහා සිහිකැඳවීම් ගණනාවක් නිකුත්

			පිළිතුරු ලැබී ඇත.		කිරීම සහ විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡා කිරීම
		31	32		
6.3	**2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **40 (4)** උප වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.	ඔව්			
6.4	මූදල් රෙගුලාසි **134(3)** ප්‍රකාරව සියලු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.	ඔව්			
7	විගණන හා කළමනාකරණ කමිටුව				
7.1	**DMA/ -12019** කළමනාකරණ චක්‍රලේඛ අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් **4**ක් පවත්වා ඇත.	yes			

8.6.4 මූල්‍ය කළමනාකරණ අංශය

1. මූල්‍ය කළමනාකරණ අංශයේ කාර්යභාරය.

ශ්‍රී ලංකා රේගුව සඳහා විනිවිදභාවයෙන් යුත් නිසි මූල්‍ය කළමනාකරණ පද්ධතියක් පවත්වා ගැනීම, රජයේ ආදායම එකතු කිරීම සහ ගිණුම්ගත කිරීම, ශ්‍රී ලංකා රේගුව සඳහා සහය මූල්‍ය කළමනාකරණ සේවාවන් සැපයීම සහ ගිණුම් කටයුතුභාවය පවත්වා ගැනීම මූල්‍ය අංශයෙහි වගකීම වේ.

රජයේ සමස්ත බදු ආදායමෙන් **50%** කට වැඩි ප්‍රමාණයකට දායක වන ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව රජයට ආදායම් උපයා දෙන ප්‍රධාන ආයතනයයි. මේ සම්බන්ධයෙන් මූල්‍ය අංශය ප්‍රධාන භූමිකාවක් ඉටුකරන අතර, දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මූල්‍ය මෙහෙයුම් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍රයන් පිළිබඳව එම අංශය වගකීම දරයි.

අ. වියදම සහ බදු ආදායම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සැකසීම.

ආ. බදු ආදායම එකතු කිරීම, සටහන් කිරීම සහ වාර්තා කිරීම.

ඇ. අනුමත අයවැය තුළ වියදම් කළමනාකරණය කිරීම සහ අමතර ප්‍රතිපාදන අවශ්‍ය වන්නේ නම් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

ඈ. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ මේ පිළිබඳව උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශව වෙත ලබාදෙන කාල රාමුව අනුව මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම.

ඉ. විවිධ ආකාරයේ අරමුදල් සහ ගිණුම් පරිපාලනය කිරීම.

i. රේගු තැන්පතු ගිණුම්,
ii. රේගු ත්‍යාග අරමුදල,
iii. රේගු අතිකාල, බාහිර පරීක්ෂා කිරීම් ගාස්තු සහ තොරතුරු සහ සන්නිවේදන ගාස්තු අරමුදල,
iv. රේගු නිලධාරීන්ගේ වන්දි සහ කළමනාකරණ අරමුදල,
v. අත්අඩංගුවට ගත් සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අත්තිකාරම් ගිණුම.
vi. රාජ්‍ය සේවකයින්ගේ අත්තිකාරම් "බී" ගිණුම.

ඊ. වාර්ෂික විසර්ජන පනත සහ ජාතික විගණන පනත අනුව ඉහත ගිණුම් සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.

උ. විගණකාධිපතිවරයා සහ අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ විසින් විමසන ලද විගණන විමසුම් සහ වාර්තා පිළිබඳව පිළිතුරු, පැහැදිලි කිරීම් සහ නිරීක්ෂණ ලබාදීම.

1.1 ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන ප්‍රධාන මූල්‍ය නිලධාරි **(CFO)** යටතේ මූල්‍ය අංශය ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික මූල්‍ය කළමනාකරණය ප්‍රධාන මූල්‍ය නිලධාරියා වෙත පැවරී ඇති අතර දෙපාර්තමේන්තුවෙහි මූල්‍ය කළමනාකරණ කාර්යයන්හි අධීක්ෂණය, සම්බන්ධීකරණය හා පරිපාලනය මූල්‍ය අධ්‍යක්ෂවරයා වෙත පැවරී ඇත. නියෝජ්‍ය අධ්‍යක්ෂවරු හතර දෙනෙක් සහ පරිපාලන නිලධාරියෙක් මේ සඳහා ඔහුට සහාය ලබාදේ. මීට අමතරව නිලධාරීන් **114** දෙනෙකුගෙන් සමන්විත සහාය කාර්ය මණ්ඩලයක් (සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන් සහ කාර්යාල කාර්ය සහායක) මූල්‍ය අංශය සඳහා වෙන් කර ඇත.

මූල්‍ය අංශයේ මනා ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා එය පහත උප අංශ යටතේ සංවිධානය වී ඇත.

- ආදායම් අංශය
- ගෙවීම් අංශය
- වැටුප් සහ අතිකාල දීමනා අංශය
- අරමුදල් කළමනාකරණ අංශය
- බදු අංශය
- සරප් අංශය

2. කාර්ය සාධනය

2.1 ආදායම් අංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආදායම්) ගේ සෘජු අධීක්ෂණය යටතේ වන ආදායම් අංශය, ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ සහ මහජන බැංකුවේ ඩියුක් වීදිය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ආදායම් රැස් කිරීමේ ගිණුම් දෙකක් හා

සම්බන්ධ උප ආදායම් රැස්කිරීමේ ගිණුම් **17**ක් මගින් ක්‍රියාත්මක ආදායම් රැස් කිරීමේ මධ්‍යස්ථාන **42**ක් හරහා ආදායම රැස්කිරීම සඳහා වගකිව යුතුවේ. තවද, රැස් කරනු ලබන ආදායම රජයේ අවශ්‍යතා සඳහා යොදාගත හැකි වන පරිදි භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට දෛනික පදනමින් ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ප්‍රේෂණය කරනු ලැබේ.

ආදායම් අංශයේ ප්‍රධාන කාර්යයන්

i. දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව සකස් කිරීම.
ii. ආදායම් රැස් කරන ස්ථාන වලින් දෛනික මුදල් තැන්පත් පත්‍රිකා ලබා ගැනීම සහ ඒවා ගෙවීම් වවුචර (PIV) බැංකු ප්‍රකාශන සමඟ සැසඳීම.
iii. රාජ්‍ය නියෝජ්‍යායතන වලින් හිඟ ආදායම් මුදල් එකතු කිරීම.
iv. දෛනික සහ මාසික ආදායම් ඉලක්ක සහ ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම (භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව)
v. ආදායම එකතු කිරීම පිළිබඳ මාසික **CIGAS** සාරාංශය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.
vi. වාර්ෂික ගිණුම් ප්‍රකාශනවල කොටසක් වන ආදායම් ගිණුම සකස් කිරීමට සහ එය විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.
vii. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ගිණුම සඳහා එකතු කරන **3%** ක **VAT** ආදායම මාසික පදනමින් ගිණුම්ගත කිරීම සහ මාරුකිරීම.
viii. පහත දැක්වෙන කාණ්ඩ තුන යටතේ ආදායම ආපසු ගෙවීම සිදුකිරීම.
    - රේගු ආඥා පනතේ **18** සහ **22** වන වගන්ති වලට අනුකූලව ආපසු ගෙවීම් භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
    - මු.රෙ. **118** යටතේ වැඩිපුර ගෙවීම් සහ අමතර ගෙවීම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය මුදල් චක්‍රලේඛ **1/2020** යටතේ එක් වරකට වැඩි වාර ගණනක් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සිදුකර ඇති ගෙවීම් සඳහා ආපසු ගෙවීම් සිදුකිරීමට කටයුතු කිරීම.

2023 සහ **2024** මූල්‍ය වසර සඳහා එකතු කරන ලද තත්‍ය ආදායම සහ ඇස්තමේන්තුගත ආදායම අතර සංසන්දනයක් පහත දක්වා ඇත.

වාර්ෂික ඇස්තමේන්තුව සහ එකතු කරන ලද තත්‍ය ආදායම සංසන්දනය කිරීම (රු.මිලි)

ආදායම් කේතය	විස්තරය	2023		2024	
		අයවැයගත (සංශෝධිත)	තත්‍ය	අයවැයගත	තත්‍ය
1001.01.00	ආනයන තීරු බදු	88,000	105,120	175,000	111,147
1001.02.00	ආනයන තීරු බදු	28	27	35	27
1001.04.00	වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු	166,000	175,486	175,000	170,014
1001.05.01	සෙස් බදු - ආනයන	51,000	54,956	58,000	79,133
1001.05.02	සෙස් බදු - අපනයන	2,000	2,228	2,000	1,995
1001.08.00	විශේෂ වෙළඳ භාණ්ඩ බදු	50,000	51,327	95,000	115,199
1002.05.01	නිෂ්පාදන බදු- සිගරට්	120,000	117,467	143,000	117,145
1002.05.03	පෙට්‍රල් හා ඩීසල්	114,000	143,642	135,000	200,200
1002.05.04	මෝටර් වාහන	30,000	32,526	30,000	58,562
1002.05.99	වෙනත්	4,000	4,713	5,000	8,039
2003.07.10	වාහන නිමිකම් බද්ද	115	979	165	240
2003.02.17	ඇහළුම් අලෙවිය	123	171	122	121
2003.03.01	දඩ සහ රේගු රාජසන්තක කිරීම්	2,696	5,438	1,500	8,024
	මුළු රේගු ආදායම	**627,962**	**694,081**	**819,822**	**869,846**
2004.04.02	ආර්ථික සේවා ගාස්තු	8	12	12	201
1002.12.03	ජාතිය ගොඩනැගීමේ බද්ද	10	260	26	8
1002.01.04	ආනයන මත එකතු කළ අගය මත බදු	220,500	225,236	660,000	597,493
1002.16.00	සමාජ ආරක්ෂණ දායකත්ව බදු	48,000	51,274	55,000	64,392
1003.01.00	සුඛෝපභෝගී වාහන බද්ද	591	2,693	2,000	2,772
2003.02.99	විවිධ	191	546	393	297
2003.99.00	අනෙකුත් ලැබීම්	39	362	210	122
	අනෙකුත් ආදායම් එකතුව	**269,339**	**280,384**	**717,641**	**665,285**
	මුළු ආදායම	**897,301**	**974,465**	**1,537,463**	**1,535,131**

2.2 ගෙවීම් අංශය

පාර්ලිමේන්තුව විසින් අනුමත කළ පරිදි අයවැය ඇස්තමේන්තු වල දැක්වෙන මූල්‍ය ප්‍රතිපාදන යටතේ සියලු ගෙවීම් කිරීම නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගෙවීම්) ගේ සෘජු අධීක්ෂණය යටතේ ඇති ගෙවීම් අංශයේ වගකීම වේ. ඊට අමතරව, රේගු නිලධාරීන්ගේ වන්දි හා කළමනාකරණ අරමුදල, අත්අඩංගුවට ගත් හා රාජසන්තක කළ භාණ්ඩ අත්තිකාරම් ගිණුම සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම යන ගිණුම් වල ප්‍රතිපාදන යටතේ ගෙවීම් කිරීම සහ රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල සහ තැන්පතු ගිණුම යටතේ ගෙවීම් සිදු කෙරේ.

ගෙවීම් අංශයේ ප්‍රධාන කාර්යයන්

I. පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා වාර්ෂික අයවැය සකස් කිරීම.
II. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සඳහා සීමාවන් නිර්ණය කිරීම.
III. දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුම් දෙක පවත්වාගෙන යාම.
IV. රුපියල් බිලියන **4.5** ක් වූ අයවැයගත සීමාව තුළ වාර්ෂික වියදම් පාලනය කිරීම.
V. සහතිකකරණයක් සහ වැටුප් ගෙවීම, සැපයුම් සහ සේවාවන් සඳහා ගෙවීම් සිදුකිරීම.
VI. **CIGAS** හරහා භාණ්ඩාගාරයට මාසික ගිණුම් ඉදිරිපත් කිරීම.
VII. භාණ්ඩාගාරයට සහ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සැකසීම.
VIII. **SLIP** පද්ධතිය හරහා සේවකයින් **2300** කට වැඩි සංඛ්‍යාවක් සඳහා වැටුප්, අතිකාල, ත්‍යාග, පරීක්ෂණ මණ්ඩල ගාස්තු, පොදු සංචිත ගෙවීම, දිරි දීමනා, ගමන් වියදම් ආදී ගෙවීම් **SLIP** පද්ධතිය හරහා නියමිත දිනට ගෙවීම.

අදාල වර්ෂයන්හි ඇස්තමේන්තු හා සන්සන්දනාත්මකව **2023** සහ **2024** වසර තුළ වාර්ෂික ඇස්තමේන්තු යටතේ සිදුකරන ලද ගෙවීම් පහත දක්වා ඇත.

වියදම් කළමනාකරණය (රු.මිලි)						
විස්තරය	**2023**			**2024**		
	ඇස්තමේන්තුගත	තත්‍ය	භාවිතා කළ %	ඇස්තමේන්තුගත	තත්‍ය	භාවිතා කළ %
පුනරාවර්තන	4,798	3,801	79	3,878	3,684	95
ප්‍රාග්ධන	483	240	50	594	459	77
රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	60	28	47	55	32	58
එකතුව	**5,341**	**4,069**	**77**	**4,527**	**4,175**	**92**

2.3 වැටුප් හා අතිකාල අංශය

දෙපාර්තමේන්තුවේ සේවය කරන **2300** කට ආසන්න කාර්ය මණ්ඩලය සඳහා වැටුප් සහ අතිකාල ගෙවීමේ වගකීම නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැටුප් හා අතිකාල) ගේ සෘජු අධීක්ෂණය යටතේ ඇති මෙම අංශය වෙත පැවරී ඇත. එබැවින්, සාමාන්‍යය කාර්යාල වේලාවෙන් පසුව සිය ආනයන හා අපනයන කාර්යයන් සඳහා කඩිනමින් සේවාවන් සේවාවන් ලබා ගැනීමට අපේක්ෂා කරන ආනයන හා අපනයනකරුවන්ගෙන් එම අතිකාල ගාස්තු අයකර ගැනීම සහ ගිණුම්ගත කිරීම සඳහා මෙම අංශය වගකිවයුතු වේ. එසේ අයකරගත් ප්‍රමාණය රේගු අතිකාල, භාණ්ඩ පරීක්ෂණ ගාස්තු, සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අරමුදල් ගිණුමට බැරවන අතර අනුමත ගෙවීම් යෝජනා ක්‍රම අනුව ගෙවීම් සිදුකරයි.

වැටුප් සහ අතිකාල අංශයේ ප්‍රධාන කාර්යයන්

I. දෙපාර්තමේන්තුවේ **2300** කට අධික සේවක සංඛ්‍යාව සඳහා මාසික වැටුප් ගෙවීම.
II. රේගු අතිකාල, භාණ්ඩ පරීක්ෂණ මණ්ඩල ගාස්තු සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අරමුදල සඳහා වාර්ෂික අයවැය සකස් කිරීම.

III. අදාල පාර්ශවයන්ගෙන් (නාවුක නියෝජිතයින්, ගුවන් සමාගම්, ගුදම්) අතිකාල ආදායම ඇස්තමේන්තුගත කිරීම සහ එකතු කිරීම.
IV. කාර්ය මණ්ඩලය සඳහා අතිකාල ගෙවීම.
V. කලින් කලට අතිකාල ගාස්තු සමාලෝචනය කිරීම සහ ඒවා සඳහා සංශෝධන සිදුකිරීම.
VI. රේගු අතිකාල, භාණ්ඩ පරීක්ෂණ මණ්ඩල ගාස්තු සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අරමුදල සඳහා අවසන් ගිණුම් වාර්තා සකස් කිරීම.

ඒ අනුව, රේගු අතිකාල, භාණ්ඩ පරීක්ෂණ ගාස්තු සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අරමුදලේ පසුගිය වසර දෙක සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය පහත පහත වගුවල දැක්වේ.

රේගු අතිකාල, භාණ්ඩ පරීක්ෂණ ගාස්තු සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අරමුදල

(අ) රේගු අතිකාල අරමුදල

විස්තරය	(රු.මි.)	
	2023	**2024**
ආරම්භක ශේෂය	1,777.71	1,651.56
ලැබීම්	821.39	908.23
රජය සඳහා දායකත්වය	82.06	88.66
අතිකාල ගෙවීම්	865.48	957.28
අවසන් ශේෂය	1,651.56	1,513.85

(ආ) භාණ්ඩ පරීක්ෂණ ගාස්තු සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අරමුදල

විස්තරය	රු. (මිලි.)			
	භාණ්ඩ පරීක්ෂණ ගාස්තු		තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අරමුදල	
	2023	**2024**	**2023**	**2024**
ආරම්භක ශේෂය	398.48	334.01	4.99	7.49
ලැබීම්	243.39	307.10	13.73	14.96
ගෙවීම්	154.02	115.52	8.99	13.97
රජය සඳහා දායකත්වය	153.84	115.51	2.25	3.49
අවසන් ශේෂය	334.01	410.08	7.49	4.99

(ඇ) වැටුප් ගෙවීම පිළිබඳ විස්තර පහත දැක්වේ;

වසර	සේවක සංඛ්‍යාව	ගෙවන ලද දළ වැටුප් (රු.මිලි)
2023	2,124	1,569.29
2024	2,265	1,875.47

2.4 අරමුදල් කළමනාකරණ අංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ (අරමුදල් කළමනාකරණ) ගේ සෘජු අධීක්ෂණය යටතේ ඇති මෙම අංශය පහත සඳහන් ගිණුම් සඳහා ලැබෙන සියලු ලැබීම් භාරගැනීම, වාර්තා කිරීම සහ ගිණුම්ගත කිරීම සඳහා වගකිව යුතුවේ. මෙම ලැබීම් වලට දඩ, අලෙවියෙන් ලද මුදල් සහ අනෙකුත් විවිධ තැන්පතු ඇතුලත්වේ. දඩ සහ විකිණීමෙන් ලද මුදල් ප්‍රථමයෙන්ම මූලික තැන්පතු ගිණුමට බැර කරන අතර විමර්ශන සහ අභියාචනා ක්‍රියාවලිය නිමවූ පසුව, රේගු ආඥාපනතේ **152** වන වගන්තිය යටතේ අනුමත යෝජනාක්‍රම වලට අනුකූලව එකී ලැබීම් රේගු ත්‍යාග අරමුදල, රේගු නිලධාරීන්ගේ වන්දි අරමුදල සහ අනෙකුත් සංචිත අරමුදල් සඳහා මාරුකරනු ලැබේ.

අරමුදල් කළමනාකරණ අංශයෙහි ප්‍රධාන කාර්යයන්

I. රේගු ත්‍යාග අරමුදල සහ රේගු නිලධාරීන්ගේ වන්දි සහ කළමනාකරණ අරමුදල සඳහා ඇස්තමේන්තු සැකසීම සහ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම.
II. අනුමත අත්තිකාරම් ගිණුමේ (**ARABA Account**) සීමාවන් නිර්ණය කිරීම.
III. ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා තාවකාලිකව රඳවා ගැනීමේ තැන්පතු සඳහා තැන්පතු ලෙජරය නඩත්තු කිරීම, ටෙන්ඩර තැන්පතු සහ අනෙකුත් විවිධ තැන්පතු සහ බැංකු හා සරප් මගින් තැන්පතු ආකාරයෙන් ලැබෙන සියලු ලැබීම් වාර්තා කිරීම.

IV. දෛනික අය වාර්තා සකස් කිරීම සහ ගිණුම්ගත කිරීම සහ වාර්තා කිරීම සඳහා ආදායම් අංශයේ සරප් කවුන්ටරයට ඉදිරිපත් කිරීම.

V. ත්‍යාග ගෙවීම් සිදුකරන අවස්ථාවේ දී තාවකාලිකව රඳවා ගැනීමේ තැන්පතු ගිණුම මගින් රේගු ත්‍යාග අරමුදල, පරිගණක අරමුදල, ඒකාබද්ධ අරමුදල සහ අනෙකුත් අරමුදල් සඳහා මාරුකිරීමේ නියෝගයක් ආකාරයෙන් ලැබීම් මාරුකිරීම.

VI. ත්‍යාග ගොනු සැකසීමේදී වාර්තා වී ඇති අලෙවිය සහ දඩ මුදල් සත්‍යෝක්ෂණය කිරීම.

VII. රේගු නිලධාරීන් සඳහා පරීක්ෂණ මණ්ඩල ගාස්තු, සංචිත සහ පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා රික්විෂන් පත්‍ර සැකසීම.

VIII. රේගු ත්‍යාග අරමුදල, රේගු නිලධාරීන්ගේ වන්දි හා කළමනාකරණ අරමුදල, තාවකාලිකව රඳවා ගැනීමේ තැන්පතු, අත්අඩංගුවට ගත් සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අත්තිකාරම් ගිණුම (ARABA) සඳහා අවසන් ගිණුම් හෝ වාර්ෂික සැසඳුම් ප්‍රකාශය සකස් කිරීම.

2.4.1. ඒ අනුව, රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන අතර එම මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කෙරේ.

රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල

රේගු නිලධාරීන්ගේ වන්දි හා කලමනාකරණ අරමුදල

විස්තරය	රේගු ත්‍යාග අරමුදල (රු.මිලි)		රේගු නිලධාරීන්ගේ කලමනාකරණ සහ වන්දි අරමුදල (රු.මිලි)	
	2023	**2024**	**2023**	**2024**
ආදායම	5,611.80	8,975.90	2,463.30	3,413.70
වියදම	5,187.50	8,507.20	63.30	66.70
අතිරික්තය	424.30	468.70	2,400.00	3,347.00
ස්ථාවර වත්කම්	-			5.00
අරමුදල් ශේෂය	1,844.60	2,313.30	12,485.10	15,837.10

2.4.2. එසේම, රේගුව විසින් රාජසන්තක කරන ලද නීතිවිරෝධී ලෙස ආනයනය හෝ අපනයනය කරන අයිතම අපහරණය සඳහා වන වියදම පියවීම සඳහා මෙම අංශය විසින් "අත්අඩංගුවට ගත් සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අත්තිකාරම් ගිණුම" නමින් අත්තිකාරම් ගිණුමක් ද පවත්වා ගෙන යනු ලැබේ. අදාල රාජසන්තක කරන ලද භාණ්ඩ අලෙවි කිරීමෙන් ලැබෙන මුදල් මගින් මෙම වියදම් පියවා ගනී.

හසුකරගත් සහ රාජසන්තක කරන ලද භාණ්ඩ අත්තිකාරම් ගිණුමේ පසුගිය වසර දෙකක විස්තර පහත දැක්වේ;

විස්තරය	**2023** (රු.මි.)			**2024** (රු.මි.)		
	වියදම	ලැබීම්	ශේෂය	වියදම	ලැබීම්	ශේෂය
සීමාවන්	16.0	4.0	75.0	16.0	05	70
තත්‍ය	15.9	14.1	31.5	10.80	14.30	28.00

2.4.3 ඉහත අරමුදල් සහ ගිණුම් වලව අමතරව මෙම අංශය යටතේ පහත දැක්වෙන තැන්පතු ගිණුම් ද පවත්වා ගෙන යනු ලැබේ.

විස්තරය	තැන්පතු ගිණුමේ නම (රු.මිලි)					
	ටෙන්ඩර		ව්‍යවස්ථාපිත ගෙවීම් මත තාවකාලික රඳවා ගැනීම්		මගීන් විසින් රැගෙන එන භාණ්ඩ සඳහා තැන්පතු රඳවා ගැනීම	
	2023	**2024**	**2023**	**2024**	**2023**	**2024**
ආරම්භක ශේෂය	86.2	73.9	11,890.7	16,250	6.7	0.9
වසර තුළ ලැබීම්	430.5	669.5	34,040.6	46,033	18.3	10.7
	516.7	**743.4**	**45,931.3**	**62,283**	**25.0**	**11.6**
වසර තුළ ගෙවීම්	442.8	637.2	29,680.8	44,527	24.2	11.2

අවසන් ශේෂය	**73.9**	**106.2**	**16,250.5**	**17,756**	**0.8**	**0.4**

2.5 බදු සහ විවිධ සේවා අංශය

දෙපාර්තමේන්තු සේවකයින් සඳහා ඇප සහතිකපත් නිකුත් කිරීම සහ අධීක්ෂණය කිරීම මෙන්ම උපයන විට ගෙවීම් බදු **(PAYE)** දත්ත පද්ධතිය පරිපාලනය කිරීම බදු අංශයේ වගකීම වේ.

ශ්‍රී ලංකා රේගුවේ සේවකයින් සිය සාමාන්‍ය වැටුපට අමතරව අතිකාල, දිරිදීමනා, ත්‍යාග, සමීක්ෂණ මණ්ඩල සහ සංචිත වැනි විවිධ මූලය ප්‍රතිලාභ ලැබීමට වරප්‍රසාද ලබන බැවින්, ඔවුන් රාජ්‍ය සේවය තුළ ප්‍රධාන බදු ගෙවන්නන් වේ. බදු අංශය විසින් සෑම සේවකයෙකු සඳහාම ඔවුන්ගේ කැමැත්ත ඇතිව උපයනවිට ගෙවන බදු **(PAYE)** ගණනය කර එකී අයකර ගැනීම් අඛණ්ඩව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරයි.

බදු සහ විවිධ සේවා අංශයේ ප්‍රධාන කාර්යයන්

බදු අංශය

I. දෙපාර්තමේන්තුවේ **3000** කට අධික නිලධාරීන් සඳහා මාසික පදනමින් වැටුප් සඳහා උපයනවිට බදු සහ අනෙකුත් නිලධාරීන් සඳහා අනෙකුත් ගෙවීම් (ත්‍යාග, පොදු සංචිත සහ පරීක්ෂණ මණ්ඩල ගාස්තු) ගණනය කිරීම.
II. උපයනවිට බදු **(PAYE)** අයකර ගැනීම සහ එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීම.
III. බදු දත්ත ගබඩාව පවත්වාගෙන යාම.
IV. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සහ නිලධාරීන්ට බදු තොරතුරු **(Form T.10)** නිකුත් කිරීම.

විවිධ සේවාවන්

i. මූල්‍ය අංශය සඳහා පොදු පරිපාලන සහය සැපයීම.
ii. පැමිණීම, නිවාඩු, ගබඩා ආදිය අධීක්ෂණය කිරීම.
iii. නිලධාරීන් සඳහා ආදායම් වාර්තා නිකුත් කිරීම.
iv. අංශයේ තැපෑල පරිපාලනය කිරීම.

උපයනවිට බදු **(PAYE)** විස්තර පහත දැක්වේ;

බදු වර්ෂය	සේවක සංඛ්‍යාව	අයකර ගත් **(PAYEE)** බදු (රු.මිලි)
2023 අප්‍රේල් **- 2024** මාර්තු	1,838	1,614.2
2024 අප්‍රේල් **- 2025** මාර්තු	3,312	1,937.7

2.6 සරප් අංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගෙවීම්) ගේ අධීක්ෂණය යටතේ පරිපාලන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක සරප් අංශය සඳහා සරප්වරුන් ලෙස කටයුතු කරන කළමනාකරණ සේවා නිලධාරීන් **22** ක් අනුයුක්තව ඇත.

හම්බන්තොට, කටුනායක ගුවන් තොටුපල, පලාලි ගුවන් තොටුපල, මත්තල ගුවන් තොටුපල, කොළඹ වරාය සහ ප්‍රධාන කාර්යාලය ඇතුලුව දිවයින පුරා පිහිටි සරප් කවුන්ටර් **15** ඇති අතර කවුන්ටර **10**ක් සෑම දින **7**කම පැය **24**ක් විවෘතව පවතී.

8.6.5 නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය

හැඳින්වීම

1990 අංක **40** දරන පනත සහ **1994** අංක **08** දරන පනත මගින් සංශෝධිත, **1989** අංක **13** දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, ශ්‍රී ලංකා රජයේ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන නෛතික මූලාශ්‍රය වේ.

මුදල් අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය විසින් ජාතියේ සුභසිද්ධිය උදෙසා නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ ඇති විධිවිධාන සහ ඒ යටතේ සාදනු ලැබූ නියෝග බලාත්මක කිරීමේ වගකීම පැවරී ඇති රාජ්‍ය ආයතනය ලෙස ජාතික වශයෙන් වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

ප්‍රධාන කාර්යයන්

1. සිගරට් හා අනෙකුත් අදාල නිෂ්පාදන ආයතන අධීක්ෂණය කිරීම සහ නියාමනය තුළින් නිවැරදි ලෙස ආදායම එකතු කිරීම.
2. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ නීති බලාත්මක කිරීමේ අධිකාරිය ලෙස කටයුතු කිරීම සහ නිෂ්පාදන බදු වලට යටත් අදාළ ආනයනික සහ දේශීයව නිෂ්පාදිත අයිතමයන් මත පැනවෙන නිෂ්පාදන බදු රැස් කිරීම.
3. නිෂ්පාදන බදු පැනවීම සම්බන්ධ කටයුතුවල නිරතවීම.

මෙහෙවර සහ අරමුණු

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශයේ මෙහෙවර වන්නේ, ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන ලද හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද අයිතම මත පනවා ඇති නිෂ්පාදන බදු ආදායම කාර්යක්ෂම ලෙස එකතු කිරීම මගින් ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක වීමයි.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශයේ අරමුණු වඩාත් පුළුල් ආකාරයෙන් පහත පරිදි හඳුනාගනු ලැබිය හැකිය :-

ඇ. **1989** අංක **13** දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම.

ආ. ඛනිජ තෙල්, සිගරට්, සිසිල් බීම, තුරහ ප්‍රකාශන, දේශීයව එකලස් කරන ලද වාහන, මේද අම්ල, පලතුරු බීම හා නිෂ්පාදන බද්දට අයත් අනෙකුත් අයිතම වලින් එන බදු ආදායම එකතු කිරීම සහ සුරක්ෂිත කිරීම.

පද්ධති සහ ක්‍රියා පටිපාටි

මෙම අංශය ආරම්භ කළ දින සිට පනත යටතේ සාදන ලද රෙගුලාසි සහ නියෝග ඇතුළත් ගැසට් නිවේදන කලින් කලට නිකුත් කරනු ලැබ ඇත. නිෂ්පාදන බදු වල ව්‍යුහය ද ඉහත රෙගුලාසි සහ නියෝගයන්ට අනුව ක්‍රියාත්මක කරනු ලැබිණි.

2024 වසර තුළ සිදුකළ මූලික වෙනස්කම්

සිගරට්/මෘදු බීම සඳහා නිෂ්පාදන බදු

i. **2023.12.31 දිනැති අංක 2364/36 දරන ගැසට් නිවේදනය මගින් නියෝග සංශෝධනය වේ (2024 වසර තුළ එකී ගැසට් නිවේදනය මගින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (HS code) සඳහා සංශෝධිත බදු අනුපාත පහත දැක්වේ)**

ගැසට් නිවේදන අංකය	දිනය	බලාත්මක වන දිනය	HS සංකේතාංකය	නිෂ්පාදන බදු අදාල වන අයිතම
2364/36	31.12.2023	01.01.2024	2106.90.32	සංයෝග සම්මිශ්‍රණ (සංයුක්ත පාන වර්ග) ලීටර් 1 කට රු. 68
			2201.10.90	ලීටර් 1 කට රු. 29 (සෝඩා)
			2202.10	ලීටර් 1කට රු. 14 ශත 34 කින් ග්‍රෑම් 1කට ශත 34 (මි.ලී. 100කට ග්‍රෑම් 6 හැර) – මෘදු බීම
			2202.99.30	ලීටර් 1කට රු. 14 ශත 34 කින් (මි.ලී. 100කට ග්‍රෑම් 6 හැර) - ශක්තිජනක පාන
			2202.99.51	ග්‍රෑම් 1කට ශත 34 (.ලී. 100කට ග්‍රෑම් 8 හැර) - පළතුරු බීම
			2402.20	සිගරට්

ii.

(අ) ලියාපදිංචි දේශීයව එකළස් කරන ලද වාහන සමාගම් - 01
(ආ) MIB ක්‍රියාවලිය යටතේ කර්මාන්ත හා සේවා අංශයට සම්බන්ධ අනෙකුත්.
(ඇ) ඉහත (ආ) ක්‍රියාවලිය පිළිබඳ නීතිපති උපදෙස් මෙතෙක් ලැබී නැත.

නිෂ්පාදන බදු ආදාල වන වන අයිතම සහ 2023 වසර තුළ එකතු වූ ආදායම (දේශීය)

	රු. මිලියන
සිගරැට්	**112,527.52**
ඛණිජ තෙල්	**42,001.95**
මෝටර් රථ (දේශීයව එකළස් කරන ලද)	**70.30**
සිසිල් බීම	**2,881.72**
තුරහ ප්‍රකාශන	**13.58**
විදුලි භාණ්ඩ (දේශීය) අනෙකුත්	**0**
පළතුරු බීම	**137.62**
මේද අම්ල	**0.27**
උසාවි ආදායම	**00**
ලියාපදිංචි කිරීමේ ගාස්තු	**.01**
මුළු එකතුව	**157,632.10**

නිෂ්පාදන බදු ආදාල වන වන අයිතම සහ 2024 වසර තුළ එකතු වූ ආදායම (දේශීය).

	රු. මිලියන
සිගරැට්	**106,662.38**
ඛණිජ තෙල්	**42,128.53**
මෝටර් රථ (දේශීයව එකළස් කරන ලද)	**130.05**
සිසිල් බීම	**3,674.73**
තුරහ ප්‍රකාශන	**18.48**
විදුලි භාණ්ඩ (දේශීය) අනෙකුත්	**-**
පළතුරු බීම	**183.78**

මේද අම්ල	-
උසාවි ආදායම	-
ලියාපදිංචි කිරීමේ ගාස්තු	**0.12**
මුළු එකතුව	**152,798.22**

දේශීය ක්‍රියාකාරකම්

හිඟ බදු සහ දඩ මුදල් අයකර ගැනීම සඳහා නිෂ්පාදන බදු ගෙවීම පැහැර හරිනු ලැබූ සමාගම් වලට විරුද්ධව නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගනු ලැබ ඇත. විස්තර පහත දක්වා ඇත.

උසාවියෙහි විභාග කරන ලද නඩු සංඛ්‍යාව	**02**
ඉදිරියට ගෙන ගිය නඩු සංඛ්‍යාව	**02**
වර්ෂය තුළදී ගොනු කළ නඩු සංඛ්‍යාව	**00**
වර්ෂය තුළදී අයකර ගත් ආදායම	**00**

Annexure – I

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. PUR/A/CUS/2024/F800

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2025 මැයි 30 දින.

RECEIVED
03 JUN 2025
D.G.C.
47

රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

ADG(C(HR)

ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

Employees' Services Division
04 JUN 2025
Sri Lanka Customs

ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා රේගුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ශ්‍රී ලංකා රේගුව
අංක 40, යෙලිත් වීදිය, කොළඹ 11.
04 JUN 2025
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්
කාර්යාලය
(මානව සම්පත්)

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

1.2 තක්ත්වාගණනය කුළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තක්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ශ්‍රී ලංකා රේගුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා රේගුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

(අ) විවිධ පාර්ශවයන් විසින් සිදුකරන ලද සෘජු බැංකුගත කිරීම් අදාලවන ආදායම් සංකේතයන් නිශ්චිතව හඳුනාගත නොහැකිවීම නිසා ආදායම් හඳුනා ගන්නා තෙක් තාවකාලිකව වාර්තා කර තැබීමට යොදාගත් ආදායම් පාලන ගිණුමේ වර්ෂ අවසාන දිනට වූ හර සහ බැර ශේෂයන් පිළිවෙලින් රු.18,785,730,933 ක් සහ රු.7,772,069,824 ක් නිවැරදිව හඳුනා නොගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයන් වශයෙන් හඳුනාගෙන තිබුණි. එම වටිනාකම් ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ නිශ්චිත ආදායම් සංකේතයන් යටතේ හඳුනා නොගෙන විවිධ ලැබීම් සහ විවිධ ගෙවීම් වශයෙන් දක්වා තිබුණි.

(ආ) ඒසීඒ 1(i) හි දක්වා තිබුණු රේගු දෙපාර්තමේන්තුවට අදාල හිඟ ආදායම් අනුව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු හෝ ගෙවිය යුතු ශේෂයක් නොමැති වුවද, ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ගිණුම් අනුව රේගුවට ගෙවිය යුතු මුදල් රු.32,072,136,585 ක් සහ රේගුවෙන් ලැබිය යුතු මුදල් රු.1,239,333,736 ක් වශයෙන් දක්වා තිබුණි.

1.6.2 ආදායම් නොවන ලැබීම්

පරීක්ෂණ අවසන් වී ඇති රේගු විමර්ශනයන් 184 ට අදාලව විවිධ පාර්ශවයන්ට පැනවූ දණ්ඩන හා අහිමිකිරීම් (penalties and forfeitures) වටිනාකම් වූ රු.4,790,470,462 ක් 2024 දෙසැම්බර් 31 දින වන විට ද අයකර ගෙන නොතිබීම නිසා රේගු ආඥා පනතේ 153 (2) (අ) වගන්තිය ප්‍රකාරව එකී දණ්ඩන හා අහිමිකිරීම්වලින් මහා භාණ්ඩාගාරයට ලැබිය යුතු සියයට 30 ක වටිනාකම් වූ රු.1,437,141,139 ක් ද හිඟ භිටව පැවතුණි.

1.6.3 අත්තිකාරම් ගෙවීම්

(අ) නිලධාරීන් 10 දෙනෙකුට අදාලව අත්තිකාරම් "බී" ගිණුමේ දැක්වූ ණය ශේෂය සහ සාමාජික ණය ලේඛණයේ (සී.සී.10 ලේඛණය) දැක්වූ ණය ශේෂය අතර රු.426,574 ක නොසැසඳීමක් වූ අතර නිලධාරීන් 26 ට අදාලව අත්තිකාරම් "බී" ගිණුමේ දැක්වූ රු. 3,762,258 ක ණය ශේෂය සාමාජික ණය ලේඛණයේ (සී.සී.10 ලේඛණය) ඇතුළත්ව නොතිබුණි.

(ආ) රේගුවේ විවිධ අංශ 13 ක් මගින් සිදු කරනු ලබන විමර්ශන 216 ට අවශ්‍ය වියදම් දැරීම සඳහා අත්අඩංගුවට ගන්නා ලද සහ රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ අත්තිකාරම් ගිණුමෙන් (අ.රා.බ. ගිණුම) වසර 05 කට පෙර ලබාගෙන තිබුණු අත්තිකාරම් රු. 6,462,337 ක් විමර්ශන විසඳීම ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ද පියවා නොකිබුණි. ලබාගත් අත්තිකාරම් එම විමර්ශන අවසන් වූ පසුව කඩිනමින් පියවිය යුතු වුවද, අවස්ථා 11 කට ආදාළව එම ගිණුමෙන් ලබාගත් අත්තිකාරම් රු. 1,122,171 ක් විමර්ශන අවසන්වී තිබියදීත් පියවීමට කටයුතු කර නොතිබුණි.

1.6.4 වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්

ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ වැරදියට සටහන් වූ විවිධ ලැබීම් රු 2,047,737 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ලෙස සැලකිල්ලට ගැනීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් වැරදියට සටහන් කර තිබුණි.

1.6.5 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

ඒසීඒ- 7 හි දැක්වූ අග්‍රිම ගැලපුම් ප්‍රකාශනයේ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම් සහ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම් පිළිවෙලින් රු.316,674,095 ක් සහ රු.10,406,781ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.6 මූල්‍ය නොවන වත්කම්

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.11,402,424,218 ක් වශයෙන් දැක්වුවද, ත්‍රිකුණාමලය සහ යාපනයේ පිහිටි ඉඩම් කැබලි 05 ක් සහ ඒවායේ පිහිටි ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම නිසා එම වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ආ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මාගේ වාර්තාවේ තක්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ 1.6.6 ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වේ.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

රේගු අධ්‍යක්ෂ ජනරාල් ආදායම් සංකේත 13 කට අදාලව ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු වශයෙන් කටයුතු කර තිබුණි. එම ආදායම් සංකේත සම්බන්ධ පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) ඇස්තමේන්තු සහ සත්‍ය ආදායම් අතර විචලනය

ආදායම් සංකේත 4 ට අදාලව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය අදායම අතර සියයට 3 සිට සියයට 36 ක් දක්වා වූ පරාසයක ඍණ විචලනයක් ද ආදායම් සංකේත 7 ට අදාලව සියයට 21 සිට 447 ක අධි විචලනයක් ද විය.

(ආ) පූර්ව වර්ෂයේ ආදායම සමඟ සැසඳීම

සමාලෝචිත වර්ෂයේ ආදායම් පූර්ව වර්ෂයේ ආදායම් සමඟ සැසඳීමේ දී වාහන හිමිකම් බද්ද, ඇඟලුම් සඳහා දේශීය විකුණුම් මත ගාස්තු සහ අපනයන සෙස් බදු යන ආදායම් සංකේතාංක 3ට අදාලව ආදායමෙහි සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණු අතර එය සියයට 10 සිට සියයට 75 ක් දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.

(ඇ) හිඟ බදු ආදායම්

සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති හිඟ ආදායම්, ඒවායේ අයකර ගැනීම් සහ වර්ෂ අවසාන ශේෂය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

i. 2024 දෙසැම්බර් 31 දිනට රු. 57,707,523,914 ක් වූ සමස්ථ හිඟ බදු ආදායමෙන් රු. 22,044,131,527 ක් හෙවත් සියයට 38 ක් ආනයන බදු විය. කෙසේවුවද, වර්ෂය තුල අයකර ගත් හිඟ ආනයන බදු ආදායම රු. 1,500,438 ක් වූ අතර එම ප්‍රමාණය හිඟ ආනයන බදු ආදායමෙන් සියයට 0.007 ක පමණ ඉතා පහළ අගයක් විය.

ii. 2024 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු ආදායමෙන් රු. 15,236,676,819 ක් හෙවත් සියයට 26 ක් විශේෂ වෙළඳ භාණ්ඩ බදු වලින් නියෝජනය වූ නමුත් එම වටිනාකම 2021 වර්ෂය සහ ඊට පෙර වර්ෂවල සිට පැවත එන හිඟගිටි ආදායම් විය. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසානය වනතෙක් එම ආදායම් අයකර ගැනීමට හැකි වී නොතිබුණි.

iii. 2024 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු ආදායමෙන් රු. 9,943,802,984 ක් එනම් සියයට 17 ක් වරාය සහ ගුවන්තොටුපොල සංවර්ධන බදු වූ අතර ඉන් ද රු.9,945,317,734 ක් එනම් 99.9 ක් 2020 වර්ෂය හා ඊට පෙර වර්ෂ වල සිට පැවත එන හිඟ ආදායම් විය. වර්ෂය තුල අයකර ගත් හිඟ ආදායම රු. 1,514,750 ක් වූ අතර එම ප්‍රමාණය වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන හිඟ බදු ආදායමෙන් සියයට 0.02 ක් පමණ ඉතා පහළ අගයක් විය.

iv. සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ ආදායම වූ රු. 58,478,974,134 ක ශේෂය විශ්ලේෂණය කිරීමේ දී වර්ෂය තුල අයකරගෙන තිබූ මුලු හිඟ ආදායම රු. 771,450,220 ක් වූයෙන් හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රමාණය සියයට 1.32 ක තරම් ඉතා සුළු ප්‍රතිශතයක් පමණක් විය.

v. අංක 01/2015 සහ 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු වක්‍රලේඛයට අනුව පිළියෙල කරන ලද හිඟ ආදායම් වාර්තාව අනුව රජයේ විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 37 න් රු.57,721,517,615 ක් 2024 දෙසැම්බර් 31 දිනට රේගුවට අය විය යුතුව පැවති අතර "මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත පසුව ගෙවීමේ පදනමින් භාණ්ඩ නිශ්කාෂණය කිරීම" හේතුවෙන් මෙම හිඟ බදු ඇති වී තිබුණි. මෙම සියලු හිඟ බදු 2020 වර්ෂයට පෙර සිට රේගුවට අය විය යුතුව පැවති ශේෂයන් වූ අතර මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව එම ආදායම් අත්හැර දැමීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් 2024 නොවැම්බර් 07 දින මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් අනුමැතිය ඉල්ලා තිබුණි. එකී හිඟ බදු ආදායම්වලට අදාල තොරතුරු දෙපාර්තමේන්තුවෙන් මේ වන විට සොයා ගැනීම අපහසු වී තිබීම මෙම අත්හැර දැමීමට හේතුවක් වශයෙන් දක්වා තිබුණි. මහා භාණ්ඩාගාරය විසින් පසුව ගෙවීමේ පදනමින් භාණ්ඩ නිශ්කාෂණය කිරීමට මුලින් අවසර ලබා දී ඉන්පසුව ඒවා අත්හැර දැමීමට කටයුතු කිරීම විගණනයේ දී ගැටලු සහගත විය.

3.2 වියදම් කළමනාකරණය

3.2.1 පුනරාවර්තන වියදම්

ප්‍රතිපාදන ඉතිරිවීම්

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් වැය විෂයයන් 13 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 6 සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් නිරීක්ෂණය විය.

3.2.2 මූලධන වියදම්

ප්‍රතිපාදන ඉතිරිවීම්

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් වැය විෂයයන් 4 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 25 සිට සියයට 66 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වීමක් සිදු වී තිබුණි.

3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) ශ්‍රී ලංකා රේගුව විසින් වැය විෂයයන් 06 කට අදාළව 2024වර්ෂයේදී බැරකම් ලේඛනයේ හඳුනාගෙන තිබුණු වියදම් වටිනාකම ඉක්මවා රු.36,542,349 ක් වූ බැරකම් වලට එළඹ තිබුණි.

(ආ) **අනිකුත් බැඳීම් හා බැරකම්**

(i) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැරකම් විස්තරයේ සහ බැරකම් ලේඛනයේ ඇතුළත් නොවූ වැය විෂයයන් 9 කට අදාළව 2025 වර්ෂයේදී ගෙවූ බැරකම් එකතු වටිනාකම රු.40,212,111 ක් විය.

(ii) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැරකම් ප්‍රකාශයේ ඇතුලත් වූ එකතු බැරකම් වටිනාකම රු.13,212,456 ක් 2025 මැයි 09 දින තෙක් ගෙවා නොතිබුණි.

3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 සහ 5.2 ඡේදවල සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) 1869 අංක 17 දරන රේගු ආඥා පනත	
(i) 84 (අ) (3) වගන්තිය	i. බන්දිත ගුදම් පහසුකම (Manufacture in Bond-MIB) ලබාගන්නා ආනයනකරුවන්ගෙන් ආනයනික භාණ්ඩ ගුදමට ගෙනෙන විට බදු අයකර නොගන්නා අතර ගුදම්ගත භාණ්ඩ එහි නිෂ්පාදනය කර දේශීය පරිභරණය සඳහා මුදාහරින අවස්ථාවේදී "ආනයනය කරන ලද භාණ්ඩ සේ සලකා" තීරු බදු ගෙවීම් සිදු කළ යුතුය. කෙසේවුවද, දේශීයව සියයට 30 ට නොඅඩු අගයක් එකතු කර වාහන නිෂ්පාදනය කරන්නන්ට කර්මාන්ත අමාත්‍යාවරයාගේ නිර්දේශ මත ලබා දෙන සියයට 70ක නිෂ්පාදන බදු සහනය එකී බන්දිත ගුදම් පහසුකම් ලබාගන්නා වාහන උපාංග එකලස් කරන සමාගම් විසින් ද ගුදමින් මුදාහරින අවස්ථාවේදී ඉල්ලීම් කර බදු සහන ලබා ගැනීම නිසා රාජ්‍ය ආදායම විශාල වශයෙන් අහිමිවන තත්ත්වයක් උද්ගත වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ තුළදී එවැනි සමාගම් 7 ක් විසින් කර්මාන්ත අමාත්‍යාවරයාගේ නිර්දේශ මත ලබා දෙන සියයට 70ක නිෂ්පාදන බදු සහනය ඉල්ලා තිබුණු අතර රේගුව විසින් ද ආඥා පනතේ යොමුගත ප්‍රතිපාදන නොසලකා හැර එකී බදු සහනය ලබා දීමට කටයුතු කර තිබුණි. ඒ අනුව 2024 වර්ෂයේදී අදාළ සමාගම් 7 විසින් මෝටර් කාර් 538 ක් සහ යතුරු පැදි 53,381 ක් MIB පහසුකම් ලබාගනිමින් ගුදමේ එකළස් කර දේශීය වෙළඳපලට නිකුත් කර තිබුණු අතර එම වාහන සඳහා ගුදමින් මුදාහරින විට අයවිය යුතු නිෂ්පාදන බද්ද රු.10,744,332,600 ක් වුවද රු.3,356,784,548 ක් පමණක් අයකර තිබීම නිසා රාජ්‍ය බදු ආදායම රු.7,387,548,052 න් අඩු වී තිබුණි.

Excise

ii. දේශීයව වාහන නිෂ්පාදනය කරන්නන් විසින් ඔවුන් දේශීයව එකතු කරන අගය සැලකිල්ලට ගෙන ලබා දෙන නිෂ්පාදන බදු සහන ප්‍රතිපාදනය අවභාවිතා කිරීමක් මෙහිදී සිදු වී ඇත්තේ අතර විගණනය විසින් ද අවස්ථා ගණනාවකදී මෙම තත්ත්වය පෙන්වා දීම තුළ 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) පනතේ පවතින ප්‍රතිපාදන සහ රේගු ආඥා පනතේ ප්‍රතිපාදන පිළිබඳව රේගුව විසින් 2023 වර්ෂයේදී නීතිපති මතය විමසීමක් සිදු කර තිබුණි. කෙසේවුවද, එයට පිළිතුරු 2025 අප්‍රේල් 30 දින වන විටත් ලැබී නොතිබුණි.

iii. ඉහළ ප්‍රාග්ධනයක් වැය කර වාහනයක සියළුම උපාංග පාහේ විදේශ රටවලින් ගෙන්වීමට හැකියාව ඇති සමාගම් සඳහා සියයට 70ක නිෂ්පාදන බදු සහනය ලබා දීමට කටයුතු කිරීම නිසා එම සමාගම් වලට විශාල ලාභයක් ඉපයීමට අවස්ථාව ලබා දී තිබුණු අතර එකී සමාගම් සමඟ තරඟ කිරීමට නොහැකි බැවින් වාහන නිෂ්පාදන ක්ෂේත්‍රයේ දේශීය නව ව්‍යවසායකයෙක් ද පසුගිය වර්ෂ ගණනාවක සිට බිහි වී නොතිබුණි.

(ii) 153 (2) (ආ) වගන්තිය

ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යාවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු වුවද, 1988 ජනවාරි 28 දින අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යාවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 2012 වසරේ සිට 2024 වර්ෂය දක්වා වූ වර්ෂ 13 ක් තුළ ත්‍යාග අරමුදල් ලෙස නිලධාරීන් සඳහා රු.25,244,792,239 ක්ද, ඔක්තුකරුවන් සඳහා රු.4,554,073,737 ක් ද බෙදා හැර තිබුණි. මුදල් අමාත්‍යාවරයාගේ අනුමැතිය ලබාගෙන ඇති ලියකියවිලි ආයතනය තුළින් සොයා ගැනීමට මේ වන විට නොහැකිවී ඇති බව රේගුව විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(iii) 162 වගන්තිය

අල්වා ගැනීමෙන් පසු නීති විරෝධී බැව් ප්‍රකාශ කළ බඩු හා නැව්, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ රේගුවේ වෙන යම් යෝග්‍ය නිලධාරියෙකු හෝ නියම කරන ආකාරයට හැකි පමණ ඉක්මනින් සුදුසු පරිදි ක්‍රියා කළ යුතු අතර නරක්වෙන සුලු බඩු වර්ග විකුණා දැමිය යුතුය. කෙසේවුවද, 2024 දෙසැම්බර් 31 දින වන විට විවිධ හේතු මත අල්වා ගෙන රේගුවේ විවිධ අංගනවල රඳවා ඇති බහාලුම් සංඛ්‍යාව 867 ක් වූ අතර ඉන් බහාලුම් 350ක් වසර 05 ට වඩා පැරණි ඒවා විය. බහාලුම් දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීම තුළ භූමිය නිෂ්කාර්යව උපයෝජනය වීම, අදාළ නැව් සමාගම්වල මෙහෙයුම් කටයුතු සඳහා බහාලුම් ලබා ගැනීමට නොහැකිවීම, බහාලුම් තුළ ඇති ද්‍රව්‍ය භාවිතයට ගත නොහැකි වීම ආදිය මෙන්ම ආනයනකරුවන් සහ නැව් සමාගම් ද රේගු මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳව කළකිරීමට පත්වීම සිදුවිය හැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

(i) XXIV පරිච්ඡේදයේ 4:1 උප වගන්තිය

- යම් නිලධාරියෙකු විශ්‍රාම ගැනීමේදී ණය මුදල් ආපසු ගෙවා අවසන් කිරීමට ඉඩ සලසනු වස් නියමිත වාරික ගණනට වඩා අඩු වාරික ගණනකින් සම්පූර්ණ මුදල් ආපසු අයකර ගත යුතුය. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාම ගිය නිලධාරීන් 11 න් රු. 1,109,581 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවතුණි.
- සේවය හැර ගිය නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු මුදල් ප්‍රධාන ණයකරුගෙන් අයකර ගත නොහැකි අවස්ථාවලදී ඇපකරුගෙන් මුදල් අයකර ගත යුතුය. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට සේවය හැර ගිය නිලධාරීන් 7 න් රු. 756,492 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවතුණි.

XI

- සමාලෝචිත වර්ෂය අවසාන දිනට වැඩ කහනම් කර ඇති නිලධාරීන් 9 න් රු. 1,358,048 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවතුණි.

(ii) XXIV පරිච්ඡේදයේ 4:6 උප වගන්තිය

මිය ගිය නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු මුදල් ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට නියමිතව ඇති ඕනෑම මුදලකින් අඩුකර ගත යුතු අතර ප්‍රධාන ණයකරු මිය ගොස් ඇත්නම් ඇපකරුගෙන් ද ඔහුගේ උරුමක්කාරයින්ගෙන් ද අයකර ගත නොහැකි නම් ඒ සම්බන්ධව අප්‍රමාදව නීතිපතිගෙන් උපදෙස් ලබා ගත යුතුය. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට මිය ගිය නිලධාරීන් 9 න් රු. 1,262,438 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවතුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මු.රෙ. 102 සහ 110

විදේශීය පුද්ගලික ආයතනයක් විසින් නැවකින් නැවකට භාණ්ඩ මාරු කිරීමේ ක්‍රමය යටතේ (Transshipment) සිංගප්පූරුවෙන් නැවගත කරනු ලැබූ දුම්වැටි තොගයකට අදාළව සිදු කරන ලද රේගු විමර්ශන අවසානයේ එම දුම්වැටි තොගය රු.5,901,750 ට රේගුව වෙන්දේසිකර තිබුණි. කෙසේවුවද, එම විකිණීමට එරෙහිව අදාල විදේශ ආයතනය විසින් පැවරූ නඩු වලින් රේගුව වැරදිකරු වී තිබුණු බැවින් රේගුවට මෙම වැරදි තීරණය මත රු.69,451,809 ක් විදේශ ආයතනය වෙත ආපසු ගෙවීමට සිදු වී තිබුණි. මෙම විමර්ශනයට අදාළ ගොනුව ද පසුව අස්ථානගත වී තිබුණු අතර එයට වගකිවයුතු නිලධාරීන්ට සහ ඉහත වැරදි තීරණයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව 2023 මැයි 11 දින පත් කරන ලද මූලික විමර්ශන කමිටු වාර්තාව ඉන් මාස දෙකක් ඇතුළත ඉදිරිපත් කළ යුතුව පැවතුණ ද, 2025 අප්‍රේල් 20 දින වන විටද ඉදිරිපත් කර නොතිබුණි. තවද, රේගු වැරදි තීරණ මත ආපසු ගෙවූ මුදල් රාජ්‍ය ආදායමෙන් ගෙවා තිබුණු බැවින් එවැනි අවස්ථාවලදී මහා භාණ්ඩාගාරයට බරක් නොවී වැරදි

තීරණයට වගකිවයුතු නිලධාරීන්ගෙන් හෝ යම් ත්‍යාග ගෙවීමක් සිදු කළේ නම් ත්‍යාග ලබාගත් පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) මු.රෙ. 570

සියලුම තැන්පතු, තැන්පත් කල දින සිට වර්ෂ 02ක් තුළ හිමිකම් නොපැවොත් ඉකුත් තැන්පතු ලෙස සළකනු ලැබිය යුතු අතර, මු.රෙ 571(3) ජේදයෙහි විධිවිධානවලට යටත්ව ඉකුත් වූ සියලු තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතුය. කෙසේවුවද, වර්ෂ 2 කට වඩා පැරණි වූ රු.13,620,000 ක ටෙන්ඩර් තැන්පතු 2024 දෙසැම්බර් 31 දින දක්වා රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ වක්‍රලේඛ 2017 අප්‍රේල් 19 දිනැති අංක 3/2017 දරන වක්‍රලේඛය.

සියලු රාජ්‍ය සේවකයන් සිය පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතු බව දැක්වුවද, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීමකින් තොරව 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2335 දෙනෙකු සඳහා වැටුප්, වේතන, අතිකාල, නිවාඩු දින වැටුප් හා දිරිදීමනා වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් රු.2,308,694,777 ක් ද රේගු අතිකාල නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදල මගින් රු.1,087,172,344 ක්ද වශයෙන් එකතුව රු.3,395,867,121 ක් ගෙවා තිබුණි. මෙම සේවකයන් දිනකට පැය 24 ක් දක්වා අතිකාල දීමනා ද ලබා ගන්නා අතර පැමිණීම් සහ පිටවීම් පිළිබඳ නිසි සනාථ කිරීමකින් තොරව ඉහත ගෙවීම් සිදු කෙරෙන බව නිරීක්ෂණය

XIII

කෙරේ. "සියලුම නිලධාරීන් ඇඟිලි සලකුණු යන්ත්‍ර අනිවාර්යෙන් භාවිතා කළ යුතු බවත්, යම් වැටලීම් අවස්ථාවක් හෝ එවැනි යම් රාජකාරි කටයුත්තක් සඳහා සහභාගි වීමට අවශ්‍ය විටෙක එසේ භාවිතා කිරීම අපහසු වන්නේ නම් ඒ පිළිබඳව අදාළ බලධාරීන් විධිමත් පරිදි දැනුවත් කර සුදුසු පරිදි කටයුතු කළ යුතු බවත්" 2024.01.24 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී ද රේගුව වෙත නිර්දේශ ලබා දී තිබුණි.

(ඉ) ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛ

2008 ජුනි 13 දිනැති අංක LD- 1,34(I) 2008 දරන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛය

රජය සතු ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම පාලනය හා කළමනාකරණය විධිමත් කිරීමට කටයුතු කලයුතු වුවද, කොම්පඤ්ඤ වීදියේ මෝගන් පාරේ ශ්‍රී ලංකා රේගුව සතු නිල නිවාස භූමියේ අනවසර පදිංචි කරුවන්ට පදිංචිවී සිටීමට ඉඩ දී තිබුණු අතර චක්‍රලේඛය අනුව අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම නිල නිවාසය පිහිටි ප්‍රදේශයේ බේරේ වැව ආශ්‍රිත සංවර්ධන සැලැස්මට මෙම ඉඩම් කොටස හදුනා ගෙන ඇති බැවින් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා රේගුවට ඇති හැකියාව ගැටලු සහගත බව රේගුව විසින් සඳහන් කරන ලදි.

3.6 අවධිමත් ගනුදෙනු

(අ) සුදු සීනි ලෙස අනාවරණය කර දුඹුරු සීනි ආනයනය කිරීම නිසා දණ්ඩනයන්ට ළක් වූ ආනයනකරුවෙකුට රේගුව විසින් රු.500,000 ක දඩයක් සහ රු.189,293,778 ක අහිමි කිරීමක් පනවා තිබූ අතර ආනයනකරු එකී දණ්ඩනයට එකඟවීම මත රාජසන්තක නොකර රු.190,000,000 ක බැංකු ඇපකරයක් මත භාණ්ඩ තොගය රේගු භාරයෙන් නිදහස් කරගෙන තිබුණි. රේගු අඥා පනතේ 165 වගන්තිය ප්‍රකාරව පනවන ලද දණ්ඩනයක් හෝ දඩයක් හෝ ඉන් කොටසක් ලිහිල් කිරීමට අමාත්‍යවරයාට බලය පවතින බැවින් ආනයනකරු විසින් එකී දණ්ඩනය සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි. අමාත්‍යවරයා විසින් එම

ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබුණු නමුත් පනවන ලද දණ්ඩන මුදලින් රු.මිලියන 30ක් අඩු කිරීමට අමාත්‍යවරයා තීරණය කළ බවට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් පසුව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දී තිබුණි. නමුත් දණ්ඩන මුදලින් රු.මිලියන 30ක් අමාත්‍යවරයා විසින් අඩු කිරීමට ලබාදුන් තීරණය විගණනයට ඉදිරිපත් නොවීය. රේගුවෙන් භාණ්ඩ නිශ්කාෂණය වූ පසුව එහි අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශයට ලද තොරතුරකට අනුව රේගුව විසින් මෙම විමර්ශනය සිදු කර තිබුණු අතර මෙම ලිහිල් කිරීම නිසා රජයට සිදුව තිබූ සමස්ත රාජ්‍ය ආදායම අහිමි වීම රු.62,505,801ක් විය. තවද, මෙම ආනයනකරු මීට පෙර අවස්ථා 23 ක දී දණ්ඩනයන්ට ලක්වූ අයෙක් ද විය. කෙසේවුවද, යොමුගත වගන්තිය ප්‍රකාරව පනවන ලද දණ්ඩනයක් හෝ දඩයක් ලිහිල් කිරීම සෘජුවම රාජ්‍ය ආදායම අඩුවීමට බලපාන බැවින් ඉහත ලිහිල් කිරීමට අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබිය යුතුව තිබියදී වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් පනතේ ප්‍රතිපාදන අභිබවා යමින් අමාත්‍යවරයාගේ බලතල භාවිතා කර සිදු කිරීම විගණනයේ දී ගැටලු සහගත වූ අතර පළමුව ප්‍රතික්ෂේප කර දෙවනුව දණ්ඩණය ලිහිල් කිරීම ද ප්‍රශ්නකාරී විය.

(ආ) ස්වර්ණාභරණ ආනයනය සහ අලෙවිය සිදු කරන ප්‍රසිද්ධ සමාගමක් විසින් විදේශ රටවල නිෂ්පාදිත රන් ආභරණ තෙවන පාර්ශවයන් හරහා විදේශයන්ගෙන් ගෙන්වාගෙන අලෙවි කර ආනයන බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් අංක PCAD/2024/00043/CCR/00171 යටතේ රේගු විමර්ශනයක් සිදු කර තිබුණි. එම සමාගම විසින් රු.753,210,479 ක් වටිනා ආනයනික රත්තරන් තොගයකට අදාලව නොගෙවීමට උත්සාහ කරන ලද බදු මුදල රු.219,817,086 ක් විය. රේගු ආඥා පනතේ 107 සහ 129 වගන්ති ප්‍රකාරව පිළිවෙලින් මෙම භාණ්ඩ රාජ සන්තක කිරීමට සහ භාණ්ඩ වටිනාකම් මෙන් තෙගුණයක අහිමිකිරීමක් සිදු කළ හැකි වුවද, විමර්ශන අවසානයේ පැනවූ රු.2,919,082,695 ක අහිමි කිරීම රු.190,000,000 ක් දක්වා ලිහිල් කිරීම පමණක් සිදුකර තිබුණි. මෙම ලිහිල් කිරීමෙන් පසු මහා භාණ්ඩාගාරයට බැර වූ මුදල රු.57,000,000 ක් පමණක් වීම නිසා එය පැහැර හැරීමට උත්සාහ කළ බදු වටිනාකමට සාපේක්ෂව රු.162,817,086 න් අඩු අගයක් විය.

(ඇ) එකඟ වූ දින අනුව, නියමිත කාලය තුළ වාහන ලබා දීමට අපොහොසත් වීම, ලබා දී ඇති වාහන ද එම ආයතනය සතු වාහන නොවී විවිධ පෞද්ගලික අයිතිකරුවන්ගෙන් තාවකාලිකව ලබා ගත් වාහන වීම, වරින් වර වාහන ලබා දීම සහ එම වාහන සම්බන්ධයෙන්ද විවිධ ගැටළු මතු වීම ආදී හේතු මත මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන 9 ක් ලබා ගැනීමේ දී ගිවිසුම්ගත නොවීමට රේගුව තීරණය කර තිබුණ ද, මාසිකව එක් වාහනයකට රු. 194,900 ක් බැගින් රු. 21,049,200ක් බදු කුලිය වශයෙන් එම සමාගමටම 2024 වසර තුළ දී ගෙවා තිබුණි. ගිවිසුම්ගත නොවීමේ වාසිය භාවිතා කරමින් එම සමාගම 2025 පෙබරවාරි මාසයේදී කල්බදු පදනමින් ලබාගත් වාහන 9 ආපසු රැගෙන තිබුණු නමුත් සේවා අවශ්‍යතාවය මත එම සමාගමෙන්ම රු.294,000 ක මාසික බදු කුලියකට නැවතත් වාහන 9ක් තාවකාලිකව ලබා ගැනීමට කටයුතු කර තිබුණි.

XV

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

(අ) 2015 සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල රේගුව විසින් සිදුකරන ලද රේගු විමර්ශණවල දී "ප්‍රකාශ නොකර භාණ්ඩ ගෙන ඒම" සහ "අතිරික්ත භාණ්ඩ ගෙන ඒම" ආනයනකරුවන් / අපනයනකරුවන් විසින් සුලභව සිදු කරන රේගු වැරදි බවට පත් වී තිබුණි. ඉහත කාලය තුළ ප්‍රකාශ නොකර භාණ්ඩ ගෙන ඒමේ සහ අතිරික්ත භාණ්ඩ ගෙන ඒමේ අවස්ථා පිළිවෙලින් 7,093 ක් සහ 5,452 ක් විය. "ආදායම සුරක්ෂිත කිරීම" රේගුවේ මෙහෙවර ප්‍රකාශයේ එක් ප්‍රධාන කාර්යයක් වශයෙන් හඳුනාගෙන තිබුණ ද මෙවැනි තත්ත්වයන් සෘජුවම රාජ්‍ය ආදායම අඩුවීමට බලපාන කාරණයක් ව තිබියදී එය දිගින් දිගටම සිදුවෙමින් පැවතුණි. අනවශ්‍ය ආදායම් කාන්දුවීම්(Revenue Leakages) වැළැක්වීමේ එක් උපක්‍රමයක් වශයෙන් රජය 2024 වර්ෂය සඳහා වූ අයවැය යෝජනා මඟින් "රේගුව තුළ අවදානම් කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම" සඳහා රු. මිලියන 100 ක් වෙන්කිරීමට කටයුතු කර තිබුණ ද ඉන් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) රේගු ආඥා පනතේ 51 වගන්තියෙන් නියම කර ඇති පරිදි රේගුවට භාණ්ඩවල අගය ප්‍රකාශ කළ යුතු අතර එසේ ප්‍රකාශ නොකළ අවස්ථාවල විමර්ශන සිදුකර රාජසන්තක කිරීම සිදුකල හැකිය. කෙසේවුවද, භාණ්ඩ වල මිල ඌන තක්සේරු කර (Under Value) ආනයනය කිරීමේදී ඒ බව අනාවරණය වූ අවස්ථාවක නියම ලෙස ගෙවිය යුතු ඉතිරි බදු මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලට සම්පූර්ණයෙන් බැර වෙන බව අධ්‍යක්ෂ ජනරාල් විසින් 2024 මැයි 09 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දී ප්‍රකාශ කර තිබුණු නමුත්, ඌන තක්සේරු කළ අවස්ථා ද රේගු විමර්ශන බවට පත් කර දණ්ඩන පනවා ඉන් සියයට 50ක් ත්‍යාග වශයෙන් නිලධාරීන් ලබා ගෙන තිබුණු බව හෙළිදරව් විය. ඒ අනුව 2015 සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී රේගු විමර්ශනවලින් පසු "භාණ්ඩ ඌන තක්සේරු කිරීම" කර ඇති බවට හෙළිදරව් වූ අවස්ථා 1858 ක් වූ අතර මේ සෑම අවස්ථාවකදීම විමර්ශනයෙන් පසු අභිමිකිරීම් සහ දණ්ඩන පනවා ඉන් සියයට 30 ක් පමණක් රාජ්‍ය ආදායමට බැර කර තිබුණි.

(ඇ) රේගු ආඥා පනත යටතේ වංචනිකව කරනු ලබන ආනයනයන් සඳහා විමර්ශනයකින් අනතුරුව අයකර ගනු ලබන දඩ මුදල්වලින් සියයට 50 ක් රජයේ ඒකාබද්ධ අරමුදලට ද, සියයට 5ක් රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සහ වන්දි අරමුදලට ද සහ සියයට 45 ක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට ද බැර වෙන පරිදි රේගු ආඥා පනතට සංශෝධන යෝජනා කර ඇති බවත් එම කටයුතු 2024 ජූනි මාසය තුළ අවසන් කරන බවත් 2024.05.09 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දී අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශ කර තිබූ ණි. කෙසේ වුවද, එම සංශෝධනයන්ට රේගු වෘත්තීය සමිති විරුද්ධ බවට අංක SLC/ESD/01/COPA /2023 සහ 2024 ජූලි 16 දිනැති අධ්‍යක්ෂ

ජනරාල්ගේ ලිපියෙන් විගණනය වෙත දැනුම් දී තිබුන අතර ඒ හේතුවෙන්,2025 අප්‍රේල් 30 දින වන විට ද ඒකාබද්ධ අරමුදලට බැර වන ප්‍රමාණයේ වර්ධනයක් දක්නට නොලැබුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) අලෙවි කළ නොහැකි භාණ්ඩ විනාශ කිරීමේ කාර්යයේ වගකීම දරන මධ්‍යම අපහරණ අංශයට සමාලෝචිත වර්ෂය තුළ දී එවැනි භාණ්ඩ විනාශ කිරීම් සඳහා ඉල්ලීම් 128 ක් ඉදිරිපත් වී තිබුණ ද, ඉන් ඉල්ලීම් 33කට අදාළව පමණක් භාණ්ඩ විනාශ කිරීමට කටයුතු කර තිබුණි. එය සිදුකරන ලද ඉල්ලීම් සංඛ්‍යාවට සාපේක්ෂව සියයට 26 ක පමණ ප්‍රගතියක් විය.

(ආ) 2016 වර්ෂයේ සිට ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීම (Build Own & Operate- BOO) යන ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ පුද්ගලික සමාගමකින් රේගුව සිය බහාළුම් පරිලෝකන කටයුතු සිදුකර ගෙන තිබුණු අතර 2021 වර්ෂයේදී එම සමාගමටම ඇ.ඩො. 21,590,008 ක් ගෙවා පද්ධතියේ පූර්ණ අයිතිය රේගුවට ලබා ගැනීමට කටයුතු කර තිබුණි. මෙහිදී රේගු නිශ්කාෂණ ක්‍රියාවලිය සඳහා පූර්ණ එක්ස්රේ පරිලෝකනයක් අපේක්ෂා කර තිබුණ ද එය ක්‍රියාත්මක නොවීම නිසා ප්‍රකාශිත භාණ්ඩ අයිතමයන් අතර සහවා ඇති අයිතමයන් හඳුනාගැනීම, ව්‍යාජ භාණ්ඩ ප්‍රකාශ කිරීම් සංඛ්‍යාව අඩු කිරීම, තහනම් හා නීතිවිරෝධී භාණ්ඩ ආනයනය අවම කිරීම යන අපේක්ෂිත සැලසුම්වලට ලඟාවීමට නොහැකි වී තිබුණි. තොග වශයෙන් සිදුකරන ආනයන, ඉහළ සනත්වයකින් යුක්ත බහාලුම් සහ දියර වර්ග ඇතුළත් බහාලුම් මෙම යන්ත්‍ර මඟින් ස්කෑන් කළද ඒවා අතර සූක්ෂමව සහවා අසුරා ඇති භාණ්ඩ හඳුනාගැනීම් ද අසීරු වී තිබුණි.

4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

"ටෙන්ඩර් වෙන්දේසි මඟින් සාර්ථක ලංසුකරුවන්ට භාණ්ඩ අලෙවිකිරීම" රේගුව විසින් අල්ලා ගන්නා ලද ද්‍රව්‍යයන් අපහරණය කරන එක් ක්‍රමවේදයක් වුවද, වාර ගණනාවක් ටෙන්ඩර් අලෙවියට ඉදිරිපත් කළ නමුත් නිසි මිලක් ඉදිරිපත් කරන ලංසුකරුවන් නොසිටීම නිසා ග්‍රේ ලයින් I, ග්‍රේ ලයින් II සහ ඒෂියන් බහාලුම් අංගනයේ පමණක් පිළිවෙලින් භාවිතා කරන ලද ඇඳුම්, වාහන අමතර කොටස් සහ මෙවට සහිත බහාලුම් 55 ක් තවදුරටත් එසේ අලෙවිය තුළින් ආදායමක් ලබා ගැනීමට නොහැකිව රඳවා තිබුණි. රේගු වෙබ් පිටුව හරහා මාර්ගගත ක්‍රමවේදය මඟින් ටෙන්ඩර් පිළිබඳව මහජනතාව දැනුවත් කර භාණ්ඩ අලෙවි කිරීමට උත්සාහ දරා තිබියදීත් මෙවැනි තත්ත්වයන් පැන නැඟී ආදායම් හඳුනා ගැනීමට ප්‍රමාදවීම පිළිබඳව පුළුල් අධ්‍යයනයක් කළ යුතුව පැවතුණි.

4.2 වත්කම් කළමනාකරණය

2025 අප්‍රේල් 11 දින වන විට රේගුව සතුව කාර්, වෑන්, කැබ් ආදී වශයෙන් වර්ග 06 ක වාහන 110 ක් පැවතුණු නමුත් ඉන් වාහන 25 ක් ධාවන තත්ත්වයේ නොතිබුණි. ඉන් සමහර වාහන මාස 29 ක කාලයක් ධාවනයේ යොදවා නොතිබුණි. 2025 මාර්තු 20 දින විගණනය විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව වාහන 20 ක් කිසිදු ආවරණයක් රහිතව වරාය පරිශ්‍රයේ නවතා දමා තිබුණු අතර සැපයුම් හා සේවා අංශය විසින් සිදු කරන ලද තහඹුරු කිරීමට අනුව එම වාහන දින 14 ක සිට අවුරුදු 12 ක් දක්වා කාලයක් එම ස්ථානයේ උපයෝජනයකින් තොරව ගාල්කර තිබුණි. ඉන් බහුතර වාහන සංඛ්‍යාවක් අලුත්වැඩියා කළයුතු තත්ත්වයේ පැවතුණ ද, එයට අවශ්‍ය කටයුතු කඩිනම්ව සිදු වී නොතිබුණි.

4.3 පාඩු හා හානි

සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට මාස 10 සිට වසර 12ක් දක්වා කාලය ඉකුත් වූ බැංකු ඇපකර 27 ක් වූ අතර ඒවායේ වටිනාකම රු.100,172,482 ක් විය. අදාල ඇපකරවල කල් ඉකුත්වීම් පිළිබඳව නිලධාරීන් යාවත්කාලීන නොවීම, කෙටි කාලයක් ඇතුලත නිලධාරීන් ස්ථාන මාරුවීම් සහ කල් ඉකුත්වීම් යාවත්කාලීනව දැන ගැනීමට නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබීම මෙයට හේතු වී තිබුණි. ඉහත වටිනාකමින් රු.13,677,400 ක් වටිනා බැංකු ඇපකර 5ට අදාලව උපකාරක ලියකියවිලි බැංකුවේ නොමැති බවට එම බැංකුව විසින් ද රේගුවට දැනුම් දී තිබුණි.

4.4 අනාර්ථික ගනුදෙනු

(අ) රේගුව විසින් දිගු කාලයක් රඳවා ගෙන ඇති බහාලුම් අතර වාහන අමතර කොටස් සහිත බහාලුම් 60 ක්, ප්ලාස්ටික් ද්‍රව්‍ය සහිත බහාලුම් 57 ක්, ලී බඩු සහ දැව සහිත බහාලුම් 36 ක්, ආහාර ද්‍රව්‍ය බහාලුම් 301 ක්, දුම්වැටි සහ දුම්වැටි සහිත දෑ ඇතුළත් බහාලුම් 24 ක්, පුවක් බහාලුම් 34 ක් සහ විවිධ මිශ්‍ර අයිතම් සහිත බහාලුම් 49 ක් විය. ආහාර ද්‍රව්‍ය සහිත බහාලුම් අතර වියළි මිරිස් අඩංගු බහාලුම් 20 ක්, අර්තාපල් බහාලුම් 11 ක්, පාන්පිටි නිෂ්පාදන බහාලුම් 9 ක්, හාල් බහාලුම් 107 ක් සහ තේ බහාලුම් 54 ක් ද වූ අතර, මේවා ඉක්මනින් නශ්‍ය වන භාණ්ඩ බැවින් ඒ සම්බන්ධයෙන් කඩිනම්ව කටයුතු නොකිරීම තුළ ප්‍රයෝජනයට ගත හැකි මට්ටමේ ද්‍රව්‍ය වලින් ලැබිය හැකි ආර්ථික වාසියද අහිමි වන මට්ටමක පැවතුණි. 2024 වර්ෂය වන විටද වසර දෙකක සිට වසර 06 ක් දක්වා පැරණි වූ ඉහත සහල් බහාලුම් 107 ටෙන්ඩර් වෙන්දේසි මඟින් සත්ව ආහාර වශයෙන් අලෙවි කිරීමට රේගුව උත්සාහ දැරුව ද, පාරිභෝගික සේවා අධිකාරියේ අංක 2285/18 සහ 2022 ජූනි 24 දිනැති ගැසට් පත්‍රය මඟින් සහල් සත්ව ආහාර වශයෙන් අලෙවිය වළක්වා ඇති බව රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් විගණනය වෙත දන්වා තිබුණි. එකී ගැසට් පත්‍රය සංශෝධනය කරන ලෙස 2024 දෙසැම්බර් 06, 2024 දෙසැම්බර් 11 සහ 2025 පෙබරවාරි 11 යන දිනයන්හිදී වෙළඳ

හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට සහ වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයට රේගුව විසින් දන්වා යවා තිබුණි. ගැසට් පත්‍රය සංශෝධනයට ඇති හැකියාව සෙවීම වෙනුවට අමාත්‍යාංශය විසින් එම සහල් "සත්ව ආහාරයට සුදුසු වේදැයි පරීක්ෂාකර වාර්තා කරන මෙන්" නැවතත් රේගුවට දැනුම් දී තිබුණු අතර ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් 2025 අප්‍රේල් 25 දින වන විට ද මෙම බහාලුම් එපරිදිම රඳවා තිබුණි.

(ආ) මාසිකව රු.4,650,000ක කුලී මුදලක් ගෙවමින් රේගුව විසින් මට්ටක්කුලිය ප්‍රදේශයේ පෞද්ගලික සමාගමකින් ලබා ගෙන තිබුණු ඉඩමක අත් අඩංගුවට ගන්නා ලද වාහන රඳවා තිබුණු අතර 2025 මාර්තු 15 දිනට එපරිදි රඳවා ගත් වාහන 332 ක් විය. රුහුණු පුර වරාය භූමියේ එදිනට තවත් වාහන 108 ක් රඳවා තිබුණි. මින් බහුතර වාහන සංඛ්‍යාවක් දිගු කාලයක් අංගනවල ගාල් කර තැබීම හේතුවෙන් දිරාපත් වී ධාවනයට නුසුදුසු තත්ත්වයට පත්වීම සහ වෙන්දේසියකින් සාධාරණ මුදලක් ඉපයීමට නොහැකි තත්ත්වයකට පත් වී තිබුණි. කෙසේවුවද, රේගු ආඥා පනතේ 109 වගන්තිය ප්‍රකාරව දින 30ට වැඩි කාලයක් රේගු භූමියේ තිබෙන්නට හරින බඩු ප්‍රසිද්ධ දැන්වීමකින් පසු වෙන්දේසියේ හෝ ටෙන්ඩර් මඟින් විකුණා දැමීමට හැකියාව පැවතියදී මෙම තත්ත්වය ඇති වී තිබුණු අතර මට්ටක්කුලිය ප්‍රදේශයේ පෞද්ගලික සමාගමට පමණක් වර්ෂය තුළ ගෙවා තිබුණු මුළු කුලී මුදල රු.55,800,000ක් විය. මෙම වාහන අපහරණය කිරීමේ හැකියාව සොයා බැලීමට කටයුතු කරමින් පවතින බව මෙම වාර්තාවේ කෙටුම්පතට පිළිතුරු වශයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මා වෙත වාර්තා කර තිබුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) මධ්‍යගත සිද්ධි ලේඛනයට (Central Case Register) අනුව 2015 සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා සිද්ධි 37,685 ක් ලියාපදිංචි කර තිබුණු අතර, ඉන් සිද්ධි 28,166 ක් විසඳා අවසන් කර තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් සිද්ධි 9,519 ක් විසඳීමට ඉතිරිව පැවතුණි. ඉන් වසරක් ඇතුලත ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව 1,523 ක් ද, වසර 1 ට වැඩි වසර 5 ට අඩු සිද්ධි සංඛ්‍යාව 4,958 ක් ද, වසර 5 ට වැඩි සිද්ධි සංඛ්‍යාව 3,038 ක් ද විය. විමර්ශන විසඳීම ප්‍රමාද වීම සඳහා මාස 6කට වරක් වශයෙන් බහුතර නිලධාරීන් සංඛ්‍යාවකට අදාලව සිදුකරන ස්ථාන මාරුවීම්, නව නිලධාරීන් පැරණි සිද්ධි අවසන් කිරීමට උනන්දුව අඩුවීම මෙන්ම ගොනු අස්ථානගතවීම ද හේතු වී තිබුණි.

(ආ) අංක 01/2024 සහ 2025 මැයි 29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබාදෙන, දීර්ඝ කාලීනව අයවී නොමැති ණය හා අත්තිකාරම් විවිධ සීමාවන් යටතේ නිරවුල් කිරීමට / අත්හැරීමට / කපාහැරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට බලය ලබා දී තිබුණි. ඒ අනුව, රේගුව විසින් සිදු කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අංක

MF/02/01/CUS/53 සහ 2024.10.08 දිනැති ලිපියෙන් නිලධාරීන් 22 ක ගේ රු. 827,488 ක් වූ ණය ශේෂ කපා හැරීමට අවසර ලබාදී තිබුණි. කෙසේවුවද, ණය කපාහැරීමට /අත්හැරීමට පෙර එම ශේෂ අයකර නොගැනීම සම්බන්ධයෙන් නිලධාරීන්ගේ යම් නොසැලකිල්ලක් හෝ අතපසුවීමක් හේතු වී ඇත්ද යන්න පරීක්ෂා කළ යුතු නමුත්, පෞද්ගලික ලිපිගොනු සොයා ගැනීමට නොහැකිවීම මත ඉහත නිලධාරීන්ගෙන් 16 දෙනෙකුගේම අදාළ ණය අත්හැරීම සිදුකර තිබියදී නිලධාරීන්ගේ යම් නොසැලකිල්ලක් වුයේද යන්න පරීක්ෂා කර නොතිබුණි. තවද, ඔවුන්ගෙන් 06 දෙනෙක් වැඩ තහනම් කළ නිලධාරීන් ද විය. මීට අමතරව රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් 2024 සැප්තැම්බර් 20 දින තවත් නිලධාරීන් 14 ක ගේ රු. 2,230,882 ක ණය ශේෂ අත්හැර දැමීමට මුදල් අමාත්‍යාංශ ලේකම්ගෙන් අනුමැතිය ඉල්ලා තිබුණු අතර ඉන් නිලධාරීන් 10 ක ගේද "පෞද්ගලික ලිපිගොනු සොයාගැනීමට නොහැකිවීම" ණය අත්හැරීමේ හේතුව වශයෙන් දක්වා තිබුණි. ඒ අතර ද, වැඩ තහනම් කළ නිලධාරීන් 06 දෙනෙක් විය.

(ඇ) 2019.06.03 දින තීරු බදු රහිත සාප්පු සංකීර්ණයෙන් නීති විරෝධී දුම්වැටි කාටුන් 45 ක් (කාටුනයක සිගරට් 200 ක් ඇත) රැගෙන යාම සම්බන්ධව ප්‍රධාන රේගු පරීක්ෂක සහ රේගු නියාමක නිලධාරීන්ට අදාලව සිදු කළ මූලික පරීක්ෂණයේ වාර්තාව 2019.10.10 දින ලබා දී තිබුණු අතර එම වාර්තාව අනුව විධිමත් විනය පරීක්ෂණයක් සිදු කරන ලෙස නිර්දේශ කර තිබුණි. 2020.10.19 දින ඔවුන් දෙදෙනාට චෝදනා පත්‍ර භාර දුන්න ද ඒ වන විටත් සිදුවීමට වසරක් ගත වී තිබුණි. කෙසේවුවද, ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII පරිච්ඡේදයේ 4: 4 වගන්තිය ප්‍රකාරව රේගු අධ්‍යක්ෂ (නිවාරණ) විසින් වුදිත රේගු නියාමකවරයාට විධිමත්ව එම චෝදනා පත්‍රය භාර දී නොමැති බව පසුව හෙළිදරව් වූ අතර ආයතන සංග්‍රහයේ පළමුවන උපලේඛණයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදු කළ හැකි වරදවල් හි 15 වන වගන්තිය යටතට ගැනෙන "ආයතන සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය කිරීම හෝ හිතාමතා හෝ අනවධානයෙන් හෝ නොඇලකා හැරීම හෝ මහහැරී යන ආකාරයෙන් කටයුතු කිරීමක්" සේ සැලකිල්ලට ගෙන විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. 2020.10.19 දින භාර දෙන ලද චෝදනා පත්‍රය අනුව ඉහත රේගු නිලධාරීන් දෙදෙනා ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධ "පළමු වන උපලේඛනය" යටතට ගැනෙන වැරදි සිදු කර තිබුණ ද, එය "දෙවන උපලේඛනයට ගැනෙන වැරදි" වශයෙන් සාවද්‍ය ලෙස වර්ගීකරණය කර තිබුණි. නිකුත් කරන ලද චෝදනා පත්‍රයේ අඩුපාඩු හඳුනා ගැනීමෙන් පසු 2023.11.29 දින සංශෝධනය කරන ලද චෝදනා පත්‍රයක් මෙම නිලධාරීන් දෙදෙනාට ලබා දී තිබුණ අතර, 2024.01.02 දින විධිමත් විනය පරීක්ෂණ සිදු කිරීම සඳහා ඒක පුද්ගල විනිශ්චය සභාවක් පත්කර තිබුණි. එහිදී සාක්ෂිකරුවන්ගේ ලිපිනයන් සොයා ගැනීමට නොහැකිවීම, සාක්ෂිකරුවන් මිය යාම, සම්බන්ධිත නිලධාරීන් විශ්‍රාම යාම ආදි විවිධ කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විටත් පරීක්ෂණ අවසන් වී නොතිබුණි. ඉහත කරුණු අනුව මෙම තීරු බදු සහිත සාප්පු සංකීර්ණයේ 2019 වසරේ සිදු වූ මෙම විෂමාචාරයට සම්බන්ධ රේගු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීම හිතාමතාම

නොසැලකිල්ලෙන් හා අනවධානයෙන් යුතුව ප්‍රමාද කරන බව ගම්‍ය වන අතර, මෙම තත්ත්වය මෙවැනි තීරු බදු රහිත සාප්පුවල පරිපාලන කටයුතු අකාර්යක්ෂම වීමට මෙන්ම තවදුරටත් විෂමාචාරයන් සිදු කිරීමට ඉඩ පරිසරයක් ඇති කරන බවක් පෙනී යයි.

(ඇ) රේගු විමර්ශන හේතුවෙන් විවිධ අංගනවල රඳවා ගෙන ඇති බහාලුම් පිළිබඳව සිදුකරන ලද විගණනයක දී රඳවා තබා ඇති ස්ථානය හඳුනාගත නොහැකි බහාලුම් 80 ක් ද, රඳවා ගැනීමට හේතුව පැහැදිලි කළ නොහැකි බහාලුම් 29 ක් ද, රඳවා ගත් කාලය සොයාගත නොහැකි බහාලුම් 08 ක්ද,අඩංගු ද්‍රව්‍ය හඳුනා නොගත් බහාලුම් 61 ක් ද විය. මෙම තත්ත්වය එම බහාලුම්වලට අදාල ඉදිරි විමර්ශන කටයුතු සඳහා බාධාවක් මෙන්ම ඒවායේ ඇති ද්‍රව්‍යයන්ගේ අනාරක්ෂිතභාවයට ද හේතු විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ඉ) සහකාර රේගු අධිකාරිවරයෙක් විසින් 2020 වර්ෂයේ දී සිදු කරන ලද මුදල් වංචාවක් සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අල්ලස් හෝ දූෂණ වෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කර තිබුණු අතර අදාළ වංචාව පිළිබඳ තොරතුරු රේගුව සතුව නොපැවතීම හේතුව වශයෙන් දක්වමින් නිලධාරියා පිළිබඳව 2023 දෙසැම්බර් 31 දින වන විට ද දෙපාර්තමේන්තු පරීක්ෂණ කිසිවක් පැවැත්වීමට කටයුතු කර නොතිබීම පිළිබඳව විගණනය විසින් සිදුකරන ලද විමසීමෙන් පසුව මූලික විමර්ශන කමිටුවක් පත් කිරීමට කටයුතු කර තිබුණි. රේගුව සතුව අදාල තොරතුරු නොතිබීම පිළිබඳව කළමනාකරණ අවධානය යොමු වී නොතිබුණු අතර පැමිණිලිකරු විමර්ශනය සඳහා පෙනී නොසිටි බව විගණනයට වාර්තා කර තිබුණි.

(ඊ) මගීන් කැටුව නොයන භාණ්ඩ (Unaccompanied Passenger Cargo-UPB) පරීක්ෂණ මධ්‍යස්ථානවල රාජසන්තක කරන ලද සහ අත්හැර දමන ලද භාණ්ඩ විශාල වශයෙන් ගොඩගසා තිබීම නිසා එම මධ්‍යස්ථානවල ඉඩකඩ ඇහිරී තිබුණු අතර භාවිතා කළ හැකි භාණ්ඩ අලෙවිය තුළින් ආදායමක් ලබා ගැනීමටත් භාවිතා කළ හැකි/නොහැකි භාණ්ඩ අපහරණය කිරීමටත් කටයුතු කිරීම ප්‍රමාද වී තිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙක් සමඟ සංවර්ධන නිලධාරිවරයෙක් සහ කළමනාකරණ සහකාරවරු 12ක් පමණ අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව සිටිය ද, බහුතරයක් කළමනාකරණ සහකාරවරුන් සෑම මාස 06ට වරක් රේගුවේම විවිධ අංශයන්ට ස්ථාන මාරු කිරීමට කටයුතු කර තිබුණි. 2024 අප්‍රේල් 09 දින විගණකාධිපති විසින් නිකුත් කරන ලද "ශ්‍රී ලංකා රේගුවේ පවතින විවිධ අරමුදල් කළමනාකරණය/පරිපාලනය සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාවේ" ද රේගුවේ කාර්යය මණ්ඩලය නිශ්චිත කාලයකට වරක් සේවා ස්ථාන/කාර්යභාර අතර

XXI

අනුයුක්ත කිරීම අභ්‍යන්තර පාලනය, අභ්‍යන්තර විගණනය සහ ආයතනික කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ අරමුණින් සිදුකළ යුත්තක් බවට නිර්දේශ කර තිබියදී ඒ පිළිබඳව නොසලකා මෙම මාරු කිරීම් දිගින් දිගටම සිදුකිරීමට කටයුතු කර තිබුණි. කෙසේවුවද " පවත්නා ස්ථාන මාරු ක්‍රමවේදය මඟින් ඉතිහාසගත ආදායම් ඉලක්ක සපුරා ගත් බවත්, රේගුවේ සුවිශේෂී තත්ත්වයන් සැලකිල්ලට ගත් කල එක් ස්ථානයක දීර්ඝ කාලයක් නිලධාරීන් රඳවා තැබීම ගැටලුකාරී වන බවත්" මෙම වාර්තාවේ කෙටුම්පත් වාර්තාවට පිළිතුරු වශයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මා වෙත වාර්තා කර තිබුණි.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව විසින් අස්පීත්වයක අරමුණු ළඟා කර ගැනීමේ ඵරමාර්ථයෙන් සම්පත් සකසුරුවම් ලෙස සහ කාර්යක්ෂමව භාවිතා කරන බවට සමාලෝචනය කළ යුතු වුවද, වසර 5 ට වඩා මුදල් අමාත්‍යාංශයේ මෙන්ම රේගු දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටුවේ ද සාකච්ඡාවට භාජනය කරන ලද ඉහත අරමුණුවලට සෘජු දායකත්වයක් ඇති කරුණු 4 ක් තවදුරටත් නොවිසඳී පැවතීම නිසා මෙම කමිටු පැවැත්වීමෙන් ලබා ගතහැකි ප්‍රතිඵල ලඟා කර ගැනීමට අසමත් වී තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම.

දෙපාර්තමේන්තුවේ සිටින විවිධ සේවාවන්ට අයත් නිලධාරීන් බහුතරයක් දෙනා සෑම මාස 06 කට වරක් විවිධ අංශ / ඒකක / ශාඛා අතර ස්ථාන මාරු කරන අතර, එකී තත්ත්වය සේවකයන් විශේෂ ප්‍රාගුණ්‍යය ලබා ගැනීමෙන් වළක්වන බවත්, රාජකාරී ඉටු කිරීමේදී අදාළ වැඩ මනා ලෙස ඉගෙන ගැනීම (Learning), වගකීම් දැරීම (Holding Responsibilities) සහ වගවීම (Accountability) අපේක්ෂිත මට්ටමින් ඉටු නොවීමට බලපාන බවත් විගණනය විසින් පෙන්වා දී තිබුණද, ස්ථාන මාරු ක්‍රමවේදය දෙපාර්තමේන්තු කාර්යයන් සඳහා දැඩි බලපෑමක් ඇති නොකරන බවත්, අපේක්ෂිත ආදායම් ඉලක්ක ඒ තුළ ළඟා කරගෙන ඇති බවත් රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් මා වෙත වාර්තා කර තිබුණි.නියැදි පරීක්ෂාවකදී කළමනාකරණ සහකාර සේවා නිලධාරීන් 25 දෙනෙක් 2023 ජූලි 01 දින සිට 2025 අප්‍රේල් 30 දින දක්වා වූ අර්ධ වර්ෂ 4 ක් තුළ අංශ / ඒකක / ශාඛා වශයෙන් ස්ථාන 4 ක් බැගින් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ලබා තිබුණි. මෙය අභ්‍යන්තර පාලන උපක්‍රමයක් ලෙස හෝ කාර්යක්ෂමතාවය වර්ධනය අපේක්ෂාවෙන් නොව සියලුදෙනාට අමතර ප්‍රතිලාභ තහවුරු කිරීමක් ලෙස නිරීක්ෂණය විය.

7. විශේෂ විගණන වාර්තාව

පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද 2024 අප්‍රේල් 09 දිනැති අංක එස් පී ආර්/2024/01 දරන " ශ්‍රී ලංකා රේගුවේ පවතින විවිධ අරමුදල් කළමනාකරණය/ පරිපාලනය" සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව ජාතික විගණන කාර්යාලයේ වෙබ් අඩවිය වන naosl.gov.lk (https:naosl.gov.lk/web/index.php/en) වෙතින් බාගත හැකිය.

ඊ. එම්. කේ. එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල.

ඊ.එම්.කේ.එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට,